කුලෙන් තොර ද කුල අන්ධ ද?

කුලය, සමාජ කොන්කිරීම් සහ ශ්‍රී ලංකාවේ සැඟවුණු සමාජ යථාර්ථය

කාලිංග ටියුඩර් සිල්වා, පී.පී. සිවප්‍රකාශම්, පරම්සෝති තන්ගේස්

වත්මන් ලංකාවේ කුලය පිළිබඳ දැඩි නිහැඬියාවක් පවතී. 1833 රාජකාරිය අහෝසි කිරීමෙන් අනතුරුව කිසිදු රාජකාරි කටයුත්තක් සඳහා කුලය පිළිගනු නොලැබේ. අසල්වැසි රටවල් වන ඉන්දියාවේ හා නේපාලයේ මෙන් ශ්‍රී ලංකාවේ ජන මාධ්‍යවල කුලය පිළිබඳව විවෘත සාකච්ඡාවක් සිදු නොවේ. උතුරු දිග ශ්‍රී ලංකාව ගැන සලකන විට LTTE සංවිධානය විසින් එක් අතකින් කුලය තහනම් කොට ඇති අතර අනෙක් අතින් එය ඊළාම් විමුක්ති අරගලයට බාධකයක් ලෙස හඳුනාගෙන ඇත. මෙවැනි පසුතලයක් පැවතුන ද කුලය විවාහය, දේශපාලනය හා සමාජ ක්‍රියාකාරිත්වය, සමාජ චලනතාවය වැනි කාරණාවලදී පෞද්ගලික සහ පොදු අවකාශයන් තුළ ක්‍රියාත්මක වන බව පෙනේ. ශ්‍රී ලංකාවේ පවත්නා වර්තමාන සමාජ දේශපාලන පසුතලය තුළ කුලය පවත්නේ බොහෝදුරට සැඟවුනු සංසිද්ධියක් වශයෙනි. එනමුත් උතුරේ හා දකුණේ පවත්නා සමාජ අසහනයන් හා විරෝධතා සඳහා දායක වන සාධක ගැන සලකා බැලීමේදී කුලයට ද කිසියම් වැදගත්කමක් දිය යුතුය. මෙම කෘතිය මඟින් සිංහල, ලාංකික දෙමළ සහ ඉන්දියානු දෙමළ ජන වර්ග තුළ ග්‍රාමීය අංශය, වතුකරය, නාගරික අඩු ආදායම් ජනාවාස, යුද්ධයෙන් පීඩිත කලාප, අවතැන් වූ ජනයාගේ කඳවුරු සහ ආගමික සහ දේශපාලන වැනි විවිධ සන්දර්භයන්හි කුල-පාදක සමාජ කොන් කිරීම් සිදුවන අයුරු විග්‍රහ කොට ඇත. ශ්‍රී ලංකා සමාජයෙහි කුල මුක්ත ස්වභාවයක් හෝ කුලරහිතභාවයකට වඩා කුලය පිළිබඳ අවිචාරාත්මක අන්ධානුකරණ ස්වභාවයක් පවත්නේ යැයි තර්ක කරන මෙම කෘතිය මඟින් කුල පීඩිත ජනයාගේ ආත්ම ගරුත්වය හා මානව අයිතිවාසිකම් තහවුරු කිරීමට දායක වන සමාජ ප්‍රතිපත්ති සහ එබඳු ජන කොටස්වල සහභාගිත්වය සහිතව සමාජ වෙනස හා සමාජ සාධාරණත්වය ඇති කිරීමේ වැදගත්කම පෙන්වා දේ.

කාලිංග ටියුඩර් සිල්වා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකු සහ ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපතිවරයා ද වේ.

පී.පී. සිවප්‍රකාශම් මහනුවර මානව සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂවරයා වේ.



පරම්සෝති තන්ගේස් කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ කථිකාචාර්යවරයෙකි.

ISBN 978-955-659-155-2
9 789556 591552
මිල රු. 700.00

කුමරන් බුක් හවුස්

විෂයයන්: සමාජ විද්‍යාව, මානව විද්‍යාව, දේශපාලනය, මානව හිමිකම්

කුලෙන් තොර ද කුල අන්ධ ද?
කාලිංග ටියුඩර් සිල්වා, පී.පී. සිවප්‍රකාශම්, පරම්සෝති තන්ගේස්

කුලෙන් තොර ද කුල අන්ධ ද?

කුලය, සමාජ කොන්කිරීම් සහ ශ්‍රී ලංකාවේ සැඟවුණු සමාජ යථාර්ථය

කාලිංග ටියුඩර් සිල්වා
පී.පී. සිවප්‍රකාශම්
පරම්සෝති තන්ගේස්

අන්තර්ජාතික දලිත් සහයෝගීතා ජාලය, කොපන්හේගන්
දලිත් අධ්‍යයන පිළිබඳව ඉන්දියානු ආයතනය, නවදිල්ලිය සහ
කුමරන් බුක් හවුස්, කොළඹ - චෙන්නායි

කුලෙන් තොර ද කුල අන්ධ ද?

කුලය, සමාජ කොන්කිරීම් සහ
ශ්‍රී ලංකාවේ සැඟවුණු සමාජ යථාර්ථය

කුලෙන් තොර ද කුල අන්ධ ද?

කුලය, සමාජ කොන්කිරීම් සහ
ශ්‍රී ලංකාවේ සැඟවුණු සමාජ යථාර්ථය

සංස්කරණය

කාලිංග ටියුඩර් සිල්වා

පී.පී. සිවප්‍රකාශම්

පරම්සෝති තන්ගේස්

අන්තර්ජාතික දලිත් සහයෝගීතා ජාලය, කොපන්හේගන්

දලිත් අධ්‍යයන පිළිබඳව ඉන්දියානු ආයතනය, නවදිල්ලිය

සහ

කුමරන් බුක් හවුස්

කොළඹ - චෙන්නායි

2009

ප්‍රකාශන අංක: 000

කුලෙන් තොර ද කුල අන්ධ ද?
කුලය, සමාජ කොන්කිරීම් සහ ශ්‍රී ලංකාවේ සැඟවුණු සමාජ යථාර්ථය
සංස්කරණය: කාලිංග ටියුඩර් සිල්වා, පී.පී. සිවප්‍රකාශම්, පරම්සෝති තන්ගේස්

ප්‍රකාශනය:

අන්තර්ජාතික දලිත් සහයෝගීතා ජාලය, කොපන්හේගන්

දලිත් අධ්‍යයන පිළිබඳව ඉන්දියානු ආයතනය, නවදිල්ලිය

සහ

කුමරන් බුක් හවුස්
361, 1/2, වේල්ල වීදිය, කොළඹ 12, දු.ක. 2421388, ඊමේල්: kumbh@sltnet.lk
3, මෙයිගෙයි විනයාගර් වීදිය, කුමරන් කොලනි, වඩපලනි, චෙන්නායි 600 026 දු.ක. 2362 280

මුද්‍රණය:

කුමරන් මුද්‍රණ (පුද්) සමාගම
361, 1/2, වේල්ල වීදිය, කොළඹ 12, දු.ක. 2421388, ඊමේල්: kumbh@sltnet.lk

Copyright © 2008 to the authors

ISBN: 978-955-659-xxx-x

All rights reserved.
No part of this book may be
reproduced, translated, stored
in a retrieval system or transmitted
in any form or by any means, electronic,
mechanical, photocopying,
recording or otherwise,
without prior written
permission from the
Author or the Publisher.

ප්‍රස්තාවනාව

අන්තර්ජාතික දලිත් සහයෝගීතා ජාලයේ (ISDN) පූර්ණ අනුග්‍රහය ඇතිව දලිත් අධ්‍යයන පිළිබඳව ඉන්දියානු ආයතනය (IIDS) විසින් මෙහෙයවන ලද දකුණු ආසියාවේ කුල.පාදක කොන් කිරීම් සම්බන්ධව සිදු කළ අධ්‍යයන මාලාවේ එක් අධ්‍යයනයක් ලෙස මෙම පර්යේෂණය සිදු කරන ලදි. ශ්‍රී ලංකාවේ "දලිත්" යන නාමය භාවිත නොවන හෙයින් මෙම ප්‍රකාශනයේදී එය කලාතුරකින් යොදන ලදි. ශ්‍රී ලංකාවේ කුල ක්‍රමයන්හි පහළ ස්තර හැඳින්වීමට "පීඩිත කුල" යන ව්‍යවහාරය සහ "පංචමර්", පල්ලර්, පරයන් සහ සක්කිලියාර් කුල යන්න යොදා ගන්නා ලදී. ශ්‍රී ලංකාවේ කුල.පාදක කොන් කිරීම් හා සමාජ අපහරණ අවබෝධ කරගැනීමේදී දුෂ්කරතා මතු වීමට උක්ත කාරණය ද හේතු විය.

ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයට ගොදුරු වූ උතුරු නැගෙනහිර ඇතුළු විවිධ ප්‍රදේශයන්හි සිදු වන කුල.පාදක කොන් කිරීම් ආවරණය කිරීම මෙම අධ්‍යයනයෙන් අපේක්‍ෂා කරන ලදි. කෙසේවුවද අධ්‍යයන කාල පරිච්ඡේදය තුළ ඒ ප්‍රදේශයේ පැවති ආරක්‍ෂක තත්වය හේතුවෙන් උතුරු නැගෙනහිර ප්‍රදේශයේ කුල.පාදක කොන් කිරීම් පිළිබඳ පූර්ණ ලෙස ආවරණය කිරීම අපහසු විය. ශ්‍රී ලංකාවේ මධ්‍යම හා දකුණු ප්‍රදේශවල කුල.පාදක කොන් කිරීම් ගැන සවිස්තර විග්‍රහයක් හා යාපන සමාජයේ කුල.පාදක කොන් කිරීම් පිළිබඳ සීමිත විමසුමක් මෙහිදී සිදු කරනු ලැබේ.

අන්තර්ජාතික දලිත් සහයෝගීතා ජාලයේ රිකී නෝර්ලින්ඩ් මහත්මියට, දලිත් අධ්‍යයන පිළිබඳව ඉන්දියානු ආයතනයේ ආචාර්ය චිත්තාරන්ජන් සේනාපති මහතාට මෙන්ම ශ්‍රී ලංකාවේදී අධ්‍යයනයට විවිධ අයුරින් සහයෝගය දැක්වූ සහායක පර්යේෂකයන්ට හා සිවිල් සමාජ ක්‍රියාකාරකයන්ට අපගේ සුවිශේෂ ස්තුතිය පළ කර සිටිමු. මෙම අධ්‍යයනයේදී මහාචාර්ය එච්.එම්.ඩී.ආර්. හේරත්, ආචාර්ය විජිත නානායක්කාර, ආචාර්ය එස්.එම්. හිස්බුල්ලා, ඩබ්.එම්.කේ.බී. වික්‍රමසිංහ සහ මහාචාර්ය ඩෙනිස් මැක්ගිල්වේ යන අයගේ උපදෙස් බොහෝ සේ ප්‍රයෝජනවත් විය. අවශ්‍ය සිතියම් සකසා දුන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා අංශයේ ආචාර්ය රාම් අලගන්, සාහිත්‍ය විමර්ශන සඳහා උපකාර කළ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය පුස්තකාලාධිපති ඊ.ඩී. අල්විස් යන මහත්වරුන්ට ද, සිංහල අත්පිටපත පිළියෙළ කිරීමේදී සහාය වූ ප්‍රියංගිකා මෙනෙවියට ද, මහනුවර නගරයේ නාගරික දුගී ප්‍රජාවන්ගේ තොරතුරු ලබා දුන්

මහනුවර නගර සභාවටද, ක්ෂේත්‍ර අධ්‍යයනවලදී ස්වකීය දැනුම හා අත්දැකීම් අප සමග බෙදා හදා ගත් අධ්‍යයන ප්‍රදේශවල සියලුම ප්‍රජා සාමාජිකයන් හා ප්‍රජා නායකයින්ට අපගේ කෘතඥතාව හිමි වේ.

මෙම අධ්‍යයනය තුළින් අප බලාපොරොත්තු වන්නේ ශ්‍රී ලංකාවේ කුල.පාදක කොන් කිරීමේ රටාවන් පිළිබඳ පුළුල් දැනුමක් ලබා දීම පමණක් නොව අදාළ ගැටලු සම්බන්ධ අනාගත ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනයට මඟ විවර කර දීමයි.

මහාචාර්ය කේ. ටියුඩර් සිල්වා
පී.පී. සිවප්‍රකාශම්
පරම්සෝති තන්ගේස්

පෙරවදන

දකුණු ආසියාතික සමාජයේ සමාජ අපහරණයට ලක් වූ ආන්තික කණ්ඩායම් පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයන සිදු කරන සංවිධාන අතර දලිත් අධ්‍යයන පිළිබඳ ඉන්දියානු ආයතනය (IIDS) ප්‍රමුඛස්ථානයක් ගනියි. පසුගිය අවුරුදු පහක කාලය තුළදී IIDS විසින්, ඉන්දියාවේ හා අසල්වැසි රටවල නිර්දිෂ්ට කුල, නිර්දිෂ්ට ගෝත්‍ර හා ආගමික සුළුතරයන් වැනි ඓතිහාසිකව ආන්තිකභාවයට පත් වූ කණ්ඩායම්වලට සිදුවන සමාජ අපහරණයන් හා කොන් කිරීම් පිළිබඳ අධ්‍යයන ගණනාවක් සිදු කරන ලදි.

මෙම ප්‍රකාශනය දකුණු ආසියාවේ කුල-පාදක කොන් කිරීම් පිළිබඳව සිදු කළ කලාපීය අධ්‍යයන ව්‍යාපෘතියේ ප්‍රතිඵලයකි. මෙහි පළමු වතාවට, බංගලාදේශය, නේපාලය, පාකිස්ථානය සහ ශ්‍රී ලංකාවේ කුල-පාදක කොන් කිරීම් විවිධ පැතිකඩ ඔස්සේ විග්‍රහ කිරීමට දකුණු ආසියාවේ පර්යේෂකයන් එකට එකතු විය. මෙම තුලනාත්මක අධ්‍යයනයේදී දකුණු ආසියාවේ කුල-පාදක කොන් කිරීම්වල ව්‍යුහාත්මක පදනම මෙන්ම, හින්දු, ඉස්ලාම්, බෞද්ධ හා අනෙකුත් ආගම් තුළින් විවිධ සමාජයන්ට බලපෑම් එල්ල වන ආකාරයත් හඳුනා ගත හැකි විය. මෙම අධ්‍යයන මාලාව තුළින් මානව හිමිකම් වෙනුවෙන් කැපවූ මානව හිතවාදී, ප්‍රජාතන්ත්‍රවාදී සමාජ පසුතලයක් දකුණු ආසියාවේ බිහි කිරීමට අවශ්‍ය රාජ්‍ය ප්‍රතිපත්ති, දේශපාලන ක්‍රියාකාරිත්වයන් හා සිවිල් සමාජ මැදිහත්වීම් උදෙසා නව ඉඩ ප්‍රස්තා විවෘත වනු ඇතැයි යන්න අපගේ අපේක්ෂාවයි.

මෙම සුවිශේෂී ප්‍රකාශනයේදී, ශ්‍රී ලංකාවේ වෙසෙන සිංහල, ශ්‍රී ලංකා දෙමළ, ඉන්දියානු දෙමළ ප්‍රජාවන්හි සිදු වන කුල-පාදක කොන් කිරීම් විමර්ශනයෙහිලා ශ්‍රී ලංකාවේ පර්යේෂණ කණ්ඩායමක් මූලිකත්වය ගෙන කටයුතු කළේය. IIDS වෙනුවෙන් ආචාර්ය චිත්තාරන්ජන් සේනාපති, මෙම දැවැන්ත වැඩසටහන සම්බන්ධීකරණය කරන ලදි. මහාචාර්ය ගණේෂ්‍යාම් ෂා, සුඛදේ තෝරාට්, මාර්ටින් මැකීවන් ඇතුළු IIDS හි විද්වත් මඬුල්ලක් විසින් රටවල් හතරම ආවරණය කළ මෙම දැවැන්ත ව්‍යාපෘතියේ අධ්‍යයන ක්‍රියාදාමයට නායකත්වය දී එය මෙහෙයවන ලදි. එසේම ව්‍යාපෘතිය සඳහා මූල්‍යමය දායකත්වය ලබා දුන් DANIDA සහ ඩෙන්මාර්ක් රජයට සහ අන්තර්ජාතික දලිත් සහයෝගීතා ජාලයට (International Dalit Solidarity Network) අපගේ කෘතඥතාව හිමිවේ. මෙම අධ්‍යයන වැඩසටහනට පහසුකම් සලසා දී මෙහි ප්‍රතිඵල ව්‍යාප්ත කිරීමට මූලිකත්වය ගැනීම සම්බන්ධව IDSN හි රිකී නෝර්ලින්ඩ් මහත්මියට අපගේ විශේෂ ස්තුතිය හිමි වේ.

මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල ප්‍රතිපත්ති සම්පාදකයන්, පර්යේෂකයන්, දලිත් ක්‍රියාකාරකයන්, සිවිල් සමාජ සංවිධානද ඇතුළු පුළුල් පාඨක පිරිසක් කුල පීඩිතයන්ගේ මානව හිමිකම් සුරැකීම සහ සුබසාධනය සඳහා යොදා ගනු ඇතැයි අපි උදක්ම අපේක්ෂා කරමු.

මහාචාර්ය සුරින්ද එස්. ජොද්කා
අධ්‍යක්ෂ
දලිත් අධ්‍යයන පිළිබඳ ඉන්දියානු ආයතනය
නවදිල්ලිය

මෙම කෘතියට දායක වූ අය

ඩී.එම්. චන්ද්‍රිමා නිලංකා අබේවර්ධන, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය.

පී. කොටිකාබද්ද, සංවර්ධන නිලධාරිනී සහ සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි අපේක්ෂිකාව.

පරම්සෝති තන්ගේස්, කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය.

ඒ.එස්. චන්ද්‍රාබෝස්, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අංශයේ අංශාධිපති.

ශෂිකුමාර් බාලසුන්දරම්, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය.

පී.පී. සිවප්‍රකාශම්, අධ්‍යක්ෂ, මානව සංවර්ධන ආයතනය, මහනුවර.

කාලිංග ටියුඩර් සිල්වා, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සහ ශාස්ත්‍රපීඨයේ පීඨාධිපති.

පටුන

ප්‍රස්තාවනාව		v
පෙරවදන		vii
සාරාංශය		xiii
පරිච්ඡේදය 1	**හැඳින්වීම** *කාලිංග ටියුඩර් සිල්වා, පී.පී. සිවප්‍රකාශම්, පරම්සෝති තන්ගේස්*	1
පරිච්ඡේදය 2	**කුල භේදය, සමාජ අසාධාරණය සහ ශ්‍රී ලංකා සමාජය** *කාලිංග ටියුඩර් සිල්වා, පරම්සෝති තන්ගේස්*	9
පරිච්ඡේදය 3	**සිංහල සමාජයේ කුල-පාදක කොන් කිරීම්** *කාලිංග ටියුඩර් සිල්වා, පී. කොට්කාබද්ද, ඩී.එම්. චන්දිමා නිලංකා අබේවර්ධන*	26
පරිච්ඡේදය 4	**යුද්ධයෙන් විනාශ වූ යාපන සමාජයේ කුල-පාදක කොන් කිරීම්** *පරම්සෝති තන්ගේස්, කාලිංග ටියුඩර් සිල්වා*	42
පරිච්ඡේදය 5	**ශ්‍රී ලංකාවේ ඉන්දියානු වතු කම්කරුවන් අතර පවත්නා කුල-පාදක කොන් කිරීම්** *ශෂිකුමාර් බාලසුන්දරම්, පී.පී. සිවප්‍රකාශම්, ඒ.එස්. චන්ද්‍රාබෝස්*	67
පරිච්ඡේදය 6	**නාගරික අස්පර්ශනීයත්වය: මහනුවර නගරයේ කසළ ශෝධකයන්ගේ සහ සනීපාරක්ෂක සේවකයින්ගේ තත්වය** *කාලිංග ටියුඩර් සිල්වා, පරම්සෝති තන්ගේස්, පී.පී. සිවප්‍රකාශම්*	79
පරිච්ඡේදය 7	**සාරාංශය සහ නිර්දේශ** *කාලිංග ටියුඩර් සිල්වා, පරම්සෝති තන්ගේස්, පී.පී. සිවප්‍රකාශම්*	99
ඇමුණුම් 1	**රොඩී කුලයේ සම්භවය පිළිබඳ පුවත**	112
ඇමුණුම් 2	**අවතැන් වූ පංචමර්වරුන්ගේ ප්‍රශ්න පැහැදිලි කරණ සිද්ධි අධ්‍යයන**	114
ඇමුණුම් 3	**2007 මැයි 27 දින ශ්‍රී ලංකාවේ පැවැත්වූ කුල-පාදක කොන් කිරීම් පිළිබඳ ජාතික වැඩමුළුවේ වාර්තාව**	115
ආශ්‍රිත ග්‍රන්ථ		123
සූචිය		130

Abbreviations

CBD	–	Caste-based Discrimination
CDO	–	Community Development Officer
DMK	–	Dravida Munetak Kalakam
GO	–	Government Organization
GOSL	–	Government of Sri Lanka
IDP	–	Internally Displaced People
IOT	–	Indian Origin Tamils
JVP	–	Janatha Vimukti Peramuna
KMC	–	Kandy Municipal Council
LTTE	–	Liberation Tigers of Tamil Eelam
MC	–	Municipal Council Quarters
MT	–	Model Tenement
NGO	–	Non-government Organization
NHDA	–	National Housing Development Authority
PPC	–	Pallan, Parayan and Chakkilian
UDA	–	Urban Development Authority
UNICEF	–	United Nations Children's Education Fund
VVT	–	Valvedditurai

සාරාංශය

ශ්‍රී ලංකාවෙහි කුල ක්‍රම තුනක් එකිනෙකට සමාන්තරව පවතී. ඒවා නම් සිංහල කුල ක්‍රමය, ශ්‍රී ලාංකික දෙමළ ජනයා අතර ඇති හින්දු කුල ක්‍රමය සහ ඉන්දීය දෙමළ ජනයා අතර ඇති හින්දු කුල ක්‍රමයයි. ඒවාට පාදක වූ අදහස් සහ මතවාද අතින් මේ කුල ක්‍රම අතර යම් යම් විෂමතා ඇත. එනමුත් පහත් යැයි සම්මත කුල කෙරෙහි කිසියම් වෙනස්කම් කිරීම් මේ කුල ක්‍රම සෑම එකක් තුළම දැක ගත හැක. ශ්‍රී ලංකාවේ කුලය පිළිබඳ ශාස්ත්‍රීය පර්යේෂණ රැසක් 1950 සහ 1960 ගණන්වලදී සිදු කරන ලදි. සමාජ ඒකාබද්ධතාවය කෙරෙහි කුල ක්‍රමයෙන් වන සමාජ කෘත්‍යයන් මෙම අධ්‍යයනවලදී පෙන්වා දෙන ලදි. එසේ නමුත් කුල ක්‍රමයන් හා බද්ධ වූ කොන් කිරීම්, සමාජ අසාධාරණය සහ මානව අයිතිවාසිකම් උල්ලංඝනයන් කෙරෙහි මෙම අධ්‍යයනවලදී සැලකිලිමත් වූ බවක් නොපෙනේ.

අන්තර්ජාතික දලිත් සහයෝගිතා ජාලයේ (IDSN) සහ දලිත් අධ්‍යයන පිළිබඳ ඉන්දියානු ආයතනයේ (IIDS) සහභාගිත්වයෙන් පවත්වන ලද වර්තමාන අධ්‍යයනයේ මූලික අරමුණ වනුයේ මානව ගරුත්වය, අධ්‍යාපනය, රැකියා, පොදු පහසුකම්, ආර්ථික අවස්ථා, දේශපාලන සහභාගිත්වය සහ සමාජ සුබසාධනය යන විවිධ ක්ෂේත්‍රවල පවත්නා කුල-පාදක වෙනස්කම් කිරීම් හා සම්බන්ධ රටාවන් සහ ප්‍රවණතා හඳුනා ගැනීමය. මේ සඳහා මෙම අධ්‍යයනයේදී ක්‍රමවේද කිහිපයක් යොදාගන්නා ලදි. ඒවා නම් සාහිත්‍යය සමාලෝචන, ද්විතියික දත්ත විශ්ලේෂණ, ප්‍රජා නායකයන් හා සිවිල් සමාජ ක්‍රියාකාරකයන් සමග සම්මුඛ සාකච්ඡා කිරීම, කුල සාධකයෙන් බලපෑමට ලක් වූ ඇතැම් කණ්ඩායම් සමග සාකච්ඡා කිරීම සහ එවැනි ප්‍රජාවන් කිහිපයක් තෝරාගෙන ඒවා ගැන මානව වංශ විද්‍යාත්මක පර්යේෂණ කිරීමය.

පවත්නා සීමිත දත්තවලින් හෙළිවන පරිදි ලංකාවේ ජනගහනයෙන් දළ වශයෙන් 20% ත් 30% ත් අතර ප්‍රමාණයක් කුල-පාදක වෙනස්කම් කිරීම්වලට යම් තරමකට හෝ ලක්වන බව ඇස්තමේන්තු කළ හැක. කුලයේ සමස්ත බලපෑම පසුගිය ශතක කිහිපය තුළ ක්‍රමයෙන් දුර්වල වී ඇති නමුත්, කුල-පාදක වෙනස්කම් කිරීම් ඇතැම්

ප්‍රදේශවල ශේෂ වී ඇති බවක් පෙනේ. එපමණක් නොව ඇතැම් සන්දර්භයන් තුළ කුල-පාදක අසමානතා අලුතින් නිර්මාණය වූ බව පෙනේ. මේවාට උදාහරණ නම් යටත් විජිත ආර්ථිකය සමග බිහි වූ වතු කම්කරු ප්‍රජාවන් තුළ කුල ධුරාවලියක් නිර්මාණය වීම සහ නගර සභා පිහිටුවීමත් සමඟ අදාළ කුලවලින් සැදුම්ලත් කසළ ශෝධක සහ සනීපාරක්ෂක කම්කරු බලකායක් බිහි වීම සහ වත්මන් යුගයේදී යුද්ධයෙන් සහ සුනාමියෙන් අවතැන් වූ ජනයා ඇතැම් අවස්ථාවලදී කුල-පාදක වෙනස්කම්වලට ලක්වීමය. පූර්ව යටත් විජිත ශ්‍රී ලංකා රාජ්‍ය තන්ත්‍රය සකස් වූයේ කුල-පාදක වරප්‍රසාද සහිත පාලක පන්තියකින් සහ ඉහළ සමාජ ස්තරයන් සහ රාජ්‍ය අවශ්‍යතා සඳහා පාරම්පරිකව කුල සේවාවන් සැපයීමට බැඳී සිටි යටහත් සමාජ ස්තරයන්ගෙනි. පවිත්‍රත්වය සහ කිල්ල පිළිබඳ ආගමානුකූල විශ්වාස මත නිර්මාණය වූ හින්දු කුල ක්‍රමයට සාපේක්ෂව විශේෂයෙන්ම සිංහල කුල ක්‍රමය, රාජ්‍යය, ඉඩම් භුක්ති ක්‍රමය, ආගමික පිළිවෙත් සහ සංවිධාන රටාව මෙන්ම පාරම්පරික ගරුත්වය වැනි ලෞකික බලවේගවලට අනුරූප වූ ස්තරායන ක්‍රමයක් විය.

කෙසේ නමුදු යටත් විජිතකරණයෙන් අනතුරුව කුල ක්‍රමයන් කෙරෙහි රාජ්‍ය තන්ත්‍රයෙන් වූ අනුග්‍රහය ක්‍රමයෙන් ඉවත් විය. ඒ වෙනුවට රජය ක්‍රමයෙන් කුලය නොසලකා කටයුතු කිරීමට, වඩාත් නිවැරදිව කිවහොත් කුලය දෙස නොබලා කටයුතු කිරීමට උනන්දු විය. අනෙක් අතට ද්‍රවිඩ විමුක්ති සංවිධානය තම බල ප්‍රදේශවල කුලය තහනම් කිරීමට ඉදිරිපත් වී ඇති අතර, එය දෙමළ ජනයාගේ පොදු අනන්‍යතාවයට සහ දේශපාලන ඒකරාශී වීමකට බාධාකාරී වූ සාධකයක් ලෙස හඳුනාගෙන ඇත. මෙම තත්වයන් යටතේ කුලය සමාජ හා දේශපාලන ක්‍රියාකාරකම් හෝ සමාජ ප්‍රතිපත්තිවලදී නොසලකා හරින එමෙන්ම සැඟවුනු සමාජ ආයතනයක් බවට පත්ව තිබේ. කෙසේ නමුත් මෙම තත්වයන් යටතේ කුල-පාදක සමාජ විෂමතා සහ සමාජ කොන් කිරීම් අහෝසි වී ඇතැයි කිව නොහැක. ඒ වෙනුවට කුලය රහසේ ක්‍රියාත්මක වන ඇතැම් විට ප්‍රචණ්ඩකාරී සමාජ දේශපාලන පෙළගැසීම්වලට දායක වන බලවේගයක් බවට පත්ව ඇත. වත්මන් යුගයේදී ඉස්මතු වී ඇති සිංහල හා දෙමළ ජාතිකවාදී ප්‍රවාහයන් සමාජයේ ප්‍රබල ලෙස ව්‍යාප්ත වූ පුරුෂාධිපතිත්වය සහ කුල සහ පන්ති විෂමතාවයන් අහෝසි කිරීමට හෝ ඉවත් කිරීමට වඩා වසන් කිරීමට දායක වී ඇත.

සිංහල සමාජය ගැන සලකන විට බ්‍රිතාන්‍ය අවධියට පෙර පැවති උඩරට රාජධානියෙහි දේශපාලන සහ සමාජ සංවිධානය, ආගමික පිළිවෙත් පද්ධතිය, ඉඩම් භුක්ති ක්‍රමය සහ සේවාවන් සිදු කිරීම සහ ලබා ගැනීම යන සියල්ල කුල ක්‍රමය වටා සකස් වූ බව රැල්ෆ් පීරිස් (1956) 'සිංහල සමාජ සංවිධානය' යන කෘතියෙහි සවිස්තරාත්මකව විග්‍රහ කොට ඇත. සුළු පිරිසකට සීමා වූ රදළ පාලක පැළැන්තිය සිය ජන්මයෙන්ම පාලනය සඳහා උචිතයන් ලෙස හඳුනා ගන්නා ලදි. ඉන් අනතුරුව සමාජ අනුපිළිවෙළ සකස් වූයේ ස්වාධීන ගැමියන් වූ ගොවි කුලයේ අය, කුල ක්‍රමයෙන් යම් තරමකට හෝ බාහිර පිරිසක් ලෙස සැලකිය හැකි වූ පහතරට කුලවලට අයත්

පිරිස්, රාජකාරි ක්‍රමය යටතේ නිශ්චිත සේවා සැපයීමට පාරම්පරිකව බැඳී සිටි සේවා කුලවල අය සහ යම් තරමකට සමාජ කොන් කිරීමකට හේතු වූ පහත්ම මට්ටමේ සේවාවන් සහ අඩු අයිතිවාසිකම් හිමි වූ රොඩී, ගහල සහ කින්නර වැනි කුලවලිනි. සම්ප්‍රදායයික උඩරට සමාජයෙහි එක් ලක්ෂණයක් වූයේ කුල මට්ටමෙන් අඩු වන විට ඉඩම් අයිතියට සහ ඉඩකඩම් පාලනයට ඇති අවකාශය ද වඩාත් සීමිත වීමය. සිංහල කුල ක්‍රමය තුළ නිශ්චිත වශයෙන් සමාජ කොන් කිරීමට ලක් වූ කුල මුළු ජනගහනයෙන් 1% ක් පමණ විය. ඔවුන් බොහෝවිට පදිංචිව සිටියේ සෙසු අයගෙන් වෙන් වූ කැළෑබද හුදෙකලා ගම්මානවලය. රොඩී කුලයේ සහ කින්නර කුලයේ ගම්මානවල පදිංචිය සකස් වූයේ ගුබ්බෑයම් (එනම් කුඩා ගෙවල් තදබදය සහිතව එකිනෙකට සමීපයේ ඉදිකොට තිබීම) ක්‍රමයටය.

කුල-පාදක වෙනස් කිරීම්වලට ලක් වූයේ එබඳු කොන් වූ කුල හෝ ගෝත්‍ර පමණක් නොවේ. සමාජ අනුපිළිවෙළට අනුව තත්වයෙන් ඊළඟ මට්ටමට අයත් බත්ගම, වහුම්පුර, කුඹල්, නැකති, හේන සහ නවන්දන්නා කුලවල අය ද යම් යම් සමාජ පීඩනයන්ට සහ සම්බාධකවලට ලක් විය. මෙම සියලු කොටස් මුළු සිංහල ජනගහනයෙන් 30% ක් පමණ වේ යැයි අනුමාන වශයෙන් කිව හැකිය.

යාපනයේ ලාංකික දෙමළ ජනයා අතර ඇති කුල ක්‍රමය ආගමානුකූල වූ, සමාජ අසමානත්වය, වෙනස්කම් කිරීම සහ සමාජ කොන් කිරීම වඩාත් පැහැදිලිව හඳුනාගත හැකි කුල ක්‍රමයකි. යාපන සමාජය තුළ බලය, අධිකාරිත්වය, සහ ගරුත්වය සැමවිටම හිමි වූයේ ඉඩම් හිමි 'ප්‍රමුඛ කුලය' වූ වෙල්ලාල කුලයටය. අනෙක් අතට ප්‍රදේශයේ කුල ධුරාවලියේ පහළම ස්ථානය, අස්පර්ශනීය ගණයට අයත් කුල පහකින් සමන්විත වූ 'පංචමර් අය' හොබවන ලදි. මෙම පංචමර් කුලයට රෙදි අපුල්ලන වන්නර් අය, කොණ්ඩ කපන අම්පට්ටර්වරු, කුලී ශ්‍රමිකයන් වූ පල්ලර්වරු, තල් රා මදින නලවර්වරු සහ මළබෙර ගසන පරයර් යන කුල අයත් වූහ. ජනගහනය අතින් 50% ක් පමණ වෙල්ලාල අය වූ අතර, පංචමර් කොටස 18% ක් පමණ විය. පංචමර් කණ්ඩායම විවිධ සීමාකම්වලට සහ තහංචිවලට ලක් වූහ. ඇඳිය හැකි ඇඳුම් පැළඳුම්, ගමන් කළ හැකි යාන වාහන, පානීය ජලය ලබා ගැනීමට, කෝවිල් වලට ඇතුළු වීමට, වෙළඳ සැල් සහ තේ කඩවලට ඇතුළු වීමට ඇති අයිතීන් යනාදී සෑම අයිතියක් අතින්ම පංචමර්වරුන්ට සීමාකම් සහ කොන් කිරීම්වලට මුහුණ පෑමට සිදු විය. පාසැල්වල ඉහළ කුලවල ළමයි බංකුවක හෝ පුටුවක වාඩි වී සිටි අතර පහළ කුලවල ළමයින්ට පන්තියේ කෙළවරක බිම වාඩි වී අධ්‍යාපනය ලැබීමට සිදු විය.

යාපන අර්ධද්වීපයෙහි පංචමර්වරුන්ට මුහුණ දීමට සිදු වූ විවිධ සමාජ අසාධාරණයන්ට එරෙහිව විරෝධතා ව්‍යාපාර ආරම්භ වූයේ 1920 තරම් ඈතකදීය. 1920 ගණන්වලදී පාසැල් තුළ "ළමයින්ට ආසන පැනවීම සහ ආහාර පාන ගැනීම අතින් සමානත්වය ඇති කිරීම සඳහා වූ අරගලය" (Campaign for Equality in Seating and Eating for School Children) දියත් විය. තේ කඩවලට ඇතුළත් වීමට තිබූ බාධක ජය ගැනීම සඳහා වූ අරගලය 1950 ගණන්වලදී ආරම්භ විය. වඩාත්

ප්‍රචණ්ඩකාරී ස්වභාවයක් ගත් "කෝවිල්වලට ඇතුළු වීම සඳහා වූ අරගලය" (Temple Entry Movement) 1960 ගණන් වලදී ඉස්මතු විය. මෙම අරගලයන්ගේ ප්‍රතිඵලයක් ලෙස 1970 ගණන් වන විට කුල සීමා සහ බන්ධනයන් යම් තරමකට සීමා විය. 1970 ගණන්වල අවසානයේදී සිංහල ආධිපත්‍යයට එරෙහිව දෙමළ ජාතික ව්‍යාපාරය ක්‍රමයෙන් ඉස්මතු වූ අතර එහිදී පන්ති කුල සහ වෙනත් ආකාරයන්ගෙන් දෙමළ ජනයා අතර වූ අභ්‍යන්තරික ප්‍රතිවිරෝධතා යටපත් වී සමස්ත ශ්‍රී ලංකා ජනගහනයෙන් සුළුතරයක් වූ දෙමළ ජනයාගේ පොදු ප්‍රශ්න කෙරෙහි වැඩි අවධානය යොමු විය. 1980 ගණන්වලදී ඉස්මතු වූ දෙමළ සටන්කාමී සංවිධාන හරහා වෙල්ලාල නොවන අඩු කුලවල දේශපාලන නායකත්වයක් ක්‍රමයෙන් බිහි වූ නමුත් එම නායකත්වය කුල අසාධාරණයන්ට වඩා ජනවාර්ගික අසාධාරණයන් කෙරෙහි වඩාත් සංවේදී විය. මේ අනුව දෙමළ ජාතික ව්‍යාපාරය මඟින් ඒ වන විට දෙමළ සමාජයේ කැකෑරෙමින් පැවති කුල අරගලය යටපත් වූ අතර කුලය ඔවුන්ගේ තහනමට ලක් වූ වඩාත් සැඟවුණු සමාජ සංසිද්ධියක් බවට පත් විය. කෙසේ නමුත් මේ මඟින් කුලය අහෝසි වී ඇති බවක් නොපෙනේ. යුද්ධයෙන් වඩාත් පීඩාවට ලක් වූ මිහිතලයේ අසරණ පිරිසක් වන්නේ අවතැන් වූ පංචමර් කණ්ඩායම්ය. වර්තමාන අධ්‍යයනයෙන් හෙළිවන පරිදි, යාපන අර්ධද්වීපයේ අවතැන් වූ අය සඳහා වූ කඳවුරුවල දිගුකාලීනව නවාතැන් ගෙන සිටින අයගෙන් බහුතරයක් පංචමර් කණ්ඩායමට අයත්ය. ජනවාර්ගික යුද්ධය මඟින් සමස්ත යාපන සමාජයම අනතුරට සහ ආපදාවලට ලක් වූ නමුත් ඉහළ කුලවල අයට පිටතට සංක්‍රමණයවීම් සහ නැවත පදිංචි කිරීම් ඔස්සේ මෙම ආපදාවලින් වඩාත් ඉක්මනින් ගැළවී යාමට හැකි වී ඇත. අනෙක් අතට කඳවුරුවල තවමත් සිටින පංචමර්වරුන්ට පානීය ජලය ලබා ගැනීම, ළමයින් පාසැල්වලට ඇතුළත් කර ගැනීම වැනි කටයුතුවලදී මෙම කඳවුරු අවට පදිංචි ඉහළ කුලවලට අයත් විශේෂයෙන්ම වෙල්ලාලවරුන්ගේ කොන් කිරීම්වලට මුහුණ දීමට සිදු වී ඇත. මෙයින් පැහැදිලි වන්නේ ජනවාර්ගික යුද්ධය මඟින් දෙමළ අයගේ පොදු අනන්‍යතාවය වඩාත් තහවුරු වී ඇති නමුදු, කුල ක්‍රමය අහෝසි කිරීම අතින් දෙමළ විමුක්ති ව්‍යාපාරය ලබා ඇති සාර්ථකත්වය සීමිත සහ බොහෝදුරට තාවකාලික එකක් බවය.

ලංකාවේ සිටින ඉන්දීය සම්භවයක් ඇති වතු කම්කරුවන් සහ නාගරික කසළ ශෝධක පිරිස් දකුණු ඉන්දීය කුල ධුරාවලියේ පහළම ස්තරවලින් ප්‍රභවය වූ අයයි. මෙය එක් අතකින් ලංකාවේ වතු ආර්ථිකයේ ආරම්භයේදී ශ්‍රමිකයන් බඳවා ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදයේ ප්‍රතිඵලයක් විය. වතුකරය පිහිටුවීම සඳහා බඳවා ගත් කම්කරුවන්ගෙන් 75% කටත් වඩා අයත් වූයේ පල්ලන්, පරයන් සහ චක්කිලියාර් යන දකුණු ඉන්දියානු පීඩිත කුලවලටය. කෙසේ නමුත් මෙම කම්කරුවන් අධීක්ෂණය සඳහා වූ කංගානිවරු බඳවා ගත්තේ කුඩියානවර් නමැති ඉහළ කුලවලින් සමන්විත සමාජ තලයෙනි. මෙයින් පෙනී යන්නේ වතු ආර්ථිකය සැකසුනේ පන්ති සහ කුල ධුරාවලියට අනුකූලව බවය. වතු ශ්‍රම හමුදාව තුළ විවිධ කුල පසුබිම්වලට අයත් ශ්‍රමිකයන් අතර පන්තිමය වශයෙන් සමාජ සමතලකරණයක්

සිදු වේ යැයි අපේක්ෂා කළ හැකි නමුදු, පසුගිය අවුරුදු 150 ක කාලයක් තිස්සේ එබඳු සමතලකරණයක් සිදු වී ඇති බවට සාක්ෂි විරලය. වතුකරයේ ශ්‍රම සංවිධානය සහ සමාජ ක්‍රමය සකස් වී ඇත්තේ ජනවාර්ගිකත්වය, පන්ති ක්‍රමය සහ කුල ක්‍රමය යන සාධක සමගාමී ලෙසත්, තිරස් සහ සිරස් සමාජ චලනතාව අවම වන ලෙසත් ක්‍රියාත්මක වීම ඔස්සේය. වතු ආර්ථිකය සහ වතු සමාජය තුළ අස්පර්ශනීයත්වය අහෝසි වූ නමුදු, ශ්‍රම හමුදාවේ පහළම ස්තරය සමාජ ගරුත්වය සහ ජීවන තත්වය අතින් වඩාත් ආන්තික තත්වයකට පත් වීම කුලය, පන්තිය සහ ජනවාර්ගිකත්වය යන සමගාමී සාධක මඟින් වඩාත් තහවුරු වී ඇත. එමෙන්ම යටත් විජිත යුගයේදී පිහිටුවන ලද නාගරික කසළ ශෝධක ප්‍රජාවන් සෙසු අයගෙන් වෙන් වූ සහ කොන් වූ ජනාවාස ලෙස ස්ථානගත වී ඇත. මෙම ජනාවාසවල ද පන්තිය, ජනවාර්ගිකත්වය සහ කුලය යන සාධක සමගාමී ලෙස ක්‍රියාත්මක වීමක් දැකිය හැකිය. මෙම ප්‍රජාවන් කෙරෙහි ක්‍රියාත්මක වන සමාජ කොන්වීම පන්තිය හෝ ජනවාර්ගිකත්වය මෙන්ම කුලය යන සාධක ඔස්සේ විමසිය යුතුය.

අවසාන වශයෙන් මෙම අධ්‍යයනයේ ප්‍රධාන නිගමනය වන්නේ ලංකා සමාජය 'කුලය රහිත' (casteless) සමාජයක් ලෙස සැලකීම මෙන්ම ඒ අනුව කුලය නොසලකා හැර රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන මෙන්ම දෙමළ කොටි සංවිධානය වැනි සංවිධාන ස්වකීය ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්පාදනය කිරීම ගැටලු සහගත බවයි. මානව හිමිකම් නීතිරීති සහ අන්තර්ජාතික එකඟතා සහ ශ්‍රී ලංකා රජයේ සමාජ සුබසාධන ප්‍රතිපත්ති යනාදිය ප්‍රකට මෙන්ම සැඟවුණු සමාජ අසමානත්වයන් අවම කිරීම සඳහා යොදා ගත යුතුය. ස්ත්‍රී-පුරුෂභාවය, සමාජ පන්තිය සහ ජනවාර්ගිකත්වය වැනි සමාජ විෂමතා සඳහා පාදක වූ අනෙකුත් සාධක මෙන්ම කුල පීඩනයට තවදුරටත් ලක් වූ පිරිස් හඳුනාගැනීමට සංවිධානය කිරීමට ද සහ බලසතු කිරීමට අදාළ රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන යොමු විය යුතුය.

පළමුවන පරිච්ඡේදය

හැඳින්වීම

කාලිංග ටියුඩර් සිල්වා
පී.පී. සිවප්‍රකාශම්
පරම්සෝති තන්ගේස්

පසුබිම

ඉන්දියාවට සාපේක්ෂව ලංකාවේ කුලය වඩාත් ලිහිල් වූ ආයතනයක් ලෙස සලකනු ලැබේ. සිංහල, ලාංකික දෙමළ සහ ඉන්දියානු දෙමළ ලෙස එකිනෙකට ස්වාධීන වූ කුල ක්‍රම තුනක් දක්නට ලැබේ. ඒ සෑම කුල ක්‍රමයක් තුළම එයට ආවේණික වූ සමාජ කොන් කිරීමේ රටා පවතී. 1950 ගණන්වලදී සහ 1960 ගණන්වලදී කුලය පිළිබඳ ශාස්ත්‍රීය පර්යේෂණ බහුලව සිදු විය. මෙම අධ්‍යනවලදී අවධානය යොමු වූයේ කුල ක්‍රමයේ ඇති සමාජ කෘත්‍යයන් කෙරෙහි මිස ඒ තුළ ඇති සමාජ කොන් කිරීම් කෙරෙහි නොවේ. කුලය සමාජයේ විවිධ පාර්ශවයන් ඓන්ද්‍රිය ලෙස යා කෙරෙන සමාජ ඒකාබද්ධතා පද්ධතියක් ලෙස හඳුනා ගැනුනු අතර, සමාජ ස්තරායනයේ පහළම ස්තරවලට මුහුණ දීමට සිදු වූ සම්බාධක නොසලකා හරින ලදි.

වත්මන් ශ්‍රී ලංකාව තුළ කුලය විවෘත කතාබහට ලක් නොවන රහසිගත මාතෘකාවක් බවට පත්වී ඇත. මුල් යුගයේ ජන සංගණනවලදී කුලය ගැන තොරතුරු විමසන ලද නමුදු 1871 දී සිදු කරන ලද දීපව්‍යාප්ත ජන සංගණනයේ සිට කුලය සංගණන ක්‍රියාවලියෙන් ඉවත් කරන ලදි. එතැන් සිට ජන සංගණනවලදී යොදා ගන්නා ලද්දේ ජාතිකත්වය (nationality) සහ මානව වර්ගය (race) යන සාධකයන්ය. මෙම තත්වය යටතේ එක් එක් කුලයට අයත් ජනගහනය ගැන නිවැරදි තොරතුරු සොයා ගැනීමට නොහැකි විය. සමාජ ප්‍රතිපත්තිවලදී හෝ මානව අයිතිවාසිකම් පිළිබඳ විග්‍රහයන්හිදී පවා කුලය ගැන සඳහන් වන්නේ විරල වශයෙනි. යටත් විජිත පාලකයන් කුලය අනුමත නොකරන ලද නමුත් විවිධ අරමුණු සඳහා කුලය යොදා ගන්නා ලදි. උදාහරණ ලෙස සිවිල් පාලනයේ තනතුරු සඳහා පුද්ගලයන් තෝරා ගැනීමේදී, විවිධ අරමුණු සඳහා සේවා ලබා ගැනීම සඳහා මෙන්ම ඔවුන් විසින්

ඉදිරි කෙරුණු වතු ආර්ථිකය සඳහා සේවකයන් තෝරාගැනීමේ සහ ඔවුන් සේවයට යොදවා ගැනීමේ ශ්‍රම සංවිධාන ක්‍රමය තුළදී කුලයට වැදගත් තැනක් හිමි විය.

1930 දශකයේ සිට ලංකාවේ බිහි වූ සුබසාධක රාජ්‍යය තුළ රජයේ වියදමින් සැපයූ නිදහස් අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා සහ ආහාර සලාක වැනි ප්‍රතිලාභ කුලය, ජන වර්ගය, සහ ස්ත්‍රී පුරුෂභාවය යන කිසිදු සාධකයක බලපෑමෙන් තොරව සියලු සුදුස්සන්ට හිමිවනු ඇතැයි කල්පනා කරන ලදි. එබැවින් පාරම්පරිකව සමාජ වරප්‍රසාද අහිමිව සිටි පීඩිත කුලවල අය සඳහා විශේෂ රැකවරණ සහ විශේෂ උපකාර සැපයීමේ අවශ්‍යතාවයක් රාජ්‍ය තන්ත්‍රය හෝ සිවිල් සමාජය හඳුනා ගත්තේ නැත. ඉන්දීය ජනනායක අම්බෙඩ්කාර් වැනි කුලහීනයන්ගේ විමුක්තිය සඳහා නොපැකිළ ඉදිරිපත් වූ ජනනායකයෙකු බිහි නොවීම ද මෙයට බලපෑ සාධකයක් ලෙස සැලකිය හැකිය.

ශ්‍රී ලංකාවේ ඇති කුල ක්‍රමයන් ඉන්දියාවේ ඇති කුල ක්‍රමයට සාපේක්ෂව වඩා දෘඩ බවින් අඩු ආයතනයක් ලෙස සැලකිය හැක්කේ කරුණු කිහිපයක් නිසාය. ලංකාවේ ඇතැම් කුල ධුරාවලින් ආගමානුකූල පද්ධතීන්වලට වඩා ලෞකික ධුරාවලින් ලෙස සැලකිය හැකිය. සිංහල සමාජයේ ප්‍රධාන ආගම වූ බුදුදහම තුළ කුලය පිළිබඳ විවේචනාත්මක චින්තනයක් පවතී. ලංකාවේ එක ද කුල ක්‍රමයක් තුළ හෝ බමුණු ආධිපත්‍යයක් නොපවතී. ඉන්දියාවට සාපේක්ෂව අස්පර්ශනීයත්වය පිළිබඳ මතවාදයන් සහ භාවිතයන් ලංකාවේ පවතින්නේ විරල වශයෙනි. එමෙන්ම විශේෂයෙන්ම සිංහල සමාජය තුළ සමාජ ගැරහීමට වඩාත් ලක් වූ කුලවලට අයත් වන්නේ ජනගහනයෙන් සීමිත ප්‍රතිශතයකි.

සිංහල කුල ක්‍රමයේ ලෞකික ස්වභාවය පෙන්වාදෙමින් පූර්ව යටත් විජිත යුගයේ පැවති උඩරට රාජධානිය සකස් වූයේ කුල මූලධර්මවලට අනුකූලවය. දේපළ, රජයේ උසස් තනතුරු සහ ගරුත්වය ඒකරාශි වූයේ රදළ වංශය තුළය. උඩරට කුල ක්‍රමය ප්‍රධාන ශ්‍රේණි හතරකින් සමන්විත විය. රදලයන් ද සහිත වූ ගොවි කුලය සමාජයේ ඉහළම ස්තරය විය. මුහුදුබඩ ප්‍රදේශවලට අයත් කරාව, සලාගම, දුරාව, හුණු යන කුල ඊළඟ මට්ටම ලෙස සැලකිය හැකිය. තුන්වන මට්ටමට අයත් වූයේ නිශ්චිත පාරම්පරික සේවා පැවරුන සේවා කුලයන්ය. සිංහල කුල ධුරාවලියේ හතරවන මට්ටම සමාජ කොන්වීමට ලක් වූ කින්නර, ගහල, සහ රොඩී යන මුළු සිංහල ජනගහනයෙන් 1% කටත් වඩා අඩු පිරිසකගෙන් සමන්විත විය. මෙම කණ්ඩායම අන්තර් පුද්ගල සබඳතාවලදී මෙන්ම සමාජ වරප්‍රසාද අතින් වඩාත්ම පීඩාවට පත් පිරිසක් විය. ඔවුන්ට අමතරව කුල ක්‍රමයේ දෙවන සහ තුන්වන ශ්‍රේණිවලට අයත් කරාව, බත්ගම සහ වහුම්පුර යන කුලවලට අයත් පුද්ගලයන් අතර ද විවිධාකාර සමාජ අසහනයන් ඉස්මතු වූ අතර ජනතා විමුක්ති පෙරමුණ වැනි ආරම්භයේදී ප්‍රචණ්ඩකාරී කැරලිකාර දේශපාලන ව්‍යාපාර බිහි වීම කෙරෙහි ද කුල සාධකය යම් තරමකට දායක වී ඇත. කෙසේ නමුත් මේ කිසිදු ව්‍යාපාරයක් මගින් කුලය ගැන විවෘත සංවාදයක් අරඹා නොමැති අතර කුල පීඩනයට එරෙහිව පෙළ ගැසීමක් සිදු

වී නොමැත. අනෙක් අතට මහ මැතිවරණවලදී සහ වෙනත් අවස්ථාවලදී කුල හැඟීම තම වාසියට යොදා ගැනීමට යම් යම් පාර්ශවයන් උනන්දු වී ඇත. ලංකා සමාජය තුළ අස්පර්ශනීයත්වය වඩාත් ක්‍රමානුකූලව සහ හින්දු ධර්මානුකූලව තහවුරුව පැවතියේ යාපන අර්ධද්වීපය තුළය. මෙම සමාජ පසුතලය තුළ අස්පර්ශනීය ගණයට අයත් වඩාත් පහත් ලෙස සැලකුණ කුල පහකින් සමන්විත පංචමර් නම් සමාජ කොටසක් සිටී. ඔවුන්ට සෙසු අය සමග ඇසුරට විවිධ සම්බාධක පැවති අතර කෝවිල්, ජල මූලාශ්‍ර සහ පාසැල්වලට ඇතුළු වීමේදී විවිධ තහංචිවලට මුහුණ පෑමට සිදු විය. 1957 සිදු කළ අධ්‍යයනයකට අනුව ඔවුන් යාපන දෙමළ ජනගහනයෙන් 18% ක් පමණ විය. එක් ලේඛනයකට අනුව ඔවුන්ට සමාජ චර්යාව සම්බන්ධ තහංචි 24 කට මුහුණ දීමට සිදු විය. කුල ක්‍රමයෙන් ඔවුන්ට එල්ල වූ විවිධ පීඩනයන්ට එරෙහිව පංචමර් අය පෙළ ගැසීම 1920 ගණන් තරම් ඈතකදී ඇරඹුණි. පාසැල් තුළදී සියලු ළමුන්ට සමාන අසුන් ලබා දීම සහ එකට ආහාර ගැනීම සඳහා වූ ව්‍යාපාරය, තේ කඩවලට බාධාවකින් තොරව ඇතුළු වීම සඳහා වූ අරගලය, කෝවිල්වලට ඇතුළු වීම සඳහා කුලහීනයන්ට වූ බාධාවන්ට එරෙහි අරගලය යාපන සමාජයේ විවිධ වකවානුවල සිදු වූ කුල පීඩිතයන්ගේ පෙළ ගැසීම් විය. මෙයින් ඇතැම් අරගල මර්දනය කිරීම සඳහා කුලීන වෙල්ලාලයන් ප්‍රචණ්ඩත්වය යොදා ගන්නා ලදි. එම නිසා මෙම අරගල ද ක්‍රමයෙන් ප්‍රචණ්ඩකාරී ස්වරූපයක් ගන්නා ලදි. 1960 ගණන්වලින් පසුව මෙම කුලවාදී අරගල ක්‍රමයෙන් යටපත් වී දෙමළ ජාතිකවාදී ව්‍යාපාරය ඉස්මතු විය. 1980 ගණන් වන විට කුල පීඩනය බොහෝදුරට ලිහිල් වූ අතර යුද්ධය නිසා සිදු වූ අවතැන්වීම් සහ සංක්‍රමණ හමුවේ කුල භේදයද යම් තරමකට අඩු වූ බව පෙනේ. යුද්ධයෙන් සියලු ජන කණ්ඩායම්වලට හානිකර බලපෑමක් සිදු විය. කෙසේ වුවද 2000 ගණන් දක්වා අවතැන් වූ අය පදිංචි කඳවුරුවල වැඩි වශයෙන් රැඳී සිටියේ පංචමර් අය බව මෙම අධ්‍යයනයේදී හෙළි විය. එයට හේතුව ඔවුන්ට විකල්ප වාසස්ථාන සපයා ගැනීමට සහ ඉඩම් ලබා ගැනීමට ඇති අවස්ථා වඩාත් සීමා වීම යැයි සැලකිය හැකිය. එමෙන්ම අවතැන් කඳවුරුවල පදිංචි පංචමර් ජනයාට පානීය ජලය ලබා ගැනීම සහ වෙනත් පොදු පහසුකම් ලබාගැනීම අතින් අවට ප්‍රදේශවල පදිංචි කුලීන අයගෙන් යම් යම් තහංචිවලට මුහුණ දීමට ද සිදු වී ඇත. දෙමළ විමුක්ති ව්‍යාපාරය කුලීන කුලහීන සැමට විවෘත දේශපාලන ව්‍යාපාරයක් වන අතර දෙමළ අයගේ ජාතික සමගිය වෙනුවෙන් කුලය තහනම් කිරීමටද ඔවුන් ඉදිරිපත් වී ඇත. කෙසේ නමුත් කුල පීඩිතයන් වෙනුවෙන් පෙනී සිටීමට හෝ ඔවුන් සඳහා සටන් කිරීමට දෙමළ විමුක්ති ව්‍යාපාරය ඉදිරිපත් වී නොමැත. එයට හේතුව කුලය දෙමළ ජනයා බෙදා වෙන් කරන සාධකයක් මෙන්ම තම ජාතික සටනට අභියෝගයක් ලෙස දෙමළ විමුක්ති ව්‍යාපාරය හඳුනාගෙන තිබීමය. මෙම තත්වය යටතේ යාපන සමාජය තුළ ද සිංහල සමාජය තුළ මෙන්ම කුලය රහසිගත සැඟවුණු එනමුත් විවිධ ආකාරයන්ගෙන් සහ විවිධ හැඩතලවලින් ක්‍රියාත්මක වන සමාජ සංසිද්ධියක් බවට පත්වී ඇත.

ඉන්දියානු දෙමළ ජනයා ලංකා සමාජයට පිවිසියේ බ්‍රිතාන්‍ය යුගයේ පිහිටවූ වතු ආර්ථිකය තුළිනි. ඔවුන්ගෙන් බහුතරය දකුණු ඉන්දියානු සමාජයේ පීඩිත කුලවලින් විශේෂයෙන් පල්ලන්, පරයර් සහ චක්කිලියාර් (PPC) කුලවලට අයත් කම්කරුවන්ය. වතු ආර්ථිකයේ ශ්‍රම හමුදාවට සම්බන්ධ වීම තුළින් ඔවුන් පන්තිමය වශයෙන් කිසියම් සමතලකරණයකට බඳුන් වූ නමුදු, වතු ආර්ථිකය එක්තරා දුරකට කුල ක්‍රමය තම වාසිය සඳහා යොදවා ගන්නා ලදි. උදාහරණයක් ලෙස මුල් යුගයේ කම්කරු බහුතරය PPC කුලවලට අයත් වූ නමුත් ඔවුන්ගේ වැඩ අධීක්ෂණය කළ කංගානිවරු වඩා ඉහළ කුලවල ඉන්දියානු දෙමළ ජනයාගෙන් තෝරා ගන්නා ලදි. ඊට අමතරව වතු ආර්ථිකය තුළ කසළ ශෝධනය, රෙදි ඇපිල්ලීම වැනි කටයුතු සඳහා අදාළ කුලවලින් තෝරා ගනු ලැබිණ. එමෙන්ම වතුවල පිහිටුවන ලද හින්දු කෝවිල්වල සියලු පුදපූජා සහ පරිපාලන කටයුතු කුල ක්‍රමයට අනුව සිදු විය. කෙසේ නමුත් මෙතෙක් කර ඇති සියලු අධ්‍යයනයන්ගෙන් හෙළිවන්නේ වතුකරය තුළ කුල ක්‍රමය යම් ආකාරයකට ආරක්ෂා වී ඇති නමුදු කුලය තුළින් සමාජ කොන්වීම ක්‍රමයෙන් අඩු වී ඇති බවයි. කුල ආධිපත්‍යය යම් තරමකට ආරක්ෂා වී ඇති එක් ප්‍රබල ආයතනයක් නම් වතුකරයේ ඇති වෘත්තීය සමිති ව්‍යාපාරයයි. වතු කම්කරුවන්ගෙන් බහුතරය PPC කුලවලට අයත් වුවද වෘත්තීය සමිති ව්‍යාපාරය කුඩියානවර් ශ්‍රේණියට අයත් කුලවල අය විසින් මෙහෙයවනු ලැබේ. එමෙන්ම ලංකාවේ නගර බොහොමයක කසළ ශෝධක කාර්යයන් සහ සනීපාරක්ෂක කටයුතු පාරම්පරිකව උරුම වී ඇත්තේ ඉන්දියානු සම්භවයක් ඇති අදාළ කුලවල පුද්ගලයන්ටය. ඔවුහු බොහෝවිට සමාජ කොන්වීමට ලක් වූ නාගරික කම්කරු පිරිසක් ලෙස ඔවුන්ටම ආවේණික වූ ජනාකීර්ණ නාගරික පෙදෙස්වල පදිංචි වී සිටිති. ඔවුහු ජනවාර්ගික, පංතිමය සහ කුල සාධක ඔස්සේ සමාජ කොන් කිරීම්වලට ලක්ව සිටිති.

ලංකා සමාජයේ පීඩිත කුල කෙරෙහි ගම්උදාව වැනි රාජ්‍ය වැඩසටහන්වලදී සහ සර්වෝදය ව්‍යාපාරය වැනි රාජ්‍ය නොවන සංවිධානවල විටින් විට අවධානය යොමු වූ නමුදු ලංකාවේ සමාජ ප්‍රතිපත්තිවලදී සහ සිවිල් සමාජ ක්‍රියාකාරකම්වලදී කුලය ගැන විවෘත ලෙස අවධානය යොමු වී ඇත්තේ සීමිත වශයෙනි. පීඩිත කුලවලට අයත් පුද්ගලයන් තම අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා සටන් කිරීම සිදුවී ඇත්තේ අවස්ථා කිහිපයකදී පමණි. ඉන්දියාවේ ප්‍රචලිත "දලිත්" යන වචනය ස්වයං අනන්‍යතාව ප්‍රකාශ කිරීම සඳහා හෝ සමාජ දේශපාලන අරමුණු සඳහා ලංකාවේ යොදා ගනු නොලැබේ.

මෙම තත්වයන් යටතේ ලාංකික කුල ක්‍රමයන් තුළින් සිදුවන සමාජ අසාධාරණයන් සහ සමාජ කොන් කිරීම් අධ්‍යයනය කිරීම අපහසු එනමුත් අත්‍යවශ්‍ය කටයුත්තකි.

අධ්‍යයනයේ අරමුණු

1. ශ්‍රී ලංකාවෙහි කුල-පාදක සමාජ කොන් කිරීම් සහ අපහරණයන්ගේ ස්වභාවය, මට්ටම සහ යාන්ත්‍රණයන් හඳුනා ගැනීම.

2. අදාළ සමාජ කොන් කිරීම් සහ අපහරණයන් අවම කිරීම සඳහා ඇති ක්‍රියාමාර්ගයන් සොයා බැලීම සහ තක්සේරු කිරීම.

3. එම සමාජ කොන් කිරීම් සහ අපහරණයන් අහෝසි කිරීමට හෝ අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හඳුනා ගැනීම.

4. විශේෂයෙන් ඔවුන්ගේ මානව හිමිකම් උල්ලංඝනයන්, දරිද්‍රතා මට්ටම, දේශපාලන සහභාගිත්වය සහ ස්ත්‍රී පුරුෂ අසමානත්වය කෙරෙහි අවධානය යොමු කරමින් පීඩිත කුලවලට අයත් ජන කණ්ඩායම් ගැන තොරතුරු සොයා බැලීම සහ එම තොරතුරු අදාළ ක්‍රියාකාරීන් සහ ආයතනවලට ඉදිරිපත් කිරීම.

5. අදාළ ගැටලුව පිළිබඳ ශ්‍රී ලංකාව තුළ ඇති අවබෝධය වර්ධනය කිරීම සහ ඒ සඳහා යොමු වූ ක්‍රියාකාරකයන් හඳුනාගෙන ඔවුන්ට අවශ්‍ය මූලික දත්ත සහ විග්‍රහයන් ඉදිරිපත් කිරීම.

අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යනයේදී ප්‍රමාණාත්මක සහ ගුණාත්මක පර්යේෂණ ක්‍රම භාවිත කරන ලදි. ලංකාවේ කුලය ගැන සාකච්ඡා කිරීමේදී මතුවන ප්‍රශ්න සහ බොහෝ අය තම කුලය ගැන කතා කිරීමට ඇති මැලිකම නිසා මෙහිදී ගෘහ සමීක්ෂණයක් නොකරන ලදි. ඒ වෙනුවට පහත සඳහන් ක්‍රම උපයෝගී කරගන්නා ලදි.

1. ලංකාවේ කුලය සම්බන්ධයෙන් ඇති ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ ලිපි ලේඛන සමාලෝචනය කිරීම.

2. සංගණන වාර්තා, සමීක්ෂණ, පර්යේෂණ ආයතන සහ රාජ්‍ය නොවන සංවිධානවලින් එකතු කළ තොරතුරු ඇතුළත් ද්විතියික දත්ත විශ්ලේෂණය.

3. විශේෂයෙන්ම පීඩිත කුලවලට අයත් ප්‍රජා සහ දේශපාලන නායකයන් සමග පැවැත්වූ සාකච්ඡා.

4. කුල පීඩිතයන්ගේ ප්‍රශ්න කෙරෙහි විශේෂ සංවේදීතාවක් සහිත රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල නිලධාරීන් සමග පැවැත්වූ සාකච්ඡා.

5. සිංහල, ලාංකික දෙමළ සහ ඉන්දියානු දෙමළ ජන වර්ගවලට අයත් පීඩිත ප්‍රජාවන් නියෝජනය වන ලෙස තෝරාගත් ප්‍රජාවන් 9 ක සිදු කළ මානව වංශ විද්‍යාත්මක තොරතුරු ගවේෂණයන්. (මෙම ප්‍රජාවන් පිළිබඳ මූලික විස්තර වගු අංක 1.1 හි දක්වා ඇත.)

6. යුද්ධයෙන් සහ සුනාමියෙන් අවතැන් වූ තෝරාගත් ප්‍රජාවන්හි සිදු කරන ලද සමූහ සාකච්ඡා.

7. වත්මන් අධ්‍යනයෙන් සොයා ගත් දෑ පිළිබඳව අදාළ ප්‍රතිපත්ති සම්පාදකයන්, සමාජ ක්‍රියාකාරීන් සහ සිවිල් සමාජ නායකයින් දැනුවත් කිරීම සඳහා

පවත්වන ලද ජාතික වැඩමුළුව.

වගු අංක 1.1

කුල-පාදක වෙනස්කම් කිරීම් පිළිබඳ මානව වංශ පර්යේෂණ සඳහා තෝරාගත් අධ්‍යයන ප්‍රදේශ

අධ්‍යයන ප්‍රදේශය	දිස්ත්‍රික්කය	ජන වර්ගය	පීඩිත කුල
මහයියාව	මහනුවර	ඉන්දියානු දෙමළ	චක්කිලියාර්, පරයර්
වැලිවිට	මහනුවර	සිංහල	බෙරවා
හේනවල	මහනුවර	සිංහල	කින්නර
කුරගල	මහනුවර	සිංහල	රොඩී
මල්ලාහම්	යාපනය	ලාංකික දෙමළ	නලවර්, පල්ලර්
රොසෙලා වත්ත	නුවරඑළිය	ඉන්දියානු දෙමළ	පල්ලර්, පරයර්, සක්කිලියර්
ඕපාත වත්ත	රත්නපුර	ඉන්දියානු දෙමළ	පල්ලර්, පරයර්, සක්කිලියර්
ටෙම්පල්ස්ටෝවේ වත්ත	නුවරඑළිය	ඉන්දියානු දෙමළ	පල්ලර්, පරයර්, සක්කිලියර්
මෝචා වත්ත	නුවරඑළිය	ඉන්දියානු දෙමළ	පල්ලර්, පරයර්, සක්කිලියර්

මෙම පර්යේෂණය මහනුවර මානව සංවර්ධන ආයතනයේ (Human Development Organisation) සහයෝගය මත, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ පරීක්ෂක කණ්ඩායමක් විසින් සිදු කරන ලදි. වඩා ඵලදායී ලෙස දත්ත ඒකරාශි කරගනු වස් විවිධ ජන වර්ග නියෝජනය වන පරිදි ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයෙන්ම කණ්ඩායම සමන්විත විය. ක්ෂේත්‍ර අධ්‍යයනයේදී සහායක පර්යේෂකයන් තෝරා ගැනීමේදී අධ්‍යයන ප්‍රදේශවලින් තෝරා ගත් පිරිසට ප්‍රමුඛත්වය ලැබිණි. මෙම මානව වංශ අධ්‍යයන සිදු කරන ලද්දේ, ක්ෂේත්‍ර අධ්‍යයන පිළිබඳ මනා පරිචයක් ඇති, එමෙන්ම ව්‍යාපෘතියේ සමස්තාර්ථය වූ කුල-පාදක වෙනස්කම් පිටුදැකීම සම්බන්ධ විශේෂ උනන්දුවක් දැක්වූ පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය උපාධිධාරීන් කණ්ඩායමක් විසිනි.

ශ්‍රී ලංකාවේ කුල-පාදක කොන් කිරීම් පිළිබඳ වූ ජාතික වැඩමුළුව 2007.06.31 දින පේරාදෙණිය විශ්වවිද්‍යාලයේදී පැවැත්විණි. එහිදී සාකච්ඡා වූ පරිදි ව්‍යාපෘතියේ ප්‍රධාන අභිමතාර්ථ පහත සඳහන් වේ.

සිතියම් අංක 01: අධ්‍යයන ප්‍රදේශ



1. ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් සොයා ගත් දෑ පිළිබඳ අදාළ ප්‍රමුඛ සමාජ ක්‍රියාකාරකයන් දැනුවත්කිරීම.
2. අධ්‍යයනයෙන් හෙළි වූ හේතු සාධක පිළිබඳ තක්සේරු කිරීම.
3. අධ්‍යයන ක්ෂේත්‍රයට සම්බන්ධ විශේෂඥයන්, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල සමාජ ක්‍රියාකාරකයන්, පර්යේෂකයන්ගෙන් උපරිම සහයෝගය ලබා ගැනීම.
4. අධ්‍යයනයේ අනාවරණ පිළිබඳ ඊට අදාළ සියලු පාර්ශවයන් දැනුවත් කිරීම.

මෙම වැඩමුළුවට සහභාගීවූවන් අතර, පර්යේෂකයන්, සමාජ ක්‍රියාකාරකයන්, රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයන් මෙන්ම ශිෂ්‍යයන් ද, වෘත්තීය සමිති ක්‍රියාකාරකයන් ද ඇතුළු 40 දෙනෙක් වූහ. එමෙන්ම දලිත් අධ්‍යයන පිළිබඳ ඉන්දියානු ආයතනය (IIDS) නියෝජනය කරමින් නවදිල්ලියේ මහාචාර්ය ගනේෂ්‍යාම් ෂා ද අන්තර්ජාතික දලිත් සහයෝගීතා ජාලය වෙනුවෙන් (IDSN) රිකී නෝර්ලින්ඩ් මහත්මිය ද වැඩමුළුවට සහභාගී වූහ. (වැඩි විස්තර සඳහා ඇමුණුම් අංක 03 බලන්න).

දෙවන පරිච්ඡේදය

කුල භේදය, සමාජ අසාධාරණය සහ ලංකා සමාජය

කාලිංග ටියුඩර් සිල්වා
පරම්සෝති තන්ගේස්

පසුබිම

ඉන්දියාව හා සසඳා බලන විට ශ්‍රී ලංකාවේ කුලය වැදගත්කමින් සහ දෘශ්‍යමාන බව අතින් සීමිත නමුදු, සමස්ත ලංකා සමාජයෙන් 90% ක් පමණ, යම් යම් අරමුණු සඳහා හෝ කුලය යොදා ගනු ලැබේ (සසඳන්න Thorat and Shah 2007). ශ්‍රී ලංකාවේ විවිධ ජන කණ්ඩායම් අතර එකිනෙකට සමාන්තරව කුල ක්‍රම තුනක් හඳුනාගත හැක.[1] හින්දු කුල ක්‍රමයේ ප්‍රභේදයන් දෙකක් ලංකාවේ විවිධ පෙදෙස්වල ජීවත් වන දෙමළ හින්දුන් අතර පවතී. වඩාත් ප්‍රබල වූ කුල ක්‍රමය පවත්නේ යාපනයේ පදිංචි දෙමළ ජනයා සහ ඔවුන්ගෙන් පැවතෙන ලංකාවේ විවිධ පෙදෙස්වල වාසය කරන ජන කණ්ඩායම් අතරය. දශක තුනකට ආසන්න කාලයක් තිස්සේ සිදු වූ යුද්ධය සහ එමඟින් සිදු වූ අවතැන් වීම්, සියලු දෙමළ ජනයා තුළ කුල භේදයෙන් තොරව වර්ධනය වී ඇති දෙමළ ජාතිකත්ව හැඟීම, දෙමළ කොටි සංවිධානයෙන් කුලය සම්බන්ධයෙන් පනවා ඇති තහංචිවල බලපෑම කෙසේවුවද, විශේෂයෙන්ම යාපන අර්ධද්වීපය තුළ කුල

---

1 මෙම කෘතියේ සාකච්ඡා වන කුල ක්‍රමයන් තුනට අමතරව ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළේ දෙමළ කතා කරන ජනයා අතර සිවුවන කුල ක්‍රමයක් ඇතැයි මතයක් ඇත. කෙසේවුවත් අප සිතන ආකාරයට එය යාපන සමාජයේ හින්දු කුල ක්‍රමයේම ප්‍රභේදයක් විය හැකිය. මෙම අධ්‍යයනය තුළ නැගෙනහිර පළාතේ එක් පීඩිත කුල ප්‍රජාවක් පිළිබඳ ආවරණය කිරීමට අප උත්සාහ ගත් නමුදු අධ්‍යයන කාල පරිච්ඡේදය තුළ ප්‍රදේශයේ පැවති ආරක්ෂක තත්වය නිසා අපට එය කිරීමට නොහැකි විය (නැගෙනහිර කුල ක්‍රමය සඳහා බලන්න McGilvray 2008, 1982, 1983).

විෂමතා එදිනෙදා ජීවිතයේදී තවමත් වැදගත් වේ.[2] 19 වන සියවසේදී සම්භවය වූ ඉන්දීය වතු කම්කරුවන් අතර ද හින්දු කුල ක්‍රමය යම් තරමකට ආරක්ෂා වී ඇත. වතු ආර්ථිකය හා සම්බන්ධ ඉන්දියානු දෙමළ ජනයා ප්‍රධාන වශයෙන්ම මධ්‍යම කඳුකර ප්‍රදේශයේ ව්‍යාප්ත වී සිටිති. 2005 වන විට ලංකාවේ ජනගහනයෙන් 12% ක් පමණ ලාංකික දෙමළ ජනයාගෙන් සමන්විත වූ අතර තවත් 6% ක් ඉන්දියානු දෙමළ ජන වර්ගයට අයත් විය. ඇතැම් පර්යේෂකයන් ඉන්දියානු වතු කම්කරුවන්ගෙන් වැඩි දෙනා දලිත් මට්ටමට අයත් කුලවලින් ප්‍රභවය වූ හෙයින් සහ වතු ආර්ථිකය තුළ කම්කරු පාන්තික අනන්‍යතාවයන් සහ බලපෑම් නිසාත් කුලය ක්‍රමයෙන් දුබල වීමක් ගැන සඳහන් කරන අතර, තවත් අය වතු පාලකයන් තම අරමුණු සාධනය කර ගැනීම සඳහා කුලය යොදා ගැනීම නිසාත් වතු ආර්ථිකය අර්ධ වැඩවසම් පදනමකින් ගොඩනැගීම නිසාත්, කුලයේ ශේෂ වීමක් ගැන සඳහන් කරති (Jayaraman 1975, Hullop 1993, 1994, De Silva 1982).

සිය ආගම වූ බුදුදහම කුලය විවේචනයට ලක් කළ නමුත්, ජනගහනයෙන් 74% ක් පමණ වූ සිංහල ජනයා අතර ඔවුන්ටම ආවේණික වූ කුල ක්‍රමයක් අඩු තරමින් මධ්‍යතන යුගයේ සිට වර්ධනය විය. මේ අනුව හින්දූන් සහ බෞද්ධයන් අතර මෙන්ම සිංහල හෝ දෙමළ කතා කරන කිතුනුවන් අතර ද යම් තරමකට හෝ කුලය තහවුරු වී ඇත. එනමුත් කුලය ගැන විවෘතව කතා කිරීමක් හෝ කුල අසාධාරණකම්වලට එරෙහිව අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති ගැන වාද විවාද සමාජයේ ඉස්මතු වී නැත.

කෙසේ නමුත් 1960 සහ 1970 දශක වලදී කුලය සමාජ හා මානව විද්‍යාත්මක පර්යේෂණවල මූලික අවධානයට ලක් විය (උදා: Bank 1957, Leach 1960, 1961, Yalman 1967, Silva 1982, 1992, Roberts 1984, Ryan 1993). මෙම අධ්‍යයනවලදී කුල අසාධාරණකම් ගැන හෝ කුලයෙන් සිදුවන සමාජ කොන්වීම් ගැන අවධානය යොමු නොවූ අතර සමාජ ඒකාබද්ධතාවය සඳහා දායක වූ ආයතනයක් ලෙස කුලය කෙරෙහි සැලකිල්ල යොමු විය. උදාහරණයක් ලෙස සිංහල සමාජයේ කුලය විග්‍රහ කළ ලීච් එය සමාජයේ ඓන්ද්‍රිය ඒකාබද්ධතාව ධූරාවලි ක්‍රමයක් ඔස්සේ තහවුරු කරන ආයතනයක් ලෙස හඳුනා ගත්තේය. එමෙන්ම කුල ක්‍රමය තුළ ඉහළ කුලවලට ඇතැම් වරප්‍රසාද ලැබෙන නමුත්, ඉහළ කුලවල අයගේ පැවැත්ම සහ ගරුත්වය සඳහා අවශ්‍ය වූ ඇතැම් සේවා ඉටු කිරීම පිණිස ඒකාධිකාරී බලයක් පහළ කුලවලට පාරම්පරිකව උරුම වූ හෙයින් කුලය තුළින් පහළ කුලවලට ද එක්තරා දුරකට සමාජ රැකවරණයක් සහ ආර්ථික අවකාශයක් ලැබී ඇති බව ඔහුගේ තර්කය විය. එමෙන්ම

2 අපගේ අධ්‍යයනයට අමතරව මෑතකාලීනව යාපන සමාජයේ අධ්‍යයන කළ ලාංකික මානව වංශ විද්‍යාඥයන් දෙදෙනෙකු වන සිද්ධාර්ථන් සහ බහිරති අපගේ සොයා ගැනීම් තහවුරු කොට ඇත. බහිරති තමාගේ ආචාර්ය උපාධිය සඳහා යාපන සමාජයේ කුලය පිළිබඳව අධ්‍යයනය කළ අතර සිද්ධාර්ථන් ඔහුගේ දර්ශන ශූරී අධ්‍යයනය සිදු කළේ තමිල්නාඩුවේ ශ්‍රී ලාංකික දෙමළ අනාථයින් සහ කැනඩාවේ විසිරී සිටින ශ්‍රී ලාංකික දෙමළ ජනයා අතර ඇති ඥාතිත්වය සහ විවාහය පිළිබඳවය. මෙම මානව වංශ අධ්‍යයන දෙකෙහිම ප්‍රතිඵලයන් ඉදිරි කාලයේදී ප්‍රකාශයට පත් වනු ඇත.

ඉන්දියානු මානව විද්‍යාඥයෙකු වූ රාගවන් (1975) ඔහුගේ "රූමත් යාචකයෝ" (Handsome Beggars) නමැති කෘතියෙහි සිංහල සමාජයේ පහත්ම කුලය ලෙස හඳුනාගත් රොඩී ජනයාට ඇති වරප්‍රසාද සහ නිදහස ඉස්මතු කොට දැක්විය. මෙවැනි කෘත්‍යවාදී විග්‍රහයන් තුළින් කුලයේ ඇති ගැටලු සහගත සූරා කෑමේ ප්‍රවණතා විග්‍රහයෙන් ගිලිහී යාමක් සිදු විය. 1980 ගණන්වලින් පසුව සමාජ පර්යේෂණ තුළ කුලය කෙරෙහි වූ සැලකිල්ල අඩු වූ අතර ඒ වෙනුවට සමාජ පන්තිය, ජනවාර්ගිකත්වය, ජාතිකත්වය වැනි සාධක තුළින් සමාජ ගැටුම්වලට ඇති වූ බලපෑම කෙරෙහි වැඩි අවධානයක් යොමු විය.

ශ්‍රී ලාංකේය කුල ක්‍රම තුනෙහි කුල ධුරාවලියේ පහළ මට්ටමේ පිරිසට සිදුවන සමාජ අසාධාරණයන් සහ වෙනස්කම් කිරීම් සලකා බැලූ විට, සිංහල කුල ක්‍රමය තුළ අස්පර්ශනීයත්වය සහ අශුද්ධත්වය පිළිබඳ හැඟීම් ආගමානුකූලව තහවුරු වී නැත. රයන් විසින් රචිත සිංහල කුල ක්‍රමය පිළිබඳ නිබන්ධනයේ ඒ පිළිබඳ මෙසේ විග්‍රහ කොට ඇත.

> "ඉන්දියානු කුල ක්‍රමය හා සැසඳීමේදී සිංහල සමාජ ස්තරායනය තුළ පැහැදිලිව දක්නට ලැබෙන ලක්ෂණය නම් හින්දු කුල ක්‍රමයේ දක්නට ඇති අස්පර්ශනීයත්වය යන්න දක්නට නොවීමයි. බුදුදහමේ සංකල්පීය හරය තුළ කිසිදු මානවයෙකු 'අශුද්ධ' නොවන බව දක්වයි. සිංහල සමාජයෙන් කොන් වූ අස්පර්ශනීය කණ්ඩායම් පවතින නමුත් ඔවුන්ගේ අශුද්ධත්වය ආගමානුකූලව නොව සමාජමය ලෞකික තහංචි මඟින් තීරණය වී ඇත. හින්දු සංකල්පයෙන් වියුක්ත සිංහල කුල ක්‍රමය තුළින් වඩා නම්‍යශීලී මෙන්ම මානව හිතවාදී බවක් පිළිබිඹු විය" (Ryan 1993:16-17).

හින්දු කුල ක්‍රමය සමග සංසන්දනය කළ විට ලෞකිකකරණය වූ කුල ක්‍රමයක් සිංහල සමාජයේ ස්ථාපිත වී ඇත. පූර්ව යටත් විජිත යුගයේ පැවති කුල ක්‍රමය තුළින් පැහැදිලිවම වැඩවසම් ලක්ෂණ දක්නට ලැබේ. එම කුල ක්‍රමය ඉඩම් හිමි ප්‍රභූ (රදල), ගැමි (ගොවිගම), කම්කරු/සේවා කුල, ඉහළ කුලවලට අකැප යැයි සැලකූ පහළ මට්ටමේ සේවා සපයන කුල (නීච කුල) තුළින් සමාජය නිසැක ලෙසම ස්තර කිහිපයට බෙදා වෙන් කොට තිබුණි. රාජ්‍ය යාන්ත්‍රණය තුළ අත්‍යවශ්‍ය පැතිකඩක් ලෙස සමගාමී මෙන්ම අන්‍යෝන්‍ය ලෙසින් එකිනෙකට සම්බන්ධ ඉඩම් භුක්ති ක්‍රමයක් හා කුල පදනම් වූ සේවා ක්‍රමයක් සකස් වී තිබිණ (Pieris 1956). පිළිගත් සමාජ පර්යාය තුළ සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් ලෙස ද ප්‍රවේණි රැකියා ක්‍රමය හේතුවෙන් කුල ධුරාවලිය තුළ පහළ කුලවල ජනයාට සුවිශේෂී අයිතිවාසිකම් හිමිවන බව ලීච්ගේ (1960) අදහස විය. කෙසේවුවත් කුල ආවේණික රැකියා අවස්ථා නිසා ඔවුන්ට සමාජයේ හිමි වූ පහත් තත්වය විවිධ අන්දමින් ඔවුන්ව හිංසා, පීඩා, දූෂණවලට ලක්වීමට හේතුවක් විය.

සෑම කුල ක්‍රමයක් තුළම ඓතිහාසිකව කොන් කිරීමට ලක් වූ කුල කණ්ඩායම් රයන්ට අනුව 'ශිෂ්ටාචාරයෙන් බැහැර කරන ලද පිරිස්' විය (Ryan 1993). ලාංකේය සමාජයේ මෙවැනි කුල හැඳින්වීමට ඉංග්‍රීසි බසින් "Depressed Caste" (පීඩිත කුල) යන

යෙදුම භාවිත විය. ලාංකික දෙමළ ජනයා අතර ඇති කුල ක්‍රමයේ 'අස්පර්ශනීයත්වය' ආගමානුකූලව තහවුරු වූවකි. එම කුල ධුරාවලියේ පහළම ස්තරය කුල පහකින් සමන්විත පංචමර් කණ්ඩායමට හිමි වී ඇත. මෙම පංචමර් පිරිසට රෙදි අපුල්ලන වන්නර් අය, කොණ්ඩ කපන අම්පට්ටර්වරු, කුලී ශ්‍රමිකයන් වූ පල්ලර්වරු සහ මළබෙර ගසන පරයර්වරු යන කුල අයත් විය. යාපන සමාජය තුළ පාරම්පරිකව මෙම කුල අස්පර්ශනීය ගණයේ ලා සැලකිණි. බෑන්ක් (1957) සහ ඩේවිඩ් (1974) ට අනුව මෙම කුල යාපනයේ සමස්ත ජනගහනයෙන් 18% ක් පමණ වූ බව තක්සේරු කොට ඇත. 1950 දශකය දක්වා පංචමර් කුලයට අදාළ වූ තහංචි 23 ක් පිළිබඳව රඝුනාදන් (1957) ලැයිස්තුගත කළේය.[3] ඇඳිය හැකි ඇඳුම් පැළඳුම්, පානීය ජලය ලබා ගැනීම, පොදු ස්ථානවලට ඇතුළු වීම, පොදු සේවා ලබා ගැනීම පිළිබඳ තහංචි සහ සීමා කිරීම් ඒ අතර විය.

ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ වතු කම්කරුවන් වැඩි දෙනා කුල ධුරාවලියේ පහළම ස්තරවලින් ප්‍රභවය වූ පිරිසක් විය. පල්ලන් (පහළ මට්ටමේ සේවා සපයන්නන්), පරයන් (මළබෙර ගසන අය) සහ චක්කිලියාර් (වැසිකිළි පිරිසිදු කරන අය) කුලවලට පිරිස් බලය අතින් ශක්තිමත් තත්වයක් හිමි වූ නමුත් වතු කම්කරු ප්‍රජාව තුළ මේ පිරිස් යම් යම් කොන් කිරීම්වලට ලක් වූහ (Jayaraman 1975, Hullop 1994). 19 වන සියවසේදී බ්‍රිතාන්‍යයන් විසින් නාගරික සභා පිහිටුවීමත් සමග ස්ථාපිත කළ රැකියා අවස්ථා වූ සනීපාරක්ෂක කම්කරු, කසළ ශෝධක වෘත්තීන් සඳහා බඳවා ගනු ලැබුවේ චක්කිලියාර් කුලයට අයත් පුද්ගලයන්ය. මේ අනුව බ්‍රිතාන්‍ය යටත් විජිත පාලකයන් පවා යම් තරමකට කුලය තම උවමනාවන් සඳහා යොදා ගත් බව පෙනේ.

සිංහල කුල ධුරාවලියේ පහළම ස්තරවලට අයත් සුළු පිරිසකගෙන් සමන්විත කුල තුනක් වේ. රොඩී (යාචක), කින්නර (පැදුරු විවීම), ගහල (වධකයන්) යන මෙම කුලවලට ආවේණික ගති ස්වභාවයන් හා පහළ මට්ටමේ රැකියා අවස්ථා හිමි වූ ඔවුන් පාරම්පරිකව කොන් කිරීම්වලට ලක් විය. සංඛ්‍යාත්මකව සුළු පිරිසකින් සමන්විත මේ කුලවල ජනයා බොහෝවිට පදිංචිව සිටියේ සෙසු අයගෙන් වෙන් වූ කැළෑබද හුදෙකලා ගම්මානවලය. මීට අමතරව පදු/බත්ගම (බර උසුලන්නන්), බෙරවා (බෙර වාදකයන්), වහුම්පුර (හකුරු නිෂ්පාදකයන්), කුඹල් (වළන් නිෂ්පාදකයන්) ද ඉහළ කුලවල (රදළ, ගොවිගම) අයගේ තහංචි හා සම්බාධකවලට ලක්වී ඇත (Ryan 1993, Silva 1982,1992). මුළු සිංහල ජනගහනයෙන් 20-30% ත් අතර ප්‍රමාණයක් මෙම පීඩිත කුල කණ්ඩායම්වලට අයත් බව දළ වශයෙන් ඇස්තමේන්තු කළ හැකිය.

ශ්‍රී ලංකාවේ කුල ව්‍යාප්තිය පිළිබඳ නිවැරදි තොරතුරු ලබා ගැනීමට නොහැකි වී ඇත්තේ දීපව්‍යාප්ත සංගණනවලදී මෙන්ම සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ සිදුවන සමාජ ආර්ථික සමීක්ෂණවලදී කුලය නොසලකා හැරීම නිසාය. මුල්කාලීන සංගණනවලදී බ්‍රිතාන්‍යයන් විසින් 'කුලය' යන සාධකය විමසා බලන ලද නමුත් පසුව යම් යම් හේතුන් නිසා කුලය ජන සංගණන ක්‍රියාවලියෙන් ඉවත් කරන ලදි. පිළිගත් ජන

3 මෙම තහංචි සිවුවන පරිච්ඡේදයේදී විස්තර වේ.

සංගණනවලදී කුලය පිළිබඳ තොරතුරු ඒකරාශී කිරීම තුළින් කුල වෙනස්කම් යම් ආකාරයක විධිමත්කරණයකට ලක්වෙතැයි කල්පනා කොට පසු කාලයේදී කුලය සංගණනවලින් ඉවත් විය (Ryan 1993, Goonasekere 2001).

ඓතිහාසික පසුබිම

මහනුවර රාජධානියේ ක්‍රියාත්මක වූ කුල පාදක සේවා සැපයීම (රාජකාරිය[4]) බ්‍රිතාන්‍යයන් විසින් 1833 දී කෝල්බෘක් කැමරන් ප්‍රතිසංස්කරණ තුළින් අහෝසි කරන ලදි. එමඟින් කුලය නීත්‍යානුකූලභාවයෙන් තොර ආයතනයක් බවට පත් කරන ලදි. බ්‍රිතාන්‍ය පාලනය යටතේ විවෘත වූ ආර්ථික, සමාජයීය අවස්ථාවන් සිංහල හා දෙමළ සමාජවල ඉහළ කුලවල ජනයාට සීමා වූයේ නැත. කෙසේ නමුත් මුල් යුගයේදී කුල ධුරාවලියේ ඉහළින්ම සිටි පිරිස් අලුතින් විවෘත වු අවස්ථාවන්ගෙන් වැඩි වාසි ප්‍රයෝජන ලබා ගැනීමට උත්සුක වූහ. සිංහල සමාජයේ මුහුදුබඩ කලාපයේ ව්‍යාප්ත වූ කුල මට්ටමෙන් තරමක් පහළ කුලවලට අයත් කරාව, සලාගම, දුරාව වැනි ඇතැම් කුල උසස් අධ්‍යාපනය, වතු ආර්ථිකය තුළින් උදා වූ ව්‍යාපාරික හා රැකියා අවස්ථා තුළින් රදල ප්‍රභූ පැළැන්තියට සම මට්ටමට තම තත්වය උසස් කර ගැනීමට උත්සාහ කළහ (Roberts 1984, Kannnangara 1993). පෘතුගීසි අවධියෙන් මෑත යුගවලදී සිංහල හා දෙමළ සමාජ දෙකෙහිම වරප්‍රසාද නොලත් හීන කුලවල ජනයාට, ක්‍රිස්තියානි ආගමට හැරීමෙන් කුල පීඩනයෙන් මිදීමට මෙන්ම පැතිර තිබූ කුල දෘෂ්ටිවාදයෙන් මිදී ජීවත් වීමට ද ඉඩ ප්‍රස්තා සැලසුණි. කෙසේනමුත් යටත් විජිත සමයේ කුල ධුරාවලිය සම්පූර්ණයෙන්ම වියැකී ගිය බවක් මින් අදහස් නොවේ. රාජ්‍ය නිලධාරි පැළැන්තියේ ඇතැම් සිවිල් නිලධාරීන් උසස් කුලවලින් පමණක් තෝරා ගැනීම හේතුවෙන් සිංහල සහ දෙමළ ප්‍රජාවන් දෙකෙහිම කුල ක්‍රමයේ සමහර අංශ තවදුරටත් ක්‍රියාත්මක විය. වතුවල කම්කරු වෘත්තීන් සඳහා ශ්‍රමිකයන් බඳවා ගැනීමේදී මෙන්ම ශ්‍රමිකයන් සංවිධානගත කිරීම කුල මූලධර්මවලට අනුකූලව සිදු කළ බව ක්ෂේත්‍ර කම්කරුවන් අධීක්ෂණය කළ කංගානිවරුන් ඉන්දියානු දෙමළ සමාජයේ ඉහළ කුලවලින් බඳවා ගැනීමෙන් පැහැදිලි වේ (Hullop 1993, 1994). නාගරික සභා පිහිටවූ මුල් යුගයේදී සනීපාරක්ෂක සහ කසළ ශෝධක යන වෘත්තීන් ස්ථාපිත කෙරිණි. එම වෘත්තීන් සඳහා පැමිණි දකුණු ඉන්දියාවේ අදාළ කුල කණ්ඩායම් නිසා ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශවල ද අස්පර්ශනියත්වය යන සංකල්පය ඉස්මතු වීමක් සිදු විය. මේ කරුණ හයවන පරිච්ඡේදය තුළ තවදුරටත් විස්තර කෙරෙනු ඇත. යටත්විජිතවාදය එක් අතකින් කුල ක්‍රමය අඩපණ කළ අතරම අනෙක් අතට කුලය යළි බලාත්මක කරමින් කුලයට පුනර්ජීවනයක් ලබා දීමට සමත් විය.

4 රාජකාරිය යන්නෙහි වචනාර්ථය 'රජුට සේවය කිරීමයි.' රජ පවුල වෙනුවෙන් කරන සේවය හැරුනු කොට මේ තුළ රජය විසින් සංවිධානය කරනු ලබන පොදු වැඩ සඳහා සාමූහික ශ්‍රමයද, බෞද්ධ පන්සල් හින්දු කෝවිල් හා පාරම්පරික ඉඩම් හිමි ප්‍රභූන් වෙනුවෙන් ඉටු කරන චාරිත්‍රමය කුල සේවාවන්ද අන්තර්ගත විය.

පශ්චාත් යටත් විජිත ශ්‍රී ලංකා සමාජය තුළ කුලයට නිල සහයෝගයක් හෝ නිල පිළිගැනීමක් නොලැබුණි. කුල-පාදක වෙනස්කම් කිරීම් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව තුළින්ම තහනම් කරන ලදි. 1930 දශකයේ පිහිටවූ 'සමසමාජය' (Lit: Equal Society) වැනි වාමාංශික පක්ෂවල මූලික දැක්ම වූයේ කුල විරහිත පන්ති රහිත සමාජයක් බිහි කිරීමයි (Silva 2005).[5] නිදහස් ලංකාවේ නිදහස් අධ්‍යාපනය, සෞඛ්‍ය සේවය, ආහාර සලාක වැනි රාජ්‍ය සුබසාධන ප්‍රතිපත්ති සම්පාදනය වූයේ කුල ධුරාවලියේ පහළම ස්තරවලට පවා සමාන හිමිකම් ලැබෙන පරිද්දෙනි. ඉන්දියාවේ දේශපාලන නායකත්වය මෙන් නොව ලංකාවේ දේශපාලන නායකත්වය, සැමට සමානව විවෘත වූ සුබසාධන පහසුකම් ඇති කළ නමුත් වරප්‍රසාද නොලත් කුල කණ්ඩායම්වලට වාසිසහගත වන විශේෂ කොන්දේසි ලබාදීම අනවශ්‍ය යැයි බැහැර කළේය. යාපන සමාජයේ අධ්‍යාපන අවස්ථා මෙන්ම රැකියා අවස්ථා බොහොමයක් මුළුමනින්ම පාහේ හිමි කරගත්තේ අධිපතිවාදී වෙල්ලාල කුලය විසිනි. එහි ප්‍රතිඵලයක් ලෙස විශේෂයෙන්ම පංචමර් කුලවල ජනයාට ඉහළට නැගීමට ලැබුණු අවස්ථා සීමිත විය. 1960 ගණන්වලදී පංචමර්වරුන් විසින් මෙහෙයවූ කෝවිල්වලට ඇතුළු වීම සඳහා වූ අරගලය යාපන සමාජයේ පැවති වෙල්ලාල ආධිපත්‍යය හා ඉන් සිදු වූ පීඩනයට එරෙහිව නැගුණු කැපී පෙනුන විරෝධතා ව්‍යාපාරයක් විය. පෆෙන්බර්ගර් ගේ විග්‍රහයට අනුව කුලය නමැති පිළිලය විනාශ කර දැමීමට බිහි වූ කුල විමුක්ති ව්‍යාපාරයක් වෙනුවට ප්‍රචණ්ඩකාරී ජාතික ව්‍යාපාරයක ස්වරූපයෙන් ඉස්මතු වූ දෙමළ විමුක්ති ව්‍යාපාරය පසුකාලීනව සිංහල ආධිපත්‍යයට එරෙහි ප්‍රබල සමාජ ව්‍යාපාරයක් බවට පරිවර්තනය විය. මෙහිදී සඳහන් කළ යුතු වැදගත් කරුණ නම් LTTE සංවිධානයේ නායකත්වයට පත්වූ ප්‍රභාකරන්, යාපන සමාජයේ අධිපතිවාදී වෙල්ලාල කුලයට නොව 'කරයර්' (මසුන් මරන්නන්) කුලයට අයත් වීමයි. මෙය එවකට පැවති සාම්ප්‍රදායික සමාජ අනුපිළිවෙළට අභියෝගාත්මක ප්‍රවණතාවක් ලෙස සැලකිය යුතුය. නිදහස් අධ්‍යාපනය තහවුරු වීම තුළින් සිංහල සමාජයේ පුළුල් ලෙස සැමට සම අයිතීන් හිමිවන තත්වයක් ක්‍රමයෙන් ඇතිවුව ද, එය කුල අසමානතාව මුලිනුපුටා දැමීමට සමත් නොවීය. කුලය සමාජය තුළ කලාතුරකින් සංවාදයට බඳුන් වන සැඟවුණු සංසිද්ධියක් වුවද, කලින් කලට ඇති වූ මැතිවරණ, සමාජ අර්බුද, කැරලිකාරී අවස්ථාවන්හිදී දේශීය සමාජය තුළ කුලය විටින් විට ඉස්මතු වූ බවක් පෙනේ (Jiggins 1979, Chandraprema 1991). 1971, 1987-89 කාලවලදී ජනතා විමුක්ති පෙරමුණ කැරලිකාරී දේශපාලන ව්‍යාපාරයක් ලෙස ස්වකීය ව්‍යාපාරය 'පහළ කුල' තුළින් ඉස්මතු වූවක් බව කෙදිනකවත් හැඳින්වූයේ නැතත්, එවකට සිංහල සමාජයේ නොවිසඳුනු කුල ප්‍රශ්නය හා පන්ති අසාධාරණයන් තම වාසිය පිණිස යොදා ගත්තේය (Moore 1993,Chandraprema 1993). ජනතා විමුක්ති පෙරමුණේ නායක රෝහණ විජේවීර ඇතුළු ප්‍රධාන දේශපාලන ක්‍රියාකාරීන් බොහොමයක් සිංහල

5 Jiggins (1979) මෙම දෘෂ්ටිවාදයට එරෙහිව තර්ක කළ අයෙකි. සමසමාජ පක්ෂය හා අනෙකුත් වාමාංශික පක්ෂ පාර්ලිමේන්තු ආකෘතිය තුළදී කුලය හා ඥාතිත්වය සිය ප්‍රායෝගික දේශපාලනයට යොදා ගත්තේ යැයි ඇය තර්ක කරයි.

සමාජයේ වූ 'කරාව' කුලයෙන් පැමිණි බව හෙළි වේ. සාම්ප්‍රදායයික ගොවිගම කුලයේ නායකත්වය වෙනුවට කරාව කුලයේ අයෙකු මෙම ව්‍යාපාරයේ නායකත්වයට පත්වීම එතෙක් සිංහල සමාජයේ පැවති සමාජ අනුපිළිවෙළ අභියෝගයට ලක් වී ඇති බවට එක් උදාහරණයකි.

යාපන සමාජයේ කුල ක්‍රමය පුපුරා යෑම

යාපන සමාජයේ අධිපතිවාදී වෙල්ලාලවරුන් විසින් අත්තනෝමතිකව ගෙන ගිය ඉඩම් පාලනය, පරිපාලන හා දේශපාලන ක්‍රියාකාරකම්, සාම්ප්‍රදායයික චාරිත්‍ර වාරිත්‍ර හා වත්පිළිවෙත්, අධ්‍යාපනය මෙන්ම රැකියා ක්ෂේත්‍රවලදී සිදු වූ බලපෑම් හමුවේ එම සමාජය තුළ කුල පීඩනය දරුණු ස්වරූපයකට පත්ව තිබුණි. පංචමර්වරුන් පහළ මට්ටමේ සේවකයන් ලෙස සලකා දුරස්තව තැබූ අතර සමාජයේ ඉහළ ස්තරවල ජනයාගේ ලාභ ප්‍රයෝජන උදෙසා ගොවිපළවල කුලී වැඩ කිරීම ඇතුළු ප්‍රවේණි සේවා සැපයීමට පංචමර්වරුන්ට බලපෑම් එල්ල විණි (Pfaffenberger 1982, 1990). යාපනයේ පැවති හින්දු ශිව ආගම තුළින් කුලය ශක්තිමත් කළා සේම පංචමර්වරුන්ගේ අස්පර්ශනීයත්වයට නිර්වචන සැපයුවේය. 19වන සියවසේ හින්දු ආගමික පුනර්ජීවන ව්‍යාපාරයේ ක්‍රියාකාරකයෙකු ලෙස ගෞරවාදරයට පාත්‍ර වූ ආරුමුගම් නාවලර් පවා කුල අනුපිළිවෙළ දැඩිව පිළිගත්තේය. කුලවාදය සහ ස්ත්‍රීන් පිළිබඳ ගතානුගතික ආකල්පය දැඩිව මතුකොට දැක්වූ අදහසක් වරක් ඔහු ඉදිරිපත් කළේය. එනම් "'පරයි' (පරයර්වරු වාදනය කළ බෙර වර්ගය), ගැහැණුන් සහ පංචමර්වරුන් යන සියල්ල බිහිව ඇත්තේ පහර කෑමට" යන්නයි. සමාජ චාරිත්‍ර සියල්ල මෙහෙයවූ අධිපතිවාදී කුලවලින් පංචමර්වරුන්ට ඒ යටතේ අනේක විධ තහංචි පැනවිණි.

යාපනයේ පංචමර්වරුන්ට එරෙහිව සම්බාධක සෑහෙන ප්‍රමාණයක් පනවා තිබුණි. අනෙකුත් සුවිශේෂ අවස්ථාවන්හිදී කුල පදනම් වූ කෙනෙහිලිකම් ද දක්නට ලැබිණ. උදාහරණයක් ලෙස අවමඟුල් අවස්ථාවකදී කාන්තාවන් එකිනෙකා වැළඳගෙන හඬන සිරිතක් තිබුණ ද මෙවන් මොහොතකදී වුවද පහළ කුලවල කාන්තාවන්ට ඉහළ කුලවල කාන්තාවන් සමග එකතු වීමට ඉඩ නොවීය. ඉහළ කුලයක අවමඟුල් අවස්ථාවකදී පහළ කුලවල කාන්තාවන්ට හැඬීම සඳහා වෙනම ස්ථානයක් වෙන් කොට තිබිණ.

යාපන අර්ධද්වීපය තුළ පංචමර්වරුන් මුහුණ දුන් මෙම සමාජ අසාධාරණකම්වලට එරෙහි විරෝධතා ව්‍යාපාර ඇරඹෙන්නේ 1920 දශකයේ දීය. පංචමර්වරුන්ට එරෙහි සීමාවන්ට විරෝධය දැක්වීමට 1927 දී යාපනයේ පීඩිත දෙමළ කම්කරු සභාව (Forum for Depressed Class Tamil Labourers) පිහිටුවන ලදි. 1928 දී මෙම සංවිධානය විසින් පාසැල්වලදී පංචමර් ළමුන් හා උසස් කුලවල ළමුන් අතර වාඩිවීමේදී සහ ආහාර ගැනීමේදී සිදුවන කුල-පාදක වෙනස්කම් කිරීම්වලට එරෙහිව "පාසැල් තුළ ළමුන්ට ආසන පැනවීම සහ ආහාරපාන ගැනීම අතින් සමානාත්මතාවය සඳහා වූ අරගලය" (Campaign for Equality in Seating and Eating for School Children) දියත් කරන

ලදි. වසර දෙකක කාලයක් පුරා නොකඩවා දැරූ ප්‍රයත්නයන්හි ප්‍රතිඵලයක් ලෙස රජයේ පාසැල්වල පහළ කුලවල ළමුන්ට බිම වාඩි වීම වෙනුවට අනෙක් ළමුන් මෙන් බංකුවල වාඩි වීමට ඉඩ දෙමින් පරිපාලන අණ පනත් නිකුත් කෙරිණි. මෙයට පළි ගැනීමක් ලෙස ඉහළ කුලවල හින්දූන් විසින් නව නීති ක්‍රියාත්මක කළ පාසැල් 15ක් පුළුස්සා දමන ලදි. 1930 දී ඉහළ කුලවල දේශපාලන ප්‍රභූන් විසින් සමාන ආසන පැනවීමේ නීතිරීති ඉවත් කරන ලෙස ඉල්ලමින් පෙත්සම් යැවූ නමුත් ඇති වූ නව ප්‍රවණතාව ආපසු හැරවීමට ඔවුන්ට නොහැකි විය (Vegujanan & Ravana 207).

1931 ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ සර්වජන ඡන්ද බලය හඳුන්වා දුන් විට, වෙල්ලාල කුල නියෝජනය කළ එස්. නඩේසන් වැනි ප්‍රමුඛ පෙළේ දේශපාලන නායකයෝ පහළ කුලවල ජනයාට ඡන්ද බලය ප්‍රදානය කිරීමට එරෙහිව හඬ නැගූහ. නඩේසන් තමාගේ අනුගාමිකයන් බොහෝ දෙනෙකු සමග ස්වකීය ඡන්ද හිමිකම අත්හරින්නට පවා සූදානම් වූයේ පහළ කුලවල පිරිස් වෙත ඡන්ද බලය ලැබීමෙන් 'නොගැළපෙන පුද්ගලයන්' අතට බලය ලැබීම වැළැක්වීමටය. වෙල්ලාල නායකයන්ගේ ඉල්ලීම් ප්‍රතික්ෂේප කරමින් සර්වජන ඡන්ද බලය ලබා දුන් විට ඔවුන් ඊට එරෙහිව පළි ගත්තේ පංචමර්වරුන්ට තවදුරටත් දැඩි තහංචි පනවමිනි. පංචමර්වරුන්ට එරෙහිව සිදු වූ මෙවැනි අකටයුතුකම් 1943 දී 'උතුරු පළාත් සුළුතර දෙමළ මහා සභාව' (Nothern Sri Lankan Minority Tamil Mahasaba[6]) පිහිටුවීමට මූල බීජය වූ බව කිව යුතුය. මෙම සංවිධානය මඟින් පීඩිත කුලවල ජනයාගේ හිමිකම් උදෙසා ව්‍යවස්ථාවෙන්ම වෙන් කෙරුණු නීතිමය රැකවරණ ලබා ගැනීම මුල් කරගත් ක්‍රියාමාර්ග රාශියක් දියත් කරන ලදි. යාපන සමාජය තුළ වෙල්ලාලවරුන්ගේ ආර්ථික, දේශපාලන, චාරිත්‍රමය හා දෘෂ්ටිවාදී බලපෑම් පිළිබඳ මනා අවබෝධයෙන් සිටි පංචමර්වරුන්ට ස්වකීය අයිතීන් තහවුරු කර ගැනීම එතරම් පහසු කාර්යයක් නොවීය. 1950 වන විට පංචමර්වරුන්ගෙන් බොහොමයක් ඉහළ කුලවල සාම්ප්‍රදායික නායකත්වයට ගැති වූ දෙමළ කොංග්‍රසයට ප්‍රතිපක්ෂව පැන නැගුනු තමිල් අරසු පක්ෂය වටා එක්රොක් වූහ. තමිල් අරසු පක්ෂය 1957 දී සමාජ දුබලතා මැඩලීමේ අරමුණින් රජයේ ආයතනවල කුල-පාදක වෙනස්කම් කිරීම්වලට එරෙහිව සිය විරෝධය දැක්වීය. 1958 ඔක්තෝම්බර් මාසය තුළ, උතුරේ සුළුතර දෙමළ මහා සභාව තමිල් අරසු පක්ෂය සමග එක්ව 'තේ කඩවලට ඇතුළුවීම සඳහා වූ අරගලය' දියත් කළේය. නොවැම්බර් මාසය වන විට මුස්ලිම් තේ කඩ හිමියන් පංචමර්වරුන්ට සිය කඩවලට ඇතුළු වීමට ඉඩ ලබා දෙන මට්ටමට එය සාර්ථක වූ අතර පසුව බොහොමයක් තේ කඩවලට බාධාවකින් තොරව ඇතුළු වීමට පංචමර්වරුන්ට හැකියාව ලැබුණි.

ලංකා කොමියුනිස්ට් පක්ෂයේ සහයෝගය ඇතිව 1968 දී සංවිධානය කළ 'කෝවිල්වලට ඇතුළුවීමේ ව්‍යාපාරය' තුළින් පංචමර්වරුන්ට[7] දැවැන්ත ශක්තියක්

---

6 "Nothern Sri Lankan Minority Tamil Mahasaba" 1944 දී "All Sri Lakan Minority Tamil Mahasaba" යනුවෙන් නම් කරන ලදී.

7 සිවුවන පරිච්ඡේදයෙහි විස්තර වන පරිදි 'පංචමර්' යන්න යාපන කුල ක්‍රමයේ අස්පර්ශනීය ගණයට වැටෙන කුල පහක් හැඳින්වීම සඳහා යෙදේ.

හිමි විය (Vegujanan & Ravana 2007). මෙම ව්‍යාපාරය හේතුවෙන් තමිල් අරසු පක්ෂය හා පංචමර්වරු අතර සම්බන්ධතාවයේ යම් දෙදරීමක් සිදු වූයේ තමිල් අරසු පක්ෂයේ ඉහළ කුලවල නායකයන් බොහෝ දෙනෙකු මෙම කෝවිල්වලට ඇතුළු වීමේ ව්‍යාපාරයට සහාය නොදැක්වූ හෙයිනි. මෙම ව්‍යාපාරයට එරෙහි ඉහළ කුලවල ප්‍රතිචාරය ගෙවල් ගිනි තැබීම්, ගැටුම්වලින් ආරම්භ වී අවසානයේ දෙපාර්ශවයේම මිනිස් ඝාතන සිදු වූ ප්‍රචණ්ඩකාරී කෝලාහලයක් බවට පත්විය. පෆෙන්බර්ගර් (1990) ගේ තර්කය නම් දෙමළ ජාතික ව්‍යාපාරය 'ආරක්ෂාකාරී ජාතික ව්‍යාපාරයක්' (Defensive Nationalism) ලෙස බිහි වූයේ එක් අතකින් කුල ගැටුම් නිසා දෙමළ සමාජය තුළ උද්ගත වූ අභ්‍යන්තර ගැටුම් සමනය කිරීම සඳහා සහ අනෙක් අතින් සිංහල අධිපතිවාදී රාජ්‍යය තුළින් දෙමළ ජනයාට එල්ල වූ තර්ජන ජය ගැනීම සඳහාය. කෝවිල්වලට ඇතුල්වීමේ ව්‍යාපාරයෙන් අපේක්ෂිත අරමුණු ඉටු වූයේ අර්ධ වශයෙනි. මාවිද්දපුරම් වැනි ප්‍රධාන හින්දු කෝවිල්වල පංචමර්වරුන්ට පිටත මළුවේ සිට ආගමික කටයුතුවල යෙදීමට ඉඩ ලැබුණත්, ඇතුළු මළුවට ඇතුල්වීමට ඉඩ නොලැබුණේ කෝවිලේ පවිත්‍රත්වයට (ශුද්ධත්වයට) එය හානිකරය යන විශ්වාසය නිසාවෙනි.

පංචමර්වරුන්ට එරෙහිව පැනවූ බොහොමයක් සම්බාධක, ඊට එරෙහිව පංචමර්වරුන්ගෙන් එල්ල වූ විරෝධතා, රාජ්‍ය හා සිවිල් සමාජයේ මැදිහත්වීම් මෙන්ම අධ්‍යාපන ව්‍යාප්තිය යන හේතු සාධක බලපෑමෙන් ක්‍රම ක්‍රමයෙන් වියැකී ගියේය. කුල-පාදක වෙනස්කම් කිරීම්වලට විරුද්ධ වූ LTTE ය ස්වකීය බලකොටුව තුළ කුල-පාදක වෙනස්කම් කිරීම් අහෝසි කරන ලදි.

1980 දශකයේ සිට දිග හැරුන සිවිල් යුද්ධය හේතුවෙන් උතුරු නැගෙනහිර දෙමළ කුල ක්‍රමය හා කුල-පාදක වෙනස්කම් කිරීම් කෙරෙහි බලපෑම් රාශියක් එල්ල විය. පළමුවෙන්, දෙමළ විමුක්තිකාමීන් ගෙන ගිය අරගල හා ඒ වන විට සියලුම ද්‍රවිඩයන් ඉලක්ක කොට ගෙන රජය විසින් සිදු කළ යුධමය මැදිහත්වීම් හේතුවෙන් කුලය යන සාධකය යටපත් වී දෙමළ ජාතිකයන් ලෙස එක්සත් හැඟීමකින් ඒකරාශි වීමේ අවශ්‍යතාව මතු විය. දෙවනුව, 1995 දී යාපනයේ සිට වන්නිය දක්වා විශාල ජනගහනයක් අවතැන් වීම හේතුවෙන් විවිධ කුලවල ජනයාට හදිසි අවස්ථාවන්වලදී එකට මුසු වීමට, එකිනෙකා සමග එක්ව කටයුතු කිරීමට සිදු විය. මෙවැනි මොහොතක අස්පර්ශනීයත්වය හෝ කුල පාදක දුරස්ත බව පවත්වා ගැනීම අසීරු විය. තෙවනුව, LTTE සංවිධානයේ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් මගින් යාපනයේ වෙල්ලාල කුලයේ සාම්ප්‍රදායික දේශපාලන නායකත්වය ක්‍රමයෙන් නැති කර දැමූ හෙයින්, වෙල්ලාල කුලයේ ඉහළ පෙළේ පවුල් බොහොමයක් වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය විය. ඒ මගින් යාපන සමාජය තුළ සමාජ, දේශපාලන ශූන්‍යත්වයක් දිස් වූ අතර පීඩිතයන් කෙරෙහි පෙර මෙන් සිය බලය තහවුරු කරගැනීමට වෙල්ලාලවරුන්ට නොහැකි විය. LTTE සංවිධානයේ ඉහළ පෙළේ නායකයන් සහ නිලධාරීන් බොහොමයක් සමාජයේ පහළ කුලවලින් පැමිණි පිරිසක් වූයෙන්, සංවිධානගත වීමේදී හා යුද

පුහුණුව තුළදී කුලය නොසලකා කටයුතු කළේය. ක්‍රමයෙන් යාපන සමාජයේ කුල ධුරාවලියේ ශක්තිමත් බව වියැකී යන්නට විය. කෙසේවුවද, මිනිසුන්ගේ සිත් තුළින් කුලය යන්න ඉවත් කිරීමට මෙම සාධකයන්ට හැකි වූයේද යන්න පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂි නොමැති අතර විවාහ, චාරිත්‍ර වාරිත්‍ර, නිත්‍ය සමාජ සංවිධාන ආදී සමාජ සංස්ථා තුළ ප්‍රායෝගිකව කුලය තවදුරටත් ක්‍රියාත්මක විය. යාපනයේ වත්මන් තත්වය පිළිබඳ අවධානය යොමු කිරීමේදී, කුලය පිළිබඳ විධිමත් පර්යේෂණයක් කිරීම අපහසු කාර්යයකි. හේතුව සමාජ දේශපාලන පීඩනයන් හේතුවෙන් කුලය සැඟවුණු සමාජ සංසිද්ධියක් බවට පත්වීමත් කුලය පිළිබඳව දැඩි නිහඬ බවක් පැවතීමත් වේ. යාපනයේ ප්‍රමුඛතම අධ්‍යාපන ආයතනය වන යාපනය විශ්වවිද්‍යාලය කුලය පිළිබඳව කෙරෙන කුමන හෝ ආකාරයේ පර්යේෂණයක් අධෛර්යමත් කරන සුළු ප්‍රතිපත්තියක් අනුගමනය කරන බව පෙනේ.

කෙසේවුවත් යාපන අර්ධද්වීපයේ සමහර අවතැන් වූ අය (IDP) සඳහා වූ කඳවුරු තුළ පංචමර් කණ්ඩායම් තවදුරටත් රැඳී සිටින බව හෙළි විය. තංගේස් (2006) ට අනුව මල්ලාහම් ප්‍රදේශයේ පිහිටි IDP කඳවුරු තුනක් තුළ නලවර්, පල්ලර්, පරයර් කුල වඩාත් කැපී පෙනුන කුල විය. 1990 ගණන්වල අධි ආරක්ෂිත කලාප පිහිටුවීම හේතුවෙන් මොවුන්ගෙන් බොහොමයක් අවතැන් විය. මින් පෙනීයන්නේ අධි ආරක්ෂිත කලාප පිහිටුවීම තුළින් ශ්‍රී ලංකා යුධ හමුදාව IDP ජනයා ස්වකීය බිම්වලට යළි පැමිණීම වළක්වාලූ බවයි. අනෙක් අතට යාපනයේ ඉඩම් හිඟකම, රැකියා අවස්ථා සීමිත වීම, දරිද්‍රතාවය නිසා ඉඩම් මිලදී ගැනීමට ඇති දුෂ්කරතා, පංචමර්වරුන් සමග මිශ්‍ර වීමට බියෙන් ඇතැම් ඉහළ කුලවල ජනයා ස්වකීය ඉඩම් පංචමර්වරුන්ට විකිණීමට අදිමදි කිරීම යන හේතු සාධක නිසා බොහෝ පංචමර්වරුන්ට IDP කඳවුරු තුළින් ඉවත්ව යාමට නොහැකි වී ඇත. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවලින් මෙම IDP කඳවුරු වෙත ප්‍රමුඛ අනුග්‍රහයන් ලැබුණද මෙම කඳවුරු ඔවුන්ගේ අසල්වැසි ප්‍රජාවන්ගෙන් වෙන්ව හුදෙකලා වී ඇති අතර, පොදු සේවා ලබා ගැනීම, ළමුන් පාසැල්වලට ඇතුළත් කර ගැනීම, පොදු ළිංවලින් පානීය ජලය ලබා ගැනීම, ඉහළ කුලවලින් පාලනය කළ කෝවිල්වලට ඇතුළු වීම සම්බන්ධව යම් යම් අසීරුතාවන්ට මුහුණ දී ඇත (Thanges 2006, Human Rights Watch උපුටා දක්වන Goonesekere 2001, Vegujanan & Ravana 1988). පෙර සඳහන් කළ සමාජ ගතිකයන් මගින් යාපන සමාජයේ කුල-පාදක වෙනස්කම් කිරීම් මුළුමනින්ම අහෝසි වී ගොස් නැති බව මෙයින් හෙළි වේ. ව්‍යසන අවස්ථාවන්හිදී කුල-පාදක වෙනස්කම් කිරීම් සක්‍රිය වූ ආකාරය, ගුජරාටයේ භූමිකම්පාවක් සිදු වූ අවස්ථාවේදී සහ සුනාමිය වැනි දකුණු ආසියාවේ සිදු වූ වෙනත් ව්‍යසන අවස්ථාවන්හිදී දැක ගත හැකි විය (Goonesekere 2001, Gill 2007).

මෑතකාලීන සමාජය තුළ යාපන සමාජයේ අම්පට්ටර්වරු (කොණ්ඩ කපන අය), වන්නර් (රෙදි අපුල්ලන අය) කුල තුළින් ක්‍රියාකාරී කුල සංවිධාන ඉස්මතු වී තිබේ.

LTTE සංවිධානයේ පූර්ණ සහයෝගය ඇතිව, එම සංවිධාන මගින් අම්පට්ටර්වරු සහ වන්නර්වරු විසින් වෙල්ලාල නිවෙස්වලට පැමිණ චාරිත්‍රමය පිළිවෙත් කිරීම තහනම් කළ අතර, මෙම සංවිධානවල නිරන්තර ප්‍රයත්නය වූයේ මෙම සේවා පිළිගත් මූල්‍යමය ආකෘතියක් සහිත වෘත්තීමය තත්වයට පත්කොට කුලය නොසලකා සේවා සපයන සංස්ථාපිත ව්‍යාපාරික ආයතන බවට පත්කිරීමටය. එසේම ධුරාවලිගත චාරිත්‍රමය පිළිවෙතකට වඩා ව්‍යාපාරයක ස්වරූපයෙන්, පුද්ගලබද්ධ නොවූ සේවාවන් ලෙස මෙම සේවා සුරක්ෂිත කිරීම ඔවුන්ගේ අභිප්‍රාය විය. සත්‍ය වශයෙන්ම මේ තුළින් කුල-පාදක වෙනස්කම් කිරීම් ක්ෂය වී ගියේද යන්න පිළිබඳව තවදුරටත් විමසිය යුතුය. නමුත් යාපන සමාජය තුළ අන්තර් කුල සබඳතා අලුතින් නිර්වචන කෙරෙන අතරම ධුරාවලි ලක්ෂණ ඉවත් වෙමින් පවතින බවක් පෙනේ.

සිංහල සමාජයේ කුල-පාදක වෙනස්කම් කිරීම්

සිංහල කුල ක්‍රමයේ පාලක ප්‍රභූ කුලයේ (රදල) සිට යාචක (රොඩී) කුලය දක්වා ධුරාවලිගත වූ කුල 15 ක් පමණ දක්නට ඇත. ජනගහනයෙන් බහුතරයක් (මුළු සිංහල ජනගහනයෙන් 50% ක් පමණ) අයත් වන්නේ ගොවිගම කුලයටය. බොහෝවිට ගොවිගම කුලයේ පිරිස් ස්වාධීන ඉඩම් හිමියන් වන අතර ඔවුන් කුල ධුරාවලියේ සියලුම පහළ කුලවල සේවය ලබා ගැනීමට හිමිකම් ඇත්තන් ලෙස නිර්වචනය කිරීම සාවද්‍ය නොවේ. සියලුම කුලවලට නියම වූ සුවිශේෂ රැකියා, සේවා හෝ ක්‍රියාකාරකම් තිබුණි. කරාව (මසුන් මරන්නන්), දුරාව (රා මදින්නන්), සලාගම (කුරුඳු තළන්නන්) වැනි කුලවල රැකියා ආර්ථිකමය වශයෙන් ලාභ උපයන රැකියා වුවද, පාරම්පරික උරුමය තුළ අඩු ගරුත්වයක් හිමි වූ රැකියා විය. යටත් විජිත අවධිය තුළ මෙම රැකියා ආර්ථික වශයෙන් වඩා කැපී පෙනෙන රැකියා වූ නිසාවෙන්ම ධුරාවලිය තුළ ඔවුන් හා සම්බන්ධ තත්වයද වැඩිදියුණු වූ බවක් පෙනේ. මෙම කුලයන්ට පහළ මට්ටමින් වූයේ සේවා කුලයන්ය. සේවා කුල තුළින් කුල ධුරාවලියේ තමාට ඉහළින් සිටින කුල වෙත සේවා සැපයීම අපේක්ෂා කෙරිණි. සේවා කුල වූයේ නවන්දන්නා (ලෝකුරු වැඩ), හේන (රෙදි ඇපිල්ලීම), කුඹල් (වළන් සෑදීම), වහුම්පුර (හකුරු නිෂ්පාදනය), බත්ගම (බර උසුලන්නෝ), බෙරවා (බෙර වාදකයන්) වැනි කුල වේ. රෙදි අපුල්ලන (හේන) වැනි සමහර සේවා කුල සමාජය තුළ පහත් කොට සැලකුවද අදාළ කුලයන් සමාජීය වශයෙන් ගර්හිත, අස්පර්ශනීය කුල ලෙස දැක්විය නොහැක. නමුත් සමාජ ධුරාවලිය තුළ ආසන පැනවීමේදී පවා පහත් තත්වයක් හිමි විය.

සේවා කුල අතරින් වහුම්පුර (හකුරු නිෂ්පාදකයන්), බත්ගම (සේවකයන්, බර උසුලන්නන්) කුල එක්ව ගත් කල මුළු ජනගහනයෙන් 15% ත් 20% ත් අතර වන බව සමහර ගණනය කිරීම්වලින් පෙනේ. මෙම කුල ඉඩම් අහිමි, රැකියා විරහිත, ප්‍රවේණිගත උරුමය හේතුවෙන් ආර්ථික, සමාජයීය වශයෙන් වරප්‍රසාද නොලත් කුල බවට පත්වී තිබිණි. මෙම කුල දෙකටම ඉඩම් හා ජීවනෝපාය සඳහා පාරම්පරිකව

රදල හා ගොවිගම පවුල් මත යැපෙන්නට සිදු විය. සමහර අවස්ථාවන්හිදී ඔවුන් රදල හා ගොවිගම නිවෙස්වල සේවය කරන දාසයන් මෙන් දිස්විය. බොහෝවිට බත්ගම කුලයේ පිරිමි හා වහුම්පුර කුලයේ ස්ත්‍රීහු ඉහළ කුලවල ඉඩම් හිමියන්ගේ කම්කරුවන් ලෙසත් ගාහස්ථ සේවකයන් ලෙසත් පිළිවෙළින් සේවය කළහ. නිරන්තරයෙන්ම මේ සම්බන්ධතා ධුරාවලියේ අනුපිළිවෙළ ඔවුන් අදාළ අන්තර් පුද්ගල සන්නිවේදනයේදී ආමන්ත්‍රණය සඳහා යොදා ගත් ගෞරවවාචී පද හෝ 'උඹ' 'තෝ' වැනි නිගරු පදවලින් ප්‍රකාශ විය. සේවා කුලවල උගත් තරුණ පරම්පරාව ක්‍රමයෙන් සාම්ප්‍රදායයික ගරු කිරීම් සහ හැසිරීම් ප්‍රතික්ෂේප කළ බැවින් වැඩවසම් සම්බන්ධතා මෑතකාලයේදී සෝදා පාළුවට ලක් වී ඇත. එමෙන්ම පහළ කුලවල තරුණයන් ඉහළ කුලවල අය සමග ඇති සම්බන්ධය එකිනෙකා මඟ හැරීම, අමනාපය හා විවෘත එදිරිවාදිකම් විදහා දැක්වීම දක්වා නරක අතට හැරී ඇත. එමෙන්ම මෙම පහළ කුලවලට අයත් දිළින්දන් බවට පත්වූ සෑහෙන ප්‍රමාණයක් තම ජීවනෝපාය සරි කරගැනීමට, දේශපාලන අනුග්‍රහය හෝ ගොවි ජනපද හෝ ගම් පුළුල් කිරීමේ වැඩසටහන් යටතේ ඉඩම් ලබා ගැනීම මෙන්ම අපරාධ, හිංසනය, නීත්‍යානුකූල නොවන ක්‍රියාවන් උදෙසා ද යොමු වී ඇත (Moore and Perera 1978). නමුත් මෙම පිරිසට පවතින දේශපාලන පක්ෂ තුළින් තමන්ට සිදුවන අසාධාරණය සම්බන්ධව විසඳුමක් ලබා ගැනීම දුෂ්කර වූයේ, එම පක්ෂ නිතරම ඉහළ කුලවල බලයට නතුව තිබූ නිසා මෙන්ම පහළ කුලවල ඡන්ද බලය තුනී වන පරිදි ඡන්ද කොට්ඨාශවල සීමා මායිම් ලකුණු කිරීම නිසා විය හැකිය (Jiggins 1979). 1971 සහ 1981-89 කාලවලදී වහුම්පුර හා බත්ගම කුලවල තරුණයන්ගේ වැඩි සහභාගීත්වයෙන් ඉස්මතු වූ ජනතා විමුක්ති පෙරමුණ පිළිබඳව මේ සන්දර්භය තුළින් අවබෝධ කර ගත යුතු බව බොහෝ නිරීක්ෂකයන් වාර්තා කොට ඇත (Jiggins 1979, Chandraprema 1991).

සාම්ප්‍රදායයික සිංහල කුල ක්‍රමය තුළ, වහුම්පුර හා බත්ගම යන කුලවලට අඩු සමාජ ගරුත්වයක් හිමි වූ නමුත් ඔවුන් ඇස ගැසීමට හෝ මුණ ගැසීමට නුසුදුසු පිරිස් ලෙස කිසිදු අයුරකින් නොසලකන ලදි. කෙසේ නමුත් සිංහල කුල ක්‍රමය තුළද ගර්හිත කුල යැයි සැලකූ කුල කිහිපයක් විය. ජනගහනය අතින් සුළු පිරිසකගෙන් සමන්විත කුල කණ්ඩායම් තුනක් වූ ගහල (වධකයන්), කින්නර (පැදුරු වියන්නන්), රොඩී (යාචක) යන කුල සාම්ප්‍රදායයිකව "හීන කුල" ලෙස සලකන ලදි. සිංහල සමාජයේ "හීන කුල කණ්ඩායම්" ලෙස සැලකෙන මෙම කුල තුනම එක්ව ගත් කල පවා මුළු සිංහල ජනගහනයෙන් 1% කටත් අඩු ප්‍රමාණයකින් යුක්ත විය. බොහෝවිට මොවුන් පුරුදුව සිටියේ සෙසු ජනයාගෙන් වෙන්ව එකිනෙකට සමීපව ඉදි කළ තදබදය සහිත නිවාසවල (ගුබ්බෑයම්) ජීවත් වීමටය. සමාජයෙන් කොන් වූ මේ කුල තරමක් දුරට හින්දු සමාජයේ "අස්පර්ශනීය" කුලවලට සමාන වූ නමුත්, සිංහල කුල ක්‍රමය තුළ "අස්පර්ශනීයත්වය" ආගමික වශයෙන් සංස්ථාපනය වූවක් නොවේ. ඒ වෙනුවට මෙම පහත් තත්වයේ සැලකෙන කුල සමාජ අනුපිළිවෙලේ

පහළම ස්තරයේ ස්ථාපිත වී ඇත්තේ එම කුලවලට ආවේණික රැකියා, එම කුලවල පෞරාණික සම්භවය හා ඔවුන්ගේ කුලවලට ආවේණික චර්යාමය ලක්‍ෂණ හේතුවෙනි. උදාහරණයක් ලෙස රජු වධකයන් පත්කරන ලද්දේ අපරාධකරුවන්ට මරණ දණ්ඩනය ලබාදීමටය. මෙම අලුගෝසු වෘත්තියට පත් කෙරුණු ගහල කුලයේ පිරිසට නියමිත වූ මනුෂ්‍ය ඝාතනය බෞද්ධ දර්ශනය අනුව පාපතර ක්‍රියාවකි. මහනුවර නගරයේ උතුරු සීමාවේ වාසය කරන ගහල ප්‍රජාව තමා අවට සිටින ප්‍රජාව සමග සීමිත සමාජ සම්බන්ධතා පවත්වාගෙන යයි. වසර ගණනාවක් පුරාවට මේ ප්‍රදේශයේ ස්ත්‍රීන් ගණිකා වෘත්තියට ද, පිරිමින් මත්පැන් නිෂ්පාදනය, අපරාධ හා හිංසනය වැනි කටයුතු සඳහා ද ප්‍රසිද්ධියක් ලබා ඇත.

කින්නර කුලය වඩාත් ප්‍රසිද්ධ ඔවුන් විසින් නිපදවන විසිතුරු කලාල හා පැදුරු හේතුවෙනි. නමුත් ඔවුන් වනචාරී ගෝත්‍රික පිරිසක් ලෙස සැලකීමට හේතු පාදක වූයේ ඔවුන් තම කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය ලබා ගැනීමට නිරන්තරයෙන්ම වනාන්තරය සමග සමීප සම්බන්ධයක් තිබෙන නිසා විය හැකිය. කින්නර කුලය පිළිබඳ වන තවත් ජනප්‍රවාදයක් නම් ඔවුන්ට හදි හූනියම්, යන්ත්‍ර මන්ත්‍ර, ගුරුකම් තුළින් මිනිසුන්ට විපත් පමුණුවීමට හැකියාවක් තිබූ බවයි. රොඩියන් ('රොඩ්ඩා' යන වචනයෙන් උපන්නකි) අපිරිසිදු කුලයක් ලෙස සැලකෙන්නේ ඔවුන්ට පාරම්පරිකව උරුම වූ සත්ව මළ කුණු ඉවත් කිරීම, සත්ව සම්වලින් සම් භාණ්ඩ තැනීම, කොසු ඉදල් නිපදවීම, කොණ්ඩා හවරි සෑදීම වැනි කුල වෘත්තීන්වල ස්වරූපය මතය (Weeratunga 1988, Raghavan 1957). ඔවුන් ජීවත් වූයේ හුදෙකලා ප්‍රදේශවල එකිනෙකට සමීපයේ තදබද වන සේ (ගුබ්බෑයම් ක්‍රමය) ඉදි කොට තිබූ කුඩා ගෙවල්වලය. තවදුරටත් මොවුන් පිළිබඳ විග්‍රහ කරන විට පාරම්පරිකව කුලයට හිමි වෘත්තිය වූ සිඟා කෑම හේතුවෙන් සෑමදෙනාම පාහේ ඔවුන්ගෙන් ගෞරවශීලි බව සහ යටහත් පහත් බව අපේක්‍ෂා කළහ. රොඩී කුලයේ පිරිස් විසින් සිදු කරන යන්ත්‍ර මන්ත්‍ර, ගුරුකම්, හදි හූනියම් වැනි අභිචාර විධි නිසා පුද්ගලයන්ට සිදු විය හැකි අතුරු ආන්තරා ගැන සලකා ඔවුන් සමීපව ඇසුරු කිරීමට හෝ ඔවුන්ව අමනාප කර ගැනීමට ඉහළ කුලවල ජනයා බිය වූහ. ගර්හිත මට්ටමට අයත් කුල තුනටම පොදු වූ ලක්‍ෂණයක් වන අන්‍යයන්ට වින කිරීමේ හැකියාව පෙර භවයන්හිදී ඔවුන් සිදු කළ පාපකාරී ක්‍රියාවන්වල කර්ම ඵලයන් බවට ජන විශ්වාසයක් ඇත. මෙම ගර්හිත සිංහල කුල තුනට පොදු වූ ලක්‍ෂණ අතර ගෝත්‍රික වනචාරී ලක්‍ෂණ, චාරිත්‍ර විරෝධී බව, ශිෂ්ට සම්පන්න ජීවිතයකට නැඹුරු වීමට ඇති අකැමැත්ත, සෙසු අයට වින කිරීමේ හැකියාව සහ පූර්ව භවයන්හිදී ඔවුන් සිදු කළ බවට විශ්වාස කරණ පාප කර්ම යනාදිය දැක්විය හැකිය.

සාම්ප්‍රදායිකව ඉහළ කුලවල ජනයා සමග අන්තර් ක්‍රියා කිරීමේදී රොඩී හා කින්නර කුලයේ අයට සමාජමය තහංචි, සමාජමය ප්‍රතික්ෂේප කිරීම් සහ කෙනෙහිලිකම්වලට ලක් වීමට සිදු විය. රොඩී කුලයේ පිරිමින්ට උඩු කය වැසෙන ඇඳුම් ඇඳීම තහනම් කොට තිබුණි. රොඩී ජනයා කුලීන නිවෙස්වලින් සිඟා කෑමට යන විට නිවසේ මිදුලට නොපැමිණ කඩුල්ල අසල සිට කන්නලව් කළ යුතු විය. සහල්

ස්වල්පයක් හෝ සුළු මුදලක් ලබා දී ඔවුන්ව හැකි ඉක්මණින් පිටත් කොට හරින ලදි. පිටස්තර කුලවල ජනයා සතු තේ කඩ, කඩ සාප්පු හෝ වෙනත් සේවා ස්ථානවලට ඇතුළු වීමට ඔවුන්ට තහනම් විය. තේ කඩයකට ගිය විට ඔවුන්ට කෝප්පයක හෝ නිසි බඳුනක නොව පොල් කටුවකට දැමූ තේ බීමට සිදු විය. ඔවුන්ගේ දරුවන් පාසැල්වලට බඳවා ගත්තේ නැත. යම් ආකාරයකින් දැඩි ප්‍රයත්නයක් දරා හෝ සමහර මානවහිතවාදීන්ගේ මැදිහත් වීම මත ඔවුන්ගේ දරුවන් පාසැල්වලට ඇතුළත් කළද, එම දරුවන් ගුරුවරුන්ගේ සහ ඉහළ කුල නියෝජනය කරන සිසු සිසුවියන්ගේ කොන් කිරීම්වලට ලක් විය. අදාළ පීඩිත කුල ඉලක්ක කොට කෙරුණු වෙනස්කම් කිරීම් ක්‍රමයෙන් අතුරුදන් වීමට පටන් ගත්තේ සමාජ වෙනස්වීම්, සම අයිතීන් පිළිබඳ දෘෂ්ටිවාදය පැතිරීම හා අදාළ කුලයන් තුළ ක්‍රමික සමාජ සංවර්ධනයක් සිදු වූ හෙයිනි. මෙම කුලවල සුළු පිරිසක් පමණක් තම කුලය පිළිබඳ අන්‍යයන්ට හෙළිදරව් කිරීමට ඉදිරිපත් වූහ. විශේෂයෙන්ම තරුණ පරම්පරාව දුර බැහැර ප්‍රදේශයකදී වුවද සිය පාරම්පරික කුල වෘත්තීන්ට සම්බන්ධ රැකියාවල යෙදීමට මැළි වූහ. බොහොමයක් තරුණ පිරිස් වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වී සිය අනන්‍යතාවය වෙනස් කර ගත්හ. ගෘහ සේවිකාවන් ලෙස මැදපෙරදිගට සංක්‍රමණය වීම මෙම ගම්මානවල කාන්තාවන් අතර ජනප්‍රිය විය. මෙවැනි සංක්‍රමණ ප්‍රවේණිගත සමාජ ධුරාවලිය තුළින් හිමි වූ අපකීර්තියෙන් පළා යෑමට ගත් උත්සාහයක් බව නිසැකයෙන්ම හඳුනා ගත හැකිය.

යාපන සමාජය හා සංසන්දනය කරන විට පෙනී යන්නේ සිංහල සමාජයේ කුල පීඩනයට එරෙහිව මතු වූ සංවිධානාත්මක විරෝධතා සීමිත බවයි. වර්තමානයේ පවා පෙළපතින් හා ප්‍රවේණිගතව උරුම වූ කුල වෘත්තීන් පාදක කොට ගත් වෙනස්කම් කිරීම් දක්නට ලැබුණත්, කුල සම්බාධක අභිමුව ඊට අභියෝග කිරීමට වඩා එය ප්‍රතික්ෂේප කිරීමට හෝ මඟ හැර යාමේ ප්‍රවණතාවක් සිංහල සමාජයේ දෘශ්‍යමාන වේ. හින්දු කුල ක්‍රමය හා සැසඳීමේදී සිංහල කුල ක්‍රමයේ මෘදු ස්වභාවයට උක්ත කරුණ කදිම සාක්ෂියකි. ගර්හිත කුලවලට අයත් කොටස සංඛ්‍යාත්මක වශයෙන් විශාල නොවූයෙන් එබඳු පීඩිත කුලවල ප්‍රජාවන් අතර සහයෝගයකට වඩා තරගකාරී බවක් දිස්විය. කුල ක්‍රමයෙන් සිදුවන අයුක්තියට එරෙහිව විවෘතව මුහුණ දීම වෙනුවට විප්ලවකාරී තරුණ දේශපාලන ව්‍යාපාර ඔස්සේ පවතින සමාජ ක්‍රමයට අභියෝග කිරීමට පීඩිත කුලවල ඇතැම් (විශේෂයෙන් තරුණ) පිරිස් නැඹුරු වී ඇත.

කුල පීඩනයට ලක් වූ ඉන්දියානු දෙමළ ජනයා

ශ්‍රී ලංකාවේ ඉන්දියානු දෙමළ ප්‍රජාවේ කුල ක්‍රමය වූ කලී දකුණු ඉන්දියානු කුල ක්‍රමයේ ප්‍රතිනිෂ්පාදනයකි. වතු කම්කරුවන්ගේ බහුතරය හින්දු සමාජයේ "පහළ මට්ටමේ කුල කණ්ඩායම්" වලට අයත් වුවත් කංගානිවරු වෘත්තීය සමිති නායකයන් සහ ප්‍රජාවේ බලගතු නායකයන් බොහොමයක් "මොට්ටයි වෙල්ලාලන්" වැනි ඉහළ කුල නියෝජනය කරන බව මෙහිදී සඳහන් කළ යුතුය (Hullop 1993, Jayaraman 1975). මෙයින් හෙළි වන්නේ වතු හිමියන් හා වතු පාලකයන් ස්වකීය ප්‍රයත්නයන්

තුළින් සංක්‍රමණික කම්කරුවන් වතු පරිසරයට අනුවර්තනය කිරීම සඳහා කුල ක්‍රමය ක්‍රමානුකූලව උපයෝගී කර ගත් බවයි. ඉන් අනතුරුව ලංකාවේ වතු අංශයට සම්බන්ධ ජනයා දේශපාලනමය වශයෙන් සංවිධානය කරන විට වතු ප්‍රජාවේ නායකයෝ කුල ප්‍රශ්නය නිහඬ කොට ජනවාර්ගික වශයෙන් සංවිධානගත වීමට උනන්දු වූහ. මෙය සිංහල සහ ලාංකික දෙමළ සමාජවල බිහි වූ ජනවාර්ගික ප්‍රවණතාවට සමාන්තරය. මෑත භාගයේදී වතුවල පහළ මට්ටමේ කුල ප්‍රජාවන්ගෙන් මතු වී ආ මතවාද ඒකරාශී කරමින් වතු ප්‍රජාවේ සමහර නායකයෝ ඉහළ කුලවල ආධිපත්‍යයෙන් යුතු ලංකා කම්කරු කොංග්‍රසය (Ceylon Workers Congress) ට අභියෝග කිරීමට මඟක් සෙවූහ (මහනුවර සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ මුතුලිංගම් මහතා සමග පැවැත්වූ සාකච්ඡාව).

වතු කම්කරු සමාජය පන්තිමය සහ ජනවාර්ගික වශයෙන් සමස්ත ශ්‍රී ලංකා සමාජය තුළ ආන්තික තත්වයක් හොබවන බව නොරහසකි. අනෙක් අතට වතුකම්කරු සමාජය තුළ කුල පීඩනයට ලක් වූ පිරිස් වඩාත් ආන්තික තත්වයක් පෙන්නුම් කරයි. මෙය හුලොප් විසින් "අභ්‍යන්තරික යටත්විජිතකරණයක්" (Internal Colonialism) ලෙස විග්‍රහ කොට ඇත (Hullop 1993, 1994). කෙසේ වුවත් මෙම තත්වය කුල සාධකය ඔස්සේ පමණක් විග්‍රහ කළ නොහැක. වතුකරය සමස්ත ලංකා සමාජයේ ඇති සමාජ දේශපාලන ක්‍රියාවලීන්ගෙන් යම් තරමකට ස්වාධීනව පැවතීම ද මෙම තත්වයට හේතු වී ඇත.

ඉන්දියානු දෙමළ සම්භවයක් සහිත පිරිස් මහනුවර, කොළඹ, ගම්පොළ, මාතලේ හා නුවරඑළිය වැනි නගරවල සනීපාරක්ෂක කටයුතු සමග සම්බන්ධ වී ඇත. පරපුරෙන් ප්‍රවේණිගතව උරුම වූ වෘත්තීන් පාදක කොට ගත් සමාජ කොන් කිරීම්වලට ඔවුන් ලක් වී ඇත. මෙම ප්‍රජාවන් තමාගේ ජනවාර්ගික පසුබිම නිසා මෙන්ම "සක්කිලියාර්" (චක්කිලියාර්) කුලය නිසා දැඩි අසීරුතාවන්ට මුහුණ දෙන අතර, වැසිකිළි ශුද්ධ පවිත්‍ර කිරීම, කසළ ශෝධනය වැනි වෘත්තීන් නිසා මෙන්ම දැඩි තදබදයක් පවතින නාගරික ප්‍රදේශවල වාසය කිරීම නිසාත් මත්ද්‍රව්‍ය භාවිතය, ගණිකා වෘත්තිය වැනි දුරාචාර රැසකට යොමු වීම නිසා ඔවුන් නාගරික පාදඩ පිරිසක් ලෙස හංවඩු ගැසී ඇත. වතු ආර්ථිකය කුලය ප්‍රතිනිෂ්පාදනය කිරීමට දායක වූ පරිදි නාගරික සභා පිහිටුවීම, ඒ මඟින් කුල පාදක සනීපාරක්ෂක සේවයක් උත්පාදනය කිරීමට හේතු කාරක වී ඇත. මෙම නාගරික ප්‍රජාවන් රැකියා, අධ්‍යාපන අවස්ථා සහ නිවාස පහසුකම් අතින් යම් දියුණුවක් මෑත කාලයේදී ලබා ඇති නමුත් සමස්ත ලංකා සමාජය තුළ සහ ඉන්දියානු දෙමළ ජනයා තුළ ඔවුන්ගේ ආන්තික තත්වය වෙනසකට බඳුන් වී නොමැත. ඔවුන්ගේ මෙම ගර්හිත තත්වය ජනවාර්ගිකත්වය, කුලය, පන්තිය සහ ඔවුන්ගේ යටත් විජිත සමාජ පසුතලය යන සාධක සියල්ලේ ප්‍රතිඵලයක් ලෙස සැලකිය යුතුය.

ශ්‍රී ලංකාවේ සමහර නගරවල රොඩී කුලයේ ජනයා ද සනීපාරක්ෂක කම්කරුවන් ලෙස ඉන්දියානු සම්භවයක් ඇති චක්කිලියාර්වරුන් සමග එක්ව කටයුතු කරති. මෙම සංසිද්ධිය තුළින් හෙළිවන්නේ ලංකාවේ විවිධ කුල ක්‍රම අතර යම් මට්ටමක සමගාමී බවක් සහ අන්තර් ක්‍රියාවන් පවත්නා බවයි.

සාරාංශය

සිංහල කුල ක්‍රමය, ශ්‍රී ලාංකික දෙමළ ජනයා අතර ඇති හින්දු කුල ක්‍රමය සහ ඉන්දියානු දෙමළ ජනයා අතර ඇති හින්දු කුල ක්‍රමය යන කුල ක්‍රම තුනම කිසියම් ගරා වැටීමකට ලක් වී ඇත. අනෙක් අතට මහනුවර මහයියාව, යාපනයේ IDP කඳවුරු වැනි විවිධ ස්ථානවල සිටින පීඩිත කුලවලට අයත් ජනයා තවදුරටත් යම් තරමකට හෝ කුල පීඩනයට ලක් වී ඇති බව පිළිගත යුතුය. යාපනයේ IDP කඳවුරු තුළ දිගුකාලීනව සිටින ඇතැම් පීඩිත කුල ප්‍රජාවන් හෙළි කරනුයේ ශ්‍රී ලංකාව තුළ කුල-පාදක වෙනස්කම් කිරීම් තවදුරටත් සිදු වන බවය.

රාජ්‍යය, දේශපාලන පක්ෂ මෙන්ම සිවිල් සංවිධාන අතර පවා කුලය සම්බන්ධ මෙවැනි ගැටලු පිළිබඳව පූර්ණ නිහැඬියාවක් පවතී. රාජ්‍ය නොවන සංවිධාන අතලොස්සක් පමණක් මෙම ප්‍රශ්න ගැන සංවේදීව සැලකිල්ලට ගෙන ඇත. 1957 දී ඉදිරිපත් කළ සමාජ අසාධාරණ පිටුදැකීමේ පනත මගින් රජය කුල-පාදක වෙනස්කම් කිරීම්වලට එරෙහි නීතිමය පියවර හඳුන්වා දෙන ලදි. නමුත් පීඩිත ප්‍රජාවන්ගේ හිමිකම් සුරක්ෂිත කිරීමට ඉන් සිදු වී ඇත්තේ සීමිත බලපෑමකි. සමහර රාජ්‍ය ප්‍රතිපත්ති සහ වැඩසටහන් (උදා: "ගම් උදාව" වැඩසටහන), සමහර දේශපාලන ක්‍රියාකාරකයන් සහ සිවිල් සමාජ ආයතන (උදා: ශ්‍රී ලංකාවේ සර්වෝදය ව්‍යාපාරය) විටින් විට පීඩිත කුලවල ගරුත්වය හා සමාජ ආර්ථික තත්වය නඟා සිටුවීමට මූලික පියවර ගනු ලැබිණි. නමුත් අදාළ පීඩිත කුලවල සාමාජිකයන් ස්වකීය හිමිකම් තහවුරු කර ගැනීමට ඉදිරියට නොපැමිණි අතර, කුල ක්‍රමයට එරෙහිව සාමූහික වශයෙන් අභියෝග කළේද නැත. ශ්‍රී ලංකාවේදී "දලිත්" යන්න කුල පීඩිතයන් සිය ස්වයං අනන්‍යතාවය ප්‍රකාශ කිරීමට හෝ සමාජ විශ්ලේෂකයන් සහ දේශපාලන ක්‍රියාකාරකයන් විසින් කුලය පිළිබඳ කෙරෙන විග්‍රහයන්ට පවා යොදා ගන්නේ නැත.

මේ වනවිට ජනවාර්ගික කණ්ඩායම් තුනෙහිම පීඩිත කුල අතර කිසිදු ක්‍රියාකාරී සංවිධානයක් නොමැත. 'සුළුතර දෙමළ මහා සභාව' (The Minority Tamils Mahasabha) 1930-60 කාල පරිච්ඡේදය තුළ සක්‍රියව කටයුතු කළත් ඉන්පසුව ක්‍රමයෙන් එම සංවිධානයද අක්‍රිය විය. වෘත්තීය සංගම්වලට සමාන කළ හැකි සුවිශේෂ කුල සංවිධාන කිහිපයක් මෑතකදී යාපනය අර්ධද්වීපය තුළ පැන නැගී ඇත.

බොහෝ අවස්ථාවන්හිදි, පීඩිත කුලවල ප්‍රජාවන්ද තමන් මුහුණ දෙන කුල-පාදක ගැටලු නොසලකා හැර සැඟවීමට උත්සාහ දරනවා විනා එම ගැටලු හඳුනාගෙන විවෘතව මේ පිළිබඳ සංවාදයක නොයෙදෙති. විදේශ රටවලට

සංක්‍රමණය වීම, ශ්‍රී ලංකාවේම වෙනත් නගරවලට හෝ ජනාවාසවලට සංක්‍රමණය වීම, කුල පාදක වෘත්තීන් අත්හැර දැමීම සහ "ගර්හිත කුල" තත්වයෙන් මිදීමේ අරමුණින් පෙළපත් නම් වෙනස් කිරීම වැනි උපක්‍රම තුළින් පෞද්ගලිකව සහ ගෘහීය මට්ටමෙන් කුල පීඩනයෙන් මිදීමට උත්සාහ කරන නමුත් කුල ක්‍රමයට එරෙහිව සාමූහිකව පෙළ ගැසීමක් දක්නට නොලැබේ.

තුන්වන පරිච්ඡේදය

සිංහල සමාජයේ කුල-පාදක කොන් කිරීම්

කාලිංග ටියුඩර් සිල්වා
පී. කොට්කාබද්ද
ඩී.එම්. නිලංකා චන්ද්‍රිමා අබේවර්ධන

පසුබිම

ඉන්දියාවේ සහ ලංකාවේ හින්දු කුල ක්‍රමයන් හා සසඳන විට සිංහල කුල ක්‍රමය එතරම් පීඩාකාරී නොවන ආයතනයක් ලෙස බොහෝ විචාරකයන් හඳුන්වා දී ඇත. එයට එක් හේතුවක් ලෙස දක්වා ඇත්තේ සිංහල සමාජයේ වඩාත් ප්‍රචලිත ආගම වූ බුදුදහම මගින් කුලය විවේචනයට ලක් කිරීමය (Gombrich 1991). අස්පර්ශනීයත්වය සිංහල කුල ක්‍රමය තුළ තහවුරු වී නොතිබීම හා ජනගහනය තුළ සීමිත පිරිසක් පමණක් නීච කුල ගණයේ ලා සැලකීම ද සිංහල කුල ක්‍රමයේ පීඩාකාරී ස්වභාවය අවම වීමට දායක වූ කරුණු ලෙස සැලකේ. කෙසේ නමුත් පූර්ව යටත් විජිත උඩරට රාජධානියෙහි කුලයට මූලිකත්වය හිමි වූ අතර රාජ්‍ය පරිපාලනය සහ සේවා සංවිධානය කුල ක්‍රමයට අනුව සිදු විය. මෙය රැල්ෆ් පීරිස් විසින් "කුලය ලෞකිකකරණය වීමක්" (secularization of caste) ලෙස විග්‍රහ කරන ලදි. පූර්ව යටත් විජිත සමාජයේ ඉඩම් භුක්තිය සහ සේවා සංවිධානය කුල ක්‍රමයට අනුව සිදු වූ අතර එය ලීච් විසින් "කුල වැඩවසම් ක්‍රමය" (caste feudalism) ලෙස හඳුන්වා දී ඇත (Leach 1959). පාලකයන් විසින් ඔවුන්ට කීකරුව සේවා සපයන්නන් සඳහා නම්බු නාම ප්‍රදානය කළ අතර ඔවුන් විසින්ම සමාජ විරෝධී කටයුතු, රජය පෙරළීමේ කුමන්ත්‍රණ සහ වෙනත් සාපරාධී කටයුතුවල නියැලෙන්නන් 'ගත්තර කිරීම' නැතහොත් කුලයෙන් පහත් අය ලෙස ප්‍රසිද්ධියට පත් කරන ලදි (Knox 1911).

මෙම පරිච්ඡේදයේදී සිංහල කුල ක්‍රමය තුළ ඇති ප්‍රභේද, පීඩිත ස්තරයන්ගේ ස්වභාවය සහ ඔවුන් මුහුණ දෙන දුෂ්කරතා මානව වංශ විද්‍යාත්මක ක්ෂේත්‍ර පරීක්ෂණ ආශ්‍රයෙන් විග්‍රහ කරනු ලැබේ.

සිංහල සමාජයෙහි කුලයේ ස්වභාවය

සංයුතිය අතින් සිංහල කුල ක්‍රමය ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වේ. සමස්තයක් හැටියට සලකන විට වර්තමානයේදී සිංහල කුල ක්‍රමය කුල 15 කින් පමණ සමන්විතය. එයින් ඇතැම් කුල තම අනන්‍යතාවය එළිපිට ප්‍රකාශ කරන්නේ කලාතුරකිනි. කුල සැකැස්ම අතින් පහතරට සහ උඩරට ප්‍රදේශවල යම් යම් මූලික විෂමතා ඇත. එනමුත් මෙම විෂමතා කාලානුරූපීව අවම වී ඇත. රයන් (1993) ට අනුව සිංහල කුල ක්‍රමය ඉන්දියානු බලපෑම යටතේ විකාශනය වූ නමුත්, එයටම ආවේණික වූ ගති ලක්ෂණ ඔස්සේ ක්‍රමයෙන් පරිණාමය වී ඇත. කෙසේ නමුත් හින්දු කුල ක්‍රමයේ එන චතුර් වර්ණ ආකෘතිය අනුව සිංහල කුල ක්‍රමය නිවැරදිව තේරුම් ගැනීමට නොහැකිය (Kannangara 1993). ඇතැම් සිංහල කුල ඉන්දියාවෙන් සංක්‍රමණය වූ අයගෙන් පැවතෙන්නේ යැයි සැලකෙන නමුදු, සමස්ත සිංහල කුල ක්‍රමය ඉන්දියාවෙන් ආනයනය කළ එකක් ලෙස සැලකිය නොහැක. සිංහල සමාජයේ ඇති කුල සංඛ්‍යාව සහ ඒ එකිනෙක කුලවල විශාලත්වය ගැන විවිධ මත ඉදිරිපත් වී ඇත. නමුත් කුලය පිළිබඳ තොරතුරු සංගණනය නොකෙරෙන බැවින් ඒ ඒ කුලයට අයත් සංඛ්‍යාව නිශ්චිත ලෙස කිව නොහැක. සිංහල සමාජයේ කුලය විවෘතව සාකච්ඡා වන්නේ කලාතුරකිනි. කුලය ගැන සාකච්ඡා කළහොත් එසේ කරනුයේ අතිශයින් පෞද්ගලික සහ රහසිගතව සමීප ඥාතීන් අතර පමණි. මීට අමතරව වෙනත් අයෙකු වාචිකව නිගරුවට ලක්කිරීමේදී හෝ දේශපාලන වේදිකාවලදී ඇතැම් විට කුලය ගැන සඳහන් කරනු ලැබේ.

කෙසේ නමුත් ගම් මට්ටමේදී බොහෝවිට පුද්ගලයෝ එකිනෙකාගේ කුලය කුමක්ද යන්න හොඳාකාරව දනිති. ව්‍යවහාර සිංහලයේදී "අපේ කෙනෙක්" "පිට මිනිහෙක්" යනාදී යෙදුම්වලින් කුල අනන්‍යතාව හඳුන්වති. කුලය ගැන යම් තරමකට විවෘතව කතා කෙරෙන එක් අවස්ථාවක් නම් විවාහ ගනුදෙනුය. අන්තර් කුල විවාහ සිදුවන නමුත් ඒවායින් වැළකීමට වෑඩිදෙනා උත්සාහ කරති. ප්‍රසිද්ධ පුද්ගලයන් කුමන කුලයට අයත්ද යන්න බොහෝවිට දන්නා අතර ඇතැම් විට අදාළ කුලයන්ට අයත් වෙනත් පුද්ගලයන් මෙම තොරතුරු තමන්ගේ වාසියට යොදාගන්නා අවස්ථාවන් ඇත. දේශපාලනඥයන් මෙන්ම දේශපාලන පක්ෂද යම් යම් අවස්ථාවලදී දේශපාලන අරමුණු සඳහා කුලය යොදා ගනු ලැබේ (Jiggins 1979).

කුල අතර ගරුත්වය අතින් ඇති වෙනස විවෘතව ප්‍රකාශ කිරීම හෝ විවෘතව හඳුනා ගැනීම බොහෝ අයගේ නොසතුටට හේතුවන කරුණකි. අතීතයේදී පුද්ගලයන්ගේ නම් අනුව ඔවුන්ගේ කුල තත්වය හඳුනා ගත හැකි වුවද වර්තමානය වන විට නම් වෙනස් කිරීම වැනි ක්‍රියාවලින් නිසා මෙම තත්වය බොහෝදුරට වෙනස් වී ඇත

(Silva 2005, 2006). ඒ ඒ කුලයට ආවේණික රැකියා ක්‍රමයෙන් අභාවයට ගොස් ඇත. විශේෂයෙන්ම ඒ ඒ කුලයට අයත් තරුණයෝ එවැනි රැකියා ප්‍රතික්ෂේප කරති. කෙසේ නමුත් පාරම්පරිකව ඒ ඒ කුලයට ඇති වාසි අවාසි සහ වරප්‍රසාද යනාදිය යම් තරමකට තවදුරටත් ආරක්‍ෂා වී ඇත. මෙම තත්වය මෙම පරිච්ඡේදයේ ඉදිරි කොටස්වලදී විග්‍රහ කරනු ඇත.

වගු අංක 3.1

සිංහල සමාජයේ කුල සංයුතිය (මුළු සිංහල ජනගහනයෙන් % ගණනක් ලෙස)

අනුපිළිවෙළ (පූර්ණ එකඟතාවක් නැත)	**කුලයේ නම**	**පාරම්පරික වෘත්තිය**	**මුළු සිංහල ජනගහනයෙන් % ලෙස**
01	ගොවිගම i. රදල ii. ගොවි iii. පට්ටි	 ඉඩම් හිමි ප්‍රභූ ගොවිතැන ගව පාලනය	0.001 49.000 0.001
02	කරාව	මසුන් මැරීම	5.000
03	සලාගම	කුරුඳු තැළීම	3.000
04	දුරාව	රා මැදීම	2.000
05	හුනු	අලු හුනු කර්මාන්තය	0.002
06	ආචාරි/ගල්ලදු/නවන්දන්න	ලෝකුරු වැඩ	0.500
07	හේන/ රදා	රෙදි ඇපිල්ලීම	3.000
08	වහුම්පුර/ හකුරු	හකුරු සෑදීම	12.500
09	කුඹල්/ බඩහැල	වළන් සෑදීම	2.500
10	දුර i. වෙල්ලදුර/බෝධි ii. පන්නදුර	 ශ්‍රී මහා බෝධිය රැක ගැනීම ඇත්ගොව්වෝ	0.001
11	නැකති/ බෙරවා	නැටුම්/ නක්ෂත්‍ර වැඩ	3.000
12	බත්ගම/ පදු	සේවකයෝ/ බර උසුලන්නෝ	18.000
13	ගහල	මළ බෙර ගැසීම	0.001
14	කින්නර	පැදුරු විවීම/ හණ කර්මාන්තය	0.300
15	රොඩී	හිඟමන/ කොහු ඉදල් සෑදීම	0.001
	වෙනත්	-	1.193
එකතුව			100.000

සිංහල සමාජයෙහි උසස්ම සහ විශාලතම කුලය ලෙස සැලකෙන්නේ ගොවි කුලයයි. මෙම කුලයේ උසස්ම උප කුලය සුළු පිරිසකගෙන් යුක්ත රදලවරුන්ගෙන් සමන්විතය.

ඔවුන් බොහෝවිට විවාහය සහ දේපළ උරුමය හරහා එකිනෙකාට සම්බන්ධ අතර රජයේ, ආගමික ආයතන සහ පුද්ගලික අංශයේ උසස් තනතුරු ලබා ගැනීමට විශේෂ උනන්දුවක් දක්වති (Moore 1985, Seneviratne 1978). සිංහල ජනගහනයෙන් 50% ක් පමණ ගොවි කුලයට අයත් යැයි සලකනු ලැබේ. සෙසු කුල අතුරින් ප්‍රමාණයෙන් තරමක් විශාල කුල නම් බත්ගම සහ වහුම්පුර කුලයන්ය. සාම්ප්‍රදායිකව සමාජයේ සියලු බලගතු සහ නම්බුකාර තනතුරු ගොවි කුලයට හිමි වූ අතර සෙසු කුල ගොවි කුලයට සේවා සපයන ඒකක විය. මෙම තත්වය යටත් විජිත යුගයේ සිට වෙනස්වීම්වලට ලක්විය. යටත් විජිත අවධියේ ගොවි කුලය බොහෝදුරට තම වාසිදායක තත්වය රැක ගත් නමුත්, අලුතින් බිහි වූ අධ්‍යාපන, ව්‍යාපාරික, රැකියා අවස්ථා බොහෝවිට හිමි වූයේ වඩා ගතික ලක්ෂණ පෙන්නුම් කළ පහතරට කුලවල අයටය. අධ්‍යයනයේ පහසුව සඳහා සිංහල සමාජයේ විවිධ කුල මට්ටම් 4 කට නැතහොත් කුලක 4 කට ඇතුළත් කළ හැකිය. එනම් ගොවිගම, පහතරට කුල, සේවා කුල සහ පීඩිත කුල ලෙසය (බලන්න වගු අංක 3.2).

ඒ ඒ කුලයේ මට්ටම අනුව ඒ ඒ කුලය විසින් රාජ්‍යය සඳහා යම් යම් සේවාවන් (රාජකාරි) ද, ආගමික ආයතන සඳහා යම් යම් පිළිවෙත් සහ සේවාවන් (රාජකාරි) සහ ආර්ථික කටයුතුද සිදු කරන ලදි. විශාලතම සහ උසස්ම කුලය වූ ගොවි කුලය සහ එහි උප කුල වඩාත්ම උසස් පරිපාලන සහ ආගමික තනතුරු, පාරම්පරික දේපළ, ඉඩකඩම් සහ කුල ක්‍රමයට අයත් වරප්‍රසාදවලින් වැඩි කොටස එනම් නම්බු නාම, සෙසු අයගෙන් සේවා ලබා ගැනීම සහ ඉඩකඩම්වල ප්‍රතිලාභ හිමි කරගන්නා ලදි.

පහතරට කුලවලට අයත් වෘත්තීන් මුහුදුකරය හා සම්බන්ධ විය. එනම් ධීවර කර්මාන්තය, හුනු ගල් සෑදීම සහ කුරුඳු කර්මාන්තය ඒ ඒ කුලයට අයත් විය. ඔවුන් මෙම ජීවනෝපායන්හි නියැළුනේ මුදල් ඉපයීම සඳහා මිස ඉහළ කුලවලට පාරම්පරිකව සිදු කරන සේවාවන් ලෙස නොවේ. යටත් විජිත අවධියේ සිට වාණිජ කටයුතු සහ අධ්‍යාපන අවස්ථා ප්‍රසාරණය වීමේදී මෙම පහතරට කුලවලට ඒ මඟින් ඉදිරියට යාමට හැකිවිය.

සේවා කුල ඉහළ කුලවල අයට සේවය කිරීම සඳහා පාරම්පරිකව බැඳී සිටියහ. බොහෝවිට ඔවුන්ට යැපීම සඳහා ඉඩකඩම් හිමි වූයේ ගොවි කුලයේ අයට සේවය කිරීමේ පදනම යටතේය. සේවා කුලවල අයගෙන් සමහරෙක් ගබඩාගම්, විහාරගම්, දේවාල ගම් සහ කෝරාල ගම්වලට අනුයුක්තව සිටි අතර එම ආයතනවලට සේවා සැපයීමට ඔවුහු බැඳී සිටියහ. පදිංචිය සහ යැපීම සඳහා ඉඩකඩම් ලැබුනේ සේවා සැපයීමේ පදනම යටතේය. සේවා කුල අතුරින් විශාලතම කුල වූයේ බත්ගම සහ වහුම්පුර යන කුල දෙක වේ. ඔවුහු මධ්‍යම සහ සබරගමුව පළාත්වල වැඩි වශයෙන් සිටිති. ඉඩම් හිඟය සහ දිළිඳුකම මොවුන්ගේ ගම්මානවල බහුලව දැකිය හැකිය (Jiggins 1979). එපමණක් නොව මෙම ගම්මානවල කලහකාරීත්වය සහ දේශපාලන වශයෙන් දැඩි ඉච්ඡා භංගත්වයද ඉහළ මට්ටමක වූ බව පර්යේෂකයන් කිහිප දෙනෙකු

පෙන්වා දී ඇත (Jiggins 1979, Moore & Perera 1978, Perera 1985). ඓතිහාසික පසුබිම අනුව මොවුහු බොහෝවිට රදල කුලවල ගෘහ සේවකයන් (වහුම්පුර කුලය) සහ කෘෂිකාර්මික කම්කරුවන් (බත්ගම) ලෙස සේවය කිරීමට නැඹුරු වී සිටියහ. මෙම ප්‍රජාවන් තුළ දරිද්‍රතා මට්ටම ඉහළ තත්වයක පැවතීමට හේතුව නම් පාරම්පරික අනුග්‍රාහක-ක්‍රායක සබඳතා බිඳවැටීම, පාරම්පරික ඉඩම් භුක්ති ක්‍රමයන් තුළ මොවුන්ගේ ඉඩම් හිමිකම සීමා වීම සහ මෑත යුගයේදී විශේෂයෙන්ම සෞඛ්‍ය පහසුකම් දියුණු වීමෙන් අනතුරුව මෙම ප්‍රජාවන්ගේ ජනගහනය ශීඝ්‍රයෙන් වර්ධනය වීමය.

සිංහල කුල ක්‍රමය තුළ පහත්ම තලය ලෙස සැලකෙන්නේ වැඩි සමාජ කොන් කිරීම්වලට ලක් වූ රොඩී, කින්නර සහ ගහල යන කුලයන්ය. ඔවුහු සමාජ ගැරහීමට ලක් වූ රැකියාවල නියැලෙන්නෝ වූහ. උදාහරණයක් ලෙස රොඩී කුලය සිඟා කෑම පාරම්පරික වෘත්තීය ලෙස සැලකූ පිරිසක් විය. ඔවුන්ගේ පාරම්පරික උරුමය හැටියට මළ මිනී ඉවත් කිරීම, සත්ව මළ කුණු ඉවත් කිරීම වැනි අපවිත්‍ර කටයුතු ඇතුළත් විය. ගහල කුලය රාජ උදහසට ලක් වූවන් සහ අපරාධකරුවන් වැනි අය මරණයට පත් කිරීමේ වගකීම සහිත රාජ නියෝගයන් ක්‍රියාත්මක කරන පිරිසක් විය. මොවුන්ද බුදුදහම අනුව පාපකාරී ක්‍රියාවක නියැලෙන එමෙන්ම ලේ අත ගෑවුනු පිරිසක් ලෙස හඳුනා ගන්නා ලදි. කින්නර කුලය ගෝත්‍රික ලක්ෂණ සහිත වනගත ජීවිත ගත කරන අයගෙන් සමන්විත යැයි සලකන ලදි. මේ පීඩිත කුල තුනම යම් තරමකට කිළිටි කුල ලෙස සලකන ලද නමුත් මෙම කිළිටි බව ශාරීරික හෝ ජන්මගත තත්වයකට වඩා භෞතික එසේ නැතහොත් කෙටිකාලීන තත්වයක් ලෙස සලකන ලදි. විශේෂයෙන්ම රොඩී කුලයේ අයට අභිචාර සහ පිළිවෙත් මඟින් සෙසු අයට වින කිරීමේ හැකියාවක් ඇතැයි පිළිගැනීමක් විය. ඉහළ කුලවල අය ඔවුන් සමග වැඩි ඇසුරක් පැවැත්වීමට මැළි වූයේ ඔවුන්ගෙන් ඇතිවිය හැකි කිළිටි වීමකට වඩා ඔවුන්ගෙන් ඇති විය හැකි හානිවලින් වැළකීම සඳහාය. මෙම කුල තුනම එක් කළ විට මුළු සිංහල ජනගහනයෙන් 1% කටත් වඩා අඩු විය. ඔවුන්ගේ වාසස්ථාන බොහෝවිට පිහිටියේ සෙසු අයගෙන් වෙන්ව වනගත පෙදෙස්වල සුසානභූමි ආසන්නයේ වැනි තැන්වලය.

සිංහල කුල ක්‍රමය ගැන සලකන විට පීඩිත කුල ගණයට අයත් කුල තුන ඉන්දියාවේ දලිත්වරුන්ට සමාන කුල ලෙස සැලකීමට හැකිය.[8] නමුත් ඔවුන් ජන සංඛ්‍යාව අතින් ඉතා සීමිත පිරිසක් වන අතර මෙම කුල අතර පාරම්පරිකව පැවතියේ එක්සත්කමකට වඩා අන්‍යෝන්‍ය අවිශ්වාසයකි. කෙසේ නමුත් සිංහල කුල ක්‍රමය තුළ සමාජ කොන්වීමට ලක් වූ කුල ලෙස ඇතැම් සේවා කුලද ඇතුළත් කළ හැක.

මෙම පරිච්ඡේදයේ ඉදිරි කොටස්වලදී කුල හීන ගම්මානවල සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂණවල ප්‍රතිඵල ඉදිරිපත් කරනු ලැබේ.

---

8 මීට අමතරව ඇතැම් පහතරට ප්‍රදේශවල කොන්වීමට බඳුන් වූ 'දෙමළ ගත්තර' නම් වූ කුලයක් ගැන ද සඳහන් වේ. මොවුන් පහත් ක්‍රියාවල නියැළීම නිසා රජු විසින් "ගත්තර" කරනු ලදුව මේ තත්වයට පත්ව ඇතැයි සැලකේ.

වගු අංක 3.2

සේවාව අනුව සිංහල කුල වර්ගීකරණය

කුලයේ නම	**සේවාව**		
	රාජකාරිය/ බද්ද	**පිළිවෙත් යාතුකර්ම**	**රැකියාව/ ජීවනෝපාය**
01 වන මට්ටම: ගොවිගම			
ගොවිගම i. රදල ii. ගොවිගම iii. පට්ටි	සිවිල් පරිපාලනය හමුදා සේවය හමුදා සේවය	දේවාලය පාලනය භික්ෂුත්වය	ඉඩම් හිමි ගොවිතැන ගව පාලනය
02 වන මට්ටම: පහතරට කුල			
කරාව	මඩිගේ බද්ද/ පරිවහන කටයුතු		මසුන් මැරීම
සලාගම	මහ බද්ද		කුරුඳු තැළීම
දුරාව			රා මැදීම
හුනු	හුනු බද්ද		අළුහුනු
03 වන මට්ටම: සේවා කුල			
ආචාරි/ ගල්ලදු/ නවන්දන්න	කොට්ටල් බද්ද	සිත්තර වැඩ	ලෝකුරු වැඩ
හේන/ රදා	රදා බද්ද	මල්වර/විවාහ/අවමගුල් උත්සවවල රාජකාරී	රෙදි ඇපිල්ලීම
වහුම්පුර/ හකුරු		මංගල උත්සවවලට කැවිලි පෙට්ටි රැගෙන යාම	හකුරු සෑදීම
කුඹල්/ බඩහැල	බඩහැල බද්ද	පන්සල් දේවාලවලට මැටි පහන් සැපයීම	වළන් සෑදීම
දුර i. වෙල්ල දුර/ බෝධි ii. පන්න දුර	කුරුවේ බද්ද	ශ්‍රී මහා බෝධිය රැකගැනීම	ඇත් ගොවුවන්
නැකති/ බෙරවා	බෙරවා බද්ද	පන්සල්, පෙරහැර යනාදියේ බෙර ගැසීම/ බලියාග පැවැත්වීම	නැටුම්, නක්ෂත්‍ර වැඩ
බත්ගම/ පදු	දෝලා ඔසවාගෙන යාම/ හමුදා සේවය		සේවක වෘත්තිය/ බර ඉසිලීම
04 වන මට්ටම: පීඩිත කුල			
ගහල			මළ බෙර ගැසීම
කින්නර	කින්නර බද්ද		පැදුරු විවීම
රොඩී		අභිචාර ගුරුකම්	හිඟමන/ කොහු ඉදල් සෑදීම

වැලිවිට ගම්මානය: නැකති බහුතරයකින් සමන්විත උඩරට ගමක කුල පීඩනය

උඩරට රාජධානියේ කේන්ද්‍රස්ථානය අසල පිහිටි ගමකි වැලිවිට. මෙය පිහිටා ඇත්තේ මහනුවර නගරයෙන් සැතපුම් දහයක් පමණ ගිනිකොන දෙසටය. ගම පිහිටා ඇත්තේ හන්තාන කඳුවැටියෙන් ආවරණය වූ සරුසාර කුඹුරු යායකින් සමන්විත විශාල ද්‍රෝණියකය. 1915 ට පෙර වැලිවිට ගම සහ ඒ අවට ප්‍රදේශය රජවාසලට අයත් ගබඩා ගමක් ලෙස පැවති බව මුඛපරම්පරාගත තොරතුරුවලින් සහ ඇතැම් වාර්තාවලින් හෙළිවේ. යටත්විජිත අවධියේදී මේ ගම යම් තරමකට ස්වාධීන ඒකකයක් බවට පත්වූ නමුදු එහි අර්ධ වැඩවසම් ලක්ෂණ තවදුරටත් ආරක්ෂා විය. උදාහරණයක් ලෙස ගමේ ඉඩම් හිමිකම සුළුතරයක් වූ ඉහළ කුල අත ඒකරාශි වූ අතර ජනගහනයෙන් බහුතරය වූ සේවා කුල එම ඉඩම් වගා කරන අඳ ගොවියන් ලෙස ජීවනෝපාය සලසා ගත්හ (Silva 1986, 1992).

මෙම ගමෙහි වැඩවසම් පසුබිම ගමේ කුල සංයුතියෙන් හෙළිවේ.

වගු අංක 3.3

වැලිවිට ගමේ කුල සංයුතිය

කුලයේ නම සහ සේවාව	වී ගොවිතැනට සම්බන්ධ වූ ආකාරය	ගෘහයන් ප්‍රමාණය	%	ජනගහනය	%
පට්ටි	ඉඩම් හිමි ප්‍රභූහු/ ස්වාධීන ගොවියෝ	14	7.0	82	6.7
නවන්දන්න	ස්වාධීන ගොවියෝ	3	1.5	22	1.8
හේන	ස්වාධීන ගොවියෝ	18	9.0	94	7.7
බෙරවා	අඳ ගොවියෝ	161	80.5	1,009	82.1
වෙනත්	-	4	2.0	21	1.7
එකතුව		200	100.0	1,228	100.0

මෙවැනි සේවා ගම්මානවල විශේෂත්වය වූයේ ජනගහනයෙන් බහුතරය සේවා කුලවලට අයත් වීමය. වැඩවසම් ක්‍රමය යටතේ රජවාසලට හෝ වෙනත් රදල ප්‍රභූන් යටතේ පැවති ගම්මානවල සේවා සැපයීම පිණිස නිශ්චිත සේවා කුලවලට අයත් බහුතරයක් පදිංචිව සිටියහ.

වැලිවිට ගම ප්‍රධාන වශයෙන් කුල හතරකින් සමන්විතය. මෙහි කුල ධුරාවලිය සමන්විත වන්නේ පිළිවෙළින් ඉහළ සිට පහළට පට්ටි, ගල්ලදු, හේන සහ නැකති යන කුලවලිනි. ගමට ආවේණික වූ කුලවලට අයත් අය හැරුනු විට විශේෂයෙන්ම පහතරට ප්‍රදේශවලින් පැමිණි කුල තත්වය අවිනිශ්චිත වූ පවුල් කිහිපයක්ද මෙහි

සිටියහ. මුළු ජනගහනයෙන් 82% ක්ම අයත් වන්නේ ප්‍රදේශයේ කුල අතුරින් පහත්ම කුලය ලෙස සැලකෙන නැකති කුලයටය. උඩරට කුල ධූරාවලියේ ඇති ප්‍රධාන ප්‍රභේදයක් නම් ගොවි කුලය (සේවා ලබන්නා) සහ සේවා කුල (සේවා සපයන්නා) අතර වෙනසයි. සේවා කුලවලට අයත් ජනගහනය ඒකරාශි වී සිටීම සේවා ගම්වල විශේෂත්වය විය. මේ අනුව වැලිවිට ගම ප්‍රධාන වශයෙන්ම නැකති කුලයේ සේවා බාහිර ප්‍රභූන්ට සපයන ගමක් වූ බව පෙනේ.[9] බෙරකරුවන්, හේවිසිකරුවන් සහ නැට්ටුවන් විශාල ප්‍රමාණයක් රජ මාළිගාවේ සහ දළදා මාළිගාවේ සේවා සඳහා අවශ්‍ය විය. පට්ටි කුලය ගොවි කුලයේ තත්වයෙන් තරමක් අඩු උප කුලයක් වූ නමුත් එය වැලිවිට ගමෙහි පරිපාලන කටයුතු භාරවූ ගමෙන් පිටස්තර ප්‍රභූන් සහ ගමේ පදිංචිකරුවන් අතර අතරමැදි පිරිසක් වූ බව පෙනේ. නවන්දන්න සහ හේන කුල ගමේ කුල ධූරාවලියේ අතරමැදි තත්වයක් හොබවන ලදි. ඔවුන් ඉඩම් හිමි සුළු ගොවීන් වූ අතර ඔවුන්ගේ සේවා පට්ටි කුලය ඇතුළු ඉහළ කුලවලට සපයන ලදි.

වැලිවිට ගමේ බහුතරය වූ නැකති කුලය එක් අතකින් අඳ ගොවියන් ලෙස ඉහළ කුලවල ඉඩම් හිමියන්ට සේවය කළ අතර, අනෙක් අතින් එම කුලයේ සේවාවන් වූ බෙරගැසීම, නැටුම් හා පිළිවෙත් විවිධ පාර්ශවයන් වෙනුවෙන් සිදු කරන ලදි. මෙම ගමෙහි සේවා කුලවලට අයත් පුද්ගලයන් ගමේ සහ ගමෙන් පිට ඉහළ කුලවලට සේවය කිරීමට පාරම්පරිකව බැඳී සිටියහ.

වැලිවිට ගම ගංගොඩවල් කිහිපයකින් සමන්විත විය. පට්ටි කුලවල අය ගමේ කේන්ද්‍රීය ස්ථානවල පිහිටි විශාල ගෙවතුවල පදිංචි වී සිටියහ. සේවා කුලවල අය එක් එක් කුලයට ආවේණික වූ ජනාකීර්ණ ගංගොඩවල්වල පදිංචිව සිටියහ. පට්ටි කුලයේ අයගේ වාසස්ථානය "වත්ත" "තැන්න" වැනි ගරුත්වය වැඩි පදවලින්ද සේවා කුලවල අයගේ ගම්ගොඩවල් "වල" "ලන්ද" "වෙල" "පිටිය" වැනි ගරුත්වය අඩු පදවලින්ද හඳුන්වා දෙන ලදි.

පුද්ගලයන්ගේ නම්වලින් බොහෝවිට කුල තත්වය මෙන්ම පාරම්පරික සේවාවද ප්‍රකාශ විය. ගමේ නැකති කුලයේ වැඩිදෙනාගේ පෙළපත් නාමය වූයේ "බෙරකාර ගෙදර" යන්නය. අනෙක් අතට පට්ටි කුලයේ අයගේ පෙළපත් නම්වලින් බලය, ගරුත්වය සහ උසස් මුතුන් මිත්තන්ගෙන් පැවත එන බව හැඟවේ. උදා: රාජපක්ෂ වාසල මුදියන්සේලාගේ (Silva 2006).

බ්‍රිතාන්‍ය යුගයේදී සහ නිදහසින් පසු මුල් කාලයේදී ප්‍රදේශයේ පරිපාලන තනතුරු සියල්ල හොබවන ලද්දේ පට්ටි සහ රටේ ඇත්තෝ (ගොවි කුලයේ මධ්‍යම ස්තරයට මෙම ප්‍රදේශයේ භාවිතා කළ නම) විසිනි. මෙම තත්වයන් යටතේ ඉඩම් භුක්ති ක්‍රමය තුළින් මෙන්ම රජයේ පරිපාලන යාන්ත්‍රණය තුළින්ද කුල පීඩනය තහවුරු

---

9 සිංහල ප්‍රදේශවල ඇති ගම්මාන බහුතරයක ජනයාගෙන් වැඩි පිරිස ගොවිගම කුලයට හෝ පහතරට ප්‍ර.දේශවල ඇති මධ්‍යම ස්තරයට අයත් එක් කුලයක අයගෙන් සමන්විත වේ. අනික් අතට කිසියම් සේවා කුලයක අයගේ බහුතරයක් සිටින ගම්මාන බොහෝවිට වැඩවසම් ක්‍රමය යටතේ ආරම්භ වූ සේවා ගම්මාන ලෙස පැවති බව පෙනේ (බලන්න පීරිස් 1956, සෙනෙවිරත්න 1979).

විය. විශේෂයෙන්ම නැකති කුලයේ අය පට්ටි සහ ගොවිගම ප්‍රභූන්ට යටහත්භාවය මෙන්ම ගෞරවය ප්‍රකාශ කළ යුතු විය. වැලිවිට ගමේ කිසිදු කුලයක් සෙසු අයගේ ස්පර්ශයට නුසුදුසු පිරිසක් ලෙස නොසැලකුණ නමුත්, ආසන පැනවීමේදී, කතාබහ කිරීමේදී මෙන්ම ආහාර පාන ගැනීමේදී සේවා කුලවල අයගේ අඩු තත්වය එළිපිට ප්‍රකාශ විය.

උඩරට ගැමි සමාජය තුළ අධ්‍යාපන අවස්ථා සහ රැකියා අවස්ථා ප්‍රසාරණය වීමේදී එයින් මුලින්ම ප්‍රයෝජන ගත්තේ ඉහළ කුලවල අයයි. එම පවුල්වල ළමයින් මහනුවර නගරයේ පාසැල්වලට යැවීම 1920 ගණන්වලදී පමණ ආරම්භ විය. මේ නිසා මුල් යුගයේ කුල ක්‍රමයට අනුව පාරම්පරික තනතුරු (ගම්මුලාදෑනි, රෙජිස්ටාර්, කෝරලේ) තම ඒකාධිකාරයට නතු කරගෙන සිටි ඉහළ කුලවල ප්‍රභූන්ගේ දරුවන් ක්‍රමයෙන් අධ්‍යාපන සුදුසුකම් අනුව පරිපාලන ක්ෂේත්‍රයේ ඉහළ තනතුරුවලට පත්විය. එම පවුල්වල ඊළඟ පරම්පරාවල වඩාත් සාර්ථක පිරිස් නගරයට සංක්‍රමණය වූ නමුත් ඔවුහු ගම්වල ඉඩම් හිමිකම හෝ කුල මහන්තත්වය තමන්ට අහිමි කර ගැනීමට අකමැති වූහ.

ගමේ සේවා කුලවල අයගේ සමාජ චලනතාවයට අවහිර පැමිණ වූ සාධක කිහිපයක්ම තිබුණි. සුළු ඉඩම් හිමියන්, අඳ ගොවියන් හෝ කුලීකරුවන් වූ සේවා කුලවල අයට ඉඩම් පිළිබඳ වූයේ සීමිත අයිතියකි. පට්ටි කුලයේ සහ රටේ ඇත්තෝ ඉඩම් හිමියන් ගමෙන් පිටතට සංක්‍රමණය වූ පසුව පවා තම ඉඩකඩම් ඔවුන්ගේම පවුල් තුළ රැකගැනීමට උනන්දු වූහ. සේවා කුලවල ළමුන්ගේ අධ්‍යාපනය ගමේ පාසැලට සීමා වූ අතර, එම පාසැල්වල ගුරුවරුන්ගෙන් බහුතරය ඉහළ කුලවල අය වූ නිසා සේවා කුලවල දරුවන්ව අධ්‍යාපනය සඳහා දිරි ගැන්වීම් සිදු වූයේ සීමිත වශයෙනි. මේ ප්‍රදේශයේ ගම්මුලාදෑනිවරු සහ රෙජිස්ටාර් වැනි තනතුරු හෙබවූවන් කුල ධුරාවලියේ ඉහළ මට්ටම්වලට අයත් වූ බැවින්, සේවා කුලවල ළමුන්ගේ හංවඩු ලක්ෂණ සහිත නම් ඉවත දමා නවීන පන්නයේ නම් ඔවුන්ට ලබා දීමට දෙමව්පියන් උනන්දු වූ විට ගම් මට්ටමේ ඉහළ කුලවල නිලධාරීන් එය වැළැක්වීමට විවිධ උපක්‍රම යෙදූහ (Silva 2006). පහළ කුලවල අයට එරෙහිව සිදු වූ කුල පීඩනය තවදුරටත් ආරක්ෂා වූයේ මෙම තත්වයන් යටතේය.

කෙසේ නමුත් 1950 ගණන්වල ඇරඹුනු සමාජ වෙනස්වීම් ක්‍රමයෙන් ඉහළ කුලවල ආධිපත්‍යයට අභියෝගාත්මක ලෙස වර්ධනය විය. 1956 දේශපාලන විපර්යාසය සමග ජාතික දේශපාලනය ක්‍රමයෙන් ගම තුළට කාන්දු විය. වැලිවිට ගමේ නැකති නායකයන් 1956 බලයට පත් වූ මහජන එක්සත් පෙරමුණ වටා ඒකරාශි වූ අතර ඒ මඟින් ඔවුන්ට තම බලය ක්‍රමයෙන් වර්ධනය කරගැනීමට හැකිවිය.[10] මෙයට සමගාමීව

10 මෙම හේතුව නිසා ජාතික මට්ටමෙන් සිදු වූ දේශපාලනමය වෙනස '1956 විප්ලවය' ලෙස හැඳින්වේ. මේ තුළින් දේශපාලන බලය බටහිරකරණය වූ ඉහළ පෙළේ ප්‍රභූන්ගෙන් වරප්‍රසාද නොලත් කුල කණ්ඩායම්වල නියෝජිතයන්ද ඇතුළු පොදු ජන නියෝජිතයන් වෙත ගලා යෑමක් සිදු විය. වැඩි විස්තර සඳහා බලන්න Roberts 1981, Silva 1982.

ගමට රථවාහන ගමන් කළ හැකි මාර්ගයක්, වාරිමාර්ග පහසුකම් ආදිය ලබා ගැනීමට මෙම නව දේශපාලන නායකත්වයට හැකිවිය. එමෙන්ම වාණිජ පදනමකින් විශේෂයෙන්ම යල කන්නයේ කුඹුරුවල එළවළු වගා කිරීම ක්‍රමයෙන් ප්‍රචලිත වූ අතර මෙයින් වැඩි වාසි ලබා ගත හැකි වූයේ ගොවිතැන් පිළිබඳ දැඩි උනන්දුවක් දැක්වූ නැකති කුලයේ සුළු ගොවීන්ට සහ අඳ ගොවීන්ටය. මෙම තත්වයන් යටතේ කුල පීඩනයෙන් යම් තරමකට මිදීමට සේවා කුලවල උඩුකුරු චලනතාවයට නැඹුරු පිරිස්වලට හැකිවිය. 1958 නව රජය විසින් ඉදිරිපත් කළ කුඹුරු පනත මගින් ඇතැම් අඳ ගොවීන්ට තම අයිතිවාසිකම් තහවුරු කර ගැනීමට සහ අඳය (බද්ද) සීමා කර ගැනීමට හැකි විය. එමෙන්ම එළවළු ගොවිතැනින් ලාභ ලැබූ ඇතැම් නැකති කුලයේ පිරිස් ඉහළ කුලවල ඉඩම් හිමියන්ගෙන් විශේෂයෙන්ම ගමෙන් පිටතට සංක්‍රමණය වූ අයගෙන් කුඹුරු ඉඩම් මිලදී ගැනීමට සමත් විය.

මෙම තත්වයන් යටතේ කිසියම් අධ්‍යාපන මට්ටමක් සහ ඉහළ නැගීමේ උනන්දුවක් සහිත පහළ කුල නායකත්වයක් ක්‍රමයෙන් වැලිවිට ගමේ බිහි විය. මෙම නායකත්වය කුල පීඩනයට එරෙහිව නැගී සිටි අතර ඉහළ කුලවල අයගේ ආධිපත්‍යය ප්‍රතික්ෂේප කළහ. මේ මගින් ගමේ කුල පීඩනය යම් තරමකට තුනී වූ අතර පහළ කුලවල අයට යම් තරමකට හෝ අවස්ථා විවෘත විය.

හේනාවල: කින්නර කුලයේ අය කෙරෙහි වූ කුල පීඩනය

ඉහත සඳහන් කළ පරිදි කින්නර කුලය සිංහල කුල ක්‍රමයේ පහත්ම මට්ටමට අයත් කුලයකි. මෙම කුලයේ අයට මුහුණ දීමට සිදුවන ගැටලු අවබෝධ කරගැනීම සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් හේනාවල ගමේ මානවවංශ විද්‍යාත්මක පර්යේෂණයක් සිදුකරන ලදි. 2007 වන විට මෙම ගමේ ගෘහයන් 114 ක් වූ අතර මුළු ජනගහනය 620 ක් විය.

මෙම ගම කුඩා ඉඩමක ජනාකීර්ණ ලෙසින් එකිනෙකට යාබදව පිහිටි ගෙවල්වලින් සමන්විත විය. ගමේ මුළු ජනගහනයම කින්නර කුලයට අයත් විය. මෙම ගම මුල් පවුල් නවයකින් විකාශනය වූ බවට විශ්වාසයක් ඇත. මෙම ගම පැදුරු, කලාල සහ වෙනත් විසිතුරු භාණ්ඩ නිපදවීම සඳහා ප්‍රසිද්ධියක් උසුලයි. ඇතැම් විශ්ලේෂකයන්ට අනුව කින්නර කුලය ගෝත්‍රික පසුබිමකින් පැවතෙන නිසා සිංහල කුල ක්‍රමය තුළ ඔවුන්ට පහත් ස්ථානයක් හිමිවිය (Raghavan 1951, Somathilaka 1998). අතීතයේදී රජවාසලේ අවශ්‍යතා සඳහා කලාල සහ පැදුරු නිපදවා සැපයීම මෙම කුලයේ සේවාව ලෙස සලකන ලදි. මෙම භාණ්ඩ නිපදවීමේ තාක්ෂණය මෙම කුලයට සීමා වී ඇති අතර එම තාක්ෂණික ඥානය කුලය තුළ රැකගැනීමට උනන්දුවක් පවතී. එම නිසාම මෙම තාක්ෂණය කාලාන්තරයක් තිස්සේ නොවෙනස්ව පවතී. ඔවුන් තදබදය සහිත කුඩා නිවාසවල පදිංචිව සිටින අතර එම නිවාස තුළම කර්මාන්ත ද සිදු කරනු ලැබේ.

වගු අංක 3.4

රැකියාව අනුව හේනාවල ගෘහස්ථ වර්ගීකරණය

ප්‍රධාන රැකියාව	ගෘහයන් ප්‍රමාණය	ප්‍රතිශතය (%)
රජයේ හෝ පෞද්ගලික අංශයේ රැකියා	6	4.7
පාරම්පරික කර්මාන්ත	80	63.0
විදේශ රැකියා	33	26.0
කුලී වැඩ	8	7.3
මුළු ගණන	127	100.0

මෙම ගමේ ප්‍රධාන රැකියාව වන්නේ හණ කර්මාන්තයයි. කර්මාන්තයෙහි නියැලෙන්නන් අතර ශ්‍රම විභජනයක් පවතී. එක් පිරිසක් ඈත ප්‍රදේශවලට ගොස් හණ එකතු කිරීම සහ ඒවායෙන් කෙඳි ශුද්ධ කිරීම කරති. සෙසු අය එම කෙඳි අමුද්‍රව්‍ය ලෙස භාවිතා කරමින් පැදුරු සහ කලාල වියීම සහ සෙසු භාණ්ඩ නිපදවීම කරති. ඉපැයීම්වලින් වැඩි කොටසක් හිමිවන්නේ නිමි භාණ්ඩ නිපදවන අයටයි. මෙම භාණ්ඩ අලෙවි කිරීම සඳහා අතරමැදි ව්‍යාපාරිකයන් පිරිසක් ද බිහි වී ඇත. මෙම කර්මාන්තයෙන් වඩාත් ලාභ උපයන්නේ මෙම පිරිසයි. මෙම කර්මාන්තයෙන් කෙරෙන ඉපයීම් පහත් මට්ටමක පවතින අතර ගම්වැසියන්ගේ දරිද්‍රතාවයට එය සෘජුවම බලපා ඇත. කර්මාන්තයේ නියැලෙන විවිධ පිරිස් අතර අන්‍යෝන්‍ය රඳා පැවැත්මක් පවත්නා අතර මේ නිසා පදිංචිය සඳහා වෙනත් ප්‍රදේශයකට සංක්‍රමණය වීම වැළකී ඇත.

මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු දෙයක් නම් මෙම වෘත්තිය හැරුනවිට විදේශ රැකියා ප්‍රජාවේ වැදගත්කමින් දෙවන ජීවන වෘත්තිය බවට පත්වී තිබීමය. මෙම ප්‍රජාවේ කාන්තාවන් විශාල පිරිසක් ගෘහ සේවිකාවන් ලෙස කටයුතු කිරීම සඳහා මැදපෙරදිග සහ වෙනත් රටවලට සංක්‍රමණය වී ඇත. මෙයට ප්‍රධාන හේතුව ඔවුන් සඳහා විකල්ප රැකියා ප්‍රදේශයේ නොවීමය. ගෘහ සේවිකාවන් ලෙස විදේශගත වීම එක් අතකින් පීඩිත කුලවලට අයත් කාන්තාවන් කුල, ගෘහීය සහ පුමතිරි පීඩනයන්ගෙන් තාවකාලිකව හෝ මිදීම සඳහා ගත් උත්සාහයක් ලෙසද සැලකිය හැකිය (Gamburd 2000).

කින්නර කුලයේ පහත් තත්වයට හේතුව විවාදයට තුඩු දී ඇත. ඔවුන්ගේ වෘත්තිය කිළිටි එකක් ලෙස සැලකිය නොහැක. එයට වඩා මෙහිලා බලපා ඇත්තේ ඔවුන් නොදියුණු ගෝත්‍රික ලක්ෂණ සහිත පිරිසක් ලෙස සැලකීමය.

මෙම ප්‍රජාවේ අධ්‍යාපන මට්ටම ඉතා පහළ තත්වයක පවතී. අපොස සාමාන්‍ය පෙළ දක්වා හෝ ඊට ඉහළ මට්ටමකට අධ්‍යාපනය ලබා සිටින්නේ මුළු වැඩිහිටි ජනගහනයෙන් 6% කට අඩු සංඛ්‍යාවකි. මෙම ප්‍රජාවේ දෙමව්පියන් තම දරුවන්ට අධ්‍යාපනය ලබාදීමට වැඩි උනන්දුවක් දක්වන්නේ නැත. මේ ගැන විමසූ විට ඔවුන් ප්‍රකාශ කළේ "අපේ දරුවන්ට මොන අධ්‍යාපනයක්ද? හොඳට ඉගෙන ගත්තා කියලා ඒ අයට ආණ්ඩුවේ රස්සා ලැබෙනවද?" යන්නය. දෙමව්පියන් වැඩි උනන්දුවක් දැක්වූයේ තම දරුවන්ට කුඩා කාලයේ සිටම "දෑතේ සවිය" ලබා ගැනීමට උදව් කිරීමටය.

ප්‍රදේශයේ පාසැල්වලට හේනාවල ළමුන් ඇතුළත් කිරීමේ දුෂ්කරතා පවත්නා අතර ඔවුන් එම පාසැල්වලට ඇතුළත් වූ පසු සෙසු ළමයින්ගෙන් සහ ගුරුවරුන්ගෙන් විවිධ ගැරහිලිවලට සහ කොන් කිරීමට ලක්වන බව වැඩිදෙනාගේ මතය විය.

වගු අංක 3.5

හේනාවල ගමේ වැඩිහිටි ජනගහනය අධ්‍යාපන මට්ටම අනුව (2007)

අධ්‍යාපන මට්ටම	ප්‍රමාණය	ප්‍රතිශතය
පාසැල් නොගිය	21	10.1
05 වන ශ්‍රේණිය සමත්	91	44.0
08 වන ශ්‍රේණිය සමත්	80	38.6
අපොස සා.පෙළ	11	5.3
අපොස උ.පෙළ	4	2.0
මුළු	207	100.0

හේනාවල ගමේ ක්‍රියාත්මක මට්ටමේ පවතින කිසිදු ප්‍රජා සංවිධානයක් නොවීය. කුඩා කර්මාන්ත දෙපාර්තුමේන්තුව මගින් හණ කර්මාන්තයේ නියැලෙන්නන් සංවිධානගත කිරීමට විටින් විට උත්සාහ කළද, විවිධ පාර්ශවයන් අතර ඇති වූ මතභේද නිසා එම උත්සාහය අතහැර දමන ලදි. අනෙක් අතට මෙම ගමේ අය අවට ගම්වල ඇති සමෘද්ධි සමිතිය වැනි දිළිඳු අය සඳහා වූ සංවිධානවලට බඳවා ගැනිමට යම් කිසි විරුද්ධතාවයක් එම ගම්වලින් ඉදිරිපත් වී ඇත. කින්නර කුලයේ අය අන්තර් කුල විවාහවලට මැළිකමක් දැක්වූහ. එවැනි විවාහ සිදු වූ විට වෙනත් කුලවල අය කින්නර කුලයට අනුබද්ධ වීමක් සිදු විය.

ප්‍රජාවේ ඉස්මතු වී ඇති එක් ප්‍රධාන ප්‍රශ්නයක් වූයේ වැඩිහිටි පිරිමින්ගේ බීමත්කමයි. මෙය එක් අතකින් ඔවුන් පිටස්තර සමාජයෙන් කොන්වීමේ ප්‍රතිඵලයක් ලෙසත් තවත් අතකින් ඔවුන් සෑහෙන පිරිසකගේ භාර්යාවන් විදේශගත වීම නිසා ඇති වූ පාළුව සහ ගෘහීය ප්‍රශ්න නිසා උත්සන්න වී ඇති බවක් පෙනේ.

මෙම ගම 1980 ගණන්වල එවකට සිටි රජය විසින් ක්‍රියාත්මක කළ ගම්උදාව වැඩසටහනට ඇතුළත් වූ ගමකි. මේ යටතේ නිවාස සහ පොදු පහසුකම් වැඩිදියුණු කිරීමක් සිදු විය. ගමේ නම වූ “හේනාවල” යන්න “කලාසිරිගම” යනුවෙන් වෙනස් කරන ලදි. කෙසේ නමුත් ප්‍රජාවේ අයට වැඩි ගරුත්වයක් ලබා දෙතැයි අපේක්ෂා කළ මෙම අලුත් නම පිටස්තර අය හෝ ගමේ පදිංචිකරුවන් විසින් උපයෝගි කරගන්නා බවක් පෙනී ගියේ නැත.

කූරගල ගම: සිංහල සමාජයේ වඩාත්ම පීඩිත කුලයේ අත්දැකීම්

කූරගල මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර කොට්ඨාශයට අයත් රොඩී ගම්මානයකි. ගමේ සමස්ත ජනගහනය වූ 570 දෙනාම රොඩී කුලයට අයත් හෝ රොඩී කුලයේ අයෙකු සමග විවාහ වූ අයයි. 1911 දී රොඩී කුලය ගැන කළ සංගණනයකදී හඳුනාගත්

රොඩී ගම්මාන 48 න් එකකි කුරගල ගම (සිතියම් අංක 02 බලන්න). රොඩී කුලයේ ජනාවාස සාමාන්‍යයෙන් හඳුන්වන පරිදි (Weeratunga, 1988) මෙම ගමද ගුබ්බෑයමක්, එනම් තදබදය සහිත පීඩිත ජනාවාසයක් ලෙස සැලකේ. ප්‍රජාවෙන් වැඩි පිරිස රොඩී කුලයේ පාරම්පරික වෘත්තියක් ලෙස සැලකෙන සත්ව සම්වලින් නිමවුන බෙර නිපදවීමේ නියැලී සිටිති. ගමේ පවුල් කිහිපයක් පැදුරු කලාල සහ වෙනත් භාණ්ඩ ඈත ප්‍රදේශවලට ගෙන ගොස් අලෙවි කිරීම තුළින් සෑහෙන ධනවතුන් බවට පත්වී ඇත. මෙම පවුල් කිහිපය සතුව ලොරි හතරක්, වෑන් තුනක් සහ ත්‍රිවිල් පහක් තිබේ. මෙම පවුල් ධනවත් වී ඇත්තේ සිංහල කුල ක්‍රමයේ පහත්ම කුලය ලෙස සැලකෙන මෙම කුලයේ අයට තිබූ ඇතැම් අවස්ථා, එනම් දුර බැහැර ප්‍රදේශවලට ගොස් යම් යම් දේ අලෙවි කිරීම, උපක්‍රමශීලි ලෙස දියුණු කර ගනිමින් බව පෙනේ. මේ කුලයට අයත් නිගරුවට ලක් වූ රැකියා, එනම් සිඟා කෑම, කසළ ශෝධනය, මළ මිනී පිළිබඳ කටයුතු කිරීම, මළ සතුන් ඉවත් කිරීම, කොණ්ඩාවලින් හවරි සකස් කිරීම හෝ අභිචාරය වැනි දේ ප්‍රජාවේ එකදු පුද්ගලයෙකු හෝ දැනට කරනු නොලැබේ.

රොඩී කුලයේ ප්‍රභවය පිළිබඳ ඇති විවිධ ජනකතාවලින් එක් අතකින් රජ පවුලට ඇති සම්බන්ධයක් ද අනෙක් අතින් මිනීමස් කෑම පිළිබඳ අපකීර්තිමත් ඉතිහාසයක්ද ප්‍රකාශ වේ (උප ග්‍රන්ථ 02 බලන්න). මෙම කුලය ගැරහීමට ලක්කරන ඉහළ කුල මොවුන් කුරුල්ලන්, ලේනුන් සහ වඳුරන් වැනි අහිංසක සතුන් ආහාර ලෙස ගන්නා බව පවසති. කෙසේ නමුත් කුරගල ගම්වාසීහු මෙම චෝදනා සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරති.

වර්තමානයේදී කුරගල ගම බාහිර සමාජය සමග විවිධාකාරයෙන් සම්බන්ධය. කෙසේ නමුත් මොවුන් අදටත් යම් යම් සමාජ කොන් කිරීම්වලට ලක්වේ. අධ්‍යාපනය මෙවැනි එක් ක්ෂේත්‍රයකි. ගමේ පාසලෙන් අධ්‍යාපනය ලැබෙන්නේ පස්වන ශ්‍රේණිය තෙක් පමණි. ගම අවට ඇති පාසැල් කුරගල ගමේ දරුවන්ට විවෘත වී ඇති නමුදු ඔවුන් තවමත් යම් කොන් කිරීම්වලට ලක්වේ . ප්‍රදේශයේ දේශපාලන නායකයෙකුගේ නිර්දේශයක් මත අවට ඇති පාසැල් මෙම ගමේ ළමයින් එම පාසැල්වලට බඳවා ගත යුතුය. අවම පහසුකම් ඇති එක් පාසැලකට ගමේ දරුවන් සෑහෙන පිරිසක් යති. නමුත් සෙසු කුලවලට අයත් දරුවන් කුරගල දරුවන් සමග මිශ්‍ර වන්නේ හෝ මිතුරු වන්නේ කලාතුරකිනි.

මෙම තත්වය යටතේ ගමේ අධ්‍යාපන සාධනය අවම මට්ටමක පවතී. ගමේ ගෘහ මූලිකයන්ගෙන් 7.5% ක් අකුරු කියවීමට නොහැකි අයයි. ගමේ එකදු පුද්ගලයෙකු හෝ අපොස උ.පෙළ මට්ටමට වඩා අධ්‍යාපනය ලබා නොමැත. කෙසේ නමුත් මෑතදී ධනවත් වූ පවුල්වල ළමයි මහනුවර උසස් පාසැල්වල අධ්‍යාපනය ලබති. ගමේ රජයේ රැකියා කරන පුද්ගලයන් සිටින්නේ අතලොස්සකි. ඉන් කිහිපදෙනෙකු රෝහල් කම්කරුවන් හෝ කාර්යාල කම්කරුවන් ලෙස රැකියා ලබා ගෙන ඇත. අධ්‍යාපනය අතින් ඇති අවස්ථා විරල නිසා මෙම ගමේ ඇතැම් පිරිස් ව්‍යාපාරික කටයුතුවලට සහ විදේශ රටවල ගෘහ සේවයට යොමු වී ඇත.

සිතියම් අංක 02: ශ්‍රී ලංකාවේ රොඩී ගම්මානවල ව්‍යාප්තිය 1911

1 මාච්ළිය
2 ගනේගොඩ
3 කහටවෙල
4 සියඹලාකඩවල
5 ලෝකුරුගම
6 පනාවේල්ල
7 දිගනවෙල
8 හිරුවෙල
9 කලල්පිටිය
10 කොස්කොටේ
11 අම්පිටිය
12 උඩුගල්පිටිය
13 හුනුවෙල
14 කූරගල
15 හම්බුළුව
16 මීගස්පිටිය
17 ගල්මුල්ල
18 කුමාරපිටිය
19 මීපනාව
20 මස්පන්නාගම
21 සොරානතොට
22 කඳවින්න
23 වටගොඩ
24 කොස්ගම
25 පිටදෙනිය
26 කටගොඩ
27 දිවිතොටවෙල
28 කලාපිටිය
29 අත්ගලපිටිය
30 මටිපිඹියාගම
31 කබිල්ලවෙලගම
32 උඩවර
33 උඩගම
34 ගල්බොඩ
35 මල්වල
36 වරණියගොඩ
37 තලාපිටිය
39 දික්පිටිගොඩ
40 විල්හේන
41 මොරතොට
42 දිගාදුර
43 වතුපිටිය



විවාහය ගැන සලකන විට බොහෝ විවාහ සිදු වී ඇත්තේ ගම තුළ නැතහොත් රොඩී කුලයට අයත් වෙනත් ගම් සමගය. කෙසේ නමුත් දුර බැහැර වෙළඳාමට යන කූරගල ඇතැම් පිරිමින් වෙනත් කුලවල කාන්තාවන් සමග ප්‍රේම සම්බන්ධතා ඇති කරගෙන පසුව විවාහ වී ඇත. එවැනි බිරින්දෑවරු එක් අයෙකු ගොවි කුලයෙන් ද, දෙදෙනෙකු බත්ගම කුලයෙන් ද, තවත් දෙදෙනෙකු අවිනිශ්චිත කුල පසුබිම්වලින් ද පැමිණ ඇත. ඔවුන් සෑම දෙනාගේම පාහේ මුල් ගම් සමග ඇති සම්බන්ධය බොහෝ දුරට බිඳ වැටී ඇත. සෙසු පීඩිත ගම්වල මෙන්ම මේ ගමේ තරුණ පරම්පරාව තම කුල තත්වය හෙළිවන නම් වෙනුවට නවීන පන්නයේ නම් ලබා ගෙන ඇත. කූරගල වැසියන් බොහෝ දෙනා බෞද්ධයෝ වෙති. එසේ නමුත් මොවුන් ප්‍රදේශයේ පන්සල් සමග ඇත්තේ ගැටලු සහගත සම්බන්ධයකි. යාබද ගම්වල ඇති පන්සල් සියල්ල ඉහළ කුලවල භික්ෂූන්ගෙන් සමන්විතය. ඔවුහු අවමඟුල් කටයුතු සඳහා කූරගල ගමේ නිවාසවලට නොපැමිණෙති. මේ නිසා අවමඟුල්වලදී ඈත ප්‍රදේශවල සිට මහ සංඝයා රැගෙන ඒමට ගම්වැසියන්ට සිදු වී ඇත. එමෙන්ම අවට ගම්වල ඇති ඇතැම් පන්සල්වල ඉදිකිරීම් කටයුතුවලට පවා කූරගල පොහොසත් ව්‍යාපාරිකයන් දායක වී ඇති නමුත් එම පන්සල්වල දහම් පාසැල්වලට ගමේ දරුවන් තවමත් භාර ගන්නේ නැත. මේ කරුණු සලකා ගමේ පවුල් හතරක් කිතු දහම වැළඳගෙන ඇත.

කූරගල වැසියන් අවට ගම්වල වැසියන් සමග ඇති සමාජ ඇසුර සීමා සහිතය. විවාහ උත්සව, අවමඟුල් යනාදියට පිටස්තර ගම්වැසියන් සහභාගී වන්නේ කලාතුරකිනි. මෙම ගම තුළ සහ අවට ප්‍රදේශයේ ශීඝ්‍ර සමාජ වෙනසක් සිදුවෙමින් පවත්නා නමුත් කුලය මත සිදුවන සමාජ කොන් කිරීම් යම් තරමකට හෝ තවදුරටත් සිදුවන බව පෙනේ.

අවසාන වශයෙන් සිංහල කුල ක්‍රමයේ අස්පර්ශනීයත්වය තහවුරු වී නැති නමුත් පාරම්පරික වශයෙන් වරප්‍රසාද නොලත් පිරිස් රාශියක් සිටිති. එබඳු කුලවල අය අතර ඉඩම්වලට ඇති අයිතිය සීමිත වේ. දරිද්‍රතාව ඉහළ මට්ටමක පවතී. ඉහළ නැගීමට ඇති අවස්ථා සීමිතය. රාජ්‍ය තන්ත්‍රය සමග ඇති සම්බන්ධය දුර්වලය. පානීය ජලය වැනි මූලික අවශ්‍යතාවන් කුලය නිසා ඔවුන්ට ඇහිරී නැති නමුදු රාජ්‍යයෙන් සැපයෙන "නිදහස් අධ්‍යාපනය" යම් තරමකට ඔවුන්ගෙන් ඇහිරී ඇත. යටත් විජිත යුගයේ සිට පහතරට කුල ඇතුළු මැද මට්ටමේ කුල අධ්‍යාපනය, වෘත්තීන් හා ව්‍යාපාර හරහා සමාජයේ ඉහළ නැගීමට සමත් වූ බව නොරහසකි (Roberts 1984, Kulasekere 1984, Kannangara 1993). කෙසේ නමුත් බොහෝ සේවා කුල සහ පීඩිත කුල එබඳු ඉහළ නැගීමේ අවස්ථාවලින් වාසි ලබා ගැනීමට අසමත් වී ඇත.

මෙම අධ්‍යයනයෙන් පැහැදිලි වූයේ සිංහල සමාජයේ කොන්වීමට ලක් වූ කුල සංඛ්‍යාවෙන් කුඩා, භූගෝලීය වශයෙන් විසිරුණු, සංවිධානමය වශයෙන් දුර්වල හා දේශපාලන වශයෙන් ඒකරාශි නොවූ පිරිසක් වන බවය. "පීඩිත" කොටසට අයත් වන්නේ සිංහල ජනගහනයෙන් 1% කට අඩු පිරිසකි. සෙසු සේවා කුලද මෙයට එක්

කළ විට ජනගහන ප්‍රතිශතය 30% ක් පමණ වේ යැයි අනුමාන කළ හැක. කෙසේ නමුත් සමාජ ප්‍රතිපත්ති සම්පාදනයේදී සහ සුබසාධන වැඩසටහන්වලදී මෙම පිරිස් කෙරෙහි විශේෂ අවධානයක් යොමු වන්නේ නැත. අනෙක් අතට මෙවැනි කුල පසුබිම්වලට අයත් අසහනයට පත් තරුණ පිරිස් 1970 ගණන්වල සහ 1980 ගණන්වල ජනතා විමුක්ති පෙරමුණ වටා ඒකරාශී වී විප්ලවීය දේශපාලන අරගලයක් කෙරෙහි යොමු වූ බව අප විසින් අමතක නොකළ යුතුය (Moore 1993, Chandraprema 1991, Jiggins 1974). ඇතැම් නිරීක්ෂකයන් විශේෂයෙන්ම සිංහල සමාජය තුළ කුලය අභාවයට පත්වෙමින් ඇතැයි කල්පනා කරන නමුත් ආනුභාවික තොරතුරු විමසන විට යථාර්ථය වඩා සංකීර්ණ බව පෙනේ.

හතරවන පරිච්ඡේදය

යුද්ධයෙන් විනාශ වූ යාපන සමාජයේ කුල-පාදක කොන් කිරීම්

පරම්සෝති තන්ගේස්
කාලිංග ටියුඩර් සිල්වා

පසුබිම

වාර්තාගත ඉතිහාසය පුරාම කුලය යාපන සමාජයේ වැදගත් සමාජ සංවිධාන මූලධර්මයක් විය. යාපනයේ කුල ක්‍රමය යම් යම් කරුණු අතින් සිංහල කුල ක්‍රමයට සමානය. සිංහලයන් අතර ගොවිගම කුලයට ලැබී ඇති තත්වයට සමානව ඉඩම් හිමි වෙල්ලාල කුලයට ලාංකික දෙමළ ජනයා අතර ප්‍රමුඛස්ථානයක් ලැබී ඇත. මධ්‍යම තලයට අයත් කරයර් වැනි කුල සිංහල සමාජයේ කරාව වැනි කුලවලට සමානය. එමෙන්ම නිත්‍ය පාරම්පරික සේවා පැවරුනු කුල මඟින් ප්‍රමුඛ කුලයට විවිධ සේවා සැපයීම අනිවාර්යය විය.

යාපන කුල ක්‍රමයෙහි විශේෂත්වය වූයේ පවිත්‍රත්වය සහ කිල්ල පිළිබඳ අදහස් දෛනික හින්දු භාවිතයන් සහ සමාජ ආර්ථික ධුරාවලිය කෙරෙහි සෘජු බලපෑමක් සිදු කිරීමය. ඉඩම් හිමි වෙල්ලාල කුලයට බොහෝ හින්දු ආගමික පිළිවෙත් සහ පූජ්‍ය ස්ථාන කෙරෙහි අධිපතිවාදී පාලනයක් හිමි විය. එමෙන්ම ශ්‍රමික කුලයන් දාසයන් මෙන්ම අපවිත්‍ර අශුද්ධ පිරිස් ලෙස හඳුනාගනු ලැබිණ. මේ මඟින් ප්‍රමුඛ කුලයට කෘෂි ආර්ථිකය තුළ, පුද පූජා පද්ධතිය තුළ සහ සමාජය තුළ බලවත් ස්ථානයක් හිමි විය. අනෙක් අතට වරප්‍රසාද අහිමි කුලහීනයන් අවාසිදායක වහල් තත්වයක පසු විය. යටත් විජිත අවධියේදී ඉදිරිපත් වූ අධ්‍යාපන, රැකියා සහ ඉහළ නැගීමේ අවස්ථා සියල්ල වෙල්ලාල පවුල් සිය වාසියට හරවා ගත් බැවින් මෙම අවධියේදී කුල ක්‍රමය වඩාත් තහවුරු වීමක් සහ කුල විෂමතා වඩාත් තීව්‍ර වීමක් සිදු විය (Pfaffenberger 1982, 1990). යටත් විජිත යුගයට අයත් යාපන සමාජය පිළිබඳ පතපොත බොහොමයක් වෙල්ලාල කතුවරුන් එසේත් නැත්නම් වෙල්ලාල අය විසින් දැනුවත් කළ යුරෝපීය කතුවරුන් විසින් රචිත කෘති විය. එබැවින් එම ලිපි ලේඛනවල කුල පීඩිතයන්ගේ දුෂ්කරතා ගැන සඳහන් වූයේ විරල වශයෙනි.

කුල ක්‍රමයට එරෙහි මුල් විරෝධතා යාපන අර්ධද්වීපයේ ඉස්මතු වූයේ 1920 දශකයේදීය.[11] කුල පීඩනයට ලක් වූ අය ඔවුන් කෙරෙහි වූ විවිධ සම්බාධකවලට එරෙහිව පෙළ ගැසීම ක්‍රමයෙන් සිදු විය. එම විරෝධතා විවිධාකාර විය. එනම් ආගමික, දේශපාලන සහ සිවිල් සමාජ යනාදී අංශවලිනි. මෙම විරෝධතා මැඬලීමට වෙල්ලාල නායකයන් ප්‍රචණ්ඩකාරී ක්‍රමෝපායන් උපයෝගී කරගත්හ. පීඩිත කුලවලට මෙම අරගලවලින් ඔවුන්ගේ සමහර ඉල්ලීම් දිනා ගත හැකි විය. නමුත් ස්වකීය ජනතාව අතර අභ්‍යන්තර මතභේද ඉවතලා ජාතියක් ලෙස එක්සත් කරනු වස් දෙමළ ජාතික ව්‍යාපාරය බිහි වීම නිසා 1960 ගණන් වනතුරුම කුල-පාදක අසාධාරණකම්වලට විරුද්ධව පැවති සමාජ අරගලය යටපත් වී සිංහල අධිපතිවාදී රාජ්‍යයෙන් සමස්ත දෙමළ ජනයාට සිදු වූ අකටයුතුකම්වලට එරෙහිව දෙමළ ජනයා ඒකරාශි කොට සංවිධානගත කිරීම සිදු විය. පෆෙන්බර්ගර් (1990) විසින් දෙමළ ජාතික ව්‍යාපාරය 'ආරක්ෂාකාරී ජාතික ව්‍යාපාරයක්' (Defensive Nationalism) ලෙස හැඳින්වූයේ, පීඩිත කුලවලින් ක්‍රමයෙන් නැගී ආ උද්ඝෝෂණ ව්‍යාපාර යටපත් කොට සිංහල අධිපතිවාදී රාජ්‍යයට එරෙහි අරගලයක් බවට එය පරිවර්තනය කිරීම නිසාය. ප්‍රධාන වශයෙන් මෙම ආරක්ෂාකාරී ජාතික ව්‍යාපාරය ද පාර්ලිමේන්තු දේශපාලන රාමුව තුළ වෙල්ලාල කුලයේ නායකත්වය විසින් නිර්වචනය කොට සංවිධානගත වූ අතර යාපන සමාජය තුළ ඒ වන විටත් විවිධ ස්වරූපයෙන් පැවති කුල-පාදක ගැටුම් අඩපණ කිරීමට මේ මඟින් ඔවුන්ට හැකි විය. දෙමළ සටන්කාමී කණ්ඩායම්වල උච්ච අවස්ථාව ලෙසින් දෙමළ ජාතික ව්‍යාපාරයේ පෙරමුණු බලමුළුව වූ දෙමළ කොටි සංවිධානය බිහි වීමත් සමග මෙම තත්වය ක්‍රමයෙන් වෙනස් විය. බොහෝදුරට, මෙම තත්වය යාපන සමාජයේ වෙල්ලාල අධිපතිවාදයේ බිඳ වැටීමට හේතුකාරක වූ නමුත්, උද්ගත වූ තත්වයන් දෙමළ ජනයාගේ වරප්‍රසාද නොලත් කුල කණ්ඩායම්වලට සිදුවන අයුක්තීන් පිළිබඳ කෙසේ ප්‍රතිචාර දැක්වූයේද යන්න තවදුරටත් විග්‍රහ කළ යුතු කාරණයකි. දෙමළ කොටි සංවිධානය කුල විමුක්තිය සඳහා නොව ජාතික විමුක්තිය සඳහා කැප වූ ව්‍යාපාරයකි. සංවිධානයේ නායකත්වය වෙල්ලාල නොවන කුලයකින් නියෝජනය වූ නමුත්, එම නායකත්වය කුල-පාදක අයුක්තීන්ට එරෙහිව ප්‍රසිද්ධියේ සටන් කිරීමට හෝ කුලය ගැන සඳහන් කිරීමට පවා අකමැති වූ බවක් පෙනේ.[12] LTTE යේ මෙම උපක්‍රමය මඟින් සිදු වී ඇත්තේ සැබෑ සමාජ යථාර්ථය

---

11 විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් නම් කුල විරෝධී දේශපාලන අරගල ඉන්දියාවේ ඇරඹීමටත් ප්‍රථම යාපනය තුළ එවැනි අරගල මතුවීමය. කෙසේවුවත් යාපනයේ කුල විරෝධී අරගල සුවිශේෂී ඉලක්කයක් කරා ඉදිරියට ගමන් නොකළ අතර ඊට හේතු වූ කරුණු මෙම පරිච්ඡේදයේ ඉදිරි කොටස්වලදී විග්‍රහ වනු ඇත.

12 LTTE ක්‍රියාකාරකයන් නිතරම 'පහළ කුලවල' ව්‍යාපාරයක් ලෙස ඔවුන් ගැන සඳහන් කිරීම ප්‍රතික්ෂේප කරන ලදි. 2002 යාපනය විශ්වවිද්‍යාලයේ පැවති සම්මන්ත්‍රණයකට සහභාගීවූවන් ව්‍යාපාරය තුළ පහළ කුලවල මුල් තිබිය හැකි බව ප්‍රකාශ කළ විට, LTTE හිතවාදී ශිෂ්‍යයෙක් ප්‍රචණ්ඩකාරී ලෙස එම ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්නා ලෙස එය ඉදිරිපත් කළ අයට පැවසුවේය. (මෙම අවස්ථාවට සහභාගී වූ ප්‍රමුඛ පෙළේ පර්යේෂකයෙකු සමඟ කළ පෞද්ගලික අදහස් හුවමාරුවකිනි).

සඟවාලීමක් මිස කුල අසමානතා අහෝසි වීමක් නොවේ. අනෙක් අතට කෙදිනක හෝ යාපන සමාජයේ යළි සාමය ස්ථාපිත වූ විටෙක, පවත්නා රාජ්‍ය පාලනය කෙබඳු වුවත් කුමන දේශපාලන හා සමාජ න්‍යායන් ප්‍රසිද්ධියේ ක්‍රියාත්මක වුවත් කුලය නැවත වතාවක් නැගී සිටිනු නොඅනුමානය.

මෙම සංකීර්ණ වාතාවරණය යටතේ යාපන සමාජයේ පවතින කුල-පාදක වෙනස්කම් කිරීම්වල ස්වභාවය හා ප්‍රමාණය විග්‍රහ කරනු වස්, යාපන සමාජයේ කුල ව්‍යූහය පිළිබඳ විශ්ලේෂණයකින් ආරම්භ වී, යුද්ධය හේතුවෙන් වරප්‍රසාද නොලත් කුල කණ්ඩායම්වල තත්වය, අවතැන් වූ ජනයා සහ උතුරු පළාත් දෙමළ ජනයා කෙරෙහි LTTE යේ බලපෑම පරීක්ෂා කිරීම දක්වා මෙම පරිච්ඡේදය ඉදිරියට විකාශනය වනු ඇත. යාපන සමාජයේ කුල-පාදක වෙනස්කම් කිරීමේ ගැටලුව පිළිබඳ සොයා බැලීමේදී, පවතින ආරක්ෂක තත්වය හේතුවෙන් පීඩිත ජන කොටස් අතර කිසිදු මානව වංශ අධ්‍යයනයක් කිරීමේ නොහැකියාව දත්ත එක්රැස් කිරීමේදී අප මුහුණ දුන් ප්‍රධානතම ගැටලුවයි. ශීඝ්‍රගාමී ක්ෂේත්‍ර අධ්‍යයන සහ පවතින දත්ත ආශ්‍රයෙන් මෙම විශ්ලේෂණය කිරීමට මෙහිදී උත්සාහ දරා ඇත.

යාපන සමාජයේ කුල සංයුතිය

යාපනයේ කුල ක්‍රමය තුළ සුවිශේෂතා කිහිපයක් දැකිය හැකිය. මුලින්ම අප පැහැදිලිව අවබෝධ කරගත යුත්තේ, දකුණු ඉන්දියාවේ කුල ක්‍රමයට වඩා තරමක් වෙනස් ස්වරූපයක් යාපනයේ කුල ධුරාවලිය තුළ දැක ගත හැකි බවයි. ඉන්දියානු කුල ක්‍රමයේ අනුපිළිවෙළ තුළ ඉහළින්ම සිටින්නේ බ්‍රාහ්මණ වංශය වන නමුත් යාපන සමාජයේ කුල ධුරාවලිය තුළ ඉහළින්ම සිටින්නේ වෙල්ලාල කුලයයි. වෙල්ලාලවරුන් විසින් සිය කෝවිල්වල පුද පූජා පිළිවෙත් ඉෂ්ට කිරීමට ඉන්දියාවෙන් බ්‍රාහ්මණයන් ගෙන්වා ගනු ලැබිණි. වෙල්ලාලවරුන් විසින් බ්‍රාහ්මණයන්ට කෝවිල්වල රැකියාව ලබා දුන් අතර, බ්‍රාහ්මණයෝ වෙල්ලාල ඉඩම් හිමියන් වෙනුවෙන් සේවය කළහ. යාපනයේදී බ්‍රාහ්මණ කුලය වෙල්ලාල කුලයට සාපේක්ෂව තරමක් පහළ මට්ටමකින් සලකන ලදි (Pfaffenberger 1982).

යාපන සමාජයේ 'කුල ඇතුළත කුල' සංකල්පයක් පැවතුණි. වෙනත් වචනවලින් කිවහොත්, එකම කුල කණ්ඩායම තුළ වුවද ධුරාවලිගත පිළිවෙළක් තිබුණි. සෑම කුලයක් තුළම ධුරාවලිගත උප කුල අන්තර්ගත විය. උදාහරණයක් ලෙස, වෙල්ලාල කුලය තුළ සමාජ තත්වය අතින් එකිනෙකට වෙනස් අහම්පඩියාර්, මඩප්පල්ලි, තනකාරර්, උල්ලූර් චෙට්ටිමාර්, චෙම්පු ඒඩා වෙල්ලාලන් යනාදි වූ උප කුල කිහිපයක් විය. කරයර් කුලය තුළ තමිලර්, මුක්කුවර් යන උප බෙදීම් හඳුනා ගත හැකිය. පල්ලර් කුලය තුළ මරම්මරිහල්, ෂෙරුප්පුකට්ටිහල්, වර්කුන්දිපල්ලර් යන උප කුල දැක ගැනීමට පුළුවන. සයිමන් කාසි චෙට්ටි (Simon Casie Chetti 1934) ශ්‍රී ලාංකික දෙමළ කුල ක්‍රමය තුළ උප බෙදීම් ද අන්තර්ගත වූ විට කුල 65

කට අධික වන බව දෙමළ කුල පිළිබඳ ඔහු විසින් රචිත 'Caste, Customs, Manners and Literature of the Tamils' ග්‍රන්ථයේ සඳහන් කොට ඇත. උප කුල බද්ධ වීම නිසා කුල සංඛ්‍යාවේ අඩු වීමක් සිදු විය හැකිය (Sivathamby 2005). ඩේවිඩ් (1974a, 1974b) සහ පෆෙන්බර්ගර් (1982) ගේ අධ්‍යයනවලදී යාපන සමාජයේ ප්‍රධාන කුල 20 ක් හඳුනාගෙන ඇත. ඒවා නම් වෙල්ලාල, බ්‍රාහ්මණ, සයිව කුරුක්කල්, පන්ඩාරම්, සිප්පාචාරි, කෝවියාර්, තට්ටාර්, කරයර්, වන්නර්, තචාර්, කොල්ලාර්, නාට්ටුවර්, කයිකුලාර්, කන්තාර්, කුකුවාර් (කුයාවර්), මුක්කුවර්, වන්නර්, අම්පට්ටර්, පල්ලර්, පරයර් යන කුල වේ. මෙම කුල කණ්ඩායම්, ඔවුන්ගේ සාම්ප්‍රදායයික වෘත්තීන් හා ඔවුන්ගේ "අඩිමෙයි-කුඩිමෙයි" (ගෘහස්ථ සේවක හා වහල්භාවය) තත්වය අනුව වගු අංක 4.1 න් දැක්වේ.[13]

ශ්‍රී ලංකාවේ සෙසු ප්‍රදේශවල මෙන්ම යාපන සමාජයේද ඒ ඒ කුලවල ජනගහන ප්‍රමාණය පිළිබඳ නිවැරදි තොරතුරු සොයා ගැනීම දුෂ්කරය. උසස්ම කුලය වන වෙල්ලාල කුලය යාපන අර්ධද්වීපයේ මුළු ජනගහනයෙන් 50% ක් පමණ වන බව මානව වංශ විද්‍යාඥයන් දෙදෙනෙකු (Kenneth David and Michael Banks) විසින් 20 වන සියවසේ මැද භාගයේදී කළ පර්යේෂණවලින් හෙළිදරව් කොට ඇත. අනෙකුත් කුල ගත් විට, කරයර් 10% ක් ද, කෝවියර් 7% ක් ද, පල්ලර් 9% ක් ද, නලවර් 9% ක් ද, අනෙක් කුල 13 ම ගත් කල අර්ධද්වීපයේ මුළු ජනගහනයෙන් 3% ක් වත් ඉක්මවා නොයන බව ගණනය කොට ඇත.

ඩේවිඩ් (1973a, 1973b, 1974a, 1974b), පෆෙන්බර්ගර් (1982, 1990), ආරුමනිනායගම් (1979, 2000) සහ සිවතම්බි (2005) වැනි වියතුන් යාපන සමාජයේ කුල වර්ගීකරණය පිළිබඳව විවිධ ආකාරයෙන් විග්‍රහ කොට ඇත. උදාහරණ ලෙස ඩේවිඩ් (1973: 36) යාපනයේ කුල,

1. ඉහළ කුල (High Caste),
2. හොඳ කුල (Good Caste),
3. පහළ කුල (Low Caste)

ලෙස ප්‍රභේද තුනකට වර්ග කොට ඇත. සිවතම්බි විසින්

1. ඉහළ කුල (High Caste),
2. අතර මැදි කුල (Non-High Caste / Intermediate Caste),
3. කුඩිමෙයිහල් කුල (Domestic Servants)

ලෙස කුල ප්‍රභේද තුනක් දක්වා ඇත.

---

13 ශ්‍රී ලංකාවේ නැගෙනහිර කුල ක්‍රමය පිළිබඳ විස්තර කිරීමේදී McGilvray (2008) විසින් කරණවෑමින්, රෙදි සෝදන අය හා බෙරකරුවන් ඉහළ කුලවල නිවෙස්වල විශේෂ ගෘහස්ත වගකීම් දරන ගෘහස්ත සේවා කුල (අඩිමෙයි) ලෙස හඳුනාගෙන ඇත. මෙම කුල, කුලය නොසලකා ගාස්තු මත සේවාදායකයන්ට සේවය සපයන රා මදින්නන්ගේ කුලය වැනි කුලවලින් වෙනස් වේ.

වගු අංක 4.1

යාපන සමාජයේ කුල

	දෙමළ නාමය	සාම්ප්‍රදායයික වෘත්තිය	අඩිමෙයි-කුඩිමෙයි තත්වය
ස්පර්ශනීය කුල	පිරාමනර් (Brahmin)	කෝවිල්වල බ්‍රාහ්මණ පූජකවරු	-
	සයිව කුරුක්කල් (Saiva Priest)	කෝවිල්වල බ්‍රාහ්මණ නොවන පූජකවරු	-
	වෙල්ලාල	ඉඩම් හිමි /ගොවි	-
	පන්ඩාරම්	කෝවිල්වල අත්උදව්කරුවන්	-
	සිප්පාචාරි	කෝවිල්වල ප්‍රතිමා නෙළීම	-
	කෝවියර්	ගෘහස්ථ සේවකයන්	අඩිමෙයි
	තට්ටාර්	රන්කරුවන්	කුඩිමෙයි
	කරයර්	ගැඹුරු මුහුදේ මසුන් මැරීම	-
	තචර්	වඩු කර්මාන්තය	කුඩිමෙයි
	කොල්ලර්	කම්මල්කරුවන්	කුඩිමෙයි
	නට්ටුවර්	මංගල අවස්ථාවල සංගීතය සැපයීම	-
	කයිකුලාර්	විවීම	-
	සාන්ඩාර්	තෙල් නිෂ්පාදනය	-
	කුකුවර්/ කුයවර්	මැටි භාණ්ඩ නිෂ්පාදනය	කුඩිමෙයි
	මුක්කුවර්	කළපුවේ මසුන් මැරීම	-
	වන්නර්	රෙදි සේදීම	කුඩිමෙයි
අස්පර්ශනීය කුල	අම්පට්ටර්	කොණ්ඩ කැපීම	කුඩිමෙයි
	පල්ලර්	නිත්‍ය කම්කරු	අඩිමෙයි
	නලවර්	නිත්‍ය කම්කරු	අඩිමෙයි
	පරයර්	බෙර වාදකයන්	කුඩිමෙයි

ඩේවිඩ්ට අනුව ඉහල කුල ගණයට වෙල්ලාල, බ්‍රාහ්මණ, සයිව කුරුක්කල්, කෝවියර් සහ සයිව චෙට්ටි යන කුල අයත් වන නමුත්, සිවතම්බිගේ (2005: 10) වර්ගීකරණය තුළ වෙල්ලාල සහ බ්‍රාහ්මණ කුල පමණක් උසස් කුල ගණයට වැටේ. යාපන කුල ධුරාවලියේ කැපී පෙනෙන වෙනසක් ලෙස 'කුඩිමෙයිහල්' සහ 'අඩිමෙයිහල්' අතර වෙනස දැක්විය හැකිය. විවිධ උගතුන් විවිධ නිර්ණායක ඔස්සේ මෙම 'කුඩිමෙයිහල්' සහ 'අඩිමෙයිහල්' යන කුල වර්ගීකරණය කොට ඇත. උදාහරණයක් ලෙස සිවතම්බි පෙන්වා දුන් පරිදි ලන්දේසි ආණ්ඩුවේ තක්සේරුව අනුව කෝවියර්, නලවර්, පල්ලර්,

සාන්ඩාර් සහ සේවියාර් යන කුල 'කුඩිමෙයිහල්' කුල ගණයට අයත් වේ. අනෙක් අතට ඩේවිඩ් (1973b) සහ පෆෙන්බර්ගර් (1982) ගේ විග්‍රහයට අනුව කෝවියර්, පල්ලර්, නලවර් යන කුල 'අඩිමෙයිහල්' ගණයට අයත් වන අතර තට්ටාර්, තචර්, කොල්ලර්, කුකුවර්, අම්පට්ටර්, පරයර් වැනි අනෙකුත් කුල 'කුඩිමෙයිහල්' කාණ්ඩයට අයත් වේ. මේ හා සමානව යාපන කුල ක්‍රමයේ ස්පර්ශනීය හා අස්පර්ශනීය කුල අතර වෙනස පිළිබඳ විමසා බැලිය හැකියි. වගු අංක 4.1 අනුව අම්පට්ටර්, පල්ලර්, නලවර් සහ පරයර් යන කුල අස්පර්ශනීය යටතට ගැනෙන කුල කණ්ඩායම් වේ. වන්නර් (රෙදි සෝදන අය) කුලය ස්පර්ශනීය ගණයේ ලා සැලකුවේ සාම්ප්‍රදායිකව ඔවුන්ට කෝවිල්වලට ඇතුළු වීමට ඉඩ ලැබුණු නිසාවෙනි. බෑන්ක්ගේ විග්‍රහයට අනුව වන්නර්වරු ස්පර්ශනීය ගණයේ ලා සැලකූ හෙයින් ඔවුන්ට කෝවිල්වලට ඇතුළු වීමට ඉඩ ලැබුණු අතර කොණ්ඩා කපන (අම්පට්ටර්) අයට කෝවිල්වලට ඇතුළු වීමට ඉඩ නොලැබුණේ ඔවුන් අස්පර්ශනීය ගණයේ ලා සැලකූ හෙයිනි. යාපනයේ ජනතාව විසින් නිසැකව හඳුනාගත් පරිදි මෙම ක්‍රමය සාමාන්‍ය දකුණු ඉන්දියානු රටාවට වෙනස්ය. වර්තමාන යාපන සමාජයේ අස්පර්ශනීයත්වය නොපවතින බව සාමාන්‍ය අදහසයි. යාපනයේ වර්තමාන තත්වය අනුව 'අස්පර්ශනීයත්වය' යන හැඟීම දුර්වල එමෙන්ම බොහෝදුරට දෙමළ ජනයා අතර ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවන ආයතනයක්ය යන මතයට එකඟ වීමට අපට සිදුවේ.

යුද්ධය හේතුවෙන් පසුගිය දශක කිහිපය තුළ යාපන සමාජයේ කුල ක්‍රමයේ බොහෝ වෙනස්කම් සිදු විය. විශාල ජනගහනයක් අවතැන් විය. කුලය පිළිබඳ විවෘත සාකච්ඡා කිරීමට විරුද්ධව LTTE යෙන් තහංචි පැනවිණි.[14] මේ කාලය තුළදීම මිනිසුන්ගේ සමාජ ආර්ථික සංස්කෘතික ජීවිතය තුළ එක් අංශයකින් හෝ වෙනත් ආකාරයකින් කුලය ක්‍රියාත්මක වන බවක් ද දිස්වේ.

අස්පර්ශනීයත්වය පිළිබඳ මතවාද සහ එහි ක්‍රියාකාරිත්වය

ශ්‍රී ලාංකික දෙමළ ජනයා අතර අස්පර්ශනීයත්වය යන්න ආගමිකව තහවුරු වූවකි. යාපන කුල ක්‍රමයේ පහළම ස්තරය, වන්නර් (රෙදි සෝදන අය), අම්පට්ටර් (කොණ්ඩා කපන අය), පල්ලර් (කුලී ශ්‍රමිකයන්), නලවර් (තල් රා මදින අය), පරයර් (මළ බෙර ගසන) යන කුල පහකින් සෑදුණු 'පංචමර්' වරුන්ගෙන් සමන්විත විය. මේ කුල අතරින් අවසානයට සඳහන් වූ කුල හතර යාපන සමාජය තුළ පාරම්පරිකව අස්පර්ශනීය ගණයෙහි ලා සැලකෙන කුල වේ (Raghavan 1953, 1957). බෑන්ක් (1957) සහ ඩේවිඩ් (1974) ගේ අධ්‍යයනවලට අනුව මෙම පීඩිත කුල මුළු යාපන ජනගහනයෙන් 18% ක් පමණ වේ. රඝුනාදන් (2004: 22-23) විසින් 1950 ගණන්වලදී

14 LTTE ය විසින් දැඩි ආකාරයකින් මෙම තහනම ක්‍රියාත්මක කොට නැත. කුල විෂමතාවයන් අවම කිරීමට වඩා කුලය විවෘතව හඳුනාගැනීම අවම කිරීමට මූලිකත්වය ලැබිණි. මෙම මතය යාපන සමාජයේ මෑතකාලීන ක්ෂේත්‍ර අධ්‍යයන අත්දැකීම් ඇති සිද්ධාර්ථන් සහ බහිරති විසින් ද තහවුරු කොට ඇත.

ඉහළ කුලවල ප්‍රභූන් විසින් පංචමර්වරුන්ට පනවා තිබූ චාරිත්‍රමය තහංචි විසිහතරක් ලැයිස්තුගත කොට ඇත.[15] එම තහංචි පහත දැක්වේ.

1. පිරිමින් උඩුකය නොවැසිය යුතුය.
2. 'වේට්ටිය' ඇඳීමේදී වළලුකර මට්ටමට පහතින් නොවැටෙන ආකාරයට එය ඇඳිය යුතුය.
3. පිරිමින් උරහිසේ සාලුවක් නොපැළඳිය යුතුය.
4. ගැහැණුන් උඩුකය නොවැසිය යුතුය.
5. ඔවුන් උත්සව පැවැත්වීමේදී හෝ ශෝකය පළ කිරීමට හෝ කිසිදු සංගීත භාණ්ඩයක් උපයෝගී කර නොගත යුතුය.
6. ඔවුන් මංගල හෝ අවමංගල අවස්ථාවකදී කිසිදු සංගීත භාණ්ඩයක් වාදනය නොකළ යුතුය.
7. ඔවුන් ඉහළ කුලවල අයට අයත් දිය පොකුණු භාවිතා නොකළ යුතුය.
8. ඔවුන් කුඩ පාවිච්චි නොකළ යුතුය.
9. ඔවුන් පාවහන් නොපැළඳිය යුතුය.
10. ඔවුන් අධ්‍යාපනය නොලැබිය යුතුය.
11. ඉහළ කුලවලට අයත් කිසිදු දෙවියෙකුට ඔවුන්ගේ කෝවිල්වල උපහාර නොකළ යුතුය.
12. ඔවුන් ඉහළ කුලවල කෝවිල්වලට ඇතුළු නොවිය යුතුය.
13. ඔවුන්ට තේ කඩවලට ඇතුළු වීමට නොහැකිය.
14. ඔවුන්ට පොදු ළිංවලින් ජලය ලබා ගැනීම තහනම් විය.
15. ඔවුන්ට බයිසිකල්, කාර් ධාවනය කිරීමට හෝ ඒවායේ ගමන් කිරීමට තහනම්ය.
16. ඔවුන්ට බසයක වාඩි වී ගමන් කිරීමට තහනම් ය.
17. ඔවුන්ගේ ළමයි පාසැල්වලට බඳවාගත් පසු ආසනයක වාඩි වී අධ්‍යාපනය ලැබීම තහනම් විය.

යාපනයේ පංචමර්වරුන්ට එරෙහිව පනවා තිබූ මෙම තහංචිවලට ජීවිතයේ හැම අංශයක්ම ඇතුළත් විය. ඇඳිය යුතු ඇඳුම් ගැන මෙන්ම මූලික අවශ්‍යතා වන

15 McGilvray (2008) විසින් අක්කරෙයිපත්තු කලාපය කේන්ද්‍ර කොට ශ්‍රී ලංකාවේ නැගෙනහිර කොටසේ පවතින කුල ක්‍රමය පිළිබඳව විස්තරාත්මක විශ්ලේෂණයක් සපයයි. සන්දර් (රා මදින්නා), වන්නර් (රෙදි සෝදන අය), අම්පට්ටර් (කරණවෑමි) හා චක්කිලියාර් (ඉන්දියානු සම්භවයක් ඇති කසළ ශෝධකයින්) වැනි පහළ කුල පිළිබඳ විමසුමට ලක් කළත්, McGilvray ගේ මෙම මානව වංශ අධ්‍යයනය තුළ කුල-පාදක කොන් කිරීම් පිළිබඳව සීමිත අවධානයක් යොමු වී ඇත.

පානීය ජලය ලබා ගැනීමේ සහ පොදු සේවා ලබා ගැනීම සම්බන්ධවද තහංචි පනවා තිබුණි. වෙනත් විශේෂ අවස්ථාවන්හිදී ද කුල-පාදක වෙනස්කම් කිරීම් ඇති විය. උදාහරණයක් ලෙස යාපනයේ අවමඟුල් අවස්ථාවකදී ගැහැණුන් එකිනෙකා වැළඳගෙන හඬන සිරිතක් තිබුණද, මෙවැනි මොහොතකදී පවා පහළ කුලවල කාන්තාවන්ට ඉහළ කුලවල කාන්තාවන් සමග එකතු වීමට අවසර නොලැබිණ. ඉහළ කුලයේ නිවෙසක අවමඟුල් අවස්ථාවකදී පහළ කුලවල ගැහැණුන්ට හැඬීම සඳහා වෙනම ස්ථානයක් වෙන් කොට දී තිබුණි. මේ වන විට අස්පර්ශනීයත්වයට එරෙහි සමාජ අරගල හේතුවෙන් ඉහත ලැයිස්තුගත තහංචිවලින් බොහොමයක් අහෝසි වී ඇත.

යාපන සමාජයේ අස්පර්ශනීයත්වයට එරෙහිව නැගුණු අරගල

මෙම සම්බාධකවලට එරෙහිව පංචමර්වරුන්ගේ විරෝධතා 1920 ගණන්වල සිට ආරම්භ විය. 1927 දී පිහිටවූ පීඩිත දෙමළ කම්කරුවන්ගේ සංවිධානය (Forum for Depressed Class Tamil Labourers) පංචමර්වරුන්ට පැනවූ තහංචිවලට එරෙහිව සටන් කිරීමට යොදා ගත් පළමු සංවිධානගත ප්‍රවේශය විය. 1928 දී මෙම සභාව විසින් පාසැල්වලදී පංචමර් දරුවන් මුහුණ දෙන කුල-පාදක වෙනස්කම් කිරීම්වලට එරෙහිව 'පාසැල් තුළ ළමයින්ට ආසන පැනවීම සහ ආහාර පාන ගැනීම අතින් සමානත්වය ඇති කිරීම සඳහා වූ අරගලය' (Equality in Seating and Equality in Eating) දියත් කරන ලදි. අවුරුදු දෙකක පමණ කාලයක් තුළ දැරූ දුෂ්කර ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵලයක් ලෙස, රජයේ පාසැල්වල පහළ කුලවල ළමුන්ට බිම වාඩි වීම වෙනුවට ඉහළ කුලවල ළමුන්ට මෙන් බංකුවල වාඩිවීමට ඉඩ ලබා දෙන අණ පනත් නිකුත් විය. මේ අණ පනත් සම්මත වීම සමගම, ඉහළ කුලවල හින්දුන් මේ සඳහා පළිගත්තේ නව නීතිරීති ක්‍රියාත්මක කළ පාසැල් 15 ක් පුළුස්සා දමමිනි. 1930 දී ඉහළ කුලවල දේශපාලන ප්‍රභූන් සමාන ආසන පැනවීමේ පිළිවෙළ ඉවත් කරන ලෙස ඉල්ලමින් පාසැල් බලධාරීන්ට පෙත්සම් යැවූ නමුත් මතු වූ ප්‍රවණතාව ආපසු හැරවීමට එම උපක්‍රම සාර්ථක නොවීය.

1931 ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ සර්වජන ඡන්ද බලය හඳුන්වා දුන් විට, වෙල්ලාල කුලය නියෝජනය කළ ප්‍රමුඛ දේශපාලන නායකයන් වූ එස්. නඩේසන් වරප්‍රසාද නොලත් කුල කණ්ඩායම්වලට ඡන්ද බලය ප්‍රදානය කිරීමට එරෙහිව හඬ නැගූහ. සර්ව ජන ඡන්ද බලය හේතුවෙන් වැරදි පුද්ගලයන් අතට බලය ලැබීම වළක්වාලනු වස්, ඔහු ප්‍රමුඛව බොහෝ පිරිසක් පහළ කුලවලට ඡන්ද බලය ලැබීමේ අයිතිය අහිමි කිරීම පිණිස ස්වකීය ඡන්ද හිමිකම අත්හරින්නට පවා සූදානම් වූහ. වෙල්ලාල නායකයන්ගේ ඉල්ලීම් පසෙකලා සර්වජන ඡන්ද බලය ස්ථාපිත කළ විට, ඉහළ කුල ඊට එරෙහිව පළි ගත්තේ පංචමර්වරුන්ට තවදුරටත් දැඩි තහංචි පනවමිනි. 1943 දී 'උතුරු ලංකාවේ සුළුතර දෙමළ මහා සභාව' (Nothern Sri Lakan Minority Tamil Mahasaba) වැනි සංවිධාන බිහි වීමට මෙවැනි පංචමර්වරුන්ට එරෙහිව සිදු

වූ අසාධාරණකම් මූල බීජ වූ බව කිව යුතුය. මෙම සංවිධානය විසින් පහළ කුලවල පිරිස් වෙනුවෙන් ව්‍යවස්ථාවෙන්ම වෙන් කළ සුවිශේෂ වරප්‍රසාද ලබා ගැනීම ඇතුළු පීඩිත කුලවල හිමිකම් දිනා ගැනීමට අරගල රැසක් දියත් කරන ලදි.

ආර්ථික, දේශපාලනමය, දෘෂ්ටිවාදිමය වශයෙන් යාපන සමාජය තුළ ඒ වනවිට මුල් බැස ගෙන තිබූ වෙල්ලාල ආධිපත්‍යය බිඳ දමා පංචමර්වරුන්ට ස්වකීය අයිතිවාසිකම් තහවුරු කර ගැනීම එතරම් පහසු කාර්යයක් නොවීය. 1950 වන විට පංචමර්වරුන්ගෙන් බොහොමයක් ඉහළ කුලවල සාම්ප්‍රදායයික නායකත්වයට ගැති වූ දෙමළ කොංග්‍රසයට ප්‍රතිපක්ෂව මතු වූ තමිල් අරසු පක්ෂය (Tamil Arasu Party) වටා එක්රොක් වූහ. 1957 දී 'සමාජ අසාධාරණ වැළැක්වීමේ පනත' (Prevention of Social Disabilities Act) සම්මත කර ගැනීමට තමිල් අරසු පක්ෂයේ සහයෝගය නොමඳව ලැබුණි. 1958 ඔක්තෝම්බර් මාසයේදී සුළුතර දෙමළ සභාව විසින් තමිල් අරසු පක්ෂයේ සහයෝගය ඇතිව 'තේ කඩවලට ඇතුළු වීමේ අරගලය' දියත් කෙරිණි. නොවැම්බර් මාසය වන විට ඇතැම් මුස්ලිම් තේ කඩවලට ඇතුළු වීමට ඉඩකඩ ලැබීම දක්වා මෙම අරගලය සාර්ථක වූ අතර, කාලානුරූපීව පසු කාලයේදී අනෙකුත් බොහොමයක් තේ කඩවලට ඇතුළු වීමට පංචමර්වරුන්ට ඉඩ අවකාශ සැලසුණි.

ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ සහයෝගය ඇතිව 1968 දී පංචමර්වරුන් විසින් 'කෝවිල්වලට ඇතුළු වීම සඳහා වූ අරගලය' දියත් කරන ලදි (Vegujanan & Ravana 2007). මේ සංසිද්ධිය තුළින් තමිල් අරසු පක්ෂය සහ පංචමර්වරුන් අතර මතභේදකාරී තත්වයක් උද්ගත වූයේ, තමිල් අරසු පක්ෂයේ ඉහළ කුලවල නායකයන් බොහොමයක් මෙම කෝවිල්වලට ඇතුළු වීමේ අරගලයට සහයෝගය නොදැක්වීම හේතුවෙනි. මෙම අරගලයට එරෙහි ඉහළ කුලවල ප්‍රතිචාරය සාහසික මුහුණුවරක් ගත් අතර, දෙපාර්ශවය තුළින්ම ඇති වූ ප්‍රචණ්ඩකාරීත්වය කෝලාහල කිරීම්, දේපළ ගිනි තැබීම් සහ මිනිස් ඝාතන සිදු කිරීම දක්වා වර්ධනය විය. පෆෙන්බර්ගර්ගේ (1990) තර්කයට අනුව නම්, දෙමළ ප්‍රජාව තුළ වූ කුලය නමැති පිළිලය තුරන් කිරීමේ අරමුණින් 'දෙමළ ජාතික ව්‍යාපාරය' ක්‍රමයෙන් 'ආරක්ෂාකාරී ජාතික ව්‍යාපාරයක්' බවට පත් වූ අතර, මේ කාලය තුළදීම සිංහල අධිපතිවාදී රාජ්‍ය තුළින් දෙමළ ජනයාට එල්ල වූ විශාල තර්ජන ද මෙයට දායක විය. කෝවිල්වලට ඇතුළු වීමේ අරගලයේ අපේක්ෂිත ප්‍රතිඵල එලෙසින්ම ඉටු නොවූ බව අරගලයට ඉක්බිති ඇතිවූ තත්වයෙන් පැහැදිලි වේ. මාවිද්දපුරම් වැනි ප්‍රධාන හින්දු කෝවිල් ආගමික චාරිත්‍ර වාරිත්‍ර ඉටු කිරීමට පිටත මළුවට පමණක් ඇතුළු වීමට පංචමර්වරුන්ට අවස්ථාව උදා කර දුන් නමුත්, ඇතුළු මළුව තවදුරටත් පංචමර්වරුන්ට තහනම් ප්‍රදේශයක් විය. එම ස්ථානයන්ට පහත් කුලවල අයගේ පැමිණීම කෝවිල්වල පාරිශුද්ධත්වයට හානිකරය යන විශ්වාසය කුලීන හින්දූන් අතර විය.

පංචමර්වරුන්ට එරෙහිව පැනවූ චාරිත්‍රමය තහංචි බොහොමයක් ක්‍රමයෙන් ක්ෂය වූයේ තමන්ට සිදුවන අයුක්තීන්ට එරෙහිව පංචමර්වරුන් තුළ වූ පෙළගැසීම්,

රජයේ හා සිවිල් සමාජයේ මැදිහත් වීම මෙන්ම අධ්‍යාපනයේ දියුණුව ඇතුළු හේතු සාධක ගණනාවක බලපෑමෙනි. 1980 ගණන්වල සිට LTTE ය කුල-පාදක වෙනස්කම් කිරීම් තහනම් කළ අතර, ඒ තුළින් විශේෂයෙන්ම LTTE ව්‍යාපාරය තුළ කුල.පාදක වෙනස්කම් කිරීම් තුරන් කර දමන ලදි.

1980 ගණන්වල සිට උතුරු නැගෙනහිර ප්‍රදේශවල උද්ගත වූ සිවිල් යුද්ධය පොදුවේ දෙමළ කුල ක්‍රමය කෙරෙහිත්, විශේෂයෙන්ම කුල-පාදක වෙනස්කම් කිරීම් කෙරෙහිත් විවිධාකාර බලපෑම් ඇති කළ සිද්ධියක් විය. පළමුව, දෙමළ සටන්කාමීන් නායකත්වය දුන් අරගල සහ සියලුම ද්‍රවිඩයන් ඉලක්ක කොටගෙන රජය විසින් සිදු කළ දේශපාලනමය හා යුධමය ක්‍රියාමාර්ග හේතුවෙන් කුලය නොසලකා හරිමින් ද්‍රවිඩයන් ලෙස එක්සත් විය යුතුය යන හැඟීම දෙමළ ජනයාගේ මනස තුළට කා වැදුණි (Danial and Thangaraj 1994). දෙවනුව, යාපනයේ සිට වන්නිය දක්වා පා ගමනින් ගිය අවතැන් වූ විශාල ජනකාය අතර සිටි විවිධ කුලවල ජනයාට මෙවැනි හදිසි අවස්ථාවන්වලදී එකට එකතු වීමටත් අන්‍යෝන්‍ය වශයෙන් එක්ව කටයුතු කිරීමටත් සිදු විය. මේ නිසා පැවති අර්බුදකාරි තත්වයට අනුකූලව අස්පර්ශනියත්වය හෝ කුල-පාදක වෙනස්කම් කිරීම් ඉදිරියට ගෙන යාම අසීරු විය (Hoole et. al. 1990).

තෙවනුව, මැද මට්ටමේ කුලවල නායකත්වයෙන් බිහි වූ LTTE සංවිධානය ත්‍රස්තවාදී ක්‍රියාදාමයන් තුළින් යාපනයේ සාම්ප්‍රදායයික වෙල්ලාල දේශපාලන නායකත්වය තුරන් කර දැමීමට උත්සුක විය. ඒ සමගම ඉහළ කුලයේ සහ ඉහළ පන්තියේ වෙල්ලාල පවුල් බොහොමයක් යාපනයෙන් පිටත ප්‍රදේශ කරා සංක්‍රමණය වීම් වර්ධනය විය. මෙම සංක්‍රමණ නිසා යාපන සමාජය තුළ දේශපාලන, සමාජමය ශූන්‍යත්වයක් දිස්වූ අතර පෙර මෙන් පීඩිතයන් කෙරෙහි ස්වකීය බලය යළි තහවුරු කර ගැනීමට වෙල්ලාලවරුන්ට නොහැකි විය. අවසාන වශයෙන් LTTE සංවිධානය බිහි වීමේදී එහි නායකයන් වැඩි පිරිසක් පහළ කුලවලින් හෝ අන්තර්මධ්‍යම කුලවලින් පැමිණි අතර එම සංවිධානය සිය පුහුණුවීම් සහ සංවිධානගත වීම් තුළදී කුලය නොසලකා හරින ලදි. මෙවැනි තත්වයන් සහ කුලයට එරෙහිව පැන නැගුණු අරගල හේතුවෙන් සමාජය තුළ කුල ධුරාවලිය බල රහිත අවලංගු වූ ආයතනයක් වී ඇතැයි කිව හැක. කෙසේ වුවත් මේ තත්වයන් සැබෑ ලෙසම කුලය යන සංකල්පය මිනිසුන්ගේ සිත් සතන් තුළින් මකා දැමීමට ඉවහල් වූයේද යන්න පිළිබඳ සාක්ෂි විරලය. විවාහය, චාරිත්‍ර වාරිත්‍ර, හින්දු ආගම වැනි නිත්‍ය සමාජ සංස්ථා තුළ කුලය තවදුරටත් ක්‍රියාත්මක වන බවක් පෙනී යයි. යාපන සමාජයේ වර්තමාන තත්වය අනුව කුලය පිළිබඳ ආනුභවික පර්යේෂණයක් සිදු කිරීම මහත් දුෂ්කර කාර්යයකි. හේතුව, කුලය පිළිබඳව දේශපාලනිකවම නිශ්ශබ්දතාවක් පැවතීම සහ සමාජ දේශපාලන පීඩනයන් හේතුවෙන් කුලය යන්න සැඟවීමට මිනිසුන් උත්සාහ කිරීමය. යාපනයේ ප්‍රධාන අධ්‍යාපනික ආයතනය වන යාපන විශ්ව විද්‍යාලය යාපන සමාජයේ කුලය පිළිබඳ කුමන ආකාරයේ හෝ පර්යේෂණයක් වුව අධෛර්යමත් කරන සුලු ප්‍රතිපත්තියක්

අනුගමනය කරන බව පෙනේ. කුලය ප්‍රතික්ෂේප කරන කුලය නොසලකා හරින මෙම නව ප්‍රවණතාවය දෙමළ ජාතික ව්‍යාපාරයට ආධාරකයක් ලෙසින් යොදා ගනු ලැබේ. ප්‍රභූ පැළැන්තියේ උගතුන් සුළු පිරිසකගේ මෙහෙයවීමෙන්, විශ්වවිද්‍යාලයට කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේදී 'කුලය' වැදගත් සාධකයක් ලෙස සලකා බලන බවට මෙම ආයතනයට චෝදනාවක්ද එල්ල වී තිබේ (යාපන විශ්වවිද්‍යාලයේ උගතුන් පිරිසක් සමග කළ පෞද්ගලික අදහස් හුවමාරුවකින් ලබා ගත් තොරතුරු).

දෙමළ කොටි සංවිධානයේ සමාජ පසුබිම

දෙමළ කොටි සංවිධානයේ සමාජ පසුබිම පිළිබඳ තොරතුරු සොයා ගත හැක්කේ අල්ප වශයෙනි. මයිකල් රොබට්ස් (2005) ට අනුව LTTE යේ ආරම්භක මුල් දශක කිහිපය තුළ එය 'කරයර් නායකත්වයෙන් සහ කරයර් ආධිපත්‍යයෙන් යුතු කණ්ඩායමක්' (A Karaiyar-led and dominated group) විය. උමා මහේෂ්වරන් (වෙල්ලාල කුලයේ අයෙකි) ව්‍යාපාරයේ ඉහළ නිලයකට උසස් වූ විට, ප්‍රභාකරන් සහ ඔහු අතර ඇති වූ තියුණු පෞද්ගලික ගැටුම් හේතුවෙන් ඔහුට LTTE ය හැර යාමට සිදු විය. 1980 මැද භාගයේදී පොන්නම්මා, කර්දීස්, යෝගී සහ රහීම් හැරුනුවිට සාපේක්ෂව LTTE යේ නායකයන් අතර වෙල්ලාල කුලයේ අය විරල විය. ප්‍රභාකරන්, මහත්තයා, කිට්ටු (1993 දී මිය ගියේය.), චාර්ල්ස් ඇන්තනී (1982 දී මිය ගියේය.), වික්ටර් (1988 දී මිය ගියේය.), කුමාරප්පා (1987 දී මිය ගියේය.), බේබි සුබ්‍රමනියම් සහ සුසෙයි යන පිරිස් කරයර් කුලයට අයත් බව අනුමාන කළ හැකිය (Roberts 2005). පාරම්පරිකව කරයර්වරු ගැඹුරු මුහුදේ මසුන් මැරීමේ වෘත්තියට සම්බන්ධ කුලයකි. නමුත් ඔවුන්ගේ ජනශ්‍රැති තුළින් හෙළිවන පරිදි ඈත අතීතයේ සිටම ඔවුන් රණ ශූර භේවායන් වන අතර මුහුදු නායකයන් ලෙස කටයුතු කොට ඇත. කරයර් කුලයේ අය "සාමාන්‍යයෙන් එඩිතර පිරිසක්" ලෙස ප්‍රකටය.

ප්‍රභාකරන් ඇතුළු දෙමළ කොටි සංවිධානයේ ප්‍රමුඛ පෙළේ නායකයන් බොහොමයක් VVT යන නමින්ද හඳුන්වන වැල්වට්ටිතුරෙයි ප්‍රදේශයෙන් පැමිණ ඇත. උතුරු මුහුදු තීරයේ පිහිටි ධීවර ගම්මාන රාශියකින් යුතු VVT ප්‍රදේශයේ කරයර් කුලයට වැදගත් ස්ථානයක් හිමි විය. නීති විරෝධී ආනයන අපනයන කටයුතුවලදී ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ ගිනිකොණ දිග ආසියාව යා කරන මධ්‍යස්ථානය වන්නේ මෙම ප්‍රදේශයයි. බහු ආගමික පරිසරයක් ඇති මෙම පළාතේ තැනින් තැන හින්දුන් සහ කතෝලිකයන් ජීවත් වේ.

LTTE සංවිධානය ආරම්භයේදී එහි නායකත්වයට පත් වූයේ පහළ මධ්‍යම පාන්තික පසුබිමකින් පැමිණි පිරිසක් බව හෙළි වේ. ද්විභාෂා හැකියාව ඇති බටහිර ඌරුවට හැඩගැසීමට සමත් වෙල්ලාල කුලයේ ප්‍රභූන් සමග සංසන්දනය කරන විට මෙම පහළ මධ්‍යම පාන්තික පිරිස් සුදු කරපටි රැකියා අපේක්ෂා කළත් ඔවුන් බොහෝවිට අධ්‍යාපනය ලැබුවේ දෙමළ භාෂාවෙනි. ප්‍රභාකරන්ගේ පියා අවසානයේ

දිස්ත්‍රික්ක ඉඩම් නිලධාරියෙකු බවට පත්වූ නමුත් මුලදී ලිපිකරුවෙකු වූ අතර පන්ති පසුබිම අතින් ඔහු මධ්‍යම පන්තියට ඇතුළත් කළ හැකිය. කරයර් කුලයේ පහළ සමාජ ස්තරයකින් පැමිණි 'මහත්තයා' වැනි පිරිස් ආර්ථික තත්වයෙන් ද පහළ මට්ටමක සිට බව හෙළි වේ. සංවිධානයේ නියෝජ්‍ය නායක තනතුර දක්වා ඉහළට නැගී තමිල් සෙල්වම් (2007 ගුවන් හමුදා ප්‍රහාරවලින් මිය ගියේය) අම්පට්ටර් කුලය වැනි පීඩිත කුලයකට අයත් කෙනෙකුට සංවිධානයේ ඉහළම තලයට නැගීමට හැකි වූ බවට උදාහරණයකි..

LTTE ය කිසිම විටෙක කිසිදු කුල ආකෘතියකින් තම සංවිධානය හඳුන්වා නොදීමට මෙන්ම ශ්‍රී ලංකාවේ දෙමළ ජන වර්ගය තුළ විශාලතම කුල කණ්ඩායම වූ වෙල්ලාල කුලය අමනාප කර නොගැනීමටත් ප්‍රවේශම්කාරී විය. එසේම එම සංවිධානය මධ්‍යම පන්තිය, පහළ මධ්‍යම පන්තිය සහ කම්කරු පන්තිය යන ස්තර තුනට අයත්, වෙල්ලාලවරුන්ගේ සහයෝගයක් නොමැතිව දෙමළ කතා කරන සියලුම ජනතාවගේ එකම නියෝජිතයා ලෙසට ඉදිරිපත් වීමට ඉඩකඩක් නොවීය. තවදුරටත් විග්‍රහ කළ විට, සංවිධානය තුළ සැලකිය යුතු ක්‍රිස්තියානි නියෝජනයක් පවතින බව Schalk (1997) වාර්තා කරයි. මුළු ශ්‍රී ලාංකික දෙමළ ක්‍රිස්තියානි ජනයාගෙන් 90% ක් පමණ වන කතෝලික අයගෙන් බහුතරය කරයර් ප්‍රජාවට අයත් වන බව පෙනේ. විශේෂයෙන්ම මන්නාරම් ප්‍රදේශය කැපී පෙනෙන කතෝලික ආගමිකයන් සංඛ්‍යාවක් ජීවත්වන ප්‍රදේශයකි. චාල්ස් ඇන්තනී, වික්ටර් සහ සුසෙයි ඇතුළු මුල් කාලීන නායකයන් සෑහෙන පිරිසක් කතෝලික වූ අතර, ද්‍රවිඩ ප්‍රදේශවල පිහිටි කතෝලික පල්ලි සහ ප්‍රොතෙස්තන්ත්‍ර පල්ලි ඊළාම් සංකල්පයට අනුකූලතා දක්වමින් ඇතැම් විට විවෘතව ඊට ක්‍රියාකාරී සහයෝගය ලබා දෙන්නේ මෙම පසුබිම අනුවය.

මෙහිදී සඳහන් කළ යුතු තවත් වැදගත් කාරණයක් නම්, යාපන සමාජයේ අධිපතිවාදී කුලය වූ වෙල්ලාල කුලයෙන් බැහැර කුලයකින් LTTE යේ නායකත්වය බිහි වීමයි. කෙසේවතුදු LTTE ය කුලය ප්‍රයෝජනයට ගනිමින් ස්වකීය දේශපාලන ගමනාන්තය කරා යාමට උත්සාහ නොකළේය. දෙමළ සමාජය බෙදා වෙන් කරන සාධකයක් ලෙස කුලය හඳුනාගත් LTTE ය, ශ්‍රී ලංකාවේ සිංහල අධිපතිවාදී රාජ්‍යයෙන් නිදහස් වී වෙනම රාජ්‍යයක් ලෙස ඒකරාශී වීම තම ඒකායන අරමුණ ලෙස සලකයි. දෙමළ සමාජයේ කුල-පාදක වෙනස්කම් කිරීම්වලට එරෙහිව නැගුණු විරෝධතා LTTEයේ න්‍යාය පත්‍රය තුළට කිසිම විටෙක ඇතුළත් වුයේ නැත. සමහර අවස්ථාවල දෙමළ ඊළාම් රාජ්‍ය බිහි කරගැනීමේ මහඟු ඉලක්කය වෙනතකට හරවන අනවශ්‍ය බාධකයක් ලෙස LTTE ය විසින් කුලය හඳුනා ගෙන ඇත. LTTE සන්නද්ධ බලකායේ ඉහළ තනතුරු ඇතුළු LTTE යේ නායකත්වය කුල පසුබිම වැනි පටු සාධකයන්ට වඩා එම සංවිධානයේ ප්‍රතිපත්ති සහ පුද්ගලයන්ගේ හැකියාවන් මත තීරණය වූයේ යැයි කිව හැකිය. LTTE යේ යුද සුසාන භූමිවල පවා කුල ක්‍රමයට පටහැනිව, කුල පසුබිම

නොසලකා හැර සිය ව්‍යාපාරය වෙනුවෙන් දිවි පිදූ විරුවන් උදෙසා එක තැන ස්මාරක තැනවීමෙන් මේ කරුණ පැහැදිලි වේ. වාර්තාගත තොරතුරුවලට අනුව, කුල ක්‍රමය අභිබවා යන්නට හිතාමතා දරන ලද උත්සාහයන් සේ පෙනෙන අන්තර්-කුල විවාහ රාශියක් සංවිධානය තුළ සිදු වී ඇත.[16] කෙසේවුවත් LTTE ය විසින් පංචමර්වරුන්ගේ තත්වය නගා සිටුවීමට හෝ කුල-පාදක වෙනස්කම් කිරීම්වලට එරෙහිව ඔවුන් සංවිධානගත කිරීමට හෝ කිසිදු උත්සාහයක් දරා නොමැත (Ravikumar 2005). කුල-පාදක වෙනස්කම් කිරීම්වලට එරෙහිව පොදු තහනමක් පැනවුවා විනා, LTTE ය කුලයට එරෙහිව ප්‍රබලව එම තහනම ක්‍රියාත්මක කළේ හෝ එම තහනම බලාත්මක කළේ නැත. ජාතිකවාදී සන්නද්ධ ඊළාම් ව්‍යාපාරය විසින් යාපන සමාජයේ දැවැන්ත සමාජ විමුක්ති ව්‍යාපාරයක් බවට පත් වෙමින් තිබූ දලිත්[17] අරගලය නිහඬ කරවීය. කාන්තා විමුක්තියට දෙමළ කොටි ව්‍යාපාරය දායක වූයේද යන්න ගැනද මීට සමාන විග්‍රහයක් ඉදිරිපත් වී ඇත. සන්නද්ධ අරගලයට දෙමළ කාන්තාවන් විශාල ප්‍රමාණයක් දායක වීමෙන් LTTE ය කාන්තා විමුක්තියට ඉඩ සැලසුවේ යැයි පෙන්වීමට ඇතැම් පාක්ෂිකයන් ඉදිරිපත් වී ඇත. නමුත් රධිකා කුමාරස්වාමි වැනි අය පෙන්වා දී ඇත්තේ කාන්තාවන් මරාගෙන මැරෙන බෝම්බකාරියන් වීම කාන්තා විමුක්තිය සලසන මාර්ග යක් නොව කාන්තාව ස්වයං තීරණ ගැනීමේ හැකියාව නැති මතවාදී සහ ශාරීරික වහලුන් බවට පත්කිරීමක් බවය. (Ann 1994, Coomaraswamy 1997, Schalk 1992).

යුද්ධය, අවතැන් වූ ජනයා සහ කුලය

මෑතකාලීනව යාපනය සමාජයේ සිදු වූ සමාජ වෙනස්වීම්වලට යුද්ධය හා ඒ සම්බන්ධ විපර්යාස තදින් බලපා ඇත. යුද්ධය නිසා අවතැන් වූ ජනයා යාපනයේ සිට ලංකාවේ වෙනත් ප්‍රදේශවලට මහා පරිමාණයෙන් සංක්‍රමණය වූ අතර, අති විශාල ජනකායක් නීතිමය හෝ නීති විරෝධී ලෙස විදේශයන්ට සංක්‍රමණය වූහ (Daniel and Thangaraj

16 LTTE පාලන ප්‍රදේශයක් තුළ සිදු කළ මානව වංශ අධ්‍යයනයන් අතුරින් එකකදී Trawick (1999) සඳහන් කළ පරිදි,

"... LTTE ය දෙමළ සමාජය සිංහල පීඩනයන්ගෙන් නිදහස් කර ගැනීමට වඩා ඔවුන්ගේ භූමිකාව ප්‍රත්‍යක්ෂ කිරීමට උත්සාහ දරයි. LTTE යේ සහායකයන් පවසන පරිදි සිවිල් යුද්ධය දෙමළ සමාජයට 'හොඳ ඖෂධයකි.' ඔවුන් පවසන ආකාරයට කුලපාදක කොන් කිරීම්, කාන්තාවන්ට සිදුවන තාඩන පීඩන යනාදි උග්‍ර ගැටලු රාශියක් දෙමළ සමාජයේ ඇති අතර LTTE ය විසින් නායකත්වය දෙන විප්ලවය තුළින් මෙම ගැටලු තුරන් කළ හැකිය. . . . සමාජමය සමානාත්මතා ප්‍රතිපත්ති විසින් LTTE සොල්දාදුවන් පාලනය කරනු ලබයි. මේ තුළින් නිලය හා කුලය අතර සම්බන්ධයක් නොමැති බව අඟවති. පුද්ගලයෙකු මිය යන තුරු ඔහුගේ/ ඇයගේ නිලය හෙළිදරව් නොකෙරේ. එමෙන්ම ක්‍රියාකාරී අරගලයට එක් වී පුරුෂයන්ගෙන් සිදුවන පීඩනයන්ගෙන් නිදහස් වන ලෙස කාන්තාවන්ට දන්වා ඇත" (Trawick 1999: 141).

17 මෙහිදී සඳහන් කළ යුතු දෙයක් නම් ඉන්දියාවේ භාවිතා වන දලිත් නමැති පදය යාපන සමාජයේ කොන් වූ කුල හැඳින්වීම සඳහා පර්යේෂකයන් විසින් හෝ අදාළ කුලවල සාමාජිකයන් විසින් යොදා ගත්තේ නැති බවයි. ඊට සමාන අරුතකින් යාපනයේ භාවිතා වන පදයක් නම් 'පංචමර්' යන්නයි.

1994, Fuglerud 1999). ක්‍රමයෙන් වැඩි වූ ගැටුම්, ඊළාම් මෙහෙයුම් i (1983-1987), ඊළාම් මෙහෙයුම් ii (1989-1993), ඊළාම් මෙහෙයුම් iii (1993-2002) සහ දැනට ක්‍රියාත්මක වන ඊළාම් මෙහෙයුම් iv (2006 ආරම්භ විය) හේතුවෙන් සිදු වූ අවතැන් වීම් උතුරු පළාතේ ජනගහනයේ ප්‍රමාණයට සහ ව්‍යාප්තියට දැඩිව බලපෑම් කළ සාධක විය. අවතැන් වූ ජනයා වෙනුවෙන් පිහිටවූ IDP (Internally Displaced People) කඳවුරු තුළදී විවිධ කුල පසුබිම්වල ජනයාට එකට එක්ව කටයුතු කිරීමට සිදු විය. 1980 ගණන්වල සිට යුද්ධය ව්‍යාප්ත වීම නිසා දස ලක්ෂයකට අධික ජනතාවක් උතුරේ යාපනය ඇතුළු විවිධ ප්‍රදේශ හැර ගියහ. විවිධ කුල පසුබිම්වලට අයත් ජනයා මෙම සංක්‍රමණවලට අනුව යාපනය හැර ගිය නමුත්, වෙල්ලාල කුලයේ වැඩි පිරිසක් අර්ධද්වීපයෙන් එහාට විහිදී ගිය තම සම්බන්ධතා ජාලයෙන් හැකි තරම් දුරට ප්‍රයෝජන ගනිමින් කොළඹට සහ විදේශයන්ට සංක්‍රමණය වූහ (Siddartan 2003). වෙල්ලාලවරුන්ගේ සංක්‍රමණ, ඔවුන්ගේ ඉඩම් වෙනත් කුලවල අයට මිලදී ගැනීමට හැකියාව ලැබීම, LTTE ය විසින් කුලයට එරෙහිව පනවා තිබූ තහංචි යන සාධක නිසා යාපනයේ කුල ක්‍රමයේ වූ පීඩාකාරී ස්වභාවය ක්‍රමයෙන් දුර්වල විය. එසේ වුවත්, මෙම මෑතකාලීන ප්‍රවණතා නිසා වෙල්ලාල හා පහළ කුල අතර තිබූ සමාජ පරතරය, කුල-පාදක කොන් කිරීම් නියත වශයෙන්ම වියැකී ගිය බවට සාක්ෂි හමු නොවේ. සිංහල සහ ඉන්දියානු දෙමළ ප්‍රජාවන් තුළ මෙන්ම මෑත කාලීනව යාපන සමාජය තුළ කුලය සැඟවුණු සමාජ සංස්ථාවක් බවට පත් වී ඇත.

යාපන සමාජයේ අභ්‍යන්තර අවතැන්වූවන් සහ කුල-පාදක කොන් කිරීම්

80 දශකයේ ආරම්භ වූ යුද්ධය සහ 2004 වසරේ දෙසැම්බර් මස සිදු වූ සුනාමි ව්‍යසනය නිසා යාපන අර්ධද්වීපයේ විශාල පිරිසක් අවතැන් විය. කුලය, පන්තිය සහ ස්ත්‍රී පුරුෂභාවය නොසලකා සියලුම ජනයා මෙම ව්‍යසනයන්ට ගොදුරු වූහ (Silva 2001). 1981 වර්ෂයෙන් පසු පරිපූර්ණ ජන සංගණනයක් නොපැවැත්වීම හේතු කොට ගෙන යාපන අර්ධද්වීපයේ වර්තමාන ජනගහනයේ ප්‍රමාණය සහ සංයුතිය පිළිබඳ නිවැරදි දත්ත ලබා ගැනීමට අපහසු වී ඇත. අර්ධද්වීපයේ මුළු සිවිල් ජනගහනය 2006 දී 300,000 සිට 500,000 ත් අතර වන බව ගණනය කොට ඇත.[18] මේ ගණනය කිරීම්වලින් කැපී පෙනෙන ප්‍රමාණයක් (ගණනය කළ මුළු ජනගහනයට අනුව 1/3 සිට 1/5 ක්) සුබසාධන මධ්‍යස්ථානවල හෝ මිත්‍රයන්, ඥාතීන් සමග ජීවත් වන අභ්‍යන්තර අවතැන්වූ ජනයා බව කිව යුතුය (වගු අංක 4.2 බලන්න).

---

18 යුද්ධය ව්‍යාප්ත වීමත් සමග ජනගහනයේ නියම ප්‍රමාණය දැන ගැනීමේ අරමුණින් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල මුළු ජනගහනය ගණනය කිරීමට රජය විසින් විවිධ ප්‍රයත්නයන් දරා ඇත. මෙම උත්සාහයන් LTTE ය විසින් උපක්‍රමශීලි ලෙස ව්‍යර්ථ කළේ නියම ජනගහනය සැඟවීමටය. අනෙක් අතට මානුෂික අරමුණු උදෙසා යැයි කියමින් ජනගහනයේ මුළු එකතුව අතිශයෝක්තියෙන් දැක්වීමට ප්‍රදේශයේ පරිපාලන නිලධාරින්ගේ නැඹුරුවක් තිබේ.

වගු අංක 4.2

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව 2007-10-31 වන විට යාපනය දිස්ත්‍රික්කයේ සිටි අභ්‍යන්තර අවතැන්වූ ජන සංඛ්‍යාව

	සුබසාධන මධ්‍යස්ථානවල සිටින අවතැන්වූවන්			මිත්‍රයන් සහ ඥාතීන් සමග සිටින අවතැන්වූවන්		මුළු එකතුව	
DS වසම	සුබසාධන මධ්‍යස්ථාන	පවුල් සංඛ්‍යාව	මුළු ජනගහනය	පවුල් සංඛ්‍යාව	මුළු ජනගහනය	පවුල් සංඛ්‍යාව	මුළු ජනගහනය
ඩෙල්ෆ්	0	0	0	58	181	58	181
වෙලානයි	0	0	0	500	1,383	500	1,383
කයිට්ස්	0	0	0	1,913	5,754	1,913	5,754
කරයිනගර්	0	0	0	410	1,464	510	1,464
යාපනය	2	115	412	1,684	6,290	1,799	6,702
නල්ලූර්	2	15	52	3,417	12,242	3,432	12,294
සන්දිලිපේ	11	226	846	1,927	7,226	2,153	8,072
චාන්කර්නි	11	381	1,365	1,485	5,057	1,866	6,422
උඩුවිල්	15	517	1,960	2,841	10,176	3,358	12,136
තෙලිප්පලායි	11	527	1,910	1,430	5,192	1,957	7,102
කෝපේ	5	244	1,001	2,997	9,430	3,241	10,431
චාවකච්චේරි	4	17	58	5,194	18,390	5,211	18,448
කරාවෙඩ්ඩි	6	120	463	1,392	5,173	1,512	5,636
පොයින්ට් පෙද්රෝ	11	590	2,122	3,206	11,291	3,796	13,413
මරුතන්කර්නි	3	268	980	425	1,507	693	2,487
මුළු	81	3,020	11,169	28,879	100,756	31,899	111,925

මූලාශ්‍රය: යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය (2007)

මේ අනුව යාපනය දිස්ත්‍රික්කයේ අවතැන් වී සිටින ජනයාගෙන් බහුතරයක් (100,756) මිත්‍රයන් හෝ ඥාතීන් සමග ජීවත් විය. අනෙක් පිරිස (11,169) රජය විසින් නඩත්තු කරන සුබසාධන මධ්‍යස්ථානවල ජීවත් විය. අවතැන් වූ ජනයාට ස්වකීය ගම් බිම් කරා යළි පැමිණීමට නොහැකි වී ඇත්තේ මේ ස්ථානවල පවත්නා ආරක්ෂක තත්වය හෝ සිදු කෙරෙන යුධමය ක්‍රියාදාමයන් හේතුවෙනි. රජයේ ආරක්ෂක හමුදාව විසින් මේ ස්ථාන අධි ආරක්ෂිත කලාප බවට පත්කර තිබීම නිසා එම ප්‍රදේශවලින් අවතැන් වූ අයට තම ජන්ම භූමිවලට ආපසු යෑමට නොහැකි වී ඇත. පොදුවේ ගත් කල සුබසාධන මධ්‍යස්ථානවල පදිංචි ජනයා සීමිත සම්පත් හිමි, සමාජ සම්බන්ධතා ජාලය අතින් සහ ඉහළ නැගීමේ ඉඩකඩ අතින් දුර්වල ජන කොට්ඨාශයක් වන අතර එනිසාම අවතැන් කඳවුරුවල දිගටම රැඳී සිටීමට සිදු වූ අයයි. අවතැන්වූවන් අතරින් කඳවුරුවල රැඳී සිටින පිරිස වූ කලී සීමිත සම්පත් ඇති උග්‍ර දිළින්දන් වන අතර, සීමිත සම්පත් සහ සීමිත සමාජ සම්බන්ධතා හේතුවෙන් මෙන්ම සීමිත අවස්ථාවන්

නිසා සිය තත්වය යළි ගොඩනගා ගැනීමට ඔවුන්ට නොහැකි වී ඇත. 2007.10.31 වන විට යාපනයේ අවතැන්වූවන් වෙනුවෙන් මුළු සුබසාධන මධ්‍යස්ථාන (කඳවුරු) සංඛ්‍යාව 81 ක් විය. යාපනයේ සියලුම අවතැන්වූවන්ගේ කුල පසුබිම පිළිබඳ නිවැරදි දත්ත ලබා ගැනීම අපහසු නමුත්, පවතින දත්තවලට අනුව IDP කඳවුරු තුළ පංචමර් අයගේ අධි ජන නියෝජනයක් පවතින බව හෙළි විය. මේ තුළින් පැහැදිලි වන එක් කරුණක් නම්, කුල භේදයෙන් තොරව සියලු ජනයා යුද්ධයට සහ සුනාමියට ගොදුරු වූ නමුත් යාපනය දිස්ත්‍රික්කයේ මුළු ජනගහනයෙන් සුළුතරය වූ පංචමර්වරුන් දිගුකාලීනව කඳවුරුගත ජනගහනයෙන් බහුතරය වන බවය. IDP කඳවුරු ජනගහනයෙන් 75% ක් ළමුන්, කාන්තාවන් සහ වැඩිහිටියන් විය. එසේම, මෙම සුබසාධන මධ්‍යස්ථානවල ජීවත් වූ ජනයාට විවිධ ආකාරයේ සමාජ, ආර්ථික, ජීවන ගැටලුවලට මුහුණදීමට සිදු විය. දකුණු ආසියාවේ මෙවැනි ව්‍යසනකාරී අවස්ථාවන්හිදී ඉස්මතු වන තත්වයක් නම් කුල ධුරාවලියේ පහළම ස්තරයේ සිටින පිරිස් බහුල වශයෙන් ව්‍යසනවල නිහඬ ගොදුරු බවට පත් වීමය (Gill 2007).

සිතියම් අංක 03: යාපනය දිස්ත්‍රික්කයේ තෝරා ගත් අධ්‍යයන ප්‍රදේශ



සිතියම් අංක 04: 1990 වන විට මයිලිට්ටි ප්‍රදේශයෙන් සිදු වූ අවතැන් වීම්



මල්ලාහම් ප්‍රදේශයේ කුල සංයුතිය

ශ්‍රී ලංකාවේ සංගණනවලදී කුලය නිල සාධකයක් ලෙසින් නොසලකන නිසා මෙන්ම LTTE පාලන ප්‍රදේශවල කුලය තහනම් විෂයයක් වන හෙයින්, පසුගිය දශක දෙක තුනක කාලයක් තිස්සේ යාපන සමාජයේ සිදු වූ ජන විතැන් වීම් නිසා ඒ ඒ කුල කණ්ඩායම්වල සංයුතිය කෙරෙහි වූ බලපෑම් පිළිබඳ නිශ්චිත දත්ත ඉදිරිපත් කිරීමට අපහසුය. මෙම පර්යේෂණය තුළදී අවතැන් වූ ජනයාට මුලිකත්වය දෙමින් මල්ලාහම් ප්‍රදේශයේ සමස්ත කුල සංයුතිය පිළිබඳ මූලික තොරතුරු රැස් කරන ලදි.

මල්ලාහම් ප්‍රදේශයේ ඉහළම කුලය වන වෙල්ලාල කුලය ජනගහනයෙන් 31%ක් පමණ වන අතර, වන්නර්, අම්පට්ටර්, පල්ලර්, නලවර් සහ පරයර් යන කුලවලින් සමන්විත පංචමර්වරු ජනගහනයෙන් බහුතරය (58.3%) වන බව පෙනේ. මෙම පහළ කුල අතරින් කුල වර්ගීකරණයේ කැපී පෙනෙන කුල බවට පත්වූයේ නලවර් (26.6%) සහ පල්ලර් (28.5%) යන පිරිස්ය. මල්ලාහම් ප්‍රදේශයේ ඒ ඒ කුල පිළිබඳව වෙන වෙනම සලකා බලන විට වෙල්ලාලවරු ප්‍රදේශයේ ජනගහනයෙන් බහුතරයක් (31%) වේ. 1950 ගණන්වලදී යාපන අර්ධද්වීපය තුළ මුළු ජනගහනයෙන් 50% කටත් වඩා වෙල්ලාලවරුන් සිටි බව මෙහිදී අප මතක තබා ගත යුතුය (Banks 1960: 67).

මෙම ප්‍රදේශයේ කුල 11 ක් ඇත. ඒවා නම්, වෙල්ලාල, පිරාමනර්, පන්ඩාරම්, කෝවියර්, තචර්, නට්ටුවර්, වන්නර්, අම්පට්ටර්, පල්ලර්, නලවර් සහ පරයර් යන කුල වේ. මෙම කුල අතරින් වෙල්ලාල සහ බ්‍රාහ්මණ කුල "ඉහළ කුල" ගණයේ ලා සැලකිණි. කෝවියාර්, පන්ඩාරම්, තචර්, නට්ටුවර් යන කුල "මධ්‍යම" හෝ "අන්තර්මධ්‍යය

කුල" ලෙස සැලකිණි. වන්නර්, අම්පට්ටර්, පල්ලර්, නලවර් සහ පරයර් යන කුල පහළ කුල ලෙස සැලකිණි. ද්‍රවිඩ භාෂාවේ මෙම කුල පහ සාමූහිකව හැඳින්වූයේ "පංචමර්" යන නමිනි.

වගු අංක 4.3

මල්ලාහම් ප්‍රදේශයේ කුල සංයුතිය (2005)

දෙමළ නාමය		ඉංග්‍රිසී නාමය	සාම්ප්‍රදායික රැකියාව	ජනගහනය (%)
වෙල්ලාල පිරාමනර්	ඉහළ කුල	- Brahmin	ඉඩම් හිමි, ගොවි පූජකවරු	31.0 0.3
පන්ඩාරම් කෝවියර් තචර් නට්ටුවර්	මැද කුල	Garland maker - Carpenter Muscian	කෝවිල් උදව්කරු ගෘහ සේවක වඩු කර්මාන්තය මංගල අවස්ථාවල සංගීතය සැපයීම	1.2 4.0 5.0 0.2
වන්නර් අම්පට්ටර් පල්ලර් නලවර්[18] පරයර්	පංචමර්වරු	Dhoby Barber - - -	රෙදි සේදීම කොණ්ඩා කැපීම කෘෂිකාර්මික කම්කරු, රා මැදීම රා මැදීම බෙර වාදනය	2.0 1.0 28.5 26.6 0.2
එකතුව				100.0

මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර සටහන්, දෙසැම්බර් 2005.

මයිලිට්ටි, ඌරන්, වසාවිලන්, කන්කසන්තුරේ සහ අනෙකුත් පෙදෙස්වල යුද්ධයෙන් අවතැන් වූ විශාල ජන සංඛ්‍යාවක්ද, යාපන අර්ධද්වීපයේ අධි ආරක්ෂිත කලාප නිසා ස්වකීය නිජ බිම් අහිමි වූ (සිතියම් අංක 03 සහ 04 බලන්න.) පිරිස්ද මල්ලාහම් ප්‍රදේශයේ සුබසාධන මධ්‍යස්ථානවල ජීවත්වෙති. ඔවුහු කොහු නිෂ්පාදන මධ්‍යස්ථානය, නීදවාන් සුබසාධන මධ්‍යස්ථානය, කෝනාපුලම් සුබසාධන මධ්‍යස්ථානය සහ ඌරානි සුබසාධන මධ්‍යස්ථානයන්හි ජීවත් වෙති. කොහු නිෂ්පාදන මධ්‍යස්ථානය මල්ලාහම්හි දකුණු ප්‍රදේශයේ පිහිටා ඇත. නීදවාන් සුබසාධන මධ්‍යස්ථානය මල්ලාහම් ප්‍රදේශයේ ප්‍රධාන සුබසාධන මධ්‍යස්ථානය වේ. කෝනාපුලම් සහ ඌරානි සුබසාධන මධ්‍යස්ථාන මල්ලාහම් ප්‍රදේශයේ උතුරින් පිහිටා ඇත. වගු අංක 4.4 හි දැක්වෙන පරිදි, මෙම IDP කඳවුරු හතර තුළම මුළු ජනගහනය පංචමර් පිරිසට අයත් නලවර් සහ පල්ලර් කුලවලින් සමන්විත විය.

19 මල්ලාහම් ප්‍රදේශයේ අවතැන් කඳවුරුවල ජීවත් වූයේ නලවර් සහ පල්ලර් කුලවලට අයත් ජනයා විය. ඔවුන් මයිලිට්ටි, ඌරන්, වසාවිලාන්, කන්කසන්තුරේ වැනි ප්‍රදේශවලින් අවතැන්වූවන් වේ. මෙම ප්‍රදේශ අධි ආරක්ෂිත කලාපයට අයත් ප්‍රදේශ වේ.

වගු අංක 4.4

2007.10.31 වන විට මල්ලාහම් ප්‍රදේශයේ සුබසාධන මධ්‍යස්ථාන තුළ අවතැන් වූ ජනගහන ව්‍යාප්තිය (කුලය අනුව)

සුබසාධන මධ්‍යස්ථානයේ නම	කුල සංයුතිය	පවුල් සංඛ්‍යාව	ජනගහනය
කොහු නිෂ්පාදන මධ්‍යස්ථානය	නලවර් සහ පල්ලර්	16	71
නීදවාන් සුබසාධන මධ්‍යස්ථානය	නලවර්	79	274
උගරන් සුබසාධන මධ්‍යස්ථානය	නලවර්	30	114
කෝනාපුලම් සුබසාධන මධ්‍යස්ථානය	නලවර්	122	415
එකතුව		247	874

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සටහන්, දෙසැම්බර් 2005.

අවතැන්වූවන් සහ කුල අනන්‍යතාවය

ලංකා රජය සහ LTTE ය අතර සාම සාකච්ඡා ආරම්භ වී වසර හතරක් පමණ ගත වූ පසු, සුබසාධන මධ්‍යස්ථානවල ඉතිරිව සිටි අවතැන් වූ ජනයා අතර පංචමර් කාණ්ඩයට අයත් අය (විශේෂයෙන් නලවර් සහ පල්ලර් කුලවල) අධි නියෝජනයක් තිබීම මෙම අධ්‍යයනයේදී අවධානයට ලක් වූ ප්‍රධාන ගැටලුවක් විය. යාපනයේ ජීවත් වූ සියලුම ජනයා කුලය, පන්ති පසුබිම්වලින් තොරව යුද්ධයෙන් පීඩාවට පත් වූයේ නම්, සංඛ්‍යාත්මකව විශාලතම කුලය වූ වෙල්ලාල කුලය අභිබවමින්, සාම්ප්‍රදායිකව වරප්‍රසාද නොලත් අනෙකුත් කුල කණ්ඩායම් විශාල වශයෙන් අවතැන් කඳවුරුවල දිගටම සිටින පිරිස් බවට පත් වූයේ කෙසේද?

2006 වන විට පවා යාපනයේ මෙන්ම අනෙකුත් බොහෝ සුබසාධන මධ්‍යස්ථානවල රැඳී සිටින අවතැන් වූ ජනයාගෙන් වැඩි දෙනා පංචමර් කුල පසුබිමින් පැවත එන බව අධ්‍යයනයේදී හෙළි විය. යාපනයේ පීඩිත කුල ලෙස සැලකෙන නලවර් (රා මදින්නෝ), පල්ලර් (කෘෂිකාර්මික කම්කරු), පරයර් (බෙර වාදක) යන කුලවල පිරිස් විශාල වශයෙන් රැඳී සිටිනුයේ IDP කඳවුරු තුළය. ඉහත දැක්වූ ආකාරයට මල්ලාහම් ප්‍රදේශයේ සුබසාධන මධ්‍යස්ථාන හතර තුළම රැඳී සිටි අවතැන් වූ ජනයා නලවර් සහ පල්ලර් කුලවලට අයත් පිරිස් වේ. යාපනයේ විවිධ සුබසාධන මධ්‍යස්ථාන තුළ දිගටම රැඳී සිටින පිරිස් ගැන විමසන විට, පංචමර් පසුබිමින් බැහැර කුලවල සෑහෙන පිරිසක් ජීවත් වන එක් සුබසාධන මධ්‍යස්ථානයක් පමණක් අපට හමුවිය. ඒ නැගෙනහිර වඩමාරච්චි ප්‍රදේශයේ පිහිටා ඇති කට්කෝවලම් සුබසාධන මධ්‍යස්ථානයයි. මෙහි පදිංචිකරුවන් සියලු දෙනාම පාහේ කරයර් (ධීවර) කුලයෙන් පැමිණි අයයි. කට්කෝවලම් මධ්‍යස්ථානයේ සිටි සැලකිය යුතු පිරිසක්, බහුතර ධීවර ප්‍රජාවක් වෙසෙන වෙරළාසන්න ප්‍රදේශවල සුනාමියට ගොදුරු වී අවතැන් වූ පිරිසක් බව සොයා ගත හැකි විය.

IDP කඳවුරු තුළ ඉතිරි වූ ජනයාගෙන් බහුතරය පංචමර් අය වීමට බලපෑ හේතු සාධක කිහිපයක් ඇත.

1. සාම්ප්‍රදායයිකව පහළ කුලවල ජනයාට එතරම් ඉඩම් ප්‍රමාණයක් හිමි නොවූ අතර පාරම්පරිකව ඔවුන්ට උරුම වූයේ සුළු ඉඩම් ප්‍රමාණයකි. එම නිසා වරක් අවතැන් වූ පසු ඔවුන් සැබවින්ම ඉඩම් අහිමි පිරිසක් වූ නිසා රජය විසින් ඉදි කළ IDP කඳවුරු වෙත යාම හැර ඔවුන්ට වෙනත් විකල්පයක් නොවීය. මෙසේ අවතැන් වූ විශාල පිරිසකගේ ගම්බිම් තුළ ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා විසින් අධි ආරක්ෂක කලාප පිහිටුවා ඇති නිසා ස්වකීය නිජ බිම් වෙත ආපසු යෑමට ඔවුන්ට නොහැකි වී ඇත.
2. වාර්තාගත තොරතුරු අනුව, අවතැන් වූ අස්පර්ශනීය පසුබිමක් ඇති ජනයාට ස්වකීය ප්‍රජාවන්ට පිටස්තරව ඇත්තේ සීමිත සමාජ සම්බන්ධතා ජාලයකි. රජයේ සහනාධාර මත යැපෙන මෙම පිරිසට සුබසාධන මධ්‍යස්ථානවලින් පිටතට ගියහොත් උදව් කිරීමට කිසිවකු නොමැත.
3. මෙම ජනයාගෙන් බොහෝ පිරිසකට අලුතින් ඉඩම් මිලදී ගැනීමට හෝ තමන්ගේම නිවෙසක් තනා ගැනීමට ප්‍රමාණවත් සම්පත් නොමැත.
4. ඔවුන් සතුව ප්‍රමාණවත් මුදලක් තිබුණද, ඉඩම් හිමි ඉහළ කුලවල අය මොවුන්ට තම ඉඩම් අලෙවි කිරීමට අකමැතිය. හේතුව, මේ වන තුරුත් කුල-පාදක කොන් කිරීම් නොකඩවා ක්‍රියාත්මක වන හෙයින් අනෙක් කුලවල ජනයා පංචමර්වරු තමාගේ අසල්වැසියන් ලෙස පිළිගැනීමට මැළිකමක් දැක්වීමයි.
5. තම ආරක්ෂාව ගැන සලකා හෝ ස්වකීය ප්‍රජාවන් තුළ ඇති අන්‍යෝන්‍ය සහයෝගය නිසා IDP කඳවුරු තුළදී හෝ ඉන් පිටතදී ඒ ඒ කුලවල ජනයා ස්වකීය ප්‍රජාව සමග එකට ජීවත් වීමට වඩාත් කැමැත්තක් දක්වන බව පෙනේ.

යුද්ධය නිසා වෙල්ලාල සහ අනෙකුත් ඉහළ කුලවල ජනයාද අවතැන් වූ බව මෙහිදී අමතක නොකළ යුතුය. නමුත් නිරන්තරයෙන් ඔවුන් කොළඹට හෝ විදේශ රටවලට සංක්‍රමණය වූයේ තමන්ගේ අධ්‍යාපන, වෘත්තීමය සුදුසුකම් මෙන්ම සමාජ සම්බන්ධතා ජාලයද උපයෝගී කරගනිමිනි (Siddartan 2003, Fuglerud 1999, Daniel & Thangaraj 1994). යාපනය දිස්ත්‍රික්කයේ ඉතිරි වූ කිහිප දෙනාද අවම පහසුකම් සහිත පෞද්ගලිකත්වයට ඉඩකඩ නොමැති IDP කඳවුරු තුළ නැවතීමෙන් අපකීර්තියක් ලබනවාට වඩා කඳවුරුවලින් පිටත සිටින ඔවුන්ගේ නෑමිතුරන් සමග නැවතීමට වඩාත් කැමැති වූහ.

සුබසාධන මධ්‍යස්ථානවල පදිංචි අවතැන්වූවන්ට එරෙහිව සිදුවන කුල-පාදක කොන් කිරීම්

අවතැන්වූවන් සාමාන්‍යයෙන් සමාජමය වශයෙන් සෙසු අයගේ කොන් කිරීමට ලක් වේ. අවට ප්‍රජාවන් හා ගැටීමේදී අවතැන් වූ ජනයා බොහොමයකගේ 'අඩු කුල තත්වය' ඔවුන්ගේ ආන්තික තත්වය වඩාත් තහවුරු කරන ලදි. අපවාදාත්මක වචන ලෙස සැලකෙන 'මුහාම් මක්කල්/සන්ගාල්' (මුහාම් මිනිසුන්) යන වචන අවතැන්වූවන් හැඳින්වීමට නිතර යෙදූ වචන විය. මෙම වචනය තුළ (වාග් විද්‍යාත්මක අර්ථය කුමක් වුවත්) අපවාදාත්මක අර්ථ කිහිපයක් තිබේ. එනම් 'අඩු කුලය', 'දුප්පත්', 'අයහපත් චර්යාව', 'කලහකාරී' යනාදියයි.

අතීතයේ පැවති වෙනස්කම් කිරීම් හා සසඳන විට වර්තමානයේ සමස්ත යාපන දිස්ත්‍රික්කය තුළ කුල-පාදක වෙනස්කම් කිරීම්වල යම් යම් සියුම් වෙනස්කම් සිදු වී ඇති බව පෙනේ. අනෙක් අතට, වර්තමානයේ දැක ගත හැකි කුල-පාදක වෙනස්කම් කිරීම් සම්පූර්ණයෙන්ම අලුත්ම සංසිද්ධීන් නොවේ. මේවා පැරණි කුල මූලයන්ගෙන් ප්‍රභවය වී සම්පූර්ණයෙන්ම වෙනස් සමාජ සන්දර්භයන් තුළ අලුත් ආකෘතියකින් ඉදිරිපත් වුවා පමණි. IDP කඳවුරු තුළ පදිංචි, 'මුක්කාම් සන්ගල්' (කඳවුරු ජනයා) යන නමින් සෙසු අයගේ කොන් වීමට ලක් වූ මෙම අවතැන් වූ ජනයා යුද්ධයෙන් හෝ සුනාමියෙන් ව්‍යසනයට පත් වීමට අමතරව, උග්‍ර දරිද්‍රතාවය සහ බැඳුණු 'අස්පර්ශනීයත්වය' තුළින් ඔවුන්ගේ තත්වය තවදුරටත් අන්ත අසරණභාවයට පත්ව ඇත. ඔවුන්ට හින්දු කෝවිල්වලට ඇතුළු වීමට ඉහළ කුලවල හින්දූන් විසින් සම්බාධක පැමිණවීම, ඉහළ කුලයේ පවුල් සතු ළිංවලින් පානීය ජලය නොදීම සහ ඉඩම් වෙළෙඳපොළ තුළ පංචමර්වරුන් මුහුණ දුන් විවිධ බාධා සහ කෙනෙහිලිකම් යාපන සමාජයේ තවදුරටත් පවත්නා කුල-පාදක වෙනස්කම් කිරීම්වලට උදාහරණ ලෙස දැක්විය හැකිය.

හින්දු කෝවිල්වල කුල-පාදක වෙනස්කම් කිරීම්

දැනටමත් සාකච්ඡා කර ඇති පරිදි, යාපන සමාජයේ කුලයට එරෙහි සමාජ ව්‍යාපාර තුළ කෝවිල්වලට ඇතුළු වීමේ ව්‍යාපාරවලට දිගු ඉතිහාසයක් ඇත. කෝවිල්වලට ඇතුළු වීමේ අරගල අතර වඩාත් ප්‍රසිද්ධ අරගලය සිදු වූයේ මාවිද්දපුරම් කෝවිල තුළය. මෙය කන්කසන්තුරින් දකුණට සැතපුම් කිහිපයක් එහායින් පිහිටා ඇත. 1968 දී මෙම කෝවිල්වලට ඇතුළු වීමේ අරගලයට, කොමියුනිස්ට් පක්ෂය සමග පීඩිත කුල පසුබිමින් පැමිණි විශාල ජනකායක් සහභාගි විය. එම කාල පරිච්ඡේදය තුළදී වෙල්ලාලවරුන් විසින් පාලනය කළ අනෙකුත් ප්‍රධාන කලාපීය සහ ප්‍රාදේශීය මට්ටමේ කෝවිල්වලට තම පූජා භූමි කෝවිල්වලට ඇතුළු වීමේ දේශපාලන අරගලය වෙතට ඇද දැමීමට කිසිවිටෙක උවමනා නොවීය. බොහෝ අවස්ථාවන්හි නාමමාත්‍රික ලෙස පමණක් කෝවිල්වලට ඇතුළු වීමට පහළ කුලවල අයට අවසර ලබා දී තිබුණි.

නමුත් මෙම අරගලයෙන් සීමිත සාර්ථකත්වයක් පමණක් අත් කර ගත් බව පෙනේ. සිවතම්බි (2005) විසින් කෝවිල්වලට ඇතුළු වීමේ අරගලය තුළින් හුදු සංකේතමය සාර්ථකත්වයක් පමණක් ලැබුණ බව නිවැරදිව පෙන්වා දී ඇත.

එසේම මෙහිදී දැක්විය යුතු වැදගත් කරුණක් නම්, ගම්වල කෝවිල් මෙම කෝවිල්වලට ඇතුළු වීමේ අරගලයට ගොදුරු නොවූ බවය. වර්තමානයේදී පවා, ඉහළ කුලවලට අයත්, ඔවුන් විසින් පාලනය කළ ගම් මට්ටමේ කෝවිල්වලට ඇතුළු වීමට පහළ කුලවල ජනයාට ඉඩකඩ නොමැත. මුදල් උපයාගත් ඇතැම් කුල හීන පිරිස් තමන්ගේම ආගමික පූජා ස්ථාන පිහිටවූ නමුත් එය ඔවුන් සියලු දෙනාගේ ප්‍රශ්නය විසඳීමේ මඟක් නොවීය. අඩු කුලවල ජනයා පිහිටවූ එබඳු කෝවිල්වල සේවයට තවමත් බ්‍රාහ්මණ කුලයේ පූජකයන් සහ නට්ටුවර් කුලයට අයත් නාදශ්වරම්-තාවිල් වාදකයන් බඳවා ගැනීමට අපහසුය. බ්‍රාහ්මණ කුලයේ පහත් ස්තරයකට අයත් පූජකයන් පමණක් මෙබඳු කෝවිල්වලට සේවය සපයති.

මල්ලාහම් ප්‍රදේශයේ පදිංචිව සිටි අවතැන් වූ ජනයා හින්දු කෝවිල්වලට ඇතුළු වීමේදී දුෂ්කරතා රැසකට මුහුණ දුන්හ. වෙල්ලාල ඉඩම් හිමියන්ගේ පාලනය යටතේ තිබූ හින්දු කෝවිල්වලදී ඔවුන්ට නිසි පිළිගැනීමක් නොලැබුණි. අනෙක් අතට පවතින ආරක්ෂිත තත්වය යටතේ ස්වකීය නිජ බිම්වල පිහිටි තමන්ගේ කෝවිල්වලට යාමටද ඔවුන්ට අවස්ථාවක් නොලැබේ. මේ තත්වය යටතේ තමන්ගේ ආගමික අවශ්‍යතා බොහෝදුරට ගෘහස්ත චාරිත්‍රවලට පමණක් සීමා කිරීමට ඔවුන්ට සිදු වී ඇත.

පානීය ජලය සපයා ගැනීමේදී සිදු වූ කුල-පාදක වෙනස්කම් කිරීම්

යාපන අර්ධද්වීපයේ ප්‍රධාන ස්වාභාවික ජල සම්පත භූගත ජලයයි. සාමාන්‍යයෙන් යාපනයේ ඒ ඒ නිවෙස්වලට තමන්ට අයත් ළිඳක් තිබේ. ඔවුන්ගේ දෛනික අවශ්‍යතා විශාල වශයෙන් සපුරා ගන්නේ මෙම ළිං වලිනි. පවිත්‍රත්වය සහ කිල්ල යන සංකල්ප ගත් විට ජලය පවිත්‍ර වස්තුවක් සේ සැලකිණි. වන්නර් කුලය හැර අඩු කුලයේ ජනයා (පංචමර්) සාම්ප්‍රදායිකව අස්පර්ශනීය ගණයේ ලා සැලකූ අතර (David 1974a: 47, Banks 1960: 65), ඔවුන්ට ඉහළ කුලවල ළිංවලින් ජලය ලබා ගැනීම සපුරා තහනම් විය. ඉහළ කුලවල නිවෙස්වල සේවය කළ අඩු කුලවල ජනයාට ජලය සහ ආහාර ලබා දීමට වෙනම කෝප්ප සහ භාජන යොදා ගත් අතර ඒවා අනාගතයේ එවැනිම අඩු කුලයේ පුද්ගලයකු වෙනුවෙන් පාවිච්චි කිරීමට වෙන් කොට තබයි. ඔවුන්ට ඉහළ කුලයේ අයෙකු පාවිච්චි කළ බඳුනක ආහාර නොදෙයි. මෙම කිල්ල පිළිබඳ සංකල්පය තරමක් දුරට වෙනස්වීම්වලට බඳුන් වුවද යාපනයේ ඉහළ කුලයේ පවුල් අතරින් මෙවැනි පීඩා කිරීම් තවදුරටත් සිදු වන බව පෙනේ. මෙය සංකීර්ණ ව්‍යාකූල තත්වයකි. සාමාන්‍යයෙන් අඩු කුලවල මිනිස්සු ඉහළ කුලයේ නිවෙස්වල ළිං කැණීම් සිදු කරති. පළමුවෙන් ඔවුහු ජලය ස්පර්ශ කරමින් මහන්සියෙන් ශ්‍රමය වැය කොට අපිරිසිදු ජලය පිරිසිදු ජලය බවට පත් කරති. එසේ කිරීමෙන් පසුව ඔවුන් විසින් සැකසූ ළිංවලින් ඔවුන්ට ජලය ලබා ගැනීමට ඉහළ කුල විසින් ඉඩ නොදෙති.

සුබසාධන මධ්‍යස්ථානවල පදිංචි පහළ කුලවල අනාථයින්ට පානීය ජලය අතින් දැඩි දුෂ්කරතා අත් විඳීමට සිදු විය. ඒ ඒ සුබසාධන මධ්‍යස්ථාන තුළ විශාල පවුල් සංඛ්‍යාවකට තම දෛනික අවශ්‍යතා සඳහා තිබුණේ කුඩා ප්‍රමාණයේ ළිං එකක් හෝ දෙකක් පමණි. උදාහරණ ලෙස මල්ලාහම් ප්‍රදේශයේ නීදවාන් සුබසාධන මධ්‍යස්ථානයේ (නීදවාන් මුකාම්) පවුල් 79 ක් සඳහා තිබුනේ කුඩා නළ ළිඳක් පමණි. නමුත් මේ පොදු ළිඳ අවතැන්වූවන්ගේ දෛනික අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් නොවීය. එම නිසා කඳවුර අවට පිටස්තර ගෙවල්වලින් ජලය ලබා ගැනීමට ඔවුන්ට සිදු විය. අවට පිහිටි ළිං අයත් වූයේ ඉහළ කුලවල පවුල්වලටය. මෙම ඉහළ කුලවල ළිංවලින් ජලය ලබා ගැනීමේදී ඔවුහු විවිධ ගැටලුවලට මුහුණ දුන්හ. ඉහළ කුලවල ළිං හිමිකරුවෝ සෘජුවම ඔවුන්ට ජලය ලබා ගැනීමට ඉඩ නොදුන්හ. ළිං හිමිකරුවන් විසින් ජලය ලබාදෙන තුරු බලා සිටීමට අඩු කුලවල ජනයාට සිදු විය. එම නිසා, අඩු කුලවල ජනයා කඳවුරු සමීපයේ සිටින ඉහළ කුලවල ජනයාගේ අනුකම්පාව මත දිවි ගෙවන තත්වයට පත් වී ඇත. ස්වකීය මුල් ජන්ම භූමි තුළ පැවති නිත්‍ය ළිං අතහැර කඳවුරුවලට පැමිණ ඔවුන් මුහුණ දෙන මෙම තත්වයන් සමාජ අසාධාරණයේ අලුත් පැතිකඩක් ලෙස හඳුනා ගත හැකිය.

ඉඩම් වෙළෙඳ පොළ තුළ කුල-පාදක වෙනස්කම් කිරීම්

ජන ඝනත්වය අධික යාපන අර්ධද්වීපයේ සීමිත සම්පතක් වූ 'ඉඩම්' වටිනා වත්කම් අතර වඩාත්ම වැදගත් වත්කමක් ලෙස සලකන ලදි. පුද්ගලයාගේ ධනවත්කම සහ තත්වය මනින මානය වූයේ ඔහු සතු ඉඩකඩම් ප්‍රමාණයයි. සාම්ප්‍රදායිකව යාපනයේ ඉඩම් විශාල ප්‍රමාණයක හිමිකම වෙල්ලාලවරුන් සතු විය. යාපනයේ ඉහළ කුල ජීවත් වන ගම්මාන තුළ හෝ ඒ අවට ඉඩම් සාමාන්‍යයෙන් පංචමර්වරුන්ට විකුණුවේ නැත. ඉහළ කුලයේ පුද්ගලයෙකුට තමාගේ ඉඩමක් විකිණීමට අවශ්‍ය වූ විටෙක, ඔහු පළමුවෙන්ම තමාගේ ඥාතියෙකුට හෝ තමාගේ කුලයේම සමීප මිත්‍රයෙකුට ඒ බව දන්වා එම ඉඩම මිලදී ගැනීමේ අවස්ථාව ඔහුගේම කුලයේ අයෙකුට උදා කර දෙයි. ඉඩකඩම් විශාල ප්‍රමාණයක් ඉහළ කුලවල ජනයාට හිමි වූ බැවින් පංචමර් ජනයාට ඉඩමක් මිලදී ගැනීම සැබෑ ලෙසම අති දුෂ්කර කටයුත්තක් විය. යුද්ධය හේතුවෙන් සිදු වූ ජන සංක්‍රමණ නිසා ඉඩම් හිමි රටාවේ එතරම් වෙනසක් සිදු නොවූ අතර අධි ආරක්ෂිත කලාප පිහිටුවීමෙන් විශාල ඉඩම් ප්‍රමාණයක් තුළට සිවිල් වැසියන්ට ඇතුළු වීමටද නොහැකි විය.

මෙය මෙසේ වුවත්, පසුගිය දශක තුන පුරා යාපනය ජනතාව පිටස්තර ප්‍රදේශයන්ට සංක්‍රමණ වීම හේතුවෙන් යම් යම් වෙනස්වීම් සිදු වී තිබේ. පංචමර් පසුබිමට අයත් ඇතැම් පවුල්වල සාමාජිකයන් සාර්ථක ලෙස බටහිර රටවලට සංක්‍රමණය විය. මෙම පවුල්වලට විදේශගත වූ තම ඥාතීන්ගෙන් මුදල් ලැබුණි. මෙම මුදල්වලින් ඔවුන්ට, කුල ප්‍රශ්න අමතක කොට අලුත් පොහොසතුන්ට තම ඉඩම් විකිණීමට කැමැති, සිය නිජබිම් අතහැර වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වූ ඉඩම්

හිමියන්ගෙන් බොහෝවිට එම ඉඩම්වල වටිනාකම අභිබවා යන මිළකට ඉඩම් මිලදී ගැනීමට හැකි වී ඇත. මෙම අඩු කුලවල ගැනුම්කරුවන්ට ඉහළ කුලයේ ඉඩම් මිලදී ගැනීමේදී වෙළඳ පොළේ පවත්නා මිල අභිබවා යන අමතර මුදලක් ගෙවීමට සිදු වීම තුළින්ම ඉඩම් වෙළෙඳ පොළ තුළ පවතින වෙනස්කම් කිරීමේ ලක්‍ෂණ විද්‍යමාන වේ. අනෙක් අතට, IDP කඳවුරුවල වාසය කරන බහුතරයක් දුප්පත් පංචමර්වරුන් වන අතර, දරිද්‍රතාවය සහ වරප්‍රසාද නොලත් කුල පසුබිම හේතුවෙන් තමා සමීපයේ ඇති ඉඩම් වෙළෙඳ පොළ තුළින් කිසි දිනෙක වාසි ප්‍රයෝජන ලබා ගැනීමට නොහැකි විය.

සාරාංශය

අවසාන වශයෙන්, ශ්‍රී ලංකාවේ වඩාත්ම තදබල ආකාරයේ අස්පර්ශනීයත්වය සහ කුල-පාදක වෙනස්කම් කිරීම් යාපන සමාජයෙන් වාර්තා වන බව කිව යුතුය. මෙම තත්වය ආර්ථික ආධිපත්‍යය, පවිත්‍රත්වය, දේශපාලන බලය යනාදිය යාපන සමාජයේ සංඛ්‍යාත්මකව විශාලම කුලය වන වෙල්ලාල කුලය අත පැවතීම හා සෘජුවම සම්බන්ධය. කුල ක්‍රමයට එරෙහි පහළ කුලවල විරෝධතා ව්‍යාපාර 1920 ගණන්වලදී ආරම්භ විය. ජනයා අවතැන් වීම්, පිට ප්‍රදේශවලට සංක්‍රමණය වීම්, පොදුවේ ගත් විට යුද්ධය නිසා වූ සමාජමය බිඳ වැටීම් සහ LTTE ය විසින් පැනවූ තහංචි කුල-පාදක වෙනස්කම් කිරීම් සැලකිය යුතු මට්ටමකින් දුබල කිරීමට ඉවහල් වී තිබේ. කෙසේ වුවත් දිගුකාලීනව අවතැන් කඳවුරු තුළ රැදී සිටින කණ්ඩායම් අතරින් අධික පිරිසක් පංචමර්වරු වීම සහ මෙම කඳවුරු සමීපයේ ජීවත් වූ ඉහළ කුලවල ප්‍රජාවන්ගෙන් ඔවුන් විඳි දුක් කරදර, බාධාවන් තුළින්, ඒ වනවිට ඇතිව තිබූ වෙනස්වීම් සහ LTTE යෙන් පැනවූ කුල තහනමද නොසලකා කුල වෙනස්කම් කිරීම් තවදුරටත් ක්‍රියාත්මක වූ බව හෙළිවේ. මෙවැනි වෙනස්කම් කිරීම් තුළින් යුද්ධය සහ ස්වාභාවික ව්‍යසනවලදී මෙන්ම සියලු හදිසි අවස්ථාවන් හා ව්‍යසනයන්ට පහසුවෙන් ගොදුරු වන්නේ වරප්‍රසාද නොලත් කුල කණ්ඩායම් බව තවදුරටත් පැහැදිලි වේ (Goonesekere 2001, Gill 2007). රාජ්‍ය සහ රාජ්‍ය නොවන යන දෙපාර්ශවයම අවතැන්වූවන් සඳහා දියත් කළ වැඩසටහන් කුලය අමතක කොට ක්‍රියාත්මක කළ නිසා පශ්චාත් යුද සහ පශ්චාත් සුනාමි සන්දර්භයන් තුළ කුල-පාදක වෙනස්කම් කිරීම් නැවත හිස ඔසවා ඇතැයි කිවහැක. යාපන සමාජය තුළ කුල-පාදක වෙනස්කම් කිරීම්වලට එරෙහි අරගල වර්තමාන සමාජ දේශපාලන වාතාවරණයට පසුබිම් වී ඇත. දෙමළ ජාතික ව්‍යාපාරයේ සටන්කාමී වැඩපිළිවෙළ තුළ කුලය යනු අනවශ්‍ය බෙදීම් ඇති කරන එමෙන්ම අපේක්ෂිත දෙමළ රාජ්‍යයේ දේශපාලන සමාජ ඒකීයත්වයට බාධාවක් ලෙසින් හඳුනාගත් LTTE ය කුලය නිහඬ කර දැමීමට විවිධ පියවර ගත්තේය. කෙසේවුවත් අවතැන්වූවන් සහ අවට ප්‍රජාවන් අතර සම්බන්ධතාවලදී සිදු වූ යම් යම් කුල-පාදක වෙනස්කම් කිරීම් වැළැක්වීමට හෝ හඳුනාගැනීමටවත් මෙම ප්‍රතිපත්තිවලට නොහැකි වී ඇත.

එනමුත් යාපන සමාජයෙන් කුල-පාදක වෙනස්කම් කිරීම්වලට එරෙහි සංවිධානගත විරෝධතා සම්පූර්ණයෙන්ම තුරන් වී ඇතැයි කිව නොහැක. මෑත වසරවලදී ක්‍රියාකාරී කුල සංවිධාන දෙකක් වූ 'සිහයි අලන්කාරිපාලර් සන්ගම්' (කරණාවෑමින්ගේ ව්‍යාපාරය), 'සාලාවයිත් තොලිලාලර් වෙන්නිරා ආඩෙව් සන්ගම්' (රෙදි සෝදන්නන්ගේ ව්‍යාපාරය) යන ව්‍යාපාර අම්පට්ටර් (කරණාවෑමින්) සහ වන්නර් (රෙදි සෝදන අය) කුලවලින් ඉස්මතු වූ සංවිධාන වේ. සමහරවිට LTTE යේ නිහඬ සහයෝගය සහ අනුමත කිරීම මත, මෙම සංවිධාන විසින් අම්පට්ටර්වරු සහ වන්නර්වරුන් චාරිත්‍රයක් ලෙස තම සේවා සැපයීම සඳහා වෙල්ලාලවරුන්ගේ නිවෙස්වලට යාම වැනි පහත් යැයි සම්මත චාරිත්‍ර සහ කුල ව්‍යවහාර තහනම් කරන ලදි. මෙම සංවිධානවල නිරන්තර ප්‍රයත්නය වී ඇත්තේ මෙම කුල-පාදක සේවා පිළිගත් මූල්‍යමය ආකෘතියක් සහිත වෘත්තීමය තත්වයට පත්කොට, කුල පදනමකින් තොරව ව්‍යාපාරික පදනමක් යටතේ මෙම සේවා පුද්ගලයන්ට සැපයීමටය. එසේම ධුරාවලිගත චාරිත්‍රමය ව්‍යවහාරයක් ලෙස නොව ව්‍යාපාරයක ස්වරූපයෙන්, පුද්ගලබද්ධ නොවූ සේවාවන් ලෙස මෙම සේවා වෙළඳපොළට සැපයීම ඔවුන්ගේ අභිප්‍රාය විය. මෙම ක්‍රියාමාර්ග තුළින් කුල අසමානතා සැබෑ ලෙසම තුරන් වී ඇත්ද යන්න තවදුරටත් විමසිය යුතු කරුණකි. එසේ නමුත් ඉන් පෙනී යන්නේ, යුද්ධය නිසා හෝ LTTE ය කුලය තහනම් කළ නිසා හෝ ජාතිකත්ව හැඟීම උත්සන්න වීම නිසා යාපන සමාජය තුළ කුලයට එරෙහි අරගල තවම අවසන් වී නොමැති බවයි.

වත්මන් යාපන සමාජය තුළ දරිද්‍රතාවය, යුද්ධයෙන් ඇතිවන පීඩාකාරී බලපෑම්, පාරම්පරික අවාසිදායක තත්වයන් සහ අස්පර්ශනීයත්වය පිළිබඳ විශ්වාස සමග මුසුව යුද්ධය සහ සුනාමිය වැනි ව්‍යසනවල පීඩාකාරී බලපෑම තීව්‍ර කොට ඇති බව මෙහිදී හෙළි විය. කුලය වූ කලී පන්තිය, ජනවාර්ගිකත්වය, ස්ත්‍රීපුරුෂභාවය යන සෙසු සාධක මෙන්ම පුද්ගලයන් මුහුණ දෙන අවාසි සහ දුෂ්කරතාවන්ට බලපාන එක් සංකීර්ණ සාධකයක් පමණි. යුද්ධය හෝ සුනාමිය නිසා අවතැන් වූ ජනයා තුළ ක්‍රියාකාරී බලපෑම් ඇති කිරීමට ඉහත සාධක අතුරින් කුලය පමණක් මුල් වේ යැයි කිව නොහැකිය. IDP කඳවුරුවල දිගු කාලයක් රැඳී සිටි ජනයා මෙන්ම LTTE සංවිධානයට එක්වූවන් යුද්ධයේ පීඩාවන්ගෙන් සහ සන්නද්ධ කණ්ඩායම්වලට බලෙන් බඳවාගැනීම්වලින් ගැලවී පිටතට සංක්‍රමණය වීමට හැකි වූයේ කාටද, වෙනත් සමාජ ආරක්ෂණයන් නොමැති හෙයින් සන්නද්ධ කණ්ඩායමට සම්බන්ධ වීමට සිදු වූයේ කාටද යන කාරණා ගැන සැලකීමේදී කුලය, පන්තිය සහ ඇතැම්විට ස්ත්‍රී-පුරුෂභාවය යන සාධක බලපෑ ඇතැයි කිව හැකිය. විවිධ පාර්ශවයන් කුලය විවෘතව හඳුනානොග න්නා නමුත් එමෙන්ම ජාතික නිදහස් අරගලය, ත්‍රස්තවාදය මර්දනය වැනි මහා ව්‍යාඛ්‍යාන තුළ මෙන්ම සියලුම නිල විග්‍රහයන් තුළ කුලයට අවකාශයක් නොමැති නමුදු, උතුරේ දිග හැරෙමින් පවත්නා සමාජ යථාර්ථය සත්‍ය වශයෙන්ම තේරුම් ගත හැක්කේ අනේක විධ සමාජ අසාධාරණ, කොන් කිරීම් සහ ප්‍රචණ්ඩකාරීත්වයන් අතර ඇති සංකීර්ණ බලපෑම් නිවැරදිව සහ ආනුභවිකව තේරුම් ගැනීම තුළිනි.

පස්වන පරිච්ඡේදය

ශ්‍රී ලංකාවේ ඉන්දියානු වතු කම්කරුවන් අතර පවත්නා කුල-පාදක කොන් කිරීම්

ශෂිකුමාර් බාලසුන්දරම්
පී.පී. සිවප්‍රකාශම්
ඒ.එස්. චන්ද්‍රාබෝස්

මෙම පරිච්ඡේදයේදී ඉන්දියානු සම්භවයක් සහිත වතු කම්කරුවන් අතර ඇති කුල ක්‍රමය සාකච්ඡාවට බඳුන් වේ. ඉන් අනතුරුව තෝරා ගත් වතු කිහිපයක ක්ෂේත්‍ර අධ්‍යයන ඇසුරින් කුලය පදනම් වූ සමාජ කොන් කිරීම් ගැන විමසනු ලැබේ.

පසුබිම

ඉන්දීය වතු කම්කරුවන් අතර ඇති කුල ක්‍රමය එක් අතකින් දකුණු ඉන්දියානු කුල ක්‍රමයේ විකාශනයක් ලෙස සැලකිය හැකිය. අනෙක් අතට එම කුල ක්‍රමය වතු ආර්ථිකයේ අවශ්‍යතා අනුව අනුවර්තනය වීමක් ලෙස විග්‍රහ කළ හැකිය. වතුකරයේ පදිංචි කම්කරුවන් බොහෝ දෙනෙක් දෙමළ බස කතා කරන හින්දු භක්තිකයන්ය. හින්දු ආගමානුකූල වූ කුල ක්‍රමයක් වතු කම්කරුවන් අතර තහවුරු වී ඇත. දකුණු ඉන්දියාවේ සිට මෙම කම්කරුවන්ගේ සංක්‍රමණ ආරම්භ වූයේ 1840 ගණන්වලදී යටත් විජිත ක්‍රමය යටතේ ලංකාවේ මධ්‍යම ප්‍රදේශවල කෝපි වගාව ඇරඹීමත් සමගය. එදා සිට අද දක්වා වතු ආර්ථිකයේ විවිධ විපර්යාස සිදු විය. කෙසේ නමුත් වතු කම්කරුවන්ගේ ජීවන මට්ටම හෝ කුල සාධකයේ ක්‍රියාකාරිත්වය වෙනස් වී නොමැත (Jayaraman 1975, Peebles 2001). මේ අතර ගැමි සමාජය තුළ ප්‍රභවය වූ කුල ක්‍රමය වතු ආර්ථිකයට ගැළපෙන ලෙස අනුවර්තනය වීමක් සිදුවී ඇත (De Silva 1982, Wesumperuma 1986, Muthulingam 1990).

වතු කම්කරුවන්ගේ ජනවාර්ගික අනන්‍යතාවය 'ඉන්දියානු දෙමළ' ලෙස රාජ්‍ය ලිපි ලේඛනවල සහ වෙනත් වාර්තාවල දැක්වේ.[20] කෙසේ නමුත් වර්තමානය වන විට මොවුන්ගෙන් වැඩි දෙනා ශ්‍රී ලංකාවේ උපන් අය වන නිසා සහ දැනට ඔවුන් ඉන්දියාව සමග ඇති සබඳතා සීමිත නිසා 'ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ' (Tamils of Indian Origin) යන්න වඩාත් යෝග්‍ය වේ. 1981 සහ 2001 ජන සංගණන තුළ මෙම ජනවර්ගයේ විශාලත්වය නිවැරදි ලෙස ගණනය වී නොමැත (Chandrabose 2003, Peebles 2001). මෙම ජන සංගණනවලදී ඉන්දීය සම්භවයක් සහිත ඇතැම් දෙමළ ජනයා 'ඉන්දියානු දෙමළ' වෙනුවට 'ලාංකික දෙමළ' ලෙස තමන් හඳුන්වා දී ඇත. විශේෂයෙන්ම පුරවැසිභාවය ලැබීමෙන් අනතුරුව ලංකා සමාජය තුළ තම අයිතිවාසිකම් තහවුරු කරනු වස් 'ලංකා දෙමළ' ලෙස තම අනන්‍යතාවය ප්‍රකාශ කළේ යැයි සිතිය හැකිය.[21] 2001 සංගණන වාර්තාව අනුව ඉන්දීය දෙමළ ජනගහනය මුළු ශ්‍රී ලංකා ජනගහනයෙන් 5% ක් පමණ විය. එසේ නමුත් සත්‍ය තත්වය අනුව මෙම ජනගහනය මිලියන 1.3 ක් නැතහොත් සමස්ත ජනගහනයෙන් 6.4% ක් වෙතැයි සමහරු කල්පනා කරති (Chandrabose 2003). ඉන්දියානු සම්භවය සහිත දෙමළ ජනගහනයෙන් 80% ක් වතුකරයේ ජීවත් වෙති. සෙසු අය කොළඹ, මහනුවර වැනි නගරවල ව්‍යාපාරික කටයුතු, කුලී වැඩ සහ සනීපාරක්ෂක කම්කරු වැනි වෘත්තීන්වල යෙදී සිටිති. සමස්ත ඉන්දීය දෙමළ ජනයාගෙන් 51.3% ක් නුවරඑළිය දිස්ත්‍රික්කයේද, 18% ක් බදුල්ල දිස්ත්‍රික්කයේද, 8.5% ක් මහනුවර දිස්ත්‍රික්කයේද පදිංචිව සිටිති.

19 වන සියවසේ මුල් භාගයේ සිට දකුණු ඉන්දීය කම්කරුවන් ලොව විවිධ ප්‍රදේශවල වතු ආර්ථිකයන්ට සංක්‍රමණය විය. ශ්‍රී ලංකාවේ වතුකරයට දකුණු ඉන්දියාවේ විවිධ පෙදෙස්වලින් සංක්‍රමණය වූ බහුතරය දරිද්‍රතාවයෙන් පෙළුණු පරයන්[22], පල්ලන්[23] සහ චක්කිලියාර්[24] යන දලිත් ගණයට අයත් කුලවලින් පැමිණි අය වූහ (Wesumperuma 1986). සංක්‍රමණිකයන්ගෙන් සුළු පිරිසක් මොට්ටයි වෙල්ලාලන්, රෙඩ්ඩියාර් සහ අගමුදියන් වැනි තරමක් උසස් කුලවලට අයත් විය. තවත් සුළු පිරිසක් රෙදි සෝදන කුලය සහ කරණවෑම් යන විශේෂ සේවා සපයන කුලවලට අයත් වූහ. වතු හිමියන් සහ ඔවුන්ගේ අතරමැදියන් විසින් කම්කරුවන් ලෙස වඩාත් පීඩිත කුලවලට අයත් අය බඳවා ගැනීම අහඹු සිද්ධියක් නොව, කම්කරු වැඩ සඳහා එබඳු අය වඩා

20 මෙම කණ්ඩායම හඳුන්වන අනෙකුත් නම් අතර 'වතු දෙමළ' හා 'මලයියාහ මිනිසුන්' (වචනාර්ථය ගත් විට කඳුකරයේ වෙසෙන ජනයා) දැක්විය හැකිය.

21 ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ ජනයාට ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ලබා දුන් පසු, ඔවුන්ගෙන් ඇතැම් අය තමන්ගේ තත්වය වෙනස් කර ගැනීමට සුදුසුම මඟ යැයි සිතා 'ශ්‍රී ලංකා දෙමළ' ලෙස තමන්ව හඳුන්වා දී ඇත.

22 සමහර ලේඛනවල පරයන් සහ පරයර් ලෙසද යෙදේ.

23 සමහර ලේඛනවල පල්ලර් ලෙසද යෙදේ. මෙම ලේඛනයේදී පල්ලන් ලෙස යෙදුවෙමු.

24 සමහර ලිපිවල හා සංවාදවලදී සක්කිලියාර් ලෙසද යෙදේ. 'චක්කිලියාර්' යන්නෙහි අපවාදාත්මක ස්වරූපය අවම හෙයින් මෙම ලේඛනයේදී එසේ යොදා ඇත.

සුදුසු යැයි යන එවකට පැවති යටත් විජිත මානසිකත්වය නිසා ඇතිවූ තත්වයකි. එබඳු කුලවල අය තම දරිද්‍රතාවය සහ කුල පීඩනයට ලක්වීම නිසා විදේශයන්ට සංක්‍රමණය වීමට වඩා කැමැත්තෙන් ඉදිරිපත් වූ බව පෙනේ (Wickramasinghe 1995). වතු කම්කරුවන් බඳවා ගැනීමේදී සහ සේවයට යෙදීමේදී කුල සාධකය උපයෝගී කරගන්නා ලදි. මෙය යටත් විජිත අවධියේදී 'කුලය අලුතින් නිර්මාණය කිරීමක්' (Dirks 1997, 2000) ලෙස ද සැලකිය හැකිය. පීඩිත කුලවල කම්කරුවන් හඳුනා ගැනීම සහ සේවයට බඳවා ගැනීම ඉහළ කුලවලින් තෝරා ගත් කංගානිවරු හරහා සිදු වූ අතර පසුව එම ශ්‍රමිකයන් වැඩ කණ්ඩායම්වලට යොදාගෙන ඔවුන්ගේ වැඩ අධීක්ෂණය කිරීමද එම කංගානිවරු විසින්ම සිදු කරන ලදි. වතු ආර්ථිකය තුළ කම්කරුවන් සහ වතු පාලකයන් අතර සම්බන්ධය ඇති කරන පුරුක බවට පත්වූයේ බොහෝදුරට කුල පදනම අනුව තෝරාගත් මෙම කංගානිවරුය.[25]

වතු ආර්ථිකය තුළ ප්‍රධාන කංගානිවරු සහ සෙසු කංගානිවරු වැඩි දෙනා වෙල්ලාලන් කුලයට අයත් විය. එපමණක් නොව සිල්ලර කඩ හිමියන් සහ මුදල් ණයට දෙන්නන්ද ඉන්දීය වතු කම්කරු සමාජය තුළ ඉහළ කුලවලට අයත් විය. වතු කම්කරුවන්ගේ වෘත්තීය සමිති ව්‍යාපාරයට නායකත්වය දුන් පිරිස් අතරද, විවිධ ප්‍රජා සංවිධානවල තනතුරුවලට පත්වූ අය අතරද ඉහළ කුලවල වැඩි නියෝජනයක් විය. මෙම වතු කම්කරු සමාජයේ මධ්‍යම තලයට අයත් අයගේ දරුවන් බොහෝවිට අධ්‍යාපනය සඳහා යවන ලද්දේ වතුකරයේ පාසැල්වලට වඩා සමීප නගරවල ඇති පාසැල්වලටය. ඉහළ කුලවලට අයත් ඇතැම් පිරිස් කම්කරු ශ්‍රේණියට අයත් කුලී වැඩ කළ නමුත් වතු ක්‍රමය තුළ කුල මට්ටම සහ රැකියා ශ්‍රේණිය අතර සමීප සම්බන්ධයක් විය.

ඉන්දීය වතු කම්කරු ජනයාගෙන් 75% ක් පමණ පල්ලන්, පරයන් සහ චක්කිලියාර් යන පීඩිත කුලවලට අයත් විය. සමස්ත ඉන්දීය වතු කම්කරු ජනයාගෙන් 40% ක් පමණ පරයන් කුලයට අයත් විය. මහරූෆ්ට අනුව ඉන්දීය වතු කම්කරු ජනයා කුල ව්‍යුහය අතින් මුදුන නැති සමාජ පිරමිඩයකට සමාන විය (Mahroof 2000). ඉහළ කුලිකයන් සංඛ්‍යාත්මකව සුළුතරයක් වූ නමුත් ඔවුහු මෙම ප්‍රජාව තුළ ප්‍රභූ පිරිස ලෙස කටයුතු කළහ. වතු ප්‍රජාවේ වාර්ෂික ආගමික පිළිවෙත්වලදී (විශේෂයෙන්ම තේරු උත්සවය වැනි), කාමන්කූත්තු වැනි සාමූහික නාට්‍යවලදී නායකත්වය දෙන ලද්දේ මෙම ප්‍රභූ පිරිස විසිනි. ආදි ද්‍රවිඩයන් ලෙස හඳුනාගත් පරයන්, පල්ලන් සහ චක්කිලියාර් කුල ජන සංඛ්‍යාව අතින් විශාල වුවද සංවිධානය අතින් දුර්වල විය. ඔවුන් වත්තේ එදිනෙදා කානු කැපීම, දලු කැඩීම සහ කර්මාන්ත ශාලාවේ වැඩවලට යොමු වූ අතර වත්ත තුළ හෝ වතු අතර ඔවුන්ට අන්‍යෝන්‍ය සබඳතා පවත්වා ගැනීමට

25 වතු කම්කරුවා වනාහි ජනවාර්ගිකත්වය හා කුලය මගින් දාසභාවයට පත් වූ වහල් කම්කරුවෙකි. ඔවුන් එක් වත්තකින් තවත් එකකට හෝ වතුවලින් ලංකාවේ වෙනත් ස්ථානවලට සංක්‍රමණය වීම සීමා වූ අතර, වතු ආර්ථිකය හා සමාජය තුළ ජනවාර්ගිකත්වය, කුලය හා ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවය අනුව ඔවුන්ගේ භූමිකාව සහ වරප්‍රසාද තීරණය විය.

තිබූ අවකාශය සීමිත විය. අනෙක් අතට ඉහළ කුලවලට අයත් පිරිස් සංඛ්‍යාවෙන් සීමිත වූ නමුත් විවාහ යනාදිය මඟින් වත්ත තුළත් වතු අතරත් එකිනෙකට සම්බන්ධ විය. එමෙන්ම ඉහළ කුලවල අය බොහෝවිට දකුණු ඉන්දියාවේ මුල් ගම් සමගද තම සම්බන්ධය ඉදිරියට ගෙන ගියහ. මෙවැනි තත්වයන් යටතේ වතු ප්‍රජාව තුළ ඉහළ කුල සහ පහළ කුල අතර විෂමතා සහ සමාජ ආර්ථික පරතරය 1980 ගණන් වන තුරු පැහැදිලිව හඳුනාගත හැකි විය.

කෙසේ නමුත් 1960 ගණන්වල සිට ඉන්දියාව සහ ලංකාව අතර ඇති කර ගත් විවිධ ගිවිසුම් යටතේ ඉන්දීය සම්භවයක් සහිත ජනයා සෑහෙන පිරිසක් ආපසු ඉන්දියාවේ පදිංචියට ගියහ. ආපසු ඉන්දියාවේ පදිංචියට යෑමට කැමැත්තෙන් ඉදිරිපත් වූ වැඩි දෙනා ඉහළ කුලවලට අයත් අය වූහ. මෙම මහා පරිමාණ සංක්‍රමණයන් නිසා ඉන්දීය සම්භවයක් සහිත ලාංකික ජනතාව අතර වූ කුල සංයුතිය වඩාත් PPC කුලවලට වාසිදායක ලෙස වෙනස් විය. සමහර අයගේ ගණනය කිරීම්වලට අනුව ලංකාවේ ඉතිරි වූ ඉන්දීය සම්භවය සහිත ජනගහනයෙන් 83% ක් පමණ පීඩිත කුල තුනට අයත් වූහ (පී. පී. සිවප්‍රකාශම් මහතා සමග පැවැත්වූ සාකච්ඡාවකදී ඔහු විසින් ප්‍රකාශ කරන ලදි). මෙම තත්වය යටතේ කුල ධුරාවලියේ පහත් ස්තරවලට අයත් අයගේ පිරිස් බලය වඩාත් ප්‍රසාරණය වූ අතර මේ මඟින් වෘත්තීය සමිති හා දේශපාලන පක්ෂ තුළ නායකත්වය ගෙන කටයුතු කළ කුලීනයන්ට අභියෝග කිරීමට PPC කුලවලට වැඩි අවකාශයක් ලැබිණි.

මෙහිදී සඳහන් කළ යුතු එක් දෙයක් නම් නිදහසින් පසු අවධියේදී වතු පරිපාලනයෙහි මූලික විපර්යාසයක් සිදු වූ බවයි. 1970 ගණන්වලදී වතු ජනසතු කිරීමත් සමග කංගානිවරු වටා සකස් වූ ශ්‍රම සංවිධානයේ වෙනසක් සිදු විය. වතු පරිපාලනය, ජනවසම, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සහ උඩවසම වැනි රාජ්‍ය සංස්ථාවලට පැවරුණි. කලින් වතු පාලකයන් ලෙස සිටි බොහෝවිට යුරෝපීය සම්භවයක් සහිත වතු පාලකයන් වෙනුවට සිංහල වතු පාලකයන් එම තනතුරුවලට පත්විය. 1973-76 කාලයේදී රටේ පැවති ආහාර හිඟය වතුකරය කෙරෙහි විශේෂයෙන් බලපෑවේය. ඊට අමතරව වතුකරයේ ජනවාර්ගික සබඳතාද ක්‍රමයෙන් පරිහානියට පත්විය. 1977 සිට අවස්ථා කිහිපයකදී ඉන්දීය වතු කම්කරුවන් අන්තවාදී සිංහල දාමරිකයන්ගේ පහරදීම්වලට ලක්විය. මේ තත්වයන් යටතේ ඉන්දීය දෙමළ වතු කම්කරුවන් තම ආරක්ෂාව පතා ආපසු ඉන්දියාවට යාම වැඩි විය.

මෙසේ ඉන්දියාවට ආපසු සංක්‍රමණය වූ අයගෙන් බහුතරය මොට්ටයි වෙල්ලාලන්, රෙඩ්ඩියාර්, අගමුදියන්, අම්බලකාරන්, නයිදු, මුදලියාර් වැනි කුලීන අය වූහ. වතු පදිංචිකරුවන්ගෙන් බහුතරය වූ PPC කුලවල අය සමග ඉහත සඳහන් කුලීන පිරිස් යම් තරමකට දුරස්ත වූ සබඳතාවක් පැවැත්වූහ. කුලීන පිරිස් බහුතරය නැවත ඉන්දියාවට සංක්‍රමණය වූ පසු ඉතිරිවූ කුලීන පිරිස්වල තත්වය වඩාත් අනාරක්ෂිත විය. ඔවුන් බොහෝවිට වතුකරයේ කාර්යාල සේවකයන්ට සහ ව්‍යාපාරික පිරිස්වලට සීමා

විය. මේ තත්වයන් යටතේ වතු සමාජය තුළ PPC කුලවල සාපේක්ෂක වැදගත්කම වඩාත් ඉස්මතු වී ඇත. වර්තමානය වන විට කංගානිවරු ඉහළ කුලයට සීමා වී නැත. බොහෝ වතුවල අද වන විට කංගානිවරු වැඩිදෙනා PPC කුලවල අයගෙන් සමන්විතය.

අතීතයේදී පරයන්, පල්ලන් සහ චක්කිලියාර් කුලවල ළමයින් බොහෝවිට ප්‍රාථමික අධ්‍යාපනයට සීමා විය.[26] දෙමාපියන්ගේ අඩු උනන්දුව, දරිද්‍රතාවය සහ වතු පාසැල්වල ගුරුවරුන් කුලහීන දරුවන්ට කළ වෙනස්කම් යනාදිය මෙයට බලපෑ සාධකයන්ය. වතු පාසැල් ජනසතු කිරීමෙන් අනතුරුව, විශේෂයෙන්ම මෙම පාසැල්වල තත්වය දියුණු කිරීම සඳහා "ස්වීඩන් අන්තර්ජාතික සංවර්ධන ආයතනයේ" (SIDA) ආධාර යටතේ සිදු කළ ව්‍යාපෘති නිසා, වතුකරයේ අධ්‍යාපන ක්‍රමය ගුණාත්මක වශයෙන් දියුණු වී ඇත. ඊට අමතරව දේශපාලනය සහ ව්‍යාපාරික අංශවලින් ද PPC කුලවල උඩුකුරු චලනතා නැඹුරුව සහිත පිරිස් යම් තරමකට වාසි ලබා ගෙන ඇත. කෙසේ නමුත් මෙම ප්‍රජාවේ දේශපාලන සහ වෘත්තීය සමිති නායකත්වය තවමත් රැඳී පවත්නේ ප්‍රජාවේ ඉතිරි වී ඇති කුලීන දේශපාලන පවුල් කිහිපයක් වටාය.

ස්පර්ශ කළ නොහැක්කන් ස්පර්ශ කළ හැක්කන් බවට පත්වීම: වතු ප්‍රජා කිහිපයක සිදු කළ මානව වංශ විද්‍යාත්මක පර්යේෂණ

තෝරා ගත් වතු කිහිපයක සිදු කළ මානවවංශ පර්යේෂණවල අරමුණ වූයේ වතුකරයේ ඇති කුල අසාධාරණයන් සහ කුලහීනයන්ට එරෙහිව ඇති සමාජ කොන් කිරීම් හඳුනා ගැනීමය. මෙම අධ්‍යයනයට ලක් වූ වතු නම්, වටවල පිහිටි රොසෙලා වත්ත, කහවත්තේ පිහිටි ඕපාත වත්ත, හැටන්වල පිහිටි ටෙම්පල්ස්ටෝවේ වත්ත සහ මස්කෙළියේ පිහිටි මෝචා වත්තයි. මෙම පරිච්ඡේදයේ කලින් සඳහන් කළ විවිධ විපර්යාසයන් නිසා වතුකරය තුළ ඉන්දියාවේ ස්පර්ශ කළ නොහැකි කුලවල අය ස්පර්ශ කළ හැක්කන් වූයේ යැයි සිතිය හැකිය. වතුකරයට අයත් PPC කුල සඳහා දලිත් යන වචනය ඇතැම් විට භාවිත කළ නමුත්, එම වචනයට වැඩි පිළිගැනීමක් වතුකරයේ නැත. සමහරුන්ට අනුව දලිත් යන නමින් ඉන්දීය සම්භවය සහිත අයගෙන් කොටසක් වෙනම හඳුනා ගැනීම මෙම ජන වර්ගය තවදුරටත් දුර්වල වීමට සහ කොන්වීමට හේතුවිය හැකි කරුණකි (පී.පී. සිවප්‍රකාශම් සමග කළ සාකච්ඡාව). කුල භේදයෙන් තොරව සමස්ත ජන වර්ගය එක්සත්ව කටයුතු කළ යුතුය යන්න බොහෝ ප්‍රජා නායකයන්ගේ මතය වී ඇත.

දැනට වතුකරයේ සිටින අති බහුතරය PPC කුලවලට අයත් බැවින් ඔවුන් සම්භාව්‍ය හින්දු කුල ක්‍රමයට අනුව අස්පර්ශනීය ගණයට අයත් වේ. කෙසේ නමුත්, වතුකරයේ බහුතරය කුල තත්වය අතින් පහළම මට්ටමට අයත් වූ නිසා, වතුකරයේ කම්කරු ශ්‍රම සංවිධානය අනුව විවිධ කුලවලට අයත් අය සමතලකරණයකට ලක්

26 වතු පාසැල් බොහොමයක පන්ති ඇත්තේ අටවන ශ්‍රේණියට පමණි. භාෂා නිපුණතාවය (දෙමළ පමණක්) සීමිත වීම වැනි කරුණු කිහිපයක් නිසා ඉහළ අධ්‍යාපනයක් ලැබීමේ හැකියාව සහ වතුවලින් පිටස්තර රැකියා සෙවීමට ඇති ඉඩ සීමා වී ඇත.

වීම නිසා සහ ලැයිම් නිවාසවල විවිධ කුලවල අය එකිනෙකා ආසන්නයේ ජීවත්වීම නිසා වතුකරය තුළ ස්පර්ශ කළ නොහැකි බව අදහසක් ලෙස හෝ භාවිතයක් ලෙස පැළපදියම් වූයේ නැත. වතුකරයේ කුල ආධිපත්‍යය සහ කුල විෂමතා වතු ආර්ථිකය තුළ හෙබවූ තනතුරු මත බොහෝදුරට රඳා පැවතුණි. ඒ ඒ කුලවලට අයත් කෝවිල් ඒ ඒ කුලයේ පාලනයට අයත් වූ නමුත්, කුලය මත පානීය ජලය, සෞඛ්‍ය පහසුකම් වැනි දේ අහිමි වූයේ නැත. වතුකරය තුළ කුල ක්‍රමය සුවිශේෂ අයුරින් ක්‍රියාත්මක විය. "වතු දෙමළ ජනයාගේ කුල ක්‍රමය භෞතික, ආර්ථික සහ මානසික සාධක අතින් සුවිශේෂ ස්වභාවයක් උසුලයි" යන්න මහරූෆ්ගේ අදහසයි (Mahroof 2000: 1).

වතුකරයේ කුල ධුරාවලිය මට්ටම් හතරකින් සමන්විතය. එනම් කුඩියානවර්, පල්ලන්, පරයර් සහ චක්කිලියාර් වේ. අස්පර්ශනීයත්වය වෙනුවට 'හොඳ කුල' සහ 'අඩු කුල' පිළිබඳ අදහසක් පවතී. පල්ලන්, පරයර් සහ චක්කිලියාර් දකුණු ඉන්දියාවේ සෙසු අය විසින් ස්පර්ශ කළ නොහැකි පිරිස් ලෙස හඳුනා ගත් නමුත්, ලංකාවේ වතුකරය තුළ එම අදහස පිළිගත් බවක් නොපෙනේ.

මේ තත්වය රොසෙලා වත්තේ කුල ක්‍රමය ඇසුරින් පෙන්වා දිය හැකිය.

වගු අංක 5.1

රොසෙලා වත්තේ කුල සංයුතිය

කණ්ඩායම	පවුල් සංඛ්‍යාව	සාම්ප්‍රදායයික කාර්යය (ඉන්දියාවේදී)	වර්තමාන රැකියාව/චාරිත්‍රමය වගකීම (ශ්‍රී ලංකාවේ වතුවලදී)
කුඩියානවර්	61 (30.3%)	ගොවිතැන	වතු කම්කරු/වෙළඳාම/ ගොවිතැන
පල්ලන්	49 (24.4%)	කුලී වැඩ	වතු කම්කරු/කෝවිලේ තප්පු ගැසීම
පරයන්	24 (11.9%)	තප්පු ගැසීම/ කුලී වැඩ	වතු කම්කරු/කෝවිලේදී හෝ වෙනත් අවස්ථාවල තප්පු ගැසීම
චක්කිලියාර්	56 (27.9%)	වීථි අතු ගෑම/ කසළ ශෝධනය	වතු කම්කරු/වැසිකිලි සේදීම
සිංහල	08 (4.0%)	-	-
මුස්ලිම්	03 (1.5%)	-	-
මුළු එකතුව	201 (100%)	-	-

මූලාශ්‍ර: ක්ෂේත්‍ර සටහන්, 2007 මැයි.

මෙම වත්තේ කිසිවකු ඒ ඒ ගෘහස්තයේ කුල අනන්‍යතාවය ප්‍රකාශ කිරීමට මැළි විය. කුලය ගැන විවෘතව කතා කිරීම වතු සමාජයේ අපහසු කරුණක් විය. වතු ප්‍රජාවේ කුල සංයුතිය ගැන විමසූ විට නිලධාරීන් සහ ප්‍රජා නායකයින් තමුන් එය නොදන්නා බව ප්‍රකාශ කළහ. අවසානයේ කුල සංයුතිය ලබා ගැනීමට හැකි වූයේ වයස 60 ඉක්මවූ කාන්තාවන් පස්දෙනෙකු සමග කළ සමූහ සාකච්ඡාවක් මඟිනි.

ඔවුන් පස්දෙනාගේ දැනුම අනුව වත්තේ කුල සංයුතිය හඳුනා ගැනීමට හැකිවිය. බොහෝ අයට සෙසු අයගේ කුලය සඳහන් කිරීමට නොහැකි විය. විශේෂයෙන්ම පිරිමි අය කුලය ගැන කතා කිරීමට අකැමති වූහ. කුලය ගැන යම් තරමකට හෝ කතා කිරීමට ඉදිරිපත් වූයේ තරමක් වයස්ගත කාන්තාවන්ය.

5.1 වගුව අනුව දකුණු ඉන්දියාවේදී ඒ ඒ කුලයට, සාම්ප්‍රදායිකව හිමි වූ කාර්යය වතුකරය තුළ සිදු කරන්නේ සීමිත වශයෙන් බව පෙනේ. මෙයට හේතුව වතුකරය තුළ සෑමදෙනාම තමන්ගේ කුල පසුබිම කුමක් වුවත් වතු කම්කරුවන් බවට පරිවර්තනය වීමය. සමහර අවස්ථාවලදී සාම්ප්‍රදායික කුල මෙහෙවර වතුකරය තුළ ද්විතීක හෝ චාරිත්‍රානුකූල කාර්යයක් බවට පත් වී ඇත. එයින් තමන්ට ලැබෙන පහත් තත්වය ගැන සලකා සමහර පුද්ගලයෝ තමන්ගේ පාරම්පරික රැකියා ගැන කීමට මැළි වෙති. විශේෂයෙන්ම තරුණ පිරිස් කසළ ශෝධනය, වැසිකිළි පිරිසිදු කිරීම වැනි කුල ක්‍රමයට අයත් පාරම්පරික රැකියා කිරීමට අකමැත්තක් දක්වති. රොසෙලා වත්තේ රෙදි ඇපිල්ලීම, කොණ්ඩා කැපීම, කසළ ශෝධනය වැනි කටයුතු කරනු ලැබුවේ ඒ ඒ කුලවලට අයත් ඇතැම් වැඩිහිටියන් පමණි. ජනගහනය ගැන සලකන විට මෙම වත්තේ ජනගහනයෙන් 64% ක් පමණ PPC කුලවලටද, 30% ක් කුඩියානවර් මට්ටමටද අයත් විය. සෙසු වතු හා සසඳන විට මේ වත්තේ කුඩියානවර් මට්ටමට අයත් ජනගහනය සාපේක්ෂ වශයෙන් තරමක් ඉහළ මට්ටමක විය. කෙසේ නමුත් මෙම වත්තේ ප්‍රජාව තුළ සමාජ, ආර්ථික සහ දේශපාලන වශයෙන් ඉහළ මට්ටමක සිටි වැඩිදෙනා කුල ක්‍රමයේ ඉහළ මට්ටමට අයත් විය.

වගු අංක 5.2

රොසෙලා වත්තේ කුල ධූරාවලිය

කුලය	උප කුල	කුඩා උප කුල
කුඩියානවර්	වෙල්ලාල, මොට්ට වෙල්ලාල, වන්නියා කවුන්දර්, මුතු රාජා, අහම්පඩියාර්, පඩච්චි, කල්ලර්, මුදලියාර්, උඩයර්, මුප්පුලි, වඩවු නායිදු, 1. පන්ඩාරම් 2. චෙට්ටියාර් 3. මරවර්, ඉදයර්, අසාරි	1. කොච්චිකාරි වඩු, කොන්ග වඩු, කොරවන් වඩු, සේලන්ගා වඩු 2. පෙරි චෙට්ටි, කෝමුට්ටි චෙට්ටි, කුදිරයි චෙට්ටි, වන්නිය චෙට්ටි 3. සෙම්පුනක්කු මරවර්, කුට්‍රාලි මරවර්, කත්කුරව් මරවර්, වන්නිකුඩි මරවර්, උප්පු කට්ටි මරවර්, පුලුක්ක මරවර්
පල්ලන්	දෙයිවේන්ද්‍ර පල්ලන්, මෙලකාර පල්ලන්, උරුම් පල්ලන්, අම්මා පල්ලන්, ආයා පල්ලන්, වෙලිකාට්ටු පල්ලන්	-
පරයර්	තන්ගලාන් පරයර්, ෂෝල පරයර්, ආර්කට්ටු පරයර්, වල්ලුව පරයර්	-
චක්කිලියාර්	අරුන්තතී චක්කිලියාර්, රෙඩ්ඩි චක්කිලියාර්, තොට්ටි චක්කිලියාර්, වඩුව චක්කිලියාර්,	-

දෙමළ වතු කම්කරුවන් අතර කුල බෙදීමක් පමණක් නොව උප කුල බෙදීමක් ද ඇති බව මෙම අධ්‍යයනයේදී හෙළි විය. වතු කම්කරුවන් අතර කුල තත්වය අතින් මට්ටම් හතරක් ඇති බව කලින් සඳහන් කරන ලදි. එනම්, කුඩියානවර්, පල්ලර්, පරයර් සහ චක්කිලියාර් වශයෙනි. මේ එක් එක් කුලය උප කුල කිහිපයකටත්, ඇතැම් අවස්ථාවලදී එක් උප කුලයක් දෙවන මට්ටමේ උප කුලවලටද බෙදී ඇති බව සොයා ගත හැකි විය (බලන්න 5.2 වගුව). ඒ ඒ උප කුල අතරද ධුරාවලි රටාවක් ඇති බව සඳහන් කරන ලදි. එසේ නමුත් තමන්ගේ උප කුලය ගැන සඳහන් කරන විට සෑම විටම එය තම කුලයට අයත් වඩාත්ම උසස් උප කුලය ලෙස බොහෝ අය සඳහන් කළහ. තමන්ගේ කුලය ගැන මෙන්ම උප කුලය ගැනද සාඩම්බරයෙන් කරුණු ඉදිරිපත් කිරීමට මේ ගැන සඳහන් කළ වැඩිහිටි කාන්තාවන් උනන්දු විය.

රොසෙලා වත්තේ එක් කුඩියානවර් මට්ටමට අයත් වැඩිහිටි පූසාරි (පූජක) කාන්තාවකට අනුව, ඇයගේ මාපියන් තුළ අස්පර්ශනීයත්වය පිළිබඳ අදහසක් විය. ඇයගේ මව ඇයට සඳහන් කොට තිබුණේ කුලහීනයන් කුලීනයන්ගේ ඇඟේ ගෑවුන විට, එසේ කිල්ලට ලක්වන ඉහළ කුලයේ අයට ගෝනුස්සන් දෂ්ට කරන බවයි. මෙය ඔවුන් කිල්ලට ලක් වීම සඳහා වූ දඬුවමක් ලෙස සලකන ලදි. මෙය ඉන්දියාවේ මුල් ගම්මානවල නිතර සිදුවන දෙයක් ලෙසද ඇය අසා තිබුණි.

මුල් යුගයේදී කුලහීනයන්ට කෝවිල්වල දේවරූප ඇති 'කුරවරයි' නම් වූ කොටසට යාම තහනම් විය. එමෙන්ම ඔවුන්ට පූසාරිවරු බවට පත් වීමටද තහනමක් තිබිණි. ඇතැම් අවස්ථාවලදී කුඩියානවර්වරු තම ගෙවල් තුළට PPC කුලවල අය පැමිණීම ගැන අකැමති වූහ. මෙම තත්වයන් ක්‍රමයෙන් ලිහිල් වී ඇත. නමුත් ඉහළ කුලවල අයට පහළ කුලවල ගෙවල්වලින් ආහාර පාන ගැනීම සහ විවාහ සිදු කර ගැනීමට ඇති බාධා යම් තරමකට තවදුරටත් පවතී.

දෙවි දේවතාවුන් කුල අනුව බෙදා වෙන් කිරීමට උත්සාහයක්ද වතුකර ප්‍රජාව තුළ පවතී. උදාහරණයක් ලෙස 'මාරිඅම්මා' වතුකරයේ සෑම කුලයකටම අයත් අයගේ පුද පූජාවලට ලක්වන දේවතාවියකි. සමහරුන්ට අනුව ඇය කුඩියානවර් කුලයට අයත්ය. එයට හේතුව ලෙස ඔවුන් දකින්නේ ඇයගේ නළලේ ඇති තිලකයෙන් සහ ඇය පැළඳ සිටින තාලි මාලයෙන් ඒ බව ප්‍රකාශ වන බවයි. කාන්තාවන් පළඳින තාලි මාලයෙන් ඔවුන්ගේ කුල අනන්‍යතාවය ප්‍රකාශ වන බව වතු ප්‍රජාවන් තුළ විශ්වාස කරනු ලැබේ. කෙසේ නමුත් චක්කිලියාර් කුලයේ අය විශ්වාස කරන්නේ මාරි අම්මාන් තම කුලයට අයත් දේවතාවියක බවයි. ඔවුන්ට අනුව මාරි අම්මාන් දේවතාවිය පළඳින තාලිය චක්කිලියාර් කුලයේ එක් උප කුලයකට අදාළ තාලි විශේෂයක් බවයි. 'වැල් රාජා' පල්ලර් අයගේ දෙවියා ලෙස සැලකේ. 'මුරුතයිවීරන්' නමැති දෙවියාගේ එක් බිසවක් පල්ලන් කුලයෙන්ද තව බිසවක් චක්කිලියාර් කුලයෙන්ද තෝරා ගත් නිසා ඔහු මේ දෙපිරිසේම පුද පූජාවලට ලක් වේ. එසේම මෙම දෙවියා කුඩියානවර් අයද වැඳුම් පිදුම් කරන දෙවියකු බව අප විසින් අමතක නොකළ යුතුය.

වතු කම්කරු සමාජය තුළ ඒ ඒ කුලයේ සුවිශේෂ ගති ලක්ෂණ පිළිබඳ අදහසක් විය. පහත සඳහන් ජන කවියෙන් එය ප්‍රකාශ වේ.

කල්ලනුක්කු පෝවෙරික්කු	-	*කල්ලන් අයට බලය තිබේ*
වෙල්ලනුක්කු පනවිරුක්කු	-	*වෙල්ලන් අයට මුදල් ඇත*
කවන්දනුක්කු සෙරුක්කුකිරුකු	-	*කවුන්දන් අයට නම්බු නාම ඇත*
පල්ලනුක්කු පලියරුක්කු	-	*පල්ලන්වරුන්ට පළිගැනීම පිහිටා ඇත*
පරියනුක්කු පට්ටිරුක්කු	-	*පරයන්ලාට කවි සින්දු තිබේ*
චක්කිලියන් සන්දයිරුක්කු	-	*චක්කිලියාර් අයට සණ්ඩු සරුවල් තිබේ*

මූලාශ්‍රයඃ ටෙම්පල්ස්ටෝවේ වත්තේ ක්ෂේත්‍ර පරීක්ෂණය

ඉහත ජන කවියෙන් හෙළි වන ඒ ඒ කුලය ගැන පැවති, ආකෘතිමය ප්‍රතිරූප හැරුනු විට තම කුලයේ විශේෂ හැකියාවන් සහ උරුමකම් ගැන ඒ ඒ කුලය තුළ අදහසක්ද විය. උදාහරණයක් ලෙස "කලාව අපේ ලේ තුළම ඇත" යන පරයන්වරුන්ගේ හැඟීම සඳහන් කළ හැක (UNFPA 2007). තප්පු ගැසීම, ගායනය සහ කාමන්කූත්තු වැනි ජන නාටකවල රඟපෑම මෙම කලා කුසලතාවන්ට ඇතුළත් විය. එමෙන්ම කුඩියානවර් අය බොහෝවිට තමන් වෙහෙස මහන්සි වී වැඩ කරන, අවංක, බුද්ධිමත්, සංවිධානාත්මක ශක්තිය ඇති අය ලෙස කල්පනා කරති.

ඉන්දියාව සහ ලංකාව අතර සංක්‍රමණ තුළින් ස්පර්ශ නොකළ හැක්කන් ස්පර්ශ කළ හැක්කන් වූ බව කලින් සඳහන් කරන ලදි. ලංකාවේ සිට ඉන්දියාවට ආපසු සංක්‍රමණය වූ විට ඇතැම් විට එයට ප්‍රතිවිරුද්ධ ප්‍රතිඵල ඇති විය. PPC කුලවල අය ඉන්දියාවට ආපසු ගිය විට ඔවුන් දලිත් අය ලෙස නිල වශයෙන් හඳුනා ගන්නා ලදි. උඩරට ප්‍රදේශවලින් ඉන්දියාවට සංක්‍රමණය වූවන්ගේ සංගමයේ ලේකම් චන්ද්‍රසේකරන්ට අනුව ඇතැම් සංක්‍රමණිකයන්ට අලුතින් කුල පීඩනයන්ට මුහුණ දීමට සිදු විය (Chandrasekeran 2006). ඉන්දීය ආගමනික නීති අනුව ඔවුන් තම කුලය ප්‍රකාශ කිරීම අනිවාර්යය විය. මෙහිදී ඔවුන්ට ඉන්දීය අස්පර්ශනීයත්වයට නැවත බද්ධ වීමට සිදු විය. PPC කුලවලට අයත් ලංකාවේ වතු කම්කරුවන් ඉන්දු-ලංකා ගිවිසුම යටතේ නැවත ඉන්දියාවේ පදිංචියට යාමට අකැමති වූ මූලික කරුණක් නම් ඔවුන්ට ඉන්දීය හින්දු කුල ක්‍රමය යටතේ ඇති විය හැකි අයහපත් බලපෑම් ගැන කිසියම් අවබෝධයක් තිබීමය.

වර්තමානයේදී කුලය විවාහය වැනි කටයුතුවලදී සලකා බලන නමුත් සෙසු කටයුතුවලදී බොහෝදුරට නොසලකා හරිනු ලැබේ. 'නල්ල ජාති' (හොඳ කුල) සහ 'කීල් ජාති' (පහත් කුලය) අතර බෙදීම විවාහ වැනි කටයුතුවලදී පමණක් මූලික වශයෙන් වැදගත් වේ. කුඩියානවර්වරු තමන් ගැන කීමේදී 'ඔයාත ජාති' (උසස් කුල) යන වචනය ඇතැම් විට යොදා ගනිති. විශේෂයෙන්ම PPC කුලවල අය කුඩියානවර්වරු ගැන සඳහන් කරන විට 'හොඳ කුලය' යන යෙදුම යොදා ගනිති.

PPC කුලවල අය තමන් ගැන සඳහන් කිරීමේදී 'කීල් ජාති' (පහත්ම කුල) යන පදයට වඩා 'කුරයින්ඩ ජාති' (අඩු කුලය) යන පදය බහුලව යොදා ගනිති. කෙසේ නමුත් සාමාන්‍ය ව්‍යවහාරයේදී 'ජාති' (කුලය) යන පදයට වඩා 'අලුහ' (මානව කණ්ඩායම්) යන පදය භාවිත කරති. එමෙන්ම ඒ ඒ කුලයේ නම සඳහන් කරනවාට වඩා 'එංග අලුහල්' (අපේ මිනිස්සු) සහ 'උංග අලුහල්' (පිට මිනිස්සු) යන පද යොදා ගනිති. මෙම යෙදුම් කුලය ගැන මෙන්ම ජන වර්ගය ගැන පැවසීමේදී ද යොදා ගනු ලැබේ. අතීතයේදී වතුකරයේ කුල ගැටුම් ඇති වීමට ප්‍රධාන හේතුවක් වූයේ කෝවිල්වල පාලනය සඳහා වූ ගැටුම්ය. නමුත් කෝවිල් සහ කුලය අතර වූ සම්බන්ධය ක්‍රමයෙන් බිඳ වැටී ඇත. ඉහළ කුලවලට සීමා වූ කෝවිල්වලට ඇතුළු වීමට පහළ කුලවලට වූ බාධා ක්‍රමයෙන් ඉවත් වී ඇත. කෙසේ නමුත් PPC කුලවල අය වාචාල, කලහකාරී, මතට ලොල් වූ පිරිසක් ලෙස ඉහළ කුලවල අය තුළ මුල් බැස ගත් පිළි ගැනීමක් ඇත.

වතු කම්කරු සමාජයේ නායකත්වය පාරම්පරිකව හිමි වූයේ කුඩියානවර් මට්ටමට අයත් පවුල්වලටය. මේ තත්වය ශ්‍රම සංවිධානයේදී, කෝවිල් පාලනයේදී සහ දේශපාලන කටයුතුවලදී දැක ගත හැකි විය. මෙම කුඩියානවර් නායකත්වය ඔවුන්ගේ ජන සංඛ්‍යාව අඩු වීමත් සමග ක්‍රමයෙන් දුර්වල වී ඇත. කෙසේ නමුත් මොවුන්ගේ ප්‍රධාන දේශපාලන සංවිධානය වූ "ලංකා වතු කම්කරු සංගමය" තවමත් පාරම්පරික කුඩියානවර් නායකත්වය යටතේ පවත්නා බව මෙහිදි සඳහන් කළ යුතුය.

වතු කම්කරු පවුල්වල පිරිමි ළමුන් සෑහෙන පිරිසක් වෙළඳසැල් සහ හෝටල්වල සේවය කිරීම සඳහා කොළඹට සංක්‍රමණය වී ඇත. ගැහැණු ළමයි පිරිසක්ද ගෙවල්වල වැඩට සහ මෑතක සිට ඇඟළුම් කම්හල්වල සේවයට කොළඹ සහ වෙනත් නගරවලට සංක්‍රමණය වී ඇත. මෙම තත්වය නිසා ඔවුන්ගේ කුල හැඟීම දුර්වල වී ඇති අතර කුල අතර ප්‍රේම සම්බන්ධතා සහ විවාහ ද වර්ධනය වී ඇත. මුලදී මෙවැනි සබඳතාවලට ඔවුන්ගේ මුල් පවුල්වලින් විරෝධතා ඉදිරිපත් විය. නමුත් ක්‍රමයෙන් මෙවැනි විවාහවලට කිසියම් සමාජ පිළිගැනීමක් ලැබී ඇත.

වතු ප්‍රජාව තුළ කුලය සහ දිළිඳුකම අතර ඇති සම්බන්ධය පිළිබඳවද මෙහිදී විමසන ලදි. සමස්තයක් හැටියට සලකන විට කුඩියානවර් අය සෙසු කුලවල අයට වඩා ආර්ථික ශක්තිය අතින් ඉහළ මට්ටමක සිටියහ. මෙය එක්තරා දුරකට මුල් යුගයේ සිට වතු ආර්ථිකය තුළ කුඩියානවර් අයට තිබූ වරප්‍රසාද නිසා ඇතිවූ තත්වයක් ලෙස සැලකිය හැකිය. ඊට අමතරව ඔවුන් අතර මත්පැන් භාවිතය අඩු මට්ටමක පැවතීම, සත්ව පාලනය සහ ගොවිතැන, සිල්ලර වෙළඳාම, මුදල් ණයට දීම වැනි වාණිජ කටයුතුවල වැඩි වශයෙන් නියැලීම සහ වතු ආර්ථිකයට අයත් කංගානි සහ ඊට උසස් තනතුරුවලට පත් වීම ඔවුන් PPC කුලවලට වඩා ඉදිරියෙන් සිටීමට බලපෑ සාධකයන්ය. එමෙන්ම ඔවුන්ගේ සමාජ සම්බන්ධතා ජාලය වඩා හොඳ මට්ටමක පැවතීම නිසා රැකියා අවස්ථා සීමිත ආන්තික වතුවල සිට වඩා ලාභදායක

වතුවලට සංක්‍රමණය වීමටද ඔවුන්ට වැඩි ඉඩකඩ හිමි විය (Silva 1990, De Silva 1989). කෙසේවුවද කුල තත්වය සහ ආර්ථික ශක්තිය අතර සබඳතාවය වඩාත් සංකීර්ණ එකක් විය. ඇතැම් අවස්ථාවලදී විදේශ රැකියා සහ ව්‍යාපාරික කටයුතු හරහා ඉහළ නැගීමට PPC කුලවල වඩා උනන්දුවක් සහිත පිරිස්වලට ද හැකි විය.

අවසන් වශයෙන් කිව හැක්කේ වතු ආර්ථිකයේ ඇති වූ විවිධ විපර්යාස ඔස්සේ කුල ක්‍රමයද යම් ආකාරයන්ගෙන් විකාශනය වී ඇති බවයි. වතු ආර්ථිකයේ ආරම්භයේ සිට වතු හිමියන්, වතු පාලකයන්, වෘත්තීය සමිති, දේශපාලන පක්ෂ සහ ප්‍රජාවන් විසින් විවිධ අරමුණු සඳහා කුලය උපයෝගී කරගන්නා ලදි. ඉන්දීය දෙමළ ව්‍යාපාරිකයන් තම ව්‍යාපාරවල අත් උදව්වට සේවකයන් බඳවා ගැනීමේදී පවා කුලය සැලකිල්ලට ගත් බව පර්යේෂකයන් පෙන්වා දී ඇත (Hollup 1993,1994; Jayaraman 1975). මෙවන් 'කුල අවිච්ඡින්නතා' (Jayaraman 1975) වතුකරයේ දැක ගත හැකි වූ නමුත් වතුකරය ඔස්සේ 'ස්පර්ශ කිරීමට නොහැකි' කුල 'ස්පර්ශ කිරීමට හැකි' කුලවලට පරිවර්තනය වූ අයුරු මෙම පරිච්ඡේදයේදී හෙළි විය. මෙයට බලපෑ විවිධ කාරණා අතර වතුකරය තුළ ජනගහන බහුතරය PPC කුලවලට අයත් වීම, වතු ආර්ථිකය තුළ පන්තිමය සාධකවලට වැඩි වැදගත්කමක් ලැබීම, වතු ආර්ථිකය තුළ වෘත්තීය සමිති මඟින් කුලයේ ඇතැම් කාර්යයන් පවරා ගැනීම, විවිධ කුලවල අය ආසන්න ලැයිම් කාමරවල පදිංචි වීම සහ වතුකරයේ ක්‍රියාත්මක වූ විවිධ ජන සංක්‍රමණ සඳහන් කළ හැකිය. මීට අමතරව 1950 ගණන්වල සිට වතුකරයේ පදිංචිව සිටි සියලු ඉන්දීය සම්භවයක් සහිත පිරිස් අතර පොදු ජනවාර්ගික අනන්‍යතාවයක් ක්‍රමයෙන් වර්ධනය වූ අතර ඒ මඟින් කුලයේ වැදගත්කම අඩු වී ජනවාර්ගිකත්වයට වැඩි වැදගත්කමක් හිමි විය. මෑතක සිට වර්ධනය වූ 'මලයියාහ' අනන්‍යතාවය මඟින් වතු කම්කරුවන් අතර අභ්‍යන්තර බෙදීම්වලට දායක වන කුල භේදය යටපත් කොට භාෂාව, ඉතිහාසය, පොදු සංස්කෘතික උරුමය පදනම් වූ ජනවාර්ගික අනන්‍යතාවය කෙරෙහි වැඩි අවධානය යොමු වී ඇත (Balasundaram 2005, Brass 2001, 2005).

උතුරේ ඉස්මතු වූ දෙමළ ජාතික ව්‍යාපාරය තුළ මෙන්ම මලයියාහ ව්‍යාපාරය තුළද කුලය වෙනුවට ජනවාර්ගික අනන්‍යතාවය ඉස්මතු කිරීමට උත්සාහයක් පවතී. මලයියාහ ව්‍යාපාරය දේශපාලන වශයෙන් කුඩියානවර් නායකත්වයට වඩාත් වාසිදායක යැයි සිතිය හැකිය. එයට හේතුව බහුතරය වූ PPC කුලවල අය සමග සිරස් සබඳතා ගොඩනගා ගැනීමට මෙම මතවාදය උදව් විය හැකි නිසාය. අනෙක් අතට මෙම මතවාදය කුල පීඩනයට ලක් වූ පිරිස්වලට තම අනන්‍යතාවය ජාතික හැඟීම ඔස්සේ අලුතින් නිර්වචනය කිරීමට ඉඩ සලසන්නේ යැයි සිතිය හැකිය. මෑතක සිට ඇතැම් ප්‍රජා නායකයන් දලිත් ව්‍යාපාරය වටා PPC කණ්ඩායම් ඒකරාශී කිරීමට උත්සාහ ගෙන ඇති නමුත්, එයට තවමත් ප්‍රධාන දේශපාලන ප්‍රවාහයට සම්බන්ධ වීමට නොහැකි වී ඇත.

සමස්තයක් ලෙස ඉන්දීය වතු කම්කරු ජනයා ශ්‍රී ලංකා සමාජයේ වඩාත්ම කොන් කිරීමට ලක් වූ සමාජ කොටසක් ලෙස සැලකිය හැකිය. වතුකරයේ කම්කරු රැකියාවලට සහ ඉන් පිටස්තර සමාජ කොන් වීම්වලට ලක් වූ ගෘහ සේවය වැනි රැකියාවලට සීමා වීමට එයින් වැඩි පිරිසකට සිදු වී ඇත. ඊට වඩා වැඩි වාසිදායක රැකියා ලබා ගැනීමට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම්, දේශපාලන බලපෑම් සහ සමාජ ප්‍රාග්ධනය ඔවුන්ට ඇත්තේ සීමිත වශයෙනි. ඔවුන්ගේ ආන්තික තත්වයට විවිධ ඓතිහාසික, ජනවාර්ගික, පන්තිමය සහ කුල සාධක බලපා ඇත. ජනවාර්ගික, පන්ති, කුල සහ ස්ත්‍රීපුරුෂ සමාජ භාවය අතින් සමාජ ධුරාවලියේ පහත්ම මට්ටම්වලට අයත් පිරිස්වලට සමාජ ආර්ථික අවස්ථා පුළුල් කිරීම සහ ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් ඔවුන්ට ලබා දීම වතු අංශය හා සම්බන්ධ සමාජ ප්‍රතිපත්තිවලදී මුහුණ දීමට ඇති ප්‍රධාන අභියෝගයක් වේ.

හයවන පරිච්ඡේදය

නාගරික අස්පර්ශනීයත්වය: මහනුවර නගරයේ කසළ ශෝධකයන්ගේ සහ සනීපාරක්ෂක සේවකයින්ගේ තත්වය

කාලිංග ටියුඩර් සිල්වා
පරම්සෝති තන්ගේස්
පී.පී. සිවප්‍රකාශම්

කුලය නාගරීකරණය සහ නවීකරණය සමග ක්‍රමයෙන් අභාවයට යන ග්‍රාමීය ප්‍රපංචයක් ලෙස බොහෝවිට සලකනු ලැබේ. ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රජාව නොදියුණු බවේ සංකේතයක් ලෙස සලකා කුලය ගැන කතා කිරීමෙන් පවා වැළකී සිටී. මෙයට පරස්පර වූ සංසිද්ධියක් නම් නාගරික සනීපාරක්ෂක කම්කරුවන්ය. මෙම කම්කරු ප්‍රජාවන් බොහෝවිට බ්‍රිතාන්‍ය යටත් විජිත අවධියේ මහ නගර සභා පිහිටවීමෙන් අනතුරුව නාගරික කසළ ශෝධනය සහ වැසිකිළි පිරිසිදු කිරීම සඳහා දකුණු ඉන්දියාවෙන් කැඳවා ගෙන ආ අදාළ කුලවලට අයත් සංක්‍රමණික කම්කරුවන්ගෙන් ආරම්භ විය. මේ අනුව ප්‍රභවය අතින් මෙම ප්‍රජාවන් එක් අතකින් පස්වන පරිච්ඡේදයේ විග්‍රහ කළ වතු කම්කරු ප්‍රජාවන්ට සමාන වේ. අනෙක් අතට මෙම සංසිද්ධිය ඩර්ක් විසින් පෙන්වා දුන් යටත් විජිත ක්‍රමය යටතේ 'කුලය ප්‍රතිනිර්මාණය වීම' (invention of caste) ක් ලෙස සැලකිය හැකිය (Dirk 2001). අදාළ මහ නගර සභා මඟින් මෙම සමාජ කොන් වීමට ලක් වූ ප්‍රජාවන් සඳහා වෙනම කම්කරු වාසස්ථාන පිහිටුවන ලදි. කාලයාගේ ඇවෑමෙන් මෙම නාගරික ප්‍රජාවන් ජනවාර්ගික (ඉන්දියානු දෙමළ), පන්තිමය සහ කුලමය (සක්කිලියාර්) වශයෙන් සෙසු නාගරික ජනයාගෙන් වෙන් වූ සහ කොන් වූ ප්‍රජාවන් බවට පරිවර්තනය වී ඇත. මෙම ප්‍රජාවන්හි ජීවත් වන ජන සංඛ්‍යාවන් ගැන නිවැරදි තොරතුරු නොමැත. කෙසේ නමුත් ලංකාවේ ප්‍රධාන සහ මධ්‍යම පරිමාණ නගර රැසක මෙවැනි නාගරික සනීපාරක්ෂක ප්‍රජාවන් ජීවත් වන බව හඳුනා ගෙන ඇත. (බලන්න 05 වන සිතියම).[27]

---

27 උදා: ලෙස McGilvray (2008) විසින් නැගෙනහිර ශ්‍රී ලංකාවේ අක්කරෙයිපත්තු ප්‍රදේශයේ සමහර චක්කිලියාර් කසළ ශෝධකයන් මහ නගර සභාව මඟින් රැකියාවල නියුක්ත කරවූවන් බව වාර්තා කොට ඇත. ඔවුන් ප්‍රදේශයට අලුතින් හඳුන්වා දුන් අය වේ. McGilvray (2008) නිරීක්ෂණය කළ පරිදි "ඔවුන් අක්කරෙයිපත්තු දෙමළ සමාජයේ අන්තර්ගත අන්තර් කුල හිමිකම් සහ රාජකාරීමය ආකෘතියෙන් බැහැර පිරිසකි" (2008: 57). මෙම විශ්ලේෂණයේදී ඉන්දියානු සම්භවයක් ඇති නාගරික කම්කරුවන්ගේ ආන්තික තත්වය විභාග කිරීමෙන් වැළකී ඇත.

ශ්‍රී ලංකාවේ කොන් වූ නාගරික ප්‍රජාවන් පිළිබඳ පර්යේෂකයන්ගේ හෝ ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අවධානය යොමු වූයේ විරල වශයෙනි. එසේ අවධානය යොමු වූයේද කුල ප්‍රශ්නයට වඩා ජනවාර්ගිකත්වය, නිවාස ප්‍රශ්නය, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම වැනි මෙම ප්‍රජාවන්හි බහුලව ව්‍යාප්ත වූ ප්‍රශ්න කෙරෙහි බව පෙනේ (Marga 1997, Silva & Atukorala 1996). ශ්‍රී ලංකාවේ දෙමළ කුල ක්‍රමය පිළිබඳ අධ්‍යයනය කළ මහරූෆ් (2000) ට අනුව, යාපනය, මඩකළපුව සහ වතු පද්ධතියට ආවේණික වූ කුල ක්‍රමයන් මෙන්ම 'නාගරික කසළ ශෝධන ප්‍රජාවන්' අතර ඇති කුල ක්‍රමයද 'අතුරු කුල ක්‍රමයක්' ලෙස දක්වා ඇත. තවදුරටත් ඔහු ඒ පිළිබඳ මෙසේ විග්‍රහ කර ඇත.

> "දෙමළ කුල ක්‍රමයේ අතුරු කුල ක්‍රමය ලංකාවේ පළාත් පාලන ආයතනවලට සම්බන්ධ කසළ ශෝධක කම්කරුවන් අතර තහවුරු වී ඇත. සංඛ්‍යාත්මකව කුඩා ප්‍රජාවක් වූ මොවුන්ට අඩු වැටුපක් යටතේ දෛනිකව රාජකාරි කළ යුතු විය. ඔවුහු කොළඹ හා වෙනත් නගරවල මුඩුක්කුවාසීන් අතර වාසස්ථාන සකසාගෙන ජීවත් වෙති. කාලයාගේ ඇවෑමෙන් ඔවුන් තමන්ගේ ඇඳුම් පැළඳුම් වෙනස් කොට, තමන්ගේ දරුවන් පාසැල්වලට යවමින්, මහන මැෂිම් වැනි ගෘහ උපකරණ පවා භාවිත කරන බව පෙනේ (Mahroof 2000:43)."

වර්තමාන අධ්‍යයනයේදී මහනුවර මහයියාව ප්‍රදේශයේ කුලය හා කුලය නිසා කොන් කිරීම්වලට ලක් වූ නාගරික ප්‍රජාවන්ට සිදුවන සමාජ අපහරණය හා සම්බන්ධ ප්‍රශ්න පිළිබඳව විමසන ලදි. මෙහිදී ගෘහස්ත සමීක්ෂණ, තරුණ තරුණියන් සමග කළ සමූහ සාකච්ඡා යනාදි කඩිනම් මානව වංශ අධ්‍යයන ක්‍රමවේද යොදා ගන්නා ලදි. මහයියාව ප්‍රදේශය ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ සනීපාරක්ෂක කම්කරු ප්‍රජාවන් වැඩි වශයෙන් ජීවත් වන ප්‍රදේශ අතුරින් එකකි. 1920 ගණන්වලදී බ්‍රිතාන්‍යයන් විසින් මහනුවර මහ නගර සභා (KMC) ප්‍රදේශයේ බහුලව භාවිතා කළ 'පෝච්චි වැසිකිළි' පිරිසිදු කිරීමටත්, වාණිජ කටයුතු, සංචාරකයන්, උත්සව ආදිය නිසා අපිරිසිදු වන වීදි දෛනිකව පිරිසිදු කිරීමටත් කසළ ශෝධක වෘත්තීන් ස්ථාපිත කරන ලදි. ක්‍රමයෙන් මහයියාව මහනුවර මහ නගර සභාව හා නගරයේ අවිධිමත් අංශයන් සමග විවිධාකාර සම්බන්ධතා ඇති නගර අභ්‍යන්තර මුඩුක්කු ප්‍රදේශයක් බවට පත් විය. 2007 වන විට, 6400 ක ජනගහනයක් සිටි මහයියාව කොට්ඨාශය මහනුවර නගරයේ නාගරික දුගීන් විශාල වශයෙන් සිටි කොට්ඨාශ අතුරින් එකක් ලෙස සලකන ලදි.

මහයියාව මහනුවර නගරයේ අඩු ආදායම් ලබන නාගරික ප්‍රජාවන් වැඩි වශයෙන් ජීවත් වන කොට්ඨාශවලින් එකකි (මෙම ප්‍රජාවන්හි ව්‍යාප්තිය සිතියම් අංක 06 දක්වා ඇත). මහයියාව ප්‍රදේශය, මහයියාව MC සහ මහයියාව MT ලෙස කොටස් දෙකකට බෙදා ඇත. MC කලාපය මහනුවර මහ නගර සභාවේ රැකියාවල නියුතු කම්කරුවන්ගේ ලැයිම් නිවාස සහ 1920 ගණන්වල ඉදි කළ ලැයිම් නිවාස ලබා ගැනීමට නොහැකි වූ KMC කම්කරුවන් පාරම්පරිකව ඉදි කළ අනවසර

ඉදිකිරීම්වලින් සමන්විතය. මෙය ඉඩම් හෙක්ටයාර 2.43 ක ප්‍රදේශයක 4130 ක ජන සංඛ්‍යාවක් ජීවත් වන අධික තදබදයක් ඇතිව ජීවත් වන ප්‍රජාවකි (හෙක්ටයාර එකකට 1700 ක ජන ඝනත්වයක්). MT කොටස KMC කම්කරු පරීක්ෂකවරු, සුළු පරිමාණ වෙළෙන්දන් වැනි කණ්ඩායම් වෙනුවෙන් මහ නගර සභාව මඟින් ඉදි කළ නිවාස සමූහයකින් යුක්තය. හෙක්ටයාර 1.82 ක වපසරියකින් යුතු මෙම ප්‍රදේශයද මුළු ජනගහනය 2,290 ක් වන අධික තදබදයකින් යුතු ප්‍රදේශයකි (හෙක්ටයාර එකකට 1,258 ක ජන ඝනත්වයක්). නිවාස තත්වය හා සමාජ ආර්ථික තත්වය අතින් MC හා MT කලාප අතර පැහැදිලි වෙනසක් ඇති බව MC කලාපය මහනුවර නගරයේ පහළම සමාජ ස්තරය නියෝජනය කිරීමෙන් පැහැදිලි වේ.

මහයියාව වසම නගරයේ පොදු සුසාන භූමියට (මහයියාව සුසාන භූමියට) මහනුවර වැසිකිළි අපද්‍රව්‍ය ගෙන යන නල සහ කානු පද්ධතියට මෙන්ම ඝන අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානයකට සමීපව පිහිටා ඇත. නගරයේ සෙසු පදිංචිකරුවන්ගේ අදහස නම්, මේ සියල්ල පාරිසරික සහ චාරිත්‍රමය පවිත්‍රත්ව දූෂණයන් මෙන්ම මෙම ප්‍රජාවන්ගේ ආන්තික තත්වය විදහා දක්වන මූලාශ්‍රයන්ය. අතීතයේදී මෙම ස්ථානය යාචකයන්ට සෙවණ දුන් සහ අයාලේ යන සතුන් ලැගුම් ගත් ස්ථානයක් විය. MC කලාපයේ සමහර ස්ථානවලට පිවිසීමේ දුෂ්කරතා මතුව ඇත්තේ මෙම කම්කරු නිවාස කඳුකර බෑවුම් සහිත ප්‍රදේශයක තදබදය සහිතව පිහිටා ඇති නිසාය.

ජනවාර්ගික හා ආගමික සංයුතිය

මහයියාව ප්‍රජාව තුළ ජනවාර්ගික, ආගමික, කුලය සහ සමාජ පන්තිය යන එකිනෙකට සමීප අංශ තුළින් සමස්ත ප්‍රජාවේ ආන්තික තත්වයත් දීර්ඝ කාලයක සිට ඔවුන් සමාජ අපහරණයට ලක් වූ ආකාරයත් පිළිබිඹු වේ.

වගු අංක 6.1

මහයියාව සහ මහනුවර නගරවල ජන වර්ග අනුව
ගෘහස්තවල ප්‍රතිශත ව්‍යාප්තිය

ජන වර්ගය	**MC***	**MT***	**මහනුවර****
සිංහල	5.3	34.0	70.5
දෙමළ	93.5	21.7	13.7
මුස්ලිම්	1.2	42.3	13.5
වෙනත්	0	2.0	2.3
මුළු එකතුව	100.0	100.0	100.0

මූලාශ්‍ර: * ගෘහස්ත සමීක්ෂණ මත පදනම් වේ.

** 2001 ජන සංගණනය මත පදනම් වේ.

සිතියම් අංක 05: පළාත් පාලන ආයතන යටතේ ඇති සනීපාරක්ෂක කම්කරු ජනාවාස අයත් නගරවල ව්‍යාප්තිය



සිතියම් අංක 06: මහනුවර, මහියාව ඇතුළු නාගරික දුගී ප්‍රජාවන්ගේ ව්‍යාප්තිය

මහයියාව MC කලාපයේ ඉන්දියානු දෙමළ බහුතරයක් සහ සිංහල, මුස්ලිම් සුළු සංඛ්‍යාවක්ද විය. අනෙක් අතට මහයියාව MT කලාපය මුස්ලිම්වරුන් බහුතරයක් හා සිංහල, දෙමළ ජනවර්ග ද ජීවත් වන ජනවාර්ගික විවිධත්වය සහිත ප්‍රදේශයකි. මෙම ජනාකීර්ණ ප්‍රදේශ දෙකෙහිම බහුතරය වූයේ දෙමළ කතා කරන ජනයා වීම විශේෂ දෙයකි. මෙම යාබද ප්‍රදේශ දෙකෙහිම ජනවාර්ගික සංයුතිය ගත් විට, මහනුවර නගරයේ හා මුළු ශ්‍රී ලංකාවේම සිංහල ජන සංයුතියෙන් සපුරා වෙනස් විය. සෙසු ප්‍රදේශවල බහුතරය වූ සිංහල ජනයා වෙනුවට මහයියාවේ බහුතරය දෙමළ කතා කරන ජනයා වේ. මහයියාව MC ප්‍රජාවේ සිටින සිංහල ජනයාද වරප්‍රසාද නොලත් කුල පසුබිමකින් පැමිණි අය වීම විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණකි. මෙහි සිටින දෙමළ අය සමග විවාහ මගින් සම්බන්ධ වූ සනීපාරක්ෂක වෘත්තීයේ නියැළුනු එක් සිංහල පවුලක් සඳහන් කළේ තමන් රොඩී කුලයට සම්බන්ධ බවය. මෙයින් පෙනී යන්නේ එක්තරා දුරකට ජනවාර්ගික බෙදීම පසෙකලා කුල පදනම මත සිංහල හා ඉන්දියානු දෙමළ ජනයා මෙහි ඒකරාශී වී ඇති බවය.

ආගමික වශයෙන් ගත් විටද සමාන රටාවක් පවතින බව හෙළි වේ. ජන වාර්ගිකත්වයට අනුරූපීව බහුතරය වූ දෙමළ ජනයා හින්දු ආගමිකයන් වූ අතර, සිංහල අය බෞද්ධයන් ද, මුස්ලිම් අය ඉස්ලාම් භක්තිකයන් ද විය. මහයියාව MC කලාපයේ සැලකිය යුතු ක්‍රිස්තියානි ජනගහනයක් විය. ප්‍රදේශයේ දෙමළ ජනයාගෙන් කොටසක් පසුකාලයේ ක්‍රිස්තියානි ආගමට හැරී ඇත. දකුණු ආසියාවේ වරප්‍රසාද නොලත් ඇතැම් කුල කණ්ඩායම් හින්දු ආගමට අනුව ප්‍රවේණිගතව උරුම වන අවාසි හා ඒ සමග පැමිණෙන දෘෂ්ටිවාදීමය තත්වයන්ගෙන් මිදීමේ උපක්‍රමයක් ලෙස ක්‍රිස්තියානි ආගමට හැරී ඇති බව පෙනේ.

වගු අංක 6.2

මහයියාව සහ මහනුවර නගරවල ආගම අනුව ගෘහස්ත ව්‍යාප්තිය (%)

ආගම/ප්‍රජාව	MC*	MT*	මහනුවර නගරය**
බෞද්ධ	5.9	34.0	66.9
හින්දු	82.8	20.6	10.9
ඉස්ලාම්	1.8	42.3	14.9
ක්‍රි.ස්තියානි	9.5	3.1	7.3
වෙනත්	0	0	0
මුළු	100.0	100.0	100.0

මූලාශ්‍ර: * ගෘහස්ත සමීක්ෂණ මත පදනම් වේ.

** 2001 ජන සංගණනය මත පදනම් වේ.

කුල පසුබිම

ජනවාර්ගිකත්වය හා ආගම මෙන් නොව කුලය සම්බන්ධව මෙම ප්‍රජාවන් තුළ දැඩි නිශ්ශබ්දතාවක් පවතී. කුලය පිළිබඳ ප්‍රශ්න කළ විට ඇතැම් ප්‍රජා නායකයන් සහ ප්‍රජා සාමාජිකයෝ "මොකටද අපේ කුලය ගැන හොයන්නේ? ඒක ඉස්සර තිබ්බ දෙයක්. දැන් ඒක එච්චර වැදගත් දෙයක් නෙමෙයි" ලෙස පිළිතුරු දුන්හ. විශේෂයෙන්ම උගත් තරුණයන් අතර කුලය ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රවණතාවක් මතු වී ඇත. කෙසේ නමුත් ප්‍රජා මට්ටමේ දේශපාලන කටයුතු සහ මහයියාව ප්‍රජාව කෙරෙහි පිටස්තර නාගරික ජනයා දරන ආකල්පය කෙරෙහි කුලය තවමත් යම් තරමකට වැදගත් බව මෙම අධ්‍යයනයේදී හෙළි විය.

1999 මහයියාවේ සේවය කළ නගර සැලසුම් ශිල්පියෙකු විසින් ප්‍රජාවේ විශේෂතා හඳුනාගෙන තිබුණි.

> "දකුණු ඉන්දියාවේ කුල ක්‍රමයෙන් ශේෂ වූ ඇතැම් ලක්ෂණ මහයියාව ප්‍රජාව තුළ තවදුරටත් දක්නට ලැබේ. ප්‍රජාව තුළ, දේශපාලනයට සම්බන්ධ වීමෙන් දියුණු වූ දෙමළ ප්‍රභූ පිරිසක් දැක ගත හැකිය. තවත් දෙමළ පිරිසක් පහළ මට්ටමේ රැකියාවල නියැළීමට නැඹුරු වී ඇත. ජනවාර්ගික සුළුතරයක් වීමෙන් හා ඔවුන්ගේ රැකියාවල ස්වභාවය තුළින් ද ඔවුන්ගේ පහත් මට්ටම තවදුරටත් අවධාරණය විය. මෙම ජනාවාසය තුළ ජීවත් වීම නිසාම මෙම ප්‍රජාවන් කොන් කිරීම්වලට ලක් වන අතර සමාජ චලනතාවයට නගරයේ ප්‍රධාන සමාජ ප්‍රවාහයට ප්‍රවිශ්ට වීමට මේ මඟින් ඉඩ ඇහිරී ඇත." (Bhanjee 1999).

මෙම කරුණු සුළු වශයෙන් හෝ අදටත් වලංගු වන බව කිව යුතුය.

මහයියාව ප්‍රජාවේ ආන්තික බව, ජනවාර්ගිකත්වය (ඉන්දියානු දෙමළ), පන්ති තත්වය (කම්කරු) සහ කුලය (ප්‍රධාන වශයෙන් සක්කිලියාර්) යන විවිධ සාධක ඔස්සේ තහවුරු වී ඇත. ප්‍රදේශයේ ජනාකීර්ණ බව, මත් කුඩු හා මත්ද්‍රව්‍ය භාවිතය යන කරුණුද සමාජ කොන් කිරීම්වලට තවදුරටත් දායක වී ඇත.

මහයියාව MC

නගරයට සමීප සම්බන්ධතා ඇති ජීවන රටාවක් හිමි සනීපාරක්ෂක කම්කරුවන්, නාගරික කම්කරු පිරිස් මෙම ප්‍රජාවේ සිටිති. මෙම ජනාවාසයේ ආරම්භය 20 වන සියවසේ මුල් භාගයේ බ්‍රිතාන්‍ය පාලකයන් විසින් සනීපාරක්ෂක කම්කරු, කසළ ශෝධක වෘත්තීන් සඳහා දකුණු ඉන්දියාවෙන් දෙමළ කම්කරුවන් ගෙන ඒම දක්වා දිව යයි. මෙම ප්‍රජාවේ කුල සංයුතිය පිළිබඳව නිවැරදි තොරතුරු ලබා ගැනීම දුෂ්කර විය. අධ්‍යයනය තුළදී ඒ ඒ ගෘහස්තයේ කුල අනන්‍යතාවය පිළිබඳව නිවැරදි තොරතුරු ලබා ගැනීමට අපහසු වූයේ ගෘහ මට්ටමේදී කුලය පිළිබඳ කිසිදු සංවාදයකට ඉඩක් නොවූ හෙයිනි. කෙසේ නමුත් මූලික තොරතුරු සපයන්නන්ගෙන් කුල සංයුතිය පිළිබඳව යම් අදහසක් ලබා ගත හැකි විය.

වගු අංක 6.3

2007 ගණනය කිරීම් අනුව මහයියාව MC කලාපයේ කුලය අනුව දෙමළ ජනගහනයේ ප්‍රතිශත ව්‍යාප්තිය

කුලය	සාම්ප්‍රදායයික රැකියාව	ප්‍රතිශතය (%)
පරයන්	බෙර ගැසීම, වීදි පිරිසිදු කිරීම, කසළ ශෝධනය	45
චක්කිලියාර්	වැසිකිළි පිරිසිදු කිරීම	30
තෙළිගු	කම්කරු අධීක්ෂණය	2
රෙඩ්ඩි	ආගමික කටයුතු	3
චෙට්ටි	අවමඟුල් අවස්ථාවල බෙර ගැසීම	5
වන්නර්	රෙදි සේදීම	2
කුලය නොදත්	-	13
මුළු එකතුව		100

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ

මූලික තොරතුරු සපයන්නන් හා පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවලදී හෙළි වූ පරිදි දෙමළ ජනගහනයෙන් 45% ක් පරයන් කුලයට ද, 30% ක් චක්කිලියාර් (වැසිකිළි පිරිසිදු කරන අය) කුලයට ද අයත් අය වූහ. මහයියාවේ ප්‍රජා නායකයන් දැක්වූ තොරතුරු අනුව බ්‍රිතාන්‍ය යුගයේ පිහිටවූ KMC මඟින් ඇති කළ විශේෂ කසළ ශෝධක කාර්යයන් සඳහා මෙම කුල කණ්ඩායම් දෙක පත් කර ඇත. වර්තමානයේ පවතින රටාව අනුව චක්කිලියාර් ජනයා පොදු වැසිකිළි පිරිසිදු කිරීම, කානු සුද්ධ කිරීම ඇතුළු සනීපාරක්ෂක කටයුතුවල නියැළි සිටින අතර පරයර් කුලයේ අය වීදි අතු ගෑම, කසළ ශෝධනය වැනි කාර්යයන්හි නියැළී සිටිති. ප්‍රජාවේ ජනගහනයෙන් බහුතරයක් 'දලිත්' පසුබිමෙන් පැමිණි පිරිස් වුවත් දලිත් යන්න ස්වයං අනන්‍යතාවය ප්‍රකාශ කිරීම සඳහා හෝ සමාජ විශ්ලේෂණය සඳහා හෝ දේශපාලන ක්‍රියාකාරකම් සඳහා යොදා ගන්නේ නැත. චක්කිලියාර් (සිංහලයෝ මෙය සක්කිලි ලෙස යොදති) පරයන් (සිංහලයෝ මෙය පරයා ලෙස යොදති) යන්න පිටස්තර සිංහලයන් විසින් අපවාදාත්මක ස්වරූපයෙන් යොදා ගන්නා බව පෙනේ. උදාහරණ ලෙස 'සක්කිලි දෙමළු' (සක්කිලි දෙමළ) හෝ 'පර දෙමළු' (පරයන් දෙමළ) යනාදි වචනවලින් ඔවුන්ගේ පහත් බව මෙන්ම පිටස්තර බවද හැඟවේ.[28] මෙම නම්වලින් ජනවාර්ගික, කුල සහ පන්ති පසුබිම අතින් ඉතා සංකීර්ණ ලෙස සමාජ ආන්තිකභාවය තහවුරු වී ඇති අයුරු හෙළි වේ.

මහනුවර මහ නගර සභාව මඟින් නඩත්තු කෙරෙන සුසාන භූමිය සමග චෙට්ටි සහ රෙඩ්ඩි යන කුලවල සම්බන්ධතාවක් ඇත. තෙළිගු කුලය මේ ප්‍රජාවේ KMC කම්කරුවන්ගේ වැඩ අධීක්ෂණය සඳහා ගෙන්වාගත් අයගෙන් පැවත එන්නේ

28 "සක්කිලි" සහ "පර" යන වචන දෙකම සිංහලයේ අපවාදාත්මක සහ අපහාසාත්මක ස්වරූපයෙන් යෙදේ.

යැයි සඳහන් කළහ. KMC ආරම්භකයන් විසින් හින්දු සමාජයේ විවිධ කුල ඒ ඒ කුලවලට ආවේණික රැකියා සඳහා යොදාගත් බව පෙනේ. විශේෂයෙන්ම නගර සභාවේ මහජන සෞඛ්‍ය අංශය තුළ කුල පාදක බඳවා ගැනීම් රටාවක් මෙන්ම කුල පාදක ශ්‍රම සංවිධාන රටාවක් විය.

මෙම ප්‍රජාවේ ඇති ලැයිම් නිවාස අවම පහසුකම්වලින් යුතු බැරැක්ක රටාවට ගොඩ නැංවූ කාමර පේළිවලින් යුක්ත විය. කල් යාමේදී වැඩිවන ජනගහනය සඳහා ලැයිම් කාමරවලට අමතරව තාවකාලික අනවසර නිවාස ඉදි වී ඇත. ජනගහනයෙන් 90% ක් පමණ ඉන්දියානු දෙමළ ජන වර්ගයට අයත් වන අතර, 2007 වසරේ ප්‍රජාවෙහි මුළු ජනගහනය 4130 ක් විය. 579 ක් වන නිවාස සංඛ්‍යාව අනුව මාධ්‍යයක ගෘහ විශාලත්වය 7.13 ක් විය. හෙක්ටයාර 2.43 ක භූමි භාගයක මුළු ජනගහනයම ව්‍යාප්ත වී සිටින අතර ජන ඝනත්වය හෙක්ටයාර එකකට 1700 ක් විය. මෙම ඉඩම් මහ නගර සභාවට හිමි වූ නමුත් බොහොමයක් ජනයා මෙම නිවාස මහ නගර සභාවෙන් දිගුකාලීන බද්දට ලබා ගෙන තිබුණි. කෙසේවුවත් ඉඩම්වල කිසිදු නෛතික හිමිකමක් නොමැති බොහෝ පදිංචිකරුවන් මහ නගර සභාවෙන් කිසිදු අවසරයක් නොගෙන තම නිවාස ඉදිකොට ඒවායේ පදිංචිව සිටියහ.

මහයියාව MT

මහයියාවේ ආදර්ශ නිවාස සංකීර්ණය මහයියාවේ MC කලාපයට සමීපව පිහිටා ඇත. මෙම නිවාස තරමක් ඉහළ ශ්‍රේණිවල KMC කම්කරුවන් සහ රජයේ සේවකයන් සහ මහනුවර නගරයේ වාණිජ කටයුතුවල නියැළී සිටින ව්‍යාපාරිකයන් වෙනුවෙන් ඉදි කරන ලදි. KMC කම්කරුවන් වෙනුවෙන් කම්කරු ලැයිම් ඉදි කිරීමෙන් අනතුරුව, වසර කිහිපයකින් පසු සෙසු නාගරික ජන කොටස් සඳහා MT ජනාවාස සංවර්ධනය කරන ලදි. බහු වාර්ගික ජනගහනයකින් යුතු මේ ප්‍රදේශයේ ජන සංයුතිය තුළ පහළ මධ්‍යම පාන්තිකයන් විශාල ප්‍රමාණයක් සිටියහ. MC කලාපය සමග සංසන්දනය කරන විට මෙම නිවාස සමූහය ගුණාත්මක වශයෙන් ඉහළ මට්ටමක පවතී. මෙම කලාපයේද, ජනගහනය වැඩි වීම, අවට ප්‍රදේශවලින් සිදුවන අභ්‍යන්තර සංක්‍රමණ හේතුවෙන් අනවසර ඉදිකිරීම් සිදු වී ඇත. බහුවාර්ගික සංයුතියක් සහිත මෙම ප්‍රජාව එකිනෙකාට යාබදව පදිංචි මුස්ලිම්, දෙමළ, සිංහල ජන වර්ගවලින් සමන්විත වන අතර ඔවුන් අතර කිසිදු ගැටුමක් වාර්තා වී නැත. MC කලාපය සමග සංසන්දනය කරන විට MT කලාපයේ දෙමළ ජනයා ඉහළ කුලවලට අයත් යැයි සාමාන්‍ය පිළිගැනීමක් පැවති නමුදු පදිංචිකරුවන්ගේ කුල සංයුතිය පිළිබඳව දැන ගත නොහැකි විය. 2007 වසරේදී 2290 ක් වූ මුළු ජනගහනය නිවාස 321 ක පදිංචි වී සිටියහ. මාධ්‍යයක ගෘහ විශාලත්වය එක් නිවාසයකට මිනිසුන් 07 දෙනෙකු විය. හෙක්ටයාර 1.28 ක මුළු භූමි භාගයක හෙක්ටයාර එකකට 1258 ක ජන ඝනත්වයක් වාර්තා විය. මහයියාවේ MT කලාපයේ බොහෝ පදිංචිකරුවන්ට ඉඩම්වල හිමිකම තිබූ අතර

මහ නගර සභාවේ අවසරය මත ඉදි කළ නිවාසවල ඔවුහු පදිංචිව සිටියහ. එසේ වුවත් මෙම ප්‍රජාව තුළ අනවසර ඉදිකිරීම් ද දක්නට ලැබේ. පොදුවේ ගත් විට, මහයියාවේ MT කලාපයේ නිවාස තත්වය සහ ජීවන තත්වය තරමක් යහපත් මටට්මක පැවති අතර ජන ඝනත්වය MC ප්‍රදේශයට වඩා අඩු මට්ටමක පවතියි. නමුත් මෙම ප්‍රජාවේ ද සමස්ත තත්වය පිළිබඳව තෘප්තිමත් විය නොහැකිය.

මෑත භාගයේදී ප්‍රජාවන් දෙකෙහිම ජනගහනය අතින් ස්ථාවර මට්ටමක පවතින අතර ප්‍රදේශය තුළට පිටස්තර අය මහා පරිමාණ ලෙස සංක්‍රමණය වී නැත. මෑතකාලීනව ජනගහන වර්ධනයට බලපා ඇත්තේ අභ්‍යන්තර සංක්‍රමණවලට වඩා ස්වාභාවික ජනගහන වැඩිවීම්ය. ප්‍රජාවෙන් පිටතට සිදු වන සංක්‍රමණ සීමිත වී ඇත්තේ අධ්‍යාපනය, රැකියා අවස්ථා තුළින් සමාජයේ ඉහළට නැග ඇත්තේද සීමිත සංඛ්‍යාවක් බැවිනි. මෙසේ ඉහළට නැග පිටතට සංක්‍රමණය වූ පිරිස් මහයියාව සමග පැවති සම්බන්ධතා බිඳ දමා ඇත්තේ ඔවුන්ගේ පහළ මට්ටමේ සමාජ සම්භවය සැඟවීමටය. මහරූෆ් (2000) පෙන්වා දුන් පරිදි මහයියාව ප්‍රජාවෙන් පිටතට සංක්‍රමණය වූ පුද්ගලයන් බොහෝවිට තම කුල අනන්‍යතාවය සඟවාලමින් ඉහළ කුලවල අය මෙන් පෙනී සිටීමට උත්සාහ කරති.

ගෘහ සමීක්ෂණයේදී මහයියාව MC කලාපයේ 47% ක් ප්‍රකාශ කර සිටියේ තමන්ට අවස්ථාව ලැබේ නම් වඩා හොඳ ස්ථානයක පදිංචියට යාමට තමන් කැමති බවය. මේ තුළින් ප්‍රජාවේ ඇති සමාජ ආන්තික බව නිසා ඔවුන් තුළ වන අතෘප්තිමත් ස්වභාවය මැනවින් පැහැදිලි වේ. අනෙක් අතට මහයියාවේ MT කලාපයේ නිවැසියන්ගෙන් 14% ක් දැනට පදිංචි ස්ථානයෙන් පිට වී යාමට කැමැත්ත පළ කළහ.

විවාහ රටා

සාම්ප්‍රදායිකව, මහයියාවේ MC කලාපයේ තරුණ තරුණියන් අතර විවාහ කටයුතු ඔවුන්ගේ දෙමව්පියන් විසින් සිදු කළ අතර, බොහෝවිට මෙම විවාහ කුල ක්‍රමයට අනුරූපව සිදු විය. පසුගිය වසර 20 ක කාලය තුළ ප්‍රජාවේ තරුණ තරුණියන් ප්‍රේම සම්බන්ධතා මඟින් විවාහ වීමට වැඩි කැමැත්තක් දක්වනු පෙනේ (බලන්න UNFPA 2007). මෙවැනි විවාහ අතර සමහර ඒවා එකම කුල කණ්ඩායම අතර සිදු වුවත් මෑතභාගයේදී අන්තර්-කුල විවාහ මෙන්ම අන්තර්-වාර්ගික විවාහ ද සිදු වී ඇත. මෙවැනි විවාහයන්ට මුලදී දෙමව්පියන්ගෙන් විරෝධතා එල්ල වුවත් පසුව කුල බෙදීම් අමතක කොට විවාහක යුවළ හෝ ඔවුන්ගේ දරුවන් එක් පාර්ශවයකින් හෝ දෙපාර්ශවයෙන්ම පිළිගනු ලැබේ.

මහයියාවේ ජනයාට එරෙහි කුල-පාදක කොන් කිරීම්

මහයියාව MC ප්‍රජාවේ නායකයන් බොහොමයක් ඔවුන්ගේ කුල තත්වය සහ ඔවුන් මුහුණ දෙන දුෂ්කරතා පිළිබඳව කතා කිරීමට මැලි වූහ. සමහරුන් සෘජුවම පැවසුවේ "මොකටද ඔයාලා කුලය ගැන කතා කරන්නේ? අපිට ඒක අමතක කරන්න ඕනේ."

මහයියාව මහ නගර සභාවේ ඡන්දයෙන් පත් වූ නියෝජිතයන් දෙදෙනෙකු චක්කිලියාර් සහ පරයන් කුලවලින් පැමිණි අය වේ. අතීතයේදී කුලය සහ වෘත්තීන් පාදක වූ කොන් කිරීම් තමන් අත්විඳි බවත් දැන් ඔවුන්ට තිබෙන ප්‍රශ්න නම් කුලය සම්බන්ධ ඒවා නොව දරිද්‍රතාවය හා බලය නොමැතිකම යන ප්‍රශ්න බවත් සමහරු පැවසූහ. ඓතිහාසිකව සනීපාරක්ෂක කම්කරුවන් සහ වීදි පිරිසිදු කරන්නන් අස්පර්ශනීයත්වයට හා කොන් කිරීම්වලට ලක් විය. තේ කඩවලදී හා නගරයේ අනෙකුත් ස්ථානවලදී ඔවුන්ට නිසි පිළිගැනීමක් නොලැබුණි. ඔවුන්ට තේ ලබා දුන්නේ පොල් කටුවක හෝ ඉවතලන කිරි ටින්වලය. ඔවුන් තේ කඩ ඇතුළට නොගත් අතර ඔවුන්ව එළියේ සිටුවා පහත් ආකාරයට සලකන ලදි. නගරයේ හොඳ පාසැල්වලට ඔවුන්ගේ දරුවන් භාර ගත්තේ නැත. ඔවුන් අධ්‍යාපනය ලැබුවේ ක්‍රිස්තියානි සංවිධාන විසින් ප්‍රජාව තුළම පිහිටුවා ඇති ප්‍රාථමික පාසැලෙනි. 1950 ගණන්වල සිට ඔවුන්ගේ තත්වය තරමක් දියුණු විය. එක් නායකයෙකු පැවසුවේ ඔවුන්ව පිළිනොගත් තේ කඩ සහ අනෙකුත් ආයතනවලට එරෙහිව ඔවුන් විරෝධය පළ කළ බවය. 1950 ගණන්වලදී මහයියාව තරුණ පිරිස් හා ව්‍යාපාර හිමිකරුවන් අතර ප්‍රචණ්ඩකාරී ගැටුම් ඇති වීමට මෙම විරෝධතා මුල් වූ බව පෙනේ. පසුව ව්‍යාපාර හිමිකරුවන් පෙන්වා දුන්නේ ඔවුන් සුදුසු ඇඳුමකින් සැරසී ඔවුන්ගේ වැඩ නිමාවී පිරිසිදු වී පැමිණියහොත් පමණක් ඔවුන්ව පිළිගත හැකි බවය. මේ කාලය තුළදී නගරයේ පොදු වැසිකිළි තුළ පෝච්චි වැසිකිළි භාවිතා කළ අතර ඒවා පිරිසුදු කරන කම්කරුවන් බොහෝ අපිරිසිදු විය. පෝච්චි වැසිකිළි, වළ වැසිකිළි බවට හා වළ වැසිකිළි, ජල මුද්‍රිත වැසිකිළි බවට පත් වීම 1950 ගණන්වල සිට සිදු විය. සනීපාරක්ෂක කටයුතු, කසළ බැහැර කිරීම සහ අපද්‍රව්‍ය එකතු කිරීමේ තාක්ෂණය දියුණු වීම ඉන්දියානු දෙමළ කම්කරුවන්ගේ තත්වය ද දියුණු වීමට ද හේතු විය. ප්‍රජාවේ මිනිසුන් ද කඩවලට සහ අනෙකුත් ස්ථානවලට ඇතුළු වීමේදී නියමිත ඇඳුමින් සැරසී යාමට උත්සුක වීමත් සමග ක්‍රමයෙන් මෙම ආයතනවලට ඇතුළු වීමට ඔවුන්ට ඉඩ ප්‍රස්තා ලැබුණි. ඒ අනුව කසළ ශෝධක පසුබිම්වලට අයත් මහයියාව ජනයා තම තත්වය පාරම්පරික කුල පසුබිමට වඩා ශාරීරික පවිත්‍රත්වය අනුව තේරුම් ගැනීමට උනන්දු වී ඇත.

මහයියාව MC ප්‍රජාවේ පදිංචිකරුවන් මුහුණ දුන් අනෙකුත් වෙනස්කම් කිරීම් පහත සඳහන් පරිදි සිදු විය.

1. සමහර හින්දු කෝවිල්වලින් ප්‍රතික්ෂේප කිරීම. මහනුවර නගරයේ ප්‍රමුඛ පෙලේ හින්දු කෝවිල් වන කටුකැලේ පුල්ලෙයාර් කෝවිලේ හා කදිරේෂන් කෝවිලේ පරිපාලනය මහයියාව පදිංචිකරුවන්ට එම කෝවිල්වලට ඇතුළුවීමට ඉඩ ලබා නොදුණි. මෙහිදී පූජකයන් ඔවුන්ගෙන් ඉල්ලා සිටියේ සම්පූර්ණයෙන් පිරිසිදු වී සුදුසු ඇඳුමකින් සැරසී කෝවිලට පැමිණෙන ලෙසයි. ඉල්ලීමට එකඟව ක්‍රියා කළ සමහරුන්ට කෝවිලට ඇතුළු වීමට ඉඩ ලැබුණත්, අදටත් මෙම ඉහළ කුලවල කෝවිල් විසින්

මහයියාව ප්‍රජාවට නිදහසේ කෝවිල්වල ඇතුල් කොටසට ඇතුළු වීමට ඉඩ නොදෙයි. මෙම පදිංචිකරුවන්ට තමන්ටම අයත් කෝවිල් (විශේෂයෙන්ම චක්කිලියාර්වරුන් පුද පූජා පවත්වන මාරිඅම්මා දේවතාවි වැඩ සිටින මාරි අම්මාන් කෝවිල) ඇත.

2. මහයියාවේ දරුවන්ට මහනුවර හොඳ පාසැල්වලට ඇතුළු වීම ප්‍රතික්ෂේප කිරීම. දිළිඳු මෙන්ම වරප්‍රසාද නොලත් ප්‍රජාවන්ගෙන් පැවත එන මෙම දරුවෝ නාගරික පාසැල් සීමිත ප්‍රමාණයක ඉගෙනුම ලබති. මහයියාව ප්‍රදේශයේම පිහිටා ඇති මෙවැනි පාසැලක් පිහිටුවා ඇත්තේ KMC කම්කරුවන්ගේ දරුවන් උදෙසා බ්‍රිතාන්‍ය අවධියේදී ගැලවීමේ හමුදාව විසිනි. මෙම දෙමළ මාධ්‍යය පාසැල තුළ අ.පො.ස උ/පෙළ කලා මාධ්‍යය තෙක් පන්ති පැවැත්වෙන නමුදු ගුරුවරුන් සහ ප්‍රමාණවත් පහසුකම් නොමැති හෙයින් සීමිත දියුණුවක් ඇත. සමහර දෙමව්පියන් පැමිණිලි කරන ආකාරයට, "අපි හොඳ පාසැල්වල සම්මුඛ පරීක්ෂණයට යනකොට අපේ මහයියාව ලිපිනය දැක්ක ගමන් පාසැල් බලධාරීන් නිතරම අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ක්‍රමයක් සොයා ගන්නවා." එමෙන්ම ඔවුන්ට හොඳ පාසැල්වල ප්‍රවේශ ගාස්තු ගෙවීමට ද හැකියාවක් නොමැත. ප්‍රජාව මුහුණ දෙන තවත් ගැටලුවක් නම් දරුවන් අධ්‍යාපනය ලැබිය යුත්තේ කුමන මාධ්‍යයෙන්ද යන ප්‍රශ්නයයි. මහනුවර නගරයේ හොඳ පාසැල් බොහොමයක සිංහල හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන අතර ප්‍රජාවේ දරුවන්ට එම පාසැල්වලට ඇතුළු වීමට නොහැක්කේ එම පාසැල්වල දෙමළ මාධ්‍යයෙන් උගන්වන්නේ නැති බැවිනි. මෙම ප්‍රජාවේ සුළු පිරිසක් උසස් අධ්‍යාපනය ලැබීමට සමත් වූ අතර අධ්‍යාපනය නිම කර හොඳ රැකියාවක් ලබා ගත් විගස ඔවුන් ප්‍රජාවෙන් ඉවත්ව ගොස් ප්‍රජාව සමග ඇති සියලු සම්බන්ධතා අත්හිටුවයි.

3. මෙම ප්‍රජාව ජීවත් වන කොට්ඨාශය පාරිසරික දූෂණයන්ට සහ වසංගත රෝගයන්ට මූලාශ්‍ර වන බව හඳුනා ගෙන ඇත. අඩු පාඩු සහිත පොදු වැසිකිළි, අපිරිසිදු කානු පද්ධති, පදිංචිකරුවන්ගේ සෞඛ්‍ය සම්පන්න නොවන ජීවන රටාව (උදා: මත්පැන්, දුම්වැටි, මත්කුඩු භාවිතය) මෙන්ම වැසිකිළි පිරිසිදු කිරීම, කසළ ශෝධනය වැනි මෙම ප්‍රජාවගේ රැකියාවන් මෙම ගැටලුවල මූලාශ්‍ර ලෙස දැක්විය හැකිය. එමෙන්ම සමාජ ගර්හාවට ලක් වූ රෝගයන් වන ක්ෂය රෝගය, අතීසාරය වැනි රෝග බෝ කරන ස්ථානයක් ලෙසද මෙම ප්‍රජාව සැලකේ. මේ තුළින් මෙම ප්‍රජාවන් පිළිබඳව නගරයේ සෞඛ්‍ය බලධාරීන්ගේ සැලකිය යුතු අවධානයක් යොමු වූ බව පැහැදිලිය. මහයියාව ප්‍රජාවේ ඇති මෙම බේදජනක තත්වය ඔවුන් අවට ප්‍රජාවන්ගෙන් සමාජ අපහරණයට ලක් වීමට හේතුවන බව පෙන්වා දිය හැක.

4. මහයියාව ප්‍රදේශය මත් කුඩු විකිණීම, අපරාධ, සුළු සොරකම් හා ගණිකා වෘත්තිය වැනි සමාජ විරෝධී ක්‍රියාවන් සිදු වන ප්‍රදේශයක් ලෙස ප්‍රකටය. මෙහි ජීවත් වන ජනයා කලහකාරී, දූෂිත පිරිසක් ලෙස සැලකේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, පොලිසිය නිතරම මෙම ප්‍රජාව පිළිබඳ පරීක්ෂාවෙන් සිටියි. මෙම තත්වය ප්‍රජාවේ ජනවාර්ගික ආන්තික බව තවදුරටත් තහවුරු කොට ඇත.

මහා සමාජයෙන් සිදුවන මෙම සියලුම සමාජ අපහරණයන් සහ වෙනස්කම් කිරීම්වල ප්‍රතිඵලය ලෙස අවට ප්‍රජාවන් සමග සංසන්දනයේදී මහයියාව දරිද්‍රතාවයෙන් පීඩිත, මූලික පහසුකම් අවම මට්ටමක ඇති ප්‍රදේශයක් බවට පත් වී තිබේ. ඔවුන්ගේ එම තත්වයට ජනවාර්ගිකත්වය, කුලය, සමාජ පන්තිය හා බලය නොමැතිකම යනාදි කරුණු ගණනාවක් බලපා ඇත. මෙම ප්‍රජාවේ තත්වය කෙරෙහි කුලය, ජනවාර්ගිකත්වය, සමාජ පන්තිය, ඔවුන්ගේ ඓතිහාසික ප්‍රභවය, යම් යම් ප්‍රවේණිගත අවාසි, ඒ හා සම්බන්ධ ක්‍රියාදාමයන් මෙන්ම මහා සමාජයේ සමාජ අගතීන් සියල්ල දායක වී ඇත. මෙම අවාසිදායක තත්වයන් රැකියා, නිවාස තත්වය හා පොදු පහසුකම් කෙරෙහි බලපා ඇති අයුරු ඊළඟ කොටස්වල විග්‍රහ වේ.

රැකියා

ඓතිහාසිකව මහයියාවේ MC ප්‍රජාව ජීවනෝපාය සකස් කර ගත්තේ මහනුවර මහ නගර සභාවට අයත් විවිධ රැකියා අවස්ථා මඟිනි. වගු 6.4 හි දැක්වෙන පරිදි මෑතකදී මෙම රටාව තවදුරටත් විවිධාංගීකරණය වූ බව පෙනී යයි.

ඉහත වගුවෙන් දැක්වෙන කරුණු අනුව බලන විට, මහයියාව MC කලාපයේ ජනයාගේ ප්‍රධාන රැකියා වූයේ මහනුවර මහ නගර සභාවේ සනීපාරක්ෂක කම්කරු හෝ වෙනත් කම්කරු වෘත්තීන්ය. මහයියාව MC සහ MT කලාපවල පිරිමින්ට සහ මහයියාව MC කලාපයේ කාන්තාවන්ට මහ නගර සභාව ප්‍රධාන රැකියා මූලාශ්‍රය විය. වෙනත් ස්ථානවල කම්කරුවන් ලෙස කටයුතු කිරීමද මහයියාව MC කලාපයේ ජනයා අතර ප්‍රචලිත විය. වෙළඳාමට මහයියාව MT කලාපයේ වැඩි වැදගත්කමක් හිමි වූ අතර මෙම ප්‍රජාවන් දෙකෙහිම සුළු වෙළඳාමද වැදගත් කොට සැලකූ බව පෙනේ. මහයියාව MC කලාපයේ කාන්තාවන් හා පිරිමින් සැලකිය යුතු සංඛ්‍යාවක් නගරයේ වෙළඳ ආයතනවල වෙළඳ සේවක සේවිකාවන් ලෙස සේවය කරති. එසේම මහයියාව MT කලාපයේ සුදු කරපටි රැකියාවල යෙදුන සුළු පිරිසක් සිටියහ. මහයියාව MC කලාපයේ කාන්තාවන් සහ MT කලාපයේ පිරිමින් සෑහෙන පිරිසක් විදේශ රැකියාවල නියුක්ත විය. පිරිමින් වැඩි වැටුපක් ලැබෙන පුහුණු රැකියා වෙත ද කාන්තාවන් අඩු වැටුපක් ලැබෙන ගෘහ සේවයට ද යොමු වූ බව දැක ගත හැකිය. මහයියාව MC කලාපයේ විශේෂයෙන්ම කාන්තාවන් අතර රැකියා විරහිත අනුපාතය ඉහළ අගයක් ගනියි. නාගරික රැකියා වෙළඳපොළ තුළ ජනවාර්ගිකත්වය, කුලය සහ ස්ත්‍රී පුරුෂභාවය නිසා සිදු වන වෙනස්කම් කිරීම් මෙම තත්වයට හේතු වී ඇත.

කාන්තාවන් සමග සංසන්දනය කරන විට මහයියාව MT කලාපයේ පිරිමින්ගේ රැකියා විරහිතභාවයට හේතුව පාරම්පරික රැකියා ගැන උනන්දු නොවීම නිසා ඇති වූ තත්වයක් විය හැකිය.

මෙම සමස්ත රැකියා සැකැස්ම තුළින් පෙන්වා දෙන ආකාරයට නාගරික සභාවේ පහළ මට්ටමේ රැකියා සහ නගරයේ අවිධිමත් රැකියා අංශ MC කලාපයේ ජනයාට විවෘත වී ඇත. ජනවාර්ගිකත්වය, කුලය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මෙන්ම අධ්‍යාපනික සුදුසුකම් අවම වීමත්, වෙනත් රැකියා අවස්ථාවන් උදා කර ගැනීමට යාමේදී මුහුණ දෙන සමාජ අපහරණයත් මෙම ආන්තික ප්‍රජාවන්හි රැකියා සැකැස්ම තේරුම් ගැනීමේදී වැදගත් වන සාධක වේ.

වගු අංක 6.4

මහයියාව MC සහ මහයියාව MT කලාපයන් තුළ ස්ත්‍රී පුරුෂභාවය සහ රැකියා ප්‍රවාහය අනුව ජනගහනයේ ප්‍රතිශත ව්‍යාප්තිය

රැකියා වර්ගය	මහයියාව MC			මහයියාව MT		
	පිරිමි	ගැහැණු	එකතුව	පිරිමි	ගැහැණු	එකතුව
KMC කම්කරු	15.2%	1.1%	8.4%	6.8%	0%	3.4%
නාගරික සේවා	0.4%	0.4%	0.4%	0.4%	0%	0.2%
සුළු වෙළඳාම්	6.6%	0.2%	3.5%	6.3%	2.1%	4.2%
වෙළඳ සහකරු	6.4%	1.3%	3.9%	0.4%	0%	0.2%
ව්‍යාපාර	2.5%	0.2%	1.4%	3.0%	1.3%	2.1%
තාවකාලික කම්කරු	4.1%	0%	2.1%	1.3%	0.9%	1.1%
පුහුණු කම්කරු	1.0%	0%	5%	0.8%	0%	4%
ලිපිකරු	3.1%	0.9%	2.0%	4.6%	3.7%	3.2%
නිල් කරපටි සේවක	4.5%	0.9%	2.8%	3.4%	0%	1.7%
ගෘහ සේවිකා	0.2%	30.3%	14.6%	4.2%	41.0%	22.5%
විදේශ රැකියා	0.6%	2.4%	1.5%	3.4%	4.1%	2.8%
ස්වයං රැකියා	1.4%	2.9%	2.1%	0.4%	0.4%	0.4%
ප්‍රවාහන කම්කරු/රියදුරු	0.8%	0%	0.4%	2.1%	0%	1.1%
ආරක්ෂක අංශ	0%	0%	0%	1.3%	0%	0.6%
වෙනත් රැකියා	5.3%	1.4%	3.5%	11.4%	5.8%	7.6%
විශ්‍රාම වැටුප්	2.7%	1.1%	1.9%	3.4%	0%	1.7%
යැපෙන දරුවන්	31.4%	32.3%	31.8%	29.5%	27.7%	29.6%
යැපෙන වැඩිහිටියන්	4.1%	8.6%	6.3%	5.9%	8.2%	7.6%
රැකියා විරහිත	9.8%	16.0%	12.8%	11.4%	4.8%	8.6%
මුළු එකතුව	100.0	100.0	100.0	100.0	100.0	100.0

නිවාස තත්වය

මහයියාව MC හා MT කලාප දෙකෙහිම අධික තදබදය ප්‍රධාන ලක්ෂණයක් විය. මහයියාව MC කලාපයේ බහුතරයක් (නියැදි සමීක්ෂණවලදී 58%) බ්‍රිතාන්‍යයන් විසින් 1920 ගණන්වලදී ඉදි කළ ලැයිම් කාමරවල ජීවත් වූ අතර සෑහෙන කාලයකින් මෙම නිවාස ප්‍රතිසංස්කරණය කොට නොමැත. 1970 ගණන් වන තුරුම මේ නිවාස මහනුවර නාගරික සභාවට අයත් වූ අතර පසුව ඒවා දිගු කාලීන බදු යටතේ පදිංචිකරුවන්ට ලබා දී ඇත. ඉඩ ප්‍රමාණය සීමිත බව හා බදු ගිවිසුම්වල කොන්දේසි නිසා මෙම නිවාස වැඩි දියුණු කිරීමට ඇති ඉඩකඩ සීමිතය. මහයියාව MT කලාපයේ, සමහර මුල් නිවාස ඉතිරිව තිබෙන නමුත්, ඉඩම් හා නිවාසවල අයිතිය මුලදී හිමි වූ බැවින් තමන්ගේම නිවාස ඉදි කර එම ගෙවල් අලුත්වැඩියා කර ගැනීමට හැකි වී ඇත. මහයියාව MC කලාපයේ නිවාසවලින් 30% ක් මහනුවර මහ නගර සභාවෙන් අවසර නොගෙන ඉදි කළ අනවසර ඉදිකිරීම් නිසා විදුලි බලය සහ ජල පහසුකම් වැනි සේවා සැපයීමේදී දුෂ්කරතා මතු වී තිබේ. මහයියාව MT කලාපයේ මෙවැනි අනවසර ඉදිකිරීම් 4% ක් විය. මහයියාව MC කලාපයේ ගෘහ ඒකකයක මාධ්‍යයක බිම් ප්‍රමාණය (වර්ග අඩි 229) මහයියාව MT කලාපයේ නිවාස ඒකකයක ප්‍රමාණය (වර්ග අඩි 418) හා සසඳන විට අඩු ප්‍රමාණයක් වේ. අනෙක් අතට නිවාස ඒකකයක සාමාන්‍යයෙන් ජීවත් වන පුද්ගලයන් සංඛ්‍යාව මහයියාව MC කලාපයේ 6.4 ක් වූ අතර මහයියාව MT කලාපයේ 5.4 ක් විය. මෙම සියලු දත්තවලින් තහවුරු වන්නේ මහයියාව MT කලාපය හා සංසන්දනය කරන විට මහයියාව MC කලාපයේ නිවාස ඒකක ප්‍රමාණයෙන් කුඩා මෙන්ම දිළිඳු තත්වයක පවතින බවත්, එක් නිවාස ඒකකයක විශාල සංඛ්‍යාවක් සිටීමෙන් අධික තදබදයක් සහ පහළ ජීවන තත්වයක් පවතින බවය.

අනවසරයෙන් ඉදි කළ සමහර නිවාස හැරුනුවිට මෙම ප්‍රජාවන් දෙකට අයත් සෙසු නිවාසවලට විදුලි බලය සපයා තිබුණි. කෙසේවුවත් මහයියාව MT කලාපයේ නිවාස 97% කට විදුලි බලය ලබා දී ඇති විට මහයියාව MC කලාපයේ විදුලි බලය ලබා දී තිබුණේ 88% කට පමණි. පානීය ජල සැපයුම අතින් මහයියාව MC කලාපයේ 60% කට පමණක් ගෘහස්ත ජල සැපයුමක් තිබුණ අතර මහයියාව MT කලාපයේ 90% කට ආසන්න ප්‍රමාණයකට ගෘහස්ත ජල සැපයුම් තිබුණි. අධික ජනගහනයක් ඇති යාබද ප්‍රජාවන් හා සංසන්දනය කරන විට පවා සනීපාරක්ෂක සේවයට සම්බන්ධ නාගරික ප්‍රජාව තුළ සමාජ ආර්ථික තත්වය දුර්වල මට්ටමක ඇති බව හෙළි වේ.

සනීපාරක්ෂක පහසුකම්

මුළු මහනුවර නගරයේම පොදු වැසිකිළි පිරිසිදු කිරීම, මහ නගර සභාවට අයත් වීදි පිරිසිදු කිරීම ඇතුළු සියලු සනීපාරක්ෂක කටයුතු මහයියාව MC ප්‍රජාව විසින් සිදු කළද ඔවුන් ජීවත් වන ප්‍රදේශය තුළ මහ නගර සභා විසින් නඩත්තු කරන සනීපාරක්ෂක කටයුතු අවම මට්ටමක පවතී. එමෙන්ම මහනුවර නගරයේ පදිංචිකරුවන් විශාල ප්‍රමාණයක් පොදු වැසිකිළි දෛනිකව පාවිච්චියට යොදා ගන්නා එකම ප්‍රජාව මෙම ප්‍රජාවයි.

ප්‍රස්තාර 6.1: මහයියාව MC හා මහයියාව MT කලාපවල වැසිකිළි භාවිතය





මහයියාව MC කලාපයේ 70% කට අධික ජන සංඛ්‍යාවක් පොදු වැසිකිළි භාවිත කළ අතර, මහයියාව MT කලාපයේ ජනයාගෙන් බහුතරයක් පෞද්ගලික ජල මුද්‍රිත වැසිකිළි (ටැප් ජල පහසුකම් සහිත හෝ රහිත) භාවිත කරති. මහයියාව MC කලාපයේ බහුතරයක් ජනයාට වැසිකිළියක් ඉදි කරගැනීමට ප්‍රමාණවත් ඉඩක් හෝ ප්‍රමාණවත් මුදලක් නොමැති වීමත් අධික තදබදය නිසා නිවෙසකට අවම බිම් ප්‍රමාණයක් හිමිවීමත් මීට බලපාන අනෙකුත් සාධක වේ. පොදු වැසිකිළි පාවිච්චි කිරීමෙන් ඇති වන ගැටලු අතර, වැසිකිළි නඩත්තු කිරීමේ අපහසුව, දිගු පෝලිම්, පෞද්ගලිකත්වය සීමා වීම, අවම ගරුත්වය, දුර්ගන්ධය මෙන්ම සෞඛ්‍ය ගැටලු මතු වීම ප්‍රධාන වේ. මෙම පොදු වැසිකිළි කුණු කානු ඔස්සේ අපද්‍රව්‍ය එකතු වන ටැංකිවලට සම්බන්ධ කොට ඇති අතර මෙම ටැංකි ද හිස් කරනු ලබන්නේ KMC බවුසර් මගිනි. බොහෝ පිරිසකට පොදු වැසිකිළිවලින් පෞද්ගලික වැසිකිළිවලට මාරු වීමට අවශ්‍ය නමුත් පුද්ගලික වැසිකිළි ඉදි කිරීමට ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති අතර විශේෂයෙන් මහයියාව MC කලාපයේ ඉදි කරන පුද්ගලික වැසිකිළිවල අපද්‍රව්‍ය බැහැර කිරීමට පවතින කානු පද්ධතිය ප්‍රමාණවත් නොවේ.

වැසිකිළි වර්ග අනුව මළ ද්‍රව්‍ය බැහැර කිරීමේ විවිධ ක්‍රම විවිධ පුද්ගලයන් විසින් යොදා ගන්නා ලදි. KMC පාලනය යටතේ ඇති පොදු වැසිකිළිවල අපද්‍රව්‍ය බහැර කරන කානු කලින් කලට හිස් කරන ලද්දේ බවුසර් උපයෝගී කර ගනිමිනි. මහනුවර මහ නගර සභාව විසින් මෙම කාර්යය කලින් කලට කළ යුතු වුවත්, සෑම විටම සිදු වන්නේ පදිංචිකරුවන් මුලින්ම KMC ට දැනුම් දී පසුව ටැංකිවලින් අපද්‍රව්‍ය ඉවත්කරන සේවකයන්ට අල්ලසක් දීමෙන් අනතුරුවය. පෞද්ගලික වැසිකිළිවලින් කිහිපයක් පමණක් නිසි ලෙස ටැංකිවලට සම්බන්ධ කොට ඇති අතර මෙම වැසිකිළි හිමිකරුවන්ට අපද්‍රව්‍ය එකතු වන ටැංකි හිස් කිරීමට මහ නගර සභාවට නිශ්චිත ගාස්තුවක් ගෙවීමට සිදු වේ. බොහෝ පෞද්ගලික වැසිකිළිවල (සංඛ්‍යාත්මකව කිව නොහැක) අපද්‍රව්‍ය විවෘත හෝ වැසුණු කානුවලට හෝ මහනුවර නගරයේ පානීය ජල මූලාශ්‍රය වන මහවැලි ගඟේ අතු ශාඛා වැනි ස්වාභාවික ජල මූලාශ්‍රවලට මුදා හරිනු ලබයි. මෙම නිවාසවල පදිංචිකරුවන් පෞද්ගලික වැසිකිළිවල අපද්‍රව්‍ය බැහැර කිරීමට විවිධ ක්‍රමවේද භාවිතා කරති. ඇතැම් පිරිස් තද වැසි පවතින විට අපද්‍රව්‍ය පොදු කානුවලට හෝ ජල මූලාශ්‍රවලට මුදා හරිති. එවිට වැසි ජලය විසින් අපද්‍රව්‍ය සෝදා හරිනු ලබයි. පොදු කානු හෝ ජල ප්‍රවාහයන් හිඟ වීම, කානු පද්ධතිය අවහිර වන සේ ඉදි කළ අනවසර ඉදිකිරීම්, ප්‍රවාහන අපහසුතා නිසා KMC වාහනවලට හා බවුසර්වලට වැසිකිළි වළවල් හෝ ටැංකි අසලට පැමිණීමට නොහැකි වීම යනාදි හේතු නිසා මෙම පිරිස් අපද්‍රව්‍ය බැහැර කිරීමේදී දුෂ්කරතා රැසකට මුහුණ දුන්හ. අදාළ නිවැසියන් තම පෞද්ගලික වැසිකිළිවල අපද්‍රව්‍ය පොදු කානුවලට හෝ ජල මූලාශ්‍රවලට මුදා හරින බව පිළිනොගත් අතරම ඔවුන් නිතරම ප්‍රකාශ කර සිටියේ තමන්ගේ අසල්වැසියන් විසින් එය සිදු කරන බවය.

පදිංචිකරුවන්ගෙන් පිටස්තර කණ්ඩායම් සමග කළ සාකච්ඡා සහ පෞද්ගලික සාකච්ඡාවලදී ඇතැම් පිරිස් ප්‍රකාශ කළේ, බොහෝ පෞද්ගලික ආයතන, මහනුවර පොදු වෙළඳ පොළ, බන්ධනාගාරය, මහනුවර මහ නගර සභාව පවා සමහර අවස්ථාවලදී පොදු කානුවලට සහ ජල මූලාශ්‍රවලට අපද්‍රව්‍ය මුදා හරින බවය. එමෙන්ම ඔවුන් අපද්‍රව්‍ය බැහැර කිරීම සාධාරණීකරණය කරනුයේ "අනිත් අයත් කරනව නම් අපි කළාම මොකද?" ලෙස පවසමිනි.

කණ්ඩායම් සාකච්ඡාවලදී වැඩි පිරිසක් සඳහන් කළ පරිදි ඔවුන්ගේ ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්වය අසතුටුදායක වන්නේ තද වැසි හේතුවෙනි. වර්ෂාව ඇති විට වැසිකිළිවල මළ ද්‍රව්‍ය සහ වෙනත් අපද්‍රව්‍ය කානු දිගේ ගලා ගොස් මාර්ගවලටත් පහත් බිම් ප්‍රදේශවලටත් ගලා යන්නේ ප්‍රදේශය පුරා අධික දුර්ගන්ධයක් ඇතිකරමින් මෙන්ම සෞඛ්‍ය ගැටලු ඇති කරමිනි.

පොදු පහසුකම් අතින් මහයියාව MC ප්‍රජාවේ පවත්නා දුර්වල තත්වය එක් අතකින්, ඔවුන්ට ප්‍රවේණිගතව උරුම වූ අවාසිදායක තත්වයන්ගේ ප්‍රතිඵලයකි. ඔවුන්ගේ දේශපාලන හා සමාජ ආන්තික භාවය නිසා ඔවුන්ට ඉහළ මට්ටමේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ වීමට හෝ බලපෑම් කිරීමට නොහැකි වී ඇත.

සනීපාරක්ෂක කම්කරුවන්ගේ සමාජ හා දේශපාලන සංවිධානගතවීම්

මහයියාව ප්‍රජාව තුළ ජාතික මට්ටමේ දේශපාලන පක්ෂ වන එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වැනි පක්ෂවල ශාඛා ද වාර්ගික පදනමක් ඇති ලංකා කම්කරු කොංග්‍රසය (CWC) වැනි වතු කම්කරුවන්ගේ උවමනාකම් නියෝජනය කරන පක්ෂ ද ඇතුළු විවිධාකාර දේශපාලන පක්ෂ ඇත. මෙම සංවිධාන මෙහෙයවනු ලබන්නේ පිටස්තර නායකයන් විසින් වන අතර, මොවුහු මහයියාව MC කලාපයේ අතරමැදි අය හරහා ප්‍රජාවේ ගැටලුවලට තාවකාලික සහන ලබා දීමට ඉදිරිපත් වූහ. මීට පෙර විග්‍රහ කළ පරිදි ලංකා කම්කරු කොංග්‍රසයේ නායකත්වය ඉන්දියානු දෙමළ ඉහළ කුලවල ප්‍රභූන්ගෙන් පැමිණි අතර ඔවුන් වඩාත් සංවේදී වූයේ ජන වාර්ගික ප්‍රශ්න කෙරෙහි මිස කුල-පාදක කොන් කිරීම් පිළිබඳව නොවේ. ජනවාර්ගික වශයෙන් බෙදුනු වරප්‍රසාද නොලත් කුල කණ්ඩායම් අතර හෝ ඒ ඒ ජනවාර්ගික කණ්ඩායමට අයත් පීඩිත කුල තුළ පොදු අනන්‍යතාවක් නොතිබිණ. මෙහිදී සඳහන් කළ යුතු වැදගත් කරුණක් නම්, රට පුරා විවිධ නාගරික මධ්‍යස්ථානවල ව්‍යාප්ත වී සිටින සනීපාරක්ෂක කම්කරුවන් විශාල ප්‍රමාණය අතර දීප ව්‍යාප්ත සංවිධානයක් හෝ ප්‍රාදේශීය සංවිධානයක් නොතිබීමයි (සිතියම් අංක 6 බලන්න). මෙම නාගරික පදිංචිකරුවන් වැඩිදෙනා තුළ කුලය ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රවණතාවක් පවතින හෙයින් එවැනි සංවිධානගතවීම්වලට ඉඩ ප්‍රස්තා නොමැත.

මහනුවර අඩු ආදායම් ලබන නාගරික ප්‍රජාවන් අතර සැලකිය යුතු සංවර්ධනයන් සිදු වී ඇති බව පැවසිය හැකිය. 1991 සිට මහනුවර මහයියාව ඇතුළු ප්‍රජාවන් කිහිපයකම UNICEF සංවිධානය විසින් නාගරිකයන් උදෙසා මූලික සේවා වැඩසටහන

දියත් කරන ලදි. මෙම ව්‍යාපෘතිය තුළදී අදාළ ප්‍රජාවන් තුළින්ම තෝරාගත් 'ප්‍රජා සංවර්ධන නිලධාරීන්' (CDO) ගේ සහභාගිත්වය තුළින් සනීපාරක්ෂක සේවා සහ ළමා සංරක්ෂණ සේවා දියුණු කිරීමට උත්සාහ දරන ලදි. මහනුවර මහ නගර සභාව ව්‍යාපෘතිය තුළ ක්‍රියාකාරී ආයතනය වූ අතර ප්‍රජා සංවර්ධන නිලධාරීන්ට UNICEF සංවිධානය මඟින් ගෙවීම් කළත් ඔවුන් සැබවින්ම නගර සභාවේ රැකියාවල නියුක්තවූවන් විය. ප්‍රජා සංවර්ධන නිලධාරීන්ගෙන් අපේක්ෂා කළේ ප්‍රජා සංවර්ධන සංවිධාන පිහිටුවා ඒවා ශක්තිමත් කිරීම තුළින් යටිතල පහසුකම් නංවාලීමේ අරමුණු උදෙසා නාගරික ප්‍රජාව සංවිධානගත කිරීමය. ප්‍රජා නායකයන් සහ ප්‍රජා සාමාජිකයන් විවිධ ප්‍රජා ක්‍රියාකාරකම් උදෙසා පුහුණු කිරීම ප්‍රජා සංවර්ධන නිලධාරීන්ගේ වගකීම විය. 1992 දී ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ (NHDA) හා නාගරික සංවර්ධන අධිකාරියේ (UDA) සහයෝගය ඇතිව මහ නගර සභාව ඉදිකිරීම් සහ ප්‍රජා යටිතල සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් ප්‍රජා වැඩසටහන් ආරම්භ කරන ලදි. NHDA විසින් ප්‍රජාවේ තෝරාගත් නාගරික පදිංචිකරුවන්ට සිය නිවාස වැඩිදියුණු කර ගැනීමට අඩු පොලියක් යටතේ ණය පහසුකම් සපයන ලදි. මෙම වැඩසටහන් ටික කාලයක් යන තුරු ප්‍රජාව තුළ ක්‍රියාකාරීව පැවතුන නමුත් පසුව ක්‍රියාකාරීත්වය අඩු වී වැඩසටහන් සැලසුම් කළ පරිදි නිමා කළේ ද නැත. අරමුදල් හිඟකම, පරිපාලනමය ප්‍රශ්න, මෙම ප්‍රජාවන්ට ආවේණික දේශපාලන සහ සමාජ සංසිද්ධීන් ඒ සඳහා බලපෑ හේතු සාධක විය. 1990 මැද භාගය වන විට බාහිර අරමුදල් නතර කළ හෙයින් ප්‍රජා සංවර්ධන නිලධාරීන්ගේ ක්‍රියාකාරකම් ද නවතා දමන ලදි.

මහයියාව MC හා මහයියාව MT කලාපවල ක්‍රියාකාරී ප්‍රජා සංවිධාන කිහිපයක් වේ. මෙම ක්‍රියාකාරී සංවිධාන අතර තරුණ ක්‍රීඩා සමාජ, ඡන්ද සමයේ ක්‍රියාකාරී වන පක්ෂ සංවිධාන, අවමංගල්‍යාධාර සංවිධාන සහ ණය දෙන සමිති යනාදිය වේ. මෙම කිසිදු සංවිධානයක් මහයියාව MC කලාපයේ ප්‍රජාවන්ගේ හිමිකම් හා අයිතිවාසිකම් සම්බන්ධ මතවාදයක් ඇති කිරීමට සමත් වී නැත. මහයියාවේ මෑත කාලීන ඉතිහාසය ගත් විට පිටස්තර ආයතන විසින් මෙම ප්‍රජාවේ යටිතල පහසුකම් නංවාලීමේ අරමුණින් ආරම්භ කළ වැඩසටහන් රාශියක් අසාර්ථක වී ඇති බව හෙළි වේ. මෙහිදී නිරීක්ෂණය කළ හැකි වැදගත් දෙයක් නම්, බොහෝ දේශපාලන පක්ෂ සහ සංවර්ධන වැඩසටහන් ජනවාර්ගිකත්වය සහ සමාජ පන්තිය පිළිබඳ අවධානය යොමු කරන නමුත් කුලය අමතක කොට ක්‍රියා කරන බවයි. 1977 සහ 1983 ජන වාර්ගික කෝලාහලවලදී මහයියාවේ ඉන්දියානු දෙමළ ප්‍රජාව ඉලක්ක නොවූයේ එම ප්‍රජාවේ සිටි අධික ජන සංඛ්‍යාව හා හිංසනය කලහකාරීත්වය පිළිබඳ එම ප්‍රජාවට තිබූ ප්‍රසිද්ධිය නිසා විය හැකිය. සිංහල බහුතරය සහිත වෙනත් නගරවල තිබූ කුඩා සනීපාරක්ෂක කම්කරු ජනාවාසවල තත්වය එලෙස නොවීය. උදාහරණ ලෙස 1990 දී අම්පාර නගරයේ සනීපාරක්ෂක කම්කරු ජනාවාසයක මුළු ජනගහනයම ජනවාර්ගික

කෝලාහලවලදී මරා දමන්නට හෝ අවතැන් වන්නට ඇතැයි සැලකේ.[29] මේ කරුණු නිසා 1983 කෝලාහලවලදී පිටස්තර දෙමළ ජනයා ආරක්ෂාව පතා මහයියාවට පැමිණ ඇත. මේ අනුව ජනවාර්ගිකත්වය සහ කුලය යන සාධක තුළින් මොවුන්ගේ අනාරක්ෂිතභාවය වඩාත් උත්සන්න වී ඇතැයි කිව හැක.

දශක කිහිපයක් තිස්සේ සමස්ත මහයියාව ප්‍රජාව සමාජ අපහරණයට සහ කොන් කිරීම්වලට ලක්වීමේ ප්‍රතිඵල මෙම පරිච්ඡේදයේදී විග්‍රහ කරන ලදි. වසර කිහිපයක සිට විවෘත කුල-පාදක කොන් කිරීම් අඩු වී ඇති නමුත් නාගරික අස්පර්ශනීයත්වය අඩු නොවී පැවතීමට කුල සම්භවය, අතීතයේ සිට උරුම වූ පහත් මට්ටමේ රැකියා, ජනවාර්ගික ගෙටෝකරණය, අධික ජනගහන තදබදය, සමාජ දුරාචාර, පාරිසරික හා සෞඛ්‍ය ගැටලු වැනි කරුණු බොහොමයක් බලපා ඇත. මෙම ප්‍රශ්න එකිනෙකට අන්තර් සම්බන්ධ බැවින් මේ පිළිබඳ වඩා පුළුල් අර්ථයකින් විග්‍රහ කළ යුතුය. දකුණු ඉන්දියාවෙහි ප්‍රභවය වූ කුලය හා බැඳුණු අස්පර්ශනීයත්වය පිළිබඳ මතවාදය මෙම ප්‍රජාව සමාජ ධුරාවලියේ පහළ මට්ටමට ඇද දැමීමට හේතු වූ අතර, ජනවාර්ගික ආන්තිකභාවයත් සමාජමය ගැටලුත් මෙම ප්‍රජාවේ සමාජ ආන්තිකභාවය වැඩි කිරීමට ඉවහල් වී ඇත. මහයියාව MC කලාපයේ ප්‍රජාවේ සමාජ කොන් කිරීම් විග්‍රහ කළ විට, නිරන්තරයෙන් කුල ප්‍රභේද නොසලකා හැර ජනවාර්ගික හෝ සමාජ පන්ති කේන්ද්‍රීය කර ගැනීමේ නැඹුරුතාවක් පවතී. 2007 මැයි 27 මහනුවර පැවති කුල-පාදක කොන් කිරීම් පිළිබඳ ජාතික සම්මන්ත්‍රණයෙන් හෙළි වූ පරිදි ඇතැම් අයට අනුව කුලය වර්තමාන සමාජ අසාධාරණයන් මෙහෙයවන බලවේගය නොවේ. නාගරික ඉදිකිරීම්, මූලික නාගරික සේවා, අධ්‍යාපනය ලබා ගැනීම, සෞඛ්‍ය සේවා වැනි අංශවලදී දේශපාලන ක්‍රියාකාරකයන් හා ප්‍රතිපත්ති සම්පාදකයන් මහයියාව ප්‍රජාවට සිදුවන කුල-පාදක කොන් කිරීම් අමතක කොට ක්‍රියා කිරීමෙන් ඔවුන්ගේ ප්‍රශ්න නිවැරදි ව්‍යුහාත්මක සන්දර්භයක් තුළ සාකච්ඡාවට බඳුන් වී නොමැත. අනෙක් අතට වර්තමාන විශ්ලේෂණය තුළින් පෙන්වා දෙන පරිදි කුලය හුදෙකලා ආයතනයක් නොව, සමාජ අපහරණය මෙන්ම හිමිකම් අහිමි වීමට බලපාන යාන්ත්‍රණයක් බව කිව යුතුය. කුල-පාදක වෙනස්කම් කිරීම් හුදෙකලාව සාකච්ඡා කරනවාට වඩා අදාළ ප්‍රජාවන්හි සමාජ හා දේශපාලනික ආන්තික භාවයට දායක වන කුලය හා සමගාමී වූ අනෙකුත් බලවේග සමග එක්ව සාකච්ඡා කිරීම වඩාත් යෝග්‍ය වේ.

---

29 මෙම වාර්ගික කෝලාහලයෙන් අවතැන් වූ පිරිස් අම්පාර නගරයේ කෙළවරක මුස්ලිම් ගම්මානවලට යාබදව පිහිටි වලාතපිටිය (Valathapitiya) ප්‍රදේශයේ නැවත පදිංචි කරන ලදි.

හත්වන පරිච්ඡේදය

නිගමන සහ නිර්දේශ

කාලිංග ටියුඩර් සිල්වා
පරම්සෝති තන්ගේස්
පී.පී. සිවප්‍රකාශම්

නිගමන

ශ්‍රී ලංකාවෙහි ජනවාර්ගික කණ්ඩායම් තුනක ඒවාට ආවේණික වූ කුල ක්‍රම හඳුනා ගත හැක. මේ කුල ක්‍රම තුන ඉන්දියාවේ හින්දු කුල ක්‍රමයේ විවිධාකාර බලපෑම්වලට ලක් වී ඇත. මේ කුල ක්‍රම තුනට එක සමාන ලෙස වැදගත් වූ කිල්ල පිළිබඳ අදහසක් නැත. අනෙක් අතට කිල්ල පිළිබඳ අදහස් සහ කුල-පාදක සමාජ කොන් කිරීම් මේ සෑම කුල ක්‍රමයක් තුළම අඩු වැඩි වශයෙන් පවතී. යාපන අර්ධද්වීපයේ පවත්නා කුල ක්‍රමය වඩාත්ම පීඩාකාරී කුල ක්‍රමය ලෙස දැක්විය හැකිය. එය තුළ පැහැදිලි සමාජ විෂමතා, කොන් කිරීම් සහ සමාජ පිළිකුල් කිරීමේ ප්‍රවණතා පවතී. සිංහල කුල ක්‍රමය තුළ ද ඇතැම් කුල සමාජ අවමානයට ලක්වී ඇත. එසේ නමුත් ජන සංඛ්‍යාව අතින් පීඩිත කුලවලට අයත් වන්නේ සීමිත පිරිසකි. ඔවුන් බොහෝවිට අවකාශමය වශයෙන් අදෘශ්‍යමාන කණ්ඩායම්ද වේ. ඉන්දීය වතු කම්කරු ජනයාගෙන් බහුතරය දකුණු ඉන්දියාවේ වඩාත් කොන්වූ සහ දරිද්‍රතාවයෙන් වඩාත්ම පීඩාවට ලක් වූ කුල පසුබිම්වලින් තෝරාගත් අයගෙන් පැවතෙන දරු මුණුපුරන්ගෙන් සමන්විතය. මෙම පසුතලය තුළ සුළුතරය වූ ප්‍රභූ කුලවල අයට රිසි පරිදි සමාජ කොන් කිරීම් හෝ කිල්ලට ලක් කිරීම් ක්‍රියාත්මක කිරීමට අසමත් වී තිබේ. කෙසේ නමුත් වතු ආර්ථිකය සහ සමාජ ක්‍රමය තුළ කම්කරුවන් තදබල සූරාකෑමකට ලක් වී ඇති අතර මෙහිලා කුල සාධකය යම් තරමකට හෝ උපයෝගි කරගෙන තිබේ. සනීපාරක්ෂක කම්කරුවන් කෙරෙහි යොමු වූ නාගරික අස්පර්ශනීයත්වය යටත් විජිත පාලනය යටතේ බිහි වූ මහ නගර සභා ක්‍රමය තුළින් උත්පාදනය වී වර්ධනය වී ඇත. මෙහිදී ද දකුණු ඉන්දියාවේ හින්දු කුල ක්‍රමය තුළින් අදාළ සේවකයන් තෝරා ගැනීම සහ සේවයට යොදා ගැනීම සිදු විය.

ලංකාවේ වර්තමාන ජන සංගණනවලදී කුලය ගැන තොරතුරු රැස් නොකරන බැවින්, කුල පීඩනයට ලක් වූ සංඛ්‍යාවන් ගැන සඳහන් කළ හැක්කේ අනුමාන වශයෙනි. පවත්නා සීමිත තොරතුරු අනුව ලංකාවේ සමස්ත ජනගහනයෙන් 20% ත් 30% ත් අතර ප්‍රමාණයක් කුලය පදනම් වූ සමාජ කොන්කිරීම්වලට අඩු වැඩි වශයෙන් ලක් වී ඇතැයි සිතිය හැකිය. මෙය ලාංකික දෙමළ ජනයාගෙන් 20% ක්, සිංහල අයගෙන් 30% ක් සහ ඉන්දියානු දෙමළ අයගෙන් 75% ක් දක්වා යනාදි වශයෙන් දැක්විය හැකිය. ඒ ඒ ජන වර්ගය තුළ කුල පීඩනයට ලක් වූ ජන කණ්ඩායම් සිටිති. උදාහරණ ලෙස යාපනයේ අවතැන් වූ අයගෙන් සමන්විත කඳවුරු, සිංහල ජනගහනය තුළ රොඩී, කින්නර, ගහල, බෙරවා, බත්ගම, කුඹල් සහ වහුම්පුර යන කණ්ඩායම් නාගරික ප්‍රදේශවල ඉන්දියානු සම්භවයක් සහිත නාගරික සනීපාරක්ෂක ප්‍රජාවන් දැක්විය හැකිය. මෙම ප්‍රජාවන් සමාජ අපහරණයන්ට සහ පාරම්පරික අවාසි සහගත තත්වයන්ට ලක් වී ඇත. එහි ප්‍රතිඵල ලෙස බොහෝවිට නිධන්ගත දිළිඳුකම, ජනාකීර්ණභාවය, ජනවාර්ගික කොන් කිරීම් සහ මූලික සේවා පහසුකම් ඌණතාවය යන සමාජ ප්‍රශ්න මෙම ප්‍රජාවන් තුළ මුල් බැසගෙන ඇත.

මෙම අධ්‍යයනයේදී ශ්‍රී ලංකාවේ කුල ක්‍රමයන්ට ආවේණික වූ විශේෂතා කිහිපයක් හඳුනා ගත හැකි විය.

ප්‍රථමයෙන්, ශ්‍රී ලංකා සන්දර්භය තුළ කුලය සැඟවුණු රහසිගත මාතෘකාවක් බවට පත් වී ඇත. කුලය ගැන කතා කිරීම අනවශ්‍ය ඕපාදූපයක් ලෙසින් ද, පරණ හණමිටි මාතෘකාවක් ලෙස ද, සමාජ අනුකලනයට බාධාවක් ලෙසින් ද විශේෂයෙන්ම ජනවාර්ගික ඒකාග්‍රතාව කඩාකප්පල් කිරීමට හිතාමතාම හඳුන්වාදෙන මාතෘකාවක් ලෙස ද විවිධ අවස්ථාවල සලකනු ලැබේ. මේ පසුතලය තුළ කුලය ගැන නිවැරදි තොරතුරු රැස් කිරීම හෝ කුලය පදනම් වූ සමාජ කොන් කිරීම්වලට එරෙහිව කිසියම් ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීම ඉතා දුෂ්කර වී ඇත. ඉන්දියාවට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ කුල පීඩනය අවම තත්වයක පවතින නමුත්, එයට ලක් වූ පිරිස් හෝ සමස්ත සමාජය විසින් එය ප්‍රශ්නයක් ලෙස හඳුනා ගැනීමක් හෝ ඒ සඳහා විසඳුම් සෙවීමට උත්සාහයක් නොපවතී.

දෙවනුව, යටත් විජිත යුගයේ අවසන් භාගයේ සිට ශ්‍රී ලංකාවේ රාජ්‍යය ජන සංගණන, වෙනත් සමාජ සමීක්ෂණ හෝ අනෙකුත් රාජකාරී කටයුතු සඳහා කුලය නොසලකා හැර ඇත. මෙයට පාදක වූ මතය වී ඇත්තේ කුලය සමාජ ප්‍රතිපත්ති සඳහා හඳුනාගැනීම හෝ උපයෝගී කරගැනීම මඟින් කුලයට අනවශ්‍ය විධිමත්භාවයක් ලැබෙන බවයි. මෙම තත්වයන් යටතේ කුලය ගැන යම් තරමකට හෝ අධ්‍යයනය කළ හැකි වී ඇත්තේ ග්‍රාමීය මට්ටමේ සිදු කළ මානව වංශ පර්යේෂණ ඔස්සේ පමණි.

තුන්වෙනුව, එක් එක් කුල ක්‍රමය තුළ පහළම සමාජ මට්ටම හඳුනා ගැනීම සඳහා ක්‍රම සහ විධි ඉදිරිපත් වී ඇත. සිංහල සමාජය තුළ 'නීච කුල' පිළිබඳ සංකල්පයත්, යාපන සමාජය තුළ 'පංචමර්වරු' ගැන අදහසත්, ඉන්දියානු දෙමළ අය අතර PPC

කුල පිළිබඳ මතවාදයත් මේ අනුව ඉදිරිපත් වී ඇත. කෙසේ නමුත් ඉන්දියාවේ දලිත් ව්‍යාපාරයේදී මෙන් ඒ ඒ කුල ක්‍රමයට අයත් පීඩිත පිරිස්වලට එකට එකතු වී කුල ක්‍රමයට එරෙහිව සාමූහිකව සටන් කිරීමට ලංකා සමාජය තුළ නොහැකි වී ඇත. එයට හේතුව සිංහල හා දෙමළ ජනයා අතර පැන නැගී ඇති ජනවාර්ගික ගැටුම නිසා ඒ ඒ ජන වර්ගය තුළ සිරවූ කුල පීඩිතයන්ට ඒකරාශි වීමට බාධා සිදු වීමය. සියලු කුල පීඩිතයන් හැඳින්වීම සඳහා 'දලිත්' යන පදය භාවිත කිරීමට ඇතැම් සමාජ ක්‍රියාකාරකයන් උත්සාහ කර ඇති නමුත්, ඒ මඟින් සියලු කුල පීඩිතයන් අතර පොදු අනන්‍යතාවක් ඇති කිරීමකට හෝ ඔවුන්ගේ පොදු සමාජ පෙළ ගැසීමකට මෙතෙක් අසමත් වී ඇත. ලංකාවේ ඇති සමාජ දේශපාලන වාතාවරණය යටතේ සමාජයේ කුල අනන්‍යතාව විවෘතව ප්‍රකාශ කිරීමට හෝ ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමට එරෙහිව විවෘතව සටන් කිරීමට පීඩිත කුලිකයන් මැළි වන බවක් පෙනේ.

හතරවෙනුව, මෑත භාගයේදී ලංකාවේ සිදු වී ඇති ජාතිකත්ව ප්‍රබෝධය නිසා කුල ප්‍රශ්නය තවදුරටත් යටපත් වී ඇත. ශ්‍රී ලංකාවේ සිදුවෙමින් පවත්නා මූලික සමාජ පරිවර්තනයක් නම් පුද්ගලයන්ගේ මූලික අනන්‍යතාවයේ පදනම කුලයේ සිට ජනවාර්ගිකත්වය දක්වා පරිවර්තනය වීමය (Silva 1999).[30] ජනවාර්ගික කණ්ඩායමේ ඒකාබද්ධතාවය උදෙසා ඒ ඒ ජන වර්ගය තුළ ඇති කුල බෙදීම් අමතක කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට උත්සාහ කෙරෙන නමුත් කුලයේ වැදගත්කම අඩුවීමක් මෙයින් නොහැඟවේ.

පස්වෙනුව, මහයියාව ප්‍රජාවේ කරන ලද මානව වංශ අධ්‍යයනයෙන් හෙළි වූ පරිදි ඇතැම් අවස්ථාවලදී පීඩිත කුල පසුබිම සහ ජනවාර්ගික ආන්තිකභාවය අන්‍යෝන්‍ය වශයෙන් පෝෂණය වී ඇත. මෙම ප්‍රජාව එක අතකින් කුල පීඩනයට ලක් වූ කණ්ඩායමක් ලෙසත් අනෙක් අතින් ජනවාර්ගික වශයෙන් කොන් වූ කණ්ඩායමක් ලෙසත් සැලකිය හැකිය. නගරයේ කසළ ශෝධකයන් ලෙස ඔවුන් එක අතකින් ජනවාර්ගික හා පන්තිමය කොන් කිරීම්වලටත් අනෙක් අතින් කුලය පාදක වූ කොන් කිරීම්වලටත් ලක් වී ඇති බවක් පෙනේ.

හයවෙනුව, කුල වෘත්තීන්වල යෙදීමට මැළි වීම, අනන්‍යතාව ප්‍රකාශ කිරීම් සහ එදිනෙදා සමාජ සම්බන්ධතා අතින් කුලයේ වැදගත්කමේ අඩුවීමක් පැහැදිලිව පෙනෙන නමුත් තවත් අංශවලින් විශේෂයෙන්ම මහනුවර දළදා පෙරහැර, කෝවිල් පිළිවෙත් සහ විවාහ රටාවන් මෙන්ම අවතැන් වූවන්ගේ කඳවුරු, සංක්‍රමණ රටා සහ ඒ ඒ ජන වර්ගය තුළ ඇති විරෝධතා වැනි නව සමාජ නිර්මිතයන් මඟින් කුලය තවදුරටත් සමාජ යටිතලය තුළ ක්‍රියාත්මක වන බව පෙනී යයි.

කුල ධුරාවලිය සහ සෙසු සමාජ විෂමතාවලට එරෙහි වූ සමාජ පෙළ ගැසීම් නූතන ලංකා සමාජය තුළ විවිධාකාරයෙන් ඉස්මතු වී ඇත. උදාහරණයක් ලෙස

30 1957, N.K Sarkar ගේ “Demography of Ceylon" හි සඳහන් වන පරිදි "....... 1824 දී ජනයා ජනවාර්ගික වෙනස්කම්වලට වඩා කුල-පාදක වෙනස්කම්වලට සංවේදී පිරිසක් විය”.

දෙමළ විමුක්ති කොටි සංවිධානය සහ ජනතා විමුක්ති පෙරමුණ තුළ කුල හා පන්ති පීඩනයට ලක් වූ දෙමළ සහ සිංහල තරුණයන් යම්තාක් දුරට පෙළ ගැසී සිටින බව පෙනේ. එමෙන්ම ඉන්දියානු වතු කම්කරු සමාජය තුළ බිහි වී ඇති කුඩියානවර් දේශපාලන නායකත්වයට අභියෝගාත්මක ලෙස පීඩිත කුලවල තරුණයන්ගේ කිසියම් පෙළ ගැසීමක්ද දැක ගත හැකිය. එමෙන්ම වත්මන් ලංකා සමාජය තුළ කුලහීනයන් කොන් කිරීමට උසස් කුලවල අය විසින් ගන්නා උත්සාහයන්ට විරෝධාකල්පයක් දක්නට ලැබේ. අනෙක් අතට රජයේ 'ගම් උදාව' වැනි සංවර්ධන වැඩසටහන්වලදී සහ සර්වෝදය වැනි රාජ්‍ය නොවන සංවිධානවල සමාජ සංවර්ධන ව්‍යාපෘතිවලදී කුල පීඩනයට ලක් වූ අයට උදව් කිරීමට කිසියම් උත්සාහයක් ගෙන ඇත (Rathnapala 1979). මෙම අධ්‍යනයේදී හෙළි වූ තවත් කරුණක් නම් වරප්‍රසාද නොලත් පසුබිම්වලට අයත් ගැහැණු සහ පිරිමි ගෝලීයකරණය සහ විවෘත ආර්ථික ප්‍රතිපත්ති යටතේ ඉස්මතු වූ රැකියා අවස්ථාවන්ගෙන් තමන්ට කිසියම් වාසි සලසා ගැනීමට ඉදිරිපත් වී ඇති බවයි. උදාහරණ ලෙස කුල පීඩනයට ලක් වූ ඇතැම් ප්‍රජාවන්ට අයත් කාන්තාවන් බහුල වශයෙන් මැදපෙරදිග රැකියා සඳහා සංක්‍රමණය වීමේ ප්‍රවණතාවක් ද, යුද්ධයෙන් අවතැන් වූ අයගෙන් සෑහෙන පිරිසක් සරණාගතයන් ලෙස හෝ නීත්‍යානුකූල සංක්‍රමණිකයන් ලෙස විදේශ රටවලට සංක්‍රමණය වීමේ නැඹුරුවක් ද, කුල පීඩනයට ලක් වූ ඇතැම් පාර්ශවයන් වාණිජ එළවළු ගොවිතැනෙහි හෝ ඈත ප්‍රදේශවල වෙළඳාම් කටයුතුවලට යෑම ද දැක්විය හැකිය. පීඩිත කුල පසුබිම්වලට අයත් ඇතැම් පිරිස් නව ආර්ථික අවස්ථාවන් කෙරෙහි නැඹුරු වී ඇත්තේ සාම්ප්‍රදායිකව ඔවුන්ට විකල්ප රැකියා සඳහා ඇති අවස්ථා සීමිත වීම නිසා සහ රජයේ සහ පෞද්ගලික අංශයේ විධිමත් රැකියා ලබා ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යාපනික පසුබිම හෝ සමාජ ප්‍රාග්ධනය සහ දේශපාලන සබඳතා ඔවුන්ට නොමැති වීම නිසයි. කෙසේ නමුත් වෙළඳපොළ ප්‍රසාරණය වීම සහ ආර්ථික ප්‍රතිසංස්කරණ පාරම්පරිකව අවාසිසහගත තත්වයක සිටි කුල ධුරාවලියේ පහළ මට්ටම්වලට අයත් අයගේ සමාජ ආර්ථික තත්වය වැඩිදියුණු කිරීමට කෙතෙක් දුරට ඉවහල් වී ඇත්ද යන්න අනාගත පර්යේෂණ මඟින් සොයා බැලිය යුතුය. ශ්‍රී ලංකා සමාජය තුළ කුල විරෝධි සමාජ දේශපාලන පෙළ ගැසීම් ඉන්දියාවේ හෝ නේපාලයේ දලිත් ව්‍යාපාරය තරම් මුහුකුරා ගිය බවක් නොපෙනේ.

ශ්‍රී ලංකාවෙහි කුල-පාදක සමාජ කොන් කිරීම්වල ලක්ෂණ

මෙම අධ්‍යයනයේදී ලංකා සමාජය තුළ කුල-පාදක සමාජ කොන් කිරීම්වල විශේෂතා කිහිපයක් හඳුනා ගන්නා ලදි. පළමුවෙන්, මෙම අධ්‍යයනයට ලක් වූ සියලුම පීඩිත ජන කොටස් සමාජ ගරුත්වය සහ සමාජ පිළිගැනීම පිළිබඳ ගැටලුවලට මුහුණ දුන් අයයි. යාපන සමාජයෙහි ඉහත කී තත්වය බොහෝදුරට කිල්ල පිළිබඳ සංකල්පය හා බැඳී ඇත. උඩරට සිංහල සමාජයෙහි මේ තත්වය බොහෝදුරට පාරම්පරික කුල මෙහෙවර හා බැඳී ඇත. මහයියාව ප්‍රජාවට මුහුණ දීමට සිදු වී ඇති සමාජ

කොන් කිරීම් මහ නගර සභා ප්‍රදේශය තුළ ඔවුන්ට සිදු කිරීමට නියමිත කසළ ශෝධක සේවාවන් හා බැඳී පවතී. මේ අනුව මේ තත්වය එක්තරා දුරකට රැකියාව හා සම්බන්ධ සමාජ කොන් කිරීමක් ලෙස සැලකිය හැකිය. කුල ක්‍රමයේ නාමයෙන් සිදුවන සමාජ අසාධාරණයන් මේ අනුව එක් අතකින් ආගමානුකූල කිල්ල පිළිබඳ අදහස් මත හා අනෙක් අතින් පාරම්පරික රැකියා හා සේවා සහ අවරෝහණය මත රඳා පවතී.

දෙවනුව, ආගමික පිළිවෙත් ඔස්සේද කුල හීන පිරිස්වලට යම් කොන් කිරීම්වලට මුහුණ දීමට සිදුවී ඇත. උදාහරණ ලෙස යාපනයේ මල්ලාහම් හා මහනුවර මහයියාව ප්‍රදේශයන්හි පදිංචි කුලහීන ජනයාට ඇතැම් හින්දු කෝවිල්වලට යෑමට අවසර නැත. එමෙන්ම කුරගල ප්‍රදේශයේ බෞද්ධාගමික රොඩී ජනයාට පන්සල්වලින් යම් යම් සමාජ කොන් කිරීම් සිදු වී ඇත. අනෙක් අතට මෙම සියලුම ප්‍රදේශවල කුල හීන අයට ඒ ඒ ආගම්වල පූජකයන් බවට පත්වීමට යම් යම් බාධාවන් පවතී. මෙයට අදාළ තවත් කරුණක් නම්, වැලිවිට වැනි ගම්වල පදිංචි නැකති කුලයේ අයට ඇතැම් ආගමික ආයතනවල තේවාවන් කිරීමට නියමිතව තිබීමයි.

තුන්වෙනුව, අධ්‍යනයට ලක් වූ සියලු ප්‍රජාවන් ඇතැම් ආර්ථික විහීනතාවයන්ට ලක් වී ඇත. උදාහරණයක් ලෙස ඉඩම් අයිතිය වැනි කරුණුවලදී ඇතැම් කුලහීන ජනයා තවමත් යම් දුෂ්කරතාවන්ට මුහුණ දේ. වැලිවිට ප්‍රජාවෙහි සේවා කුලවල අයට ඉඩම් අයිතිය සීමිත වීම එක්තරා දුරකට ඓතිහාසික ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. අනෙක් අතට යාපනයෙහි සිටින අවතැන් වූ පංචමර් කණ්ඩායම්වලට තවදුරටත් මුහුණ දීමට සිදු වී ඇති කුල පීඩනයන් නිසා වෙළෙඳ පොළ යාන්ත්‍රණය තුළදී පවා කුලීන අයගෙන් පදිංචිය සඳහා හෝ වගාව සඳහා ඉඩම් ලබා ගැනීමට අපහසු වී ඇත. අධ්‍යයනයට ලක් වූ සෑම ප්‍රජාවක් තුළම ඉඩම් හිඟය සහ දරිද්‍රතාවය ඉහළ මට්ටමක පැවතුණි. එපමණක් නොව මහයියාව වැනි නාගරික ප්‍රදේශවල ප්‍රජාව මෙන්ම හේනාවල වැනි කර්මාන්තයක නියැළී සිටින ග්‍රාමීය ප්‍රජාව තුළ පවා ජනාකීර්ණ සහ තදබදය සහිත ස්වභාවයක් පැහැදිලිව හඳුනා ගත හැකිය.

හතරවෙනුව, පානීය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් වැනි සේවාවන් සඳහා මොවුනට හිමි වූයේ සීමිත අයිතියකි. මේ තත්වය ජනාකීර්ණ මහයියාවේ මෙන්ම අවතැන් වූ අය පදිංචිව සිටි මල්ලාහම්වලද විශේෂයෙන් දැක ගත හැකිය. රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල තීරණ ගැනීමේ ක්‍රියාවලිය කෙරෙහි මේ අයට ඇති අඩු බලපෑමද මෙවැනි මූලික පහසුකම් ඔවුන්ට ලබා ගැනීමට අපහසු වීමෙන් පෙනී යයි.

පස්වෙනුව, පිටස්තර දේශපාලන සංවිධාන ඔවුන්ගේ විවිධ දේශපාලන අරමුණු සඳහා කුල හීන පිරිස්වල සහයෝගය ලබා ගැනීමට උනන්දු වී ඇත. උදාහරණයක් ලෙස දකුණේ ජනතා විමුක්ති පෙරමුණ ද උතුරේ දෙමළ විමුක්ති කොටි සංවිධානය ද කුලහීන ප්‍රජාවන්ගේ දේශපාලන සහයෝගය සහ ක්‍රියාකාරි සහභාගිත්වය ලබා

ගැනීමට උත්සුක වී ඇත. කෙසේ නමුත් මේ එකද සංවිධානයක් හෝ කුල ප්‍රශ්නය වටා මෙම ප්‍රජාවන් පෙළ ගැස්වීමට ඉදිරිපත් වී නොමැත. ලංකාවේ සිටින ඉන්දීය සම්භවයක් සහිත කම්කරු ප්‍රජාවට නායකත්වය දෙන ලංකා කම්කරු කොංග්‍රසයේ නායකත්වය තුළ PPC කුලවල ප්‍රමාණවත් නියෝජනයක් නොමැති වීම ද මෙහිලා සඳහන් කළ යුතුය.

හයවෙනුව, මෙම අධ්‍යයනයේදී හෙළි වූ තවත් කරුණක් නම් යුද්ධය හා සුනාමි වැනි ස්වභාවික විපත්වලදී වරප්‍රසාද නොලත් කුලවල අය වඩාත් පීඩාවට ලක් වී ඇති බවයි. විශේෂයෙන්ම අවතැන්වූවන්ගෙන් සමන්විත මල්ලාහම් කඳවුර තුළ පංචමර් කුලවල අධි නියෝජනයක් තිබීමෙන් මේ තත්වය වඩාත් පැහැදිලි වේ. එමෙන්ම මෑත භාගයේදී සිදු වූ ඇතැම් ජාතිවාදී කෝලාහලවලදී ද නාගරික ප්‍රදේශවල සිටින කසළ ශෝධක කම්කරුවන් ද ප්‍රහාරයට ලක් වී ඇත.

හත්වෙනුව, ශ්‍රී ලංකා සමාජය තුළ කුලය බොහෝවිට වෙනත් සමාජ බලවේග සහ සාධක සමග සංකීර්ණ ආකාරයෙන් මිශ්‍ර වී පවතී. උදාහරණයක් ලෙස මහයියාව ප්‍රජාව මුහුණ දෙන සමාජ කොන් කිරීම්වලදී කුලය, පන්තිය සහ ජනවාර්ගිකත්වය යන සමාජ සාධක සමාන්තරව ක්‍රියාත්මක වේ. මෙහිදී අධ්‍යයනයට ලක් වූ (කූරගල ගම්මානය හැරුනුවිට) සියලුම ආන්තික ප්‍රජාවන් පන්ති සහ කුල ධුරාවලි ද්විත්වයේම පහළම මට්ටම්වලට අයත්ය. මෙම තත්වයන් යටතේ කුලය හුදෙකලාව සැලකීම ගැටලු සහගත වනු ඇත. අනෙක් අතට ජනවාර්ගිකත්ව සාධකය පමණක් උපයෝගී කරගන්නා ජාතිකවාදී විග්‍රහයන් තුළ සහ පන්ති ක්‍රමය පමණක් උපයෝගී කරගන්නා මාක්ස්වාදී විග්‍රහාත්මක රාමුව තුළ කුලය නොවැදගත් ද්විතීක කරුණක් ලෙස සලකනු ලැබේ. මේ සියලු කරුණුවලින් පැහැදිලි වන්නේ කුලය සමාජ කොන් කිරීම්වලට සම්බන්ධ අනෙකුත් සාධකවලට සාපේක්ෂව විභාග කළ යුතු බවය. මෑතකදී ජාත්‍යන්තර කම්කරු සංවිධානය මඟින් කළ අධ්‍යයනයකින් ද හෙළි වූයේ අවරෝහණය සහ රැකියාව පදනම් වූ සමාජ කොන් කිරීම් බොහෝවිට එකිනෙකට අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ බවය (ILO 2007).

අටවෙනුව, පීඩිත කුලවල අයගෙන් සමන්විත බොහෝ ප්‍රජාවන් තුළ මත්පැන් භාවිතය ඉහළ මට්ටමක පවතින බව මෙම අධ්‍යයනයේදී හෙළි විය. මෙම තත්වය සිංහල ජනයා වාසය කරන කූරගල ප්‍රදේශයේ ද ඉන්දියානු දෙමළ ජනයා ජීවත් වන මහයියාව ප්‍රදේශයේ ද ලාංකික දෙමළ අයගෙන් සමන්විත අවතැන් වූ කඳවුරු තුළ ද හඳුනා ගත හැකි විය. මෙය එක් අතකින් මෙම කණ්ඩායම් මුහුණ දී ඇති සමාජ කොන් කිරීම්වලට මුහුණ දීම සඳහා අදාළ පීඩිත ජන කොටස් යොදා ගන්නා යාන්ත්‍රණයක් ලෙස සැලකිය හැකිය. අනෙක් අතට මත්පැනට ඇබ්බැහි වීම තුළින් මෙම ප්‍රජාවන්ගේ අනාරක්ෂිතභාවය සහ දරිද්‍රතාවය මෙන්ම ප්‍රචණ්ඩත්වය ද තහවුරු වී ඇත.

නවවෙනුව, මෙම ප්‍රජාවන් තුළ කාන්තාවන් ජනවාර්ගික, කුල, පන්ති සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය තුළින් කොන් කිරීම්වලට බහුල වශයෙන් ගොදුරු වන බව

දැකිය හැකිය. මහයියාව ප්‍රදේශය තුළ විරැකියා මට්ටම කාන්තාවන් අතර ඉහළ අගයක් ගන්නා අතර සමහර කාන්තාවෝ මේ තත්වයෙන් මිදීමට මැදපෙරදිග සංක්‍රමණ ප්‍රවාහයට එක්වූහ. අවතැන් වූ ප්‍රජාවන්ට අයත් කාන්තාවන් යුද්ධයෙන් හා සහ සුනාමියෙන් වඩාත් පීඩාවට පත් වූ අය වේ. යුද්ධය නිසා නැවත නැවත තම පදිංචි ස්ථාන අහිමි වීම, සැමියන් හෝ දූ දරුවන් තමන්ට අහිමි වීම, අවිගත්තවුන්ගේ තාඩන පීඩනවලට ලක් වීම වැනි අනේකවිධ දුෂ්කරතාවලට මුහුණ දීම තුළින් ඔවුන්ගේ ධෛර්යමත්භාවය, ප්‍රශ්නවලට ඔරොත්තු දීමේ හැකියාව සහ එඩිතර බව මනාව ස්ඵුට වී ඇත (බලන්න Coomaraswamy 1997, Siddartan 2003, Goodhand, Hulme & Lewer 2000). එක් අතකින් කුලයේ පවිත්‍රත්වය මෙන්ම ජනවාර්ගික පිරිසුදු බව ආරක්‍ෂා කිරීමට ද අනෙක් අතින් LTTE යේ සන්නද්ධ අරගලයට කැමැත්තෙන් හෝ අකමැත්තෙන් සහභාගි වීමට ද විවිධ කාන්තාවන්ට සිදු වී ඇත. මෙහිදී, LTTE යේ 'සන්නද්ධ කන්‍යාවන්' (armed virgins) ගේ කාර්ය භාරයද අපගේ අවධානයට ලක් විය යුතුය.

අවසාන වශයෙන් මෙම ප්‍රජාවන් තුළ අධ්‍යාපනය, වෙළඳාම සහ අනෙකුත් මාර්ග ඔස්සේ යම් යම් කොටස් සමාජයේ ඉහළ නැගීමට සමත් වී ඇත. කෙසේවුවත් එසේ ඉහළට නැගි පිරිස් තම මුල් ප්‍රජාව සමග ඇති සියලු සම්බන්ධතා අත්හැර දැමුවේ ප්‍රජාව සමග බැඳුනු පහත් සමාජ මට්ටම මඟ හැරීම උදෙසාය. එහි ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික මට්ටමේ පුද්ගල සාර්ථකත්වයක් හැරුනුවිට ප්‍රජාවේ පාරම්පරික සමාජ තත්වයන් හා දුර්වලතාවයන් තවදුරටත් නොවෙනස්ව සමාජය තුළ ශේෂ වී ඇත. මෙම ප්‍රජාවන්හි සාමාජිකයන් බොහෝ දෙනෙකු විසින් ඔවුන්ගේ ප්‍රශ්නවලට සාමූහික ප්‍රතිකර්ම සෙවීම පසෙකලා දේශීය හෝ විදේශීය සංක්‍රමණ වැනි පෞද්ගලික මට්ටමේ ප්‍රතිකර්ම වෙත යොමුවන බවක් පෙනේ. බොහෝ අවස්ථාවල පීඩිත කුලවලට අයත් ප්‍රජාවන් ඔවුන් මුහුණ දෙන ප්‍රශ්න ප්‍රතික්ෂේප කිරීමට, නොසලකා හැරීමට සහ සැඟවීමට උත්සාහ දරනු විනා ඒ ප්‍රශ්න හඳුනාගෙන විවෘතව ඒවාට මුහුණ දීමට පසුබට වී ඇත. වැලිවිට වැනි ප්‍රදේශවල පැහැදිලිව දැකගත හැකි වූයේ නම් වෙනස් කිරීම, පිටස්තර සංක්‍රමණ හා ඉහළ කුලවල අය සමග විවාහ වීම මගින් කුලය ප්‍රතික්ෂේප කිරීමට වඩා කුල අනන්‍යතාවය සැඟවීමට හෝ කුල තත්වය උසස් කර ගැනීමට වැඩි උනන්දුවක් පවත්නා බවය.

කුලය, නීතිය සහ සමාජ ප්‍රතිපත්ති

1978 ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 12 (2) වගන්තිය අනුව පුද්ගලයෙකුට ඔහුගේ/ඇයගේ කුලය, ජන්මය හෝ රැකියාව පදනම් කොට ගෙන කඩ සාප්පු, පොදු ආපන ශාලා, පූජ්‍ය ස්ථානවලට ඇතුළු වීමේදී සිදුවන කුමන ආකාරයේ හෝ වෙනස්කම් කිරීමක් තහනම් කොට ඇත. යාපනයේ පංචමර් කුල විසින් මෙහෙයවූ කෝවිල්වලට ඇතුළු වීම සඳහා වූ අරගලයේ බලපෑම් හේතුවෙන් 1957 දී රජය විසින් 'සමාජ අසාධාරණකම් පිටුදැකීමේ පනත' (Prevention of Social Disabilities Act)

ඉදිරිපත් කරන ලදි. මේ පනත තුළින් පූජ්‍ය ස්ථානවලට, කඩසාප්පු, පොදු ආපන ශාලා, නේවාසිකාගාර, පොදු ළිං, කොණ්ඩා කපන සැලුන්, ලොන්ඩරි, සොහොන් බිම්වලට ඇතුළු වීමේදී හෝ අධ්‍යාපන, රැකියා අවස්ථාවලදී පුද්ගලයෙකුට කුලය නිසා පනවා තිබූ සියලු සම්බාධක නීති විරෝධී ක්‍රියා බවට පත් කරන ලදි. මෙම පනතේ ඵලදායි බව ශක්තිමත් කිරීම සඳහා මෙන්ම ඒ යටතේ දිය හැකි දඬුවම් වැඩි කිරීම සඳහා 1971 දී එය සංශෝධනය කරන ලදි. මූලිකවම, ශ්‍රී ලංකාවේ උතුරු පළාතෙන් මේ පනත යටතේ යම් යම් පැමිණිලි ඉදිරිපත් වූ නමුත් පොලිසිය විසින් මෙම පනත ක්‍රියාත්මක කිරීමට උනන්දු නොවූ හෙයින්[31] පීඩිත ප්‍රජාවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීම අතින් මෙම පනත තුළින් සිදු වූයේ සීමිත බලපෑමක් බව පැවසිය හැකිය (Silva & Hettihewage 2001).

1930 ගණන්වලදී ඇරඹුණු ශ්‍රී ලංකා රජයේ රාජ්‍ය සුබසාධන ප්‍රතිපත්ති හරහා නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය සේවය, ආහාර සලාක යනාදිය සියලුම ප්‍රජාවන්ට ලබා දුන්නේ කුලය, ජනවාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂභාවය යන සාධක කිසිවක් නොසලකා හරිමිනි. පාරම්පරිකව අඩු වරප්‍රසාද හිමි වූ කුල කණ්ඩායම් සඳහා නීතිමය විශේෂ වරප්‍රසාද ලබා දීම පිළිබඳව ශ්‍රී ලංකා රජයේ සැලකිය යුතු අකමැත්තක් පවතින අතර එහි ප්‍රතිඵලයක් ලෙස පීඩිත කුල කණ්ඩායම් මුහුණ දෙන අවාසිසහගත තත්වයන් නැති කිරීමට ඔවුන් සඳහා නිශ්චිත අවස්ථා (reservation) වෙන් කිරීමේ ප්‍රතිපත්ති හඳුන්වා දී නැත. විශ්වීය ආවරණ ප්‍රතිපත්ති සහ වැඩසටහන් ඔස්සේ ශ්‍රී ලංකාව සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍රවල සෑහෙන ප්‍රගතියක් අත්පත් කර ගත් නමුදු, ජනවාර්ගිකත්වය, කුලය සහ ස්ත්‍රී-පුරුෂභාවය වැනි සමහර සමාජ යාන්ත්‍රණයන් විශ්වීය ආවරණ ප්‍රතිපත්තිවල ක්‍රියාකාරිත්වය දුර්වල කිරීමට දායක වී ඇති අතර විවිධ සමාජ අපහරණ යාන්ත්‍රණයන් තුළින් ඇතැම් පීඩිත කුලවල ප්‍රජාවන් එවැනි වැඩසටහන්වලට සහභාගි වීමද වළක්වා ඇති බව මෙම අධ්‍යයනයේදී සොයා ගන්නා ලදි. උදාහරණයක් ලෙස මෙම ප්‍රජාවන්හි දරුවන් හොඳ පාසැල්වල අධ්‍යාපනය ලැබීම වළක්වාලන කරුණු අතර, පාසැල්වලට ඇතුළු වීමේදී ඔවුන් මුහුණ දෙන සම්බාධක සහ පාසැල් බලධාරින්, ගුරුවරුන් මෙන්ම අනෙකුත් ශිෂ්‍යයන්ගෙන් මෙම දරුවන්ට එරෙහිව එල්ල වන පීඩනයන් දැක්විය හැකිය. නිදහස් අධ්‍යාපනය තුළින් පහළ සිට ඉහළ නැගීමට විවිධ පාර්ශවයන් සමත් වී ඇති නමුදු මෙම ක්‍රියාවලිය තුළ ඇති විවිධ සම්බාධක සමාජ අසහනය ව්‍යාප්ත කිරීමටද හේතු වී ඇති බව අමතක නොකළ යුතුය (Uswatte Aratchy 1972).

එසේම මෙහිදී සඳහන් කළ යුතු වැදගත් කරුණක් නම්, ගැටලුව පවත්නේ විශ්වීය ආවරණ ප්‍රතිපත්ති තුළ නොව අදාළ පොදු පහසුකම් ගම් මට්ටමේ ක්‍රියාත්මක

31 Prevention of Discrimination and Protection of Indigenous Peoples (E/CN.4/Sub.2/2001/16) pp11: "වෘත්තිය සහ ජන්මය පාදක කොට ගත් වෙනස්කම් කිරීම්" යන මාතෘකාව යටතේ ගුණසේකර මහතා විසින් උප කොමිසමේ 2000/4 වගන්තිය අනුව ඉදිරිපත් කළ වාර්තාව.

වීමේදී කොන් කිරීම් සිදු වන විවිධ සමාජ යාන්ත්‍රණයන් තුළ බවය. මේ අනුව පවතින සමාජ ප්‍රතිපත්ති හෝ නීතිමය රාමුව, රජයේ රැකියා, පොදු පහසුකම් හා සේවා බෙදා හැරීමේදී කුල පාදකව සිදු වන කොන් කිරීම් සහ සම්බාධක මැඩ පැවැත්වීමට ප්‍රමාණවත් නොවන බව කිව යුතුය.

සිවිල් සමාජයේ භූමිකාව

මානව අයිතිවාසිකම් සංවිධාන ඇතුළුව විවිධ සිවිල් සමාජ සංවිධාන ශ්‍රී ලංකාවේ තිබෙන නමුත්, ඒවා මඟින් කුල-පාදක කොන් කිරීම් සම්බන්ධ ප්‍රමාණවත් අවධානයක් ලැබී නොමැත (Jayawickrama 1976). ශ්‍රී ලංකාවේ සර්වෝදය ව්‍යාපාරය රොඩී ගම්මාන වැනි පීඩිත ගම්මාන හඳුනාගෙන, කොළඹ පාසැල්වල ස්වේච්ඡා කණ්ඩායම් යොදා ගනිමින් ස්වේච්ඡා ශ්‍රමදාන ක්‍රමය ඔස්සේ මෙම ගම්මානවල ප්‍රජා සංවර්ධන වැඩසටහන් ආරම්භ කරන ලදි (Rathnapala 1979). රොඩී ජනයාගේ තත්වය පිළිබඳ මහජන අවධානය යොමු වීමට මෙය උපකාරී වූ නමුත්, මේ ආරම්භක වැඩසටහන් කුල-පාදක වෙනස්කම් කිරීම්වලට එරෙහිව පුළුල් මහජන මතයක් ගොඩනැගීමට දායක වූයේ නැත.

සමහර රාජ්‍ය නොවන සංවිධාන කුඹල් ප්‍රජාව වැනි කණ්ඩායම් තුළ ජීවනෝපාය සංවර්ධනය කර ගැනීමට ආධාර කළ නමුත් මෙම සංවිධාන කුල සාධකය පිළිබඳව නොසලකා හැර ඇත (e.g. Rupasinghe 2000). මේ හා සමානව යුද්ධයෙන් හා සුනාමියෙන් අවතැන්වූවන් වෙනුවෙන් රාජ්‍ය නොවන සංවිධාන විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක වන නමුදු, දිගු කාලීනව අවතැන් වූ අයගේ (IDP) කඳවුරු තුළ සිටින 'පහළ කුලවල' විශාල පිරිස ගැන මෙන්ම ඔවුන් අත්විඳින කුල-පාදක කොන් කිරීම් පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් මෙතෙක් යොමු වී නොමැත.

කුල ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කරන සිවිල් සංවිධාන අතලොස්සක් අතුරින් එකක් ලෙස මහනුවර මානව සංවර්ධන සංවිධානය (Human Development Organisation) දැක්විය හැකි අතර, එම සංවිධානය වතු කම්කරුවන් සහ නාගරික අඩු ආදායම් ලබන ප්‍රජාවන් මුහුණ දෙන කුල ප්‍රශ්න පිළිබඳ වැඩි අවධානයක් යොමු කොට ඇත. මෙම ආයතනය විසින් අදාළ ප්‍රජාවන් දැනුවත් කිරීම, අදාළ ප්‍රජාවන් සහ එවැනි ප්‍රජාවන් නියෝජනය කරන සංවිධාන මෙන්ම ඒ හා සම්බන්ධ වෙනත් සිවිල් සංවිධාන අතර සම්බන්ධතා ඇති කරලීමට මූලිකත්වය ගෙන තිබේ. මෙම ආයතනය විසින් කුල ප්‍රශ්නය ගැන වෙනත් සංවිධාන සමග විටින් විට ප්‍රයෝජනවත් සංවාදයන් ආරම්භ කොට ඇත.

ගෝලීය සන්දර්භය

ජාත්‍යන්තර තලයේදී ජන්මය සහ කුල පදනම් වූ වෙනස්කම් කිරීම්වලට එරෙහිව ජාත්‍යන්තර ප්‍රඥප්ති ගණනාවක් සම්මත වී ඇති අතර ඒ අතරින් 'වර්ගවාදි වෙනස්කම් කිරීම් අහෝසි කිරීම සඳහා වන ජාත්‍යන්තර සම්මුතිය' (Convention on Elimination of Racial Discrimination) ප්‍රධාන වේ. 1996 දී මෙම සම්මුතිය විසින් කුල-පාදක

වෙනස්කම් කිරීම් ද ඇතුළත් වන පරිදි සිය පළමු වගන්තියේ සඳහන් කළ මානව වර්ගය (race) යන්න සුදු කලු භේදය පමණක් නොව පාරම්පරිකව තීරණය වූ කුල සහ ඒ සමාන වෙනත් ප්‍රභේද ද ඇතුළත් වන පරිදි පුළුල් කරන ලදි. CERD හි 29 වන නිර්දේශය තුළ, මෙවැනි වෙනස්කම් කිරීම් සම්මුතියේ 'අවරෝහණය පාදක වූ වෙනස්කම් කිරීම්' (Descent-based discrimination) යටතට ගැනෙන බව දක්වා ඇත.[32] ශ්‍රී ලංකා රජය විසින් මෙම සම්මුතියට අත්සන් කර ඇති නිසා එක්සත් ජාතීන්ගේ සංවිධානය යටතේ වාර්ගික විෂමතා අහෝසි කිරීමේ කමිටුවේ 29 වන වගන්තියේ අන්තර්ගත වන සාමාන්‍ය සහ විශේෂ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාව බැඳී සිටී. මේ යටතේ ශ්‍රී ලංකාව කුල-පාදක වෙනස්කම් කිරීම්වලට සම්බන්ධ මානව හිමිකම් කඩ කිරීම් පිළිබඳ පූර්ණ විමර්ශනයක් කළ යුතුව තිබේ.

නිර්දේශ

කුල-පාදක වෙනස්කම් කිරීම් අවම කර අවසානයේදී ඒවා මුලිනුපුටා දැමීම සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කළ හැකිය.

1. ශ්‍රී ලංකා රජය ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ක්‍රියාකාරකයන් ඇතුළු සිවිල් සමාජ සංවිධාන සහ ශ්‍රී ලංකාවේ සංවර්ධන වැඩසටහන්වලට ආධාර කරන ජාත්‍යන්තර සංවිධාන විසින් පවතින කුල-පාදක වෙනස්කම් කිරීම් හඳුනාගෙන අදාළ ප්‍රජාවන්ට බලපාන පාරම්පරික රැකියාව සහ අවරෝහණය පාදක කොට ගත් වෙනස්කම් කිරීම් තහනම් කිරීමට සමාජ ප්‍රතිපත්තිමය, නීතිමය සහ පරිපාලනමය පියවර ගත යුතුය. කුල-පාදක වෙනස්කම් කිරීම් වැළැක්වීමට දැනට පවතින ව්‍යවස්ථාපිත නීතිමය පියවර සමාලෝචනය කොට ඒවා සුදුසු පරිදි බලාත්මක කළ යුතුය. ජාත්‍යන්තර සම්මුතිවලට අනුව ශ්‍රී ලංකා රජය විසින් මානව අයිතිවාසිකම් ප්‍රතිපත්ති අනුව කටයුතු කළ යුතු අතර ඒ යටතේ ඔවුන් ලබන ප්‍රගතිය අදාළ එක්සත් ජාතීන්ගේ ඒකකවලට නිතිපතා වාර්තා කළ යුතුය.
2. රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවර්ධන ක්‍රියාකාරිකයන් විසින් සහන සේවා, නැවත පදිංචි කිරීම, දරිද්‍රතාවය අඩු කිරීම, ග්‍රාමීය සහ නාගරික සංවර්ධන වැඩසටහන්වලදී මෙන්ම ප්‍රජා සහභාගිත්වයේදී කුලය අමතක කොට කටයුතු කිරීම සුදුසු නොවේ. මෙහිදී දැක්විය යුතු වැදගත් කරුණක් නම්, විශ්වීය ආවරණය සහිත නිදහස් අධ්‍යාපනය පමණක් ස්ත්‍රී-පුරුෂභාවය, කුලය, ජනවාර්ගිකත්වය සහ අනෙකුත් පාරම්පරික අනන්‍යතා පදනම් වූ

32 එක්සත් ජාතීන්ගේ සංවිධානය යටතේ වාර්ගික විෂමතා අහෝසි කිරීමේ කමිටුව: සාමාන්‍ය නිර්දේශ අංක 29 (2002).

කොන් කිරීම් නැති කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බවය. ශ්‍රී ලංකාවේ කුලය නොසලකා හැර ස්වභාවිකව විනාශ වීමට ඉඩ හැරිය යුතුය යනුවෙන් දැඩි මතවාදයක් පවතින නමුත් වර්තමාන අධ්‍යයනයෙන් හෙළි වූයේ කුල-පාදක කොන් කිරීම් යම් යම් ක්ෂේත්‍රයන් සහ සීමාවන් තුළ තවම ක්‍රියාත්මක වන බවය. මේ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති සම්පාදනයේදී 'කුලය' විවෘතව සලකා බැලිය යුතු සාධකයක් ලෙස හඳුනාගත යුතුය (ඉන්දියාව සම්බන්ධයෙන් බලන්න Thorat & Shah 2007).

3. ශ්‍රී ලංකා සමාජය තුළ පාරම්පරික වරප්‍රසාද නොලත් කුල කණ්ඩායම්වලට විශේෂ අනුග්‍රහය ලැබෙන කුමන ආකාරයේ හෝ පහසුකම් බෙදා වෙන් කිරීමේ ප්‍රතිපත්තිවලට එරෙහිව සැලකිය යුතු විරෝධතාවක් පවතී. එවැනි ප්‍රතිපත්ති දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන නිදහස් අධ්‍යාපනය, සෞඛ්‍ය වැනි අනෙකුත් සුබසාධක සේවා පිළිබඳ වූ විශ්වීය ආවරණ ප්‍රතිපත්ති සමග නොගැළපේ යැයි කිව හැක. කුමන ආකාරයක හෝ විශේෂ අනුග්‍රහය සහිත පහසුකම් බෙදා වෙන් කිරීමේ ප්‍රතිපත්ති තුළින් කුල හැඟීම සහ දැනටමත් ඔඩු දුවා ඇති ජනවාර්ගික ගැටුම් උද්දීපනය වන බවට රට තුළ දැවැන්ත මතයක් ගොඩ නැගී ඇත. කෙටිකාලීනව කුල පීඩිතයන්ට විශේෂ අනුග්‍රහය ලබා දෙන ප්‍රතිපත්ති ශ්‍රී ලංකාවට යෝග්‍ය නොවන නමුත් වර්තමානයේ පවතින විෂමතා දුරු කිරීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග හඳුනා ගත යුතුය. උදාහරණයක් ලෙස පීඩිත කුලවල ළමුන්ට වර්තමානයේ ඇති සම්බාධක ඉවත් වන පරිදි පාසැල්වලට ළමුන් ඇතුළත් කර ගැනීමේ ප්‍රතිපත්ති සංශෝධනය විය යුතුය. එසේම වරප්‍රසාද නොලත් පසුබිම්වලට අයත් ළමුන්ට සේවය සපයන පාසැල්වල තත්වය නගා සිටුවීම කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

4. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, ජනවාර්ගිකත්වය, ආදිවාසීන්ගේ තත්වය සහ දරිද්‍රතාවය වැනි සෙසු සමාජ විචල්‍යයන් සමග කුලය තුළින් වන සමාජ බලපෑම තක්සේරු කළ යුතු අතර ශ්‍රී ලංකාවේ සංවර්ධන වැඩසටහන් ඇගයීමේදී මේ පිළිබඳ අවධානය යොමු විය යුතුය.

5. ශ්‍රී ලංකාවේ ජාතික මානව හිමිකම් කොමිෂන් සභාව විසින් කුලය පදනම් වූ සහ ඒ හා සම්බන්ධ හේතූන් නිසා පාසැල්වලට ළමුන්ට ඇතුළත් වීමට නොහැකි වීම, ඉඩම් හා පානීය ජල මූලාශ්‍රයන් ගැන ඇති සම්බාධක, ආගමික ස්ථානවලට ඇතුළු වීමට තහංචි පැනවීම සහ දේශපාලන හිමිකම් අහිමි වීම වැනි මානව හිමිකම් කඩ වීම් පිළිබඳ මූලික අවධානය යොමු කළ යුතුය.

6. වර්තමානයේදී ජන සංගණන, සමාජ ආර්ථික සමීක්ෂණ හා දරිද්‍රතා ප්‍රශ්නය ගැන නිල දත්ත ඒකරාශි කිරීමේදී 'කුලය' ඇතුළත් කොට නොමැත. එහි ප්‍රතිඵලයක් ලෙස කුල-පාදක වෙනස්කම් කිරීම් සම්බන්ධව තක්සේරු කිරීමට යෝග්‍ය දත්ත නොමැත. කුලය ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රවණතාව තුළ කුලය විචල්‍යයක් ලෙස හඳුන්වා දීම අපහසු නිසා කුමන හෝ ජාතික මට්ටමේ සමීක්ෂණවලදී කුලය පිළිබඳ විශ්වාසදායක තොරතුරු ලබා ගැනීමද අපහසු වී ඇත. අදාළ ප්‍රදේශවල සේවය කරන සංවර්ධන ආයතන විසින් කුල-පාදක වෙනස්කම් කිරීම්වලට අදාළ මෙතෙක් එකතු නොකළ දත්ත එකතු කොට ප්‍රයෝජනයට ගත යුතුය. ඉන්දියාවේ මෙන් කුල අනන්‍යතාවය විවෘතව ප්‍රකාශ නොකරන තත්වයක් ශ්‍රී ලාංකිකයන් තුළ පවතින නිසා කුල අනන්‍යතාවය පිළිබඳ ප්‍රශ්න කිරීම ගැටලු සහගත වේ. පීඩිත කුලවලින් සමන්විත ප්‍රජාවන් වෙනුවෙන් ක්‍රියාකරන ආයතන ඔවුන්ගේ ව්‍යාපෘතිවලදී කුල-පාදක වෙනස්කම් කිරීම් ද ව්‍යාපෘති සැලසුම්කරණයේදී සහ ප්‍රතිඵල විමසීමේදී යොදා ගත යුතුය.

7. ජනවාර්ගික බෙදීම් පසෙකලා සියලුම වරප්‍රසාද නොලත් කුල ප්‍රජාවන් වෙනුවෙන් පොදුවේ යොදා ගත් 'දලිත්' වැනි පොදු නාමයක් නොමැති වීම විවිධ ජනවාර්ගික කණ්ඩායම්වලින් සමන්විත අදාළ ප්‍රජාවේ පොදු අනන්‍යතාවය වර්ධනය කිරීමට මෙන්ම ඔවුන් අතර අන්තර් සහයෝගීතාව ඇති කිරීමට බාධාවක් වී ඇත. දලිත් යන පදය විදේශයකින් හඳුන්වාදීම නිසා එය දේශීය කුල ක්‍රමයට අදාළත්වයක් නොමැති හෙයින් එය ශ්‍රී ලංකාවේ ප්‍රචලිත වෙතැයි අපේක්ෂා කළ නොහැක.

8. ශ්‍රී ලංකාවේ පීඩිත කුල ප්‍රජාවන්ගේ සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක වන සිවිල් සමාජ සංවිධාන විසින් තමන්ගේ අත්දැකීම් බෙදාහදා ගත යුතු අතර මෙම ප්‍රජාවන්ගේ ජනවාර්ගික විවිධතා පසෙකලා ප්‍රජාවන් අතර අන්තර් සහයෝගීත්වය ඇතිකරලීමට ඇති හැකියාව විමසා බැලිය යුතුය. ඒ තුළින් පීඩිත ජන කොටස් අතර අන්තර් ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීමට ඉඩ ලැබෙන අතර ඉන්දියානු දලිත් ක්‍රියාකාරින්ගේ අත්දැකීම් ශ්‍රී ලංකාවේ සහ අනෙකුත් දකුණු ආසියානු රටවල පීඩිත කුලවල සමාජ ක්‍රියාකාරීන්ට ලබා දීම ප්‍රයෝජනවත් වනු ඇත.

9. දියුණු තාක්ෂණික ක්‍රමෝපායන්, වෘත්තීය උසස් වීම් සහ ආරක්ෂිත පියවරයන් ඔස්සේ සනීපාරක්ෂක කම්කරුවන්ගේ සහ කසළ ශෝධකයන්ගේ ජීවන තත්වය, වෘත්තීය මට්ටම සහ සමාජ ගරුත්වය වැඩිදියුණු කිරීමට අදාළ පළාත් පාලන ආයතන උනන්දු කළ යුතුය. උදාහරණයක් ලෙස, මහනුවර නගරයේ ජපන් ආධාර යටතේ යෝජිත අපවිත්‍ර ජලය බැහැර කිරීමේ ව්‍යාපෘතිය වැනි විධිමත් අපද්‍රව්‍ය බැහැරකරලීමේ යාන්ත්‍රණයක්

තුළින් දෛනික කසළ ශෝධනය අඩු කිරීමටත්, ඒ සමග පාරම්පරිකව කසළ ශෝධකයන්ට උරුම වූ පහත් සමාජ තත්වය නැති කිරීමටත් හැකි වනු ඇත. මේ හා සමානව, හේනාවල කින්නර පිරිස් නූතන තාක්ෂණය තමන්ගේ නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගතහොත් එය ඔවුන්ගේ අභිවෘද්ධියට හේතු වනු ඇත.

10. කුල-පාදක වෙනස්කම් කිරීම් හා සම්බන්ධ වූ ගැටලු පිළිබඳ තවදුරටත් අධ්‍යයන කිරීම අත්‍යවශ්‍ය කාරණයකි. එසේ අධ්‍යයනය කළ යුතු ප්‍රශ්න අතර,

    (අ) දරිද්‍රතාව සහ සමාජ ගැටුම්වලට කුල-පාදක කොන් කිරීමේ බලපෑම.

    (ආ) Goonesekere (2001) මුලින් පෙන්වා දුන් පරිදි කුලහීනයන්ගේ මානව හිමිකම් කඩ කිරීම් තවදුරටත් සොයා බැලීම.

    (ඇ) විවෘත ආර්ථිකය නිසා කුල අසමානතා රටාව කෙරෙහි සිදුවන බලපෑම

    (ඈ) කුලය, පන්තිය සහ ජනවාර්ගික අනන්‍යතාව අතර අන්තර්ක්‍රියා කුල පාදක වෙනස්කම් කිරීම් ඉවත් කිරීම සඳහා යෝග්‍ය අනාගත ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ගවලට අවශ්‍ය දත්ත සහ විග්‍රහයන් මෙම අධ්‍යයන තුළින් ඉදිරිපත් විය යුතුය.

ඇමුණුම්

ඇමුණුම් 01

රොඩී කුලයේ සම්භවය පිළිබඳ කතා පුවත

රොබට් නොක්ස් (1911) ට අනුව රොඩී කුලයේ සම්භවය පිළිබඳ කතා පුවත

මෙම ජනයාගේ ආදිතමයන් දඩයම්කරුවන් ලෙස ප්‍රකට දඩ වැද්දන්ගෙන් පැවත එයි. අතීත රජ කාලයේදී රාජ භෝජනය සඳහා මුව මස් සැපයීමට මොවුන්ට නියමව තිබුණි. නමුත් රජ පවුලට නොදන්වා වරක් මුව මස් වෙනුවට මිනිස් මස් රැගෙන විත් තිබුණි. මෙම මාංශයට කැමති වූ රජු, එම වර්ගයේම මුව මස් රැගෙන එන ලෙස අණ කළේය. රජුගේ කරණවෑමියා මෙම මස් මොනවාදැයි හඳුනාගෙන ඒ පිළිබඳව රජුට අනාවරණය කළේය. රජු මහත් සේ කෝප වී, දඩයම්කරුට මරණ දණ්ඩනය ලබා දී වරදකරුට පමණක් දඬුවම් දීම ප්‍රමාණවත් නොවූ හෙයින් දඩයම්කරුවන් සියලු දෙනාට දඬුවම් කිරීමට පෙළඹුණි. නොපමාව රජු ආඥාවක් නිකුත් කොට දඩයම්කරුවන් සියලු දෙනා ස්වකීය බිමේ ඔවුන් පදිංචි වාසස්ථානවලින් නෙරපා ඔවුන්ට තම ජීවනෝපාය සරි කරගැනීමට හැකි වන කිසිදු ආකාරයේ වාසි ප්‍රයෝජනයක් ලබා ගැනීමේ ඉඩ අහිමි කරන ලදි. තම යැපීම සඳහා ඔවුන් පරම්පරාවෙන් පරම්පරාවට, ගෙයින් ගෙයට රාජධානිය තුළ සිඟමන් යැදිය යුතු විය. එබැවින් සෙසු සියලුම ජනයා මෙම පිරිස පහත් පිළිකුල් සහගත පිරිසක් ලෙස සලකන්නට වූහ.

අද වන විටත් මොවුන් පිළිකුල් සහගත පිරිසක් ලෙස සලකනු ලැබේ. ඔවුන්ට ළිංවලින් ජලය ලබා ගැනීමට අවසර නැත. නමුත් ඔවුන් වතුර වළවල්වලින් හෝ ගංගාවලින් ජලය ලබා ගනිති. කිසිවෙකු ඔවුන්ව ස්පර්ශ නොකරන්නේ අපිරිසිදු වේ යැයි බියෙනි.

තමාව කෝප ගැන්වූ උසස් මිනිසුන්ට දඬුවම් කිරීමට අවශ්‍ය වූ බොහෝ අවස්ථාවන්හි, රජු ඔවුන්ට මරණ දඬුවම නියම කළ අතර ඔවුන්ගේ බිරින්දෑවරුන් සහ දියණිවරුන් රොඩී ජනයා වෙත භාර දේ. මෙවැනි දඬුවමක් මරණ දඬුවමට වඩා දරුණු බව සැළකුණි. මෙවැනි දඬුවම් ඉතා කෲර බව පෙනුන අතර රජුගේ

අතිරේක දඬුවම මරණ දඬුවමට වඩා දරුණු අපහාසයක් ලෙස සලකන ලදි. වධකයන් මෙවැනි කාන්තාවන් රැගෙන ගොස් ගංතෙරකදී රොඩී අයට භාර දිය යුතුයි. මෙහිදී මෙම කාන්තාවන්ට නිදහස් වීමට අවශ්‍ය නම් ගඟට පැන දියේ ගිලී සියදිවි නසා ගත හැකිය. බොහෝවිට කුලීන කාන්තාවන් රොඩී රැහැට භාවෙනවාට වඩා ගඟට පැන දිවි හානි කර ගැනීම තෝරා ගනු ලබයි.

කරණවෑමියා විසින් තොරතුරු හෙළි කිරීම මෙම ජනයාගේ දුක්ඛිත තත්වයට හේතු වූ නිසා ඉන් පළි ගැනීමක් ලෙස ඔවුන් අදටත් කරණවෑමියාගේ නිවෙසින් ආහාර ගැනීමට මැළි වේ.

Denham ගේ මුල් වාර්තාවක් Hugh Neville (1911) උපුටා දැක්වූ පරිදි රොඩී ජනයා පහත් තත්වයකට ඇද වැටීමේ පුවත මෙසේය.

පරාක්‍රමබාහු රජුගේ මාළිගයට මුව මස් සපයන ලද්දේ එක් වැදි දුනුවායෙකු විසිනි. මුවන් හිඟකම නිසා වරක් වනයේදී හමුවූ කුඩා දරුවෙකුගේ මාංශ මුව මස් වෙනුවට රජ මාළිගයට සපයන ලදි. රජුගේ සුරූපී දියණිය නවරත්න වල්ලි, මෙම ප්‍රයෝගය දැන මිනිස් මාංශයේ රසට වශී වී මෙම මාංශය දිනපතා රැගෙන එන ලෙස දඩයම්කරුට අණ කළාය. වැද්දා වනය අසල ළමුන් සොරකම් කර ඔවුන් මරා දමා ඔවුන්ගේ මාංශ රාජ භෝජනාගාරයට සපයන ලදි. මුළු රටම තරුණ පිරිමි සහ ගැහැණු දරුවන්ගේ අතුරුදන්වීම්වලින් භීතියට පත් විය. මෙය හෙළිදරව් වූයේ කරණවෑමියා තමන්ගේ පුතාගේ අතුරුදන් වීම පිළිබඳ දැනුම්දීමට රජ මාළිගයට පැමිණි අවස්ථාවේ රාජ භෝජනාගාරයෙන් ඔහුට දුන් මුව මස් සහිත බත් ආහාරයට ගැනීමට සූදානම් වූ විටය. එහි කුඩා දරුවෙකුගේ ඇඟිලි පුරුකක් තිබෙනු ඔහු දුටුවේය. එම ඇඟිලි පුරුකේ විකෘති ස්වභාවයෙන් එය තම පුතුගේ බව හඳුනාගෙන මාළිගයෙන් පැන දුවමින් රජු නගරයේ දරුවන් මරා කන බව කෑ ගසා කීවේය. කරුණු සියල්ල හෙළි වූ පසු රජු දියණියගේ ආභරණ සියල්ල ගළවා දමා අසල මිදුලක අතු ගාමින් සිටි කසළ ශෝධකයකු ගෙන්වා ඇයව ඔහුට විවාහ කර දෙන ලදි. මෙසේ කසළ ශෝධක මට්ටමට පත් කොට ඇයව කුලයෙන් නෙරපා හරින ලදි. කුමරිය කසළ ශෝධකයා සමග නගරයෙන් පළා ගොස් කින්නර අයෙකුගෙන් නවාතැන් ඉල්ලූ නමුත් එම කින්නරුන් ඔවුන්ව කෝපයෙන් එළවා දමන ලදි.

ඇමුණුම් 02

අවතැන් වූ පංචමර්වරුන්ගේ ප්‍රශ්න පැහැදිලි කරන සිද්ධි අධ්‍යයනයක්

සීලන්, මල්ලාහම්හි පිහිටි කෝනාපුලම් සුබසාධන මධ්‍යස්ථානයේ සිටින අවුරුදු 42 ක් වයසැති අවතැන් වූ පුද්ගලයෙක් විය. නලවර් කුලයේ සාමාජිකයෙකු ලෙස, වරක් ඔහු සිය උපන් ගම වූ මයිලිට්ටිහිදී රා මැදීමෙහි නියැළී සිටියේය. ඔහු ඊළාම් යුද්ධ තුනක අත්දැකීම් විඳ ඇත්තෙකි. ඔහු 1987 දී ප්‍රථම වතාවට අවතැන් වූයේ IPKF සහ LTTE අතර ඇති වූ පළමු ඊළාම් යුද්ධය හේතුවෙනි. මෙම පළමු අවතැන් වීමේදී, ඔහු තෙලිප්පලෙයිහි පිහිටි මයිලිට්ටි ගමෙන් කිලෝ මීටර් 08 ක් පමණ එහායින් පිහිටා තිබූ කරවම්පනෙයි ප්‍රදේශයට සංක්‍රමණය වී ඇත. ඔහු මාස තුනකට ආසන්න කාලයක් එහි රැඳී සිටියේය. පසුව නැවතත් ඔහු තම මුල් ගම කරා පැමිණ ඇත. 1990 දී ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා සහ LTTE අතර ඇති වූ II වන ඊළාම් යුද්ධය හේතුවෙන් ඔහුට නැවත වතාවක් මල්ලාහම් ප්‍රදේශයට අවතැන් වීමට සිදු විය. III වන ඊළාම් යුද්ධය හේතුවෙන් (විශේෂයෙන් I වන රිවිරැස මෙහෙයුම අතරතුර), ඔහු තෙන්මරාච්චිවල පිහිටි කොඩිකාමම් ප්‍රදේශයට අවතැන් විය. ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා විසින් II වන රිවිරැස මෙහෙයුම තුළින් මුළු යාපන අර්ධද්වීපයම සිය පාලනයට නතු කරගත් අවස්ථාවේදී, ඔහු නැවතත් මල්ලාහම්වල පිහිටි කෝනාපුලම් සුබසාධන මධ්‍යස්ථානය වෙත ගියේය. ඔහු තම ජීවිතයේ වාර ගණනාවකදීම නැවත නැවත අවතැන්වූවෙකු බවට පත් වූ අයෙකි.

කුලය සම්බන්ධ ප්‍රශ්න පිළිබඳ කළ සම්මුඛ සාකච්ඡා ආරම්භයේදීම ඔහු මෙම ප්‍රශ්නය ගැන කතා කිරීමට මැළි විය. දිගින් දිගටම සාකච්ඡා කිරීමේදී, ඔහු විවෘතව කතා කිරීම ආරම්භ කළ අතර, කුල ප්‍රශ්න පිළිබඳ තමාගේ පිලිකුළත් අවතැන් වූ විවිධ ස්ථානවලදී ඔහු විඳි පීඩාවන් ද විස්තර කොට සුබසාධන මධ්‍යස්ථානවල ජීවිතය පිළිබඳවත් විස්තර කළේය.

ඔහු සඳහන් කළ පරිදි, කෝවිල් පාසල් වැනි තාවකාලික සුබසාධන මධ්‍යස්ථානවලදී පමණක් ඔහු වෙල්ලාලවරුන් සමග සිටි අතර එය ද දින කිහිපයකට පමණක් සීමා විය. කෙසේවුවත්, කඳවුරු පිහිටා තිබුණේ වෙල්ලාලවරුන්ට අයත් ඉඩම්වලය. තවදුරටත් කරුණු දැක්වූ ඔහු සඳහන් කළේ, බොහෝ වෙල්ලාලවරුන් ආර්ථික වශයෙන් ශක්තිමත් වූ නිසා යාපනයේ පදිංචි සෙසු සමකුලිකයන් සමග සමාජ සම්බන්ධතා ඇතිකර ගැනීමට ඔවුන්ට හැකි වූ බවය. ඔවුන්ට තමන් කැමති ස්ථානයක පදිංචි වීමටත්, සුදුසු බිමක තමන්ගේම නිවෙසක් තනා ගැනීමටත් හැකියාව තිබුණි. "අපිට යාපනයේ අනෙක් පැති එක්ක සම්බන්ධතා නැති හින්දා වගේම අනෙක් කුලවල අයගෙන් සහයෝගයක් නැති නිසා අපි කැමති උණත් නැතත් අපිට අපේ මිනිස්සු ඉන්න තැනක හරි සුබසාධන මධ්‍යස්ථානයක හරි නවතින්න සිද්ධ වෙනවා."

ඇමුණුම් 03

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සම්මන්ත්‍රණ ශාලාවේදී 2007 මැයි 27 දින පැවැත්වූ කුල-පාදක කොන් කිරීම් පිළිබඳ ජාතික වැඩමුළුවේ වාර්තාව

මෙම වැඩමුළුවට පර්යේෂකයන්, සමාජ ක්‍රියාකාරකයන්, රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයන්, මානව හිමිකම් ක්‍රියාකාරීන්, ශිෂ්‍යයන් මෙන්ම වෘත්තීය සමිති ක්‍රියාකාරකයන් ද සහභාගි විය. කුල ප්‍රශ්නය පිළිබඳව සිවිල් සමාජ ක්‍රියාකාරකයන් එකට එකතුව අදහස් හුවමාරු කර ගත්, කුල-පාදක කොන් කිරීම් පිළිබඳ ශ්‍රී ලංකාවේ මෑතකදී පැවැත්වූ පළමු ජාතික වැඩමුළුව මෙය විය.

ජාත්‍යන්තර දලිත් සහයෝගීතා ජාලයේ හා දලිත් අධ්‍යයන පිළිබඳව ඉන්දියානු ආයතනයේ අනුග්‍රහය යටතේ රටවල් කිහිපයක සිදු කළ අධ්‍යයන මාලාවේ එක් අංගයක් ලෙස මෙම වැඩමුළුව පැවැත්විණි. මෙම වැඩමුළුවේ අභිමතාර්ථ පහත සඳහන් වේ.

1. අධ්‍යයනය තුළින් ශ්‍රී ලංකාව පිළිබඳ සොයා ගත් කරුණු ගැන අදාළ සමාජ ක්‍රියාකාරකයන් දැනුවත් කිරීම.
2. අධ්‍යයනයෙන් හෙළි වූ හේතු සාධක පිළිබඳ තක්සේරු කිරීම.
3. අධ්‍යයන ක්ෂේත්‍රයට සම්බන්ධ විශේෂඥයන්, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල සමාජ ක්‍රියාකාරකයන්ගේ, පර්යේෂකයන්ගේ උපරිම සහයෝගය ලබා ගැනීම.
4. අධ්‍යයනයේ ප්‍රතිඵල පිළිබඳ ඊට අදාළ පාර්ශවයන් දැනුවත් කිරීම.

වැඩමුළුවේ න්‍යාය පත්‍රයට අනුකූලව අධ්‍යයන ව්‍යාපෘතියේ කණ්ඩායම් නායක මහාචාර්ය කාලිංග ටියුඩර් සිල්වා විසින් පිළිගැනීමේ කතාව හා අරමුණ පැහැදිලි කිරීමෙන් අනතුරුව වැඩමුළුව ආරම්භ විය. දෙවනුව, දලිත් අධ්‍යයන පිළිබඳව ඉන්දියානු ආයතනය නියෝජනය කරමින් මහාචාර්ය ගනේෂ්‍යාම් ෂා සභාව අමතන ලදි. නේපාලය, පාකිස්ථානය, බංගලාදේශය හා ශ්‍රී ලංකාව ඇතුළු දකුණු ආසියාවේ කුල-පාදක කොන් කිරීම් පිළිබඳ සිදු කෙරෙන පුළුල් අධ්‍යයන මාලාවේ පසුබිම ඔහු විස්තර කළේය.

ඉදිරිපත් කිරීම්වල සාරාංශය: මහාචාර්ය කාලිංග ටියුඩර් සිල්වා

අධ්‍යයනයේ මූලික සොයා ගැනීම්

1. ශ්‍රී ලංකාවේ සිංහල, ලාංකික දෙමළ සහ ඉන්දියානු දෙමළ වශයෙන් එකිනෙකට සමාන්තර කුල ක්‍රම තුනක් පවතී.

2. 1950-60 ගණන්වලදී කුලය පිළිබඳ සිදු වූ අධ්‍යයන කුලය සමාජ ඒකාබද්ධතාවයට දායක වූ ආයතනයක් ලෙස හඳුනා ගත්තා විනා කුල-පාදක කොන් කිරීම් නොසලකා හැර තිබේ.
3. ශ්‍රී ලංකාවේ කුලය තහනම් විෂයයක් වන හෙයින් ජනගහන සංගණනවලදී හෝ ජාතික සමීක්ෂණවලදී කුලය පිළිබඳ තොරතුරු ගණනය නොකෙරේ.
4. ලංකාවේ සිටි යටත් විජිත පාලකයන් කුලය අනුමත නොකළ නමුත් ඔවුන්ගේ යම් යම් අරමුණු ඉටු කර ගැනීම උදෙසා කුලය ප්‍රයෝජනයට ගත්තේය.
5. 1930 ගණන්වල සුබසාධක ප්‍රතිපත්ති හරහා අධ්‍යාපනය, සෞඛ්‍ය, ආහාර වැනි දේ කුලය, ජනවාර්ගිකත්වය සහ ස්ත්‍රී-පුරුෂභාවය නොසලකා සැමට සමානව බෙදා දුන් නමුත් පීඩිත කුලවලට වාසි සහගත විශේෂ වරප්‍රසාද ලබා නොදුණි.
6. අධ්‍යයනයේ මුලින්ම අවධානය යොමු වූ යාපනයේ කුල ක්‍රමය ඉන්දියාවේ මෙන් ආගමික විශ්වාස මඟින් තහවුරු වූවකි. ඉහළ කුලවලින් පීඩිත කුලවලට විවිධ සම්බාධක පැනවූ අතර ඊට එරෙහි අරගල 1920 ගණන්වල ඇරඹේ.
7. ශ්‍රී ලංකාවේ ඉන්දියානු දෙමළ වතු කම්කරුවන් බොහෝ ප්‍රමාණයක් දකුණු ඉන්දියාවේ පහළම කුල වන පල්ලන්, පරයර්, චක්කිලියාර් (PPC කුල) කුලවලින් පැමිණි අය වේ.
8. හින්දු කුල ක්‍රමයට සාපේක්ෂව සිංහල කුල ක්‍රමය දෘඪ බවින් අඩු සංස්ථාවකි. කුල ධුරාවලියේ ඉහළින්ම ගොවිගම කුලය වූ අතර පහළින්ම කින්නර, ගහල, රොඩී කුල පවතී.
9. සමස්ත අධ්‍යයනය සාරාංශගත කළ මහාචාර්ය සිල්වා, කුලය පිළිබඳව තවදුරටත් නිහඬව නොසිට රාජ්‍ය නොවන සංවිධාන හා සිවිල් සමාජ සංවිධාන එකට එක්ව මෙම ප්‍රශ්න පිළිබඳ විවෘතව සාකච්ඡා කළ යුතු බවත්, ජන වර්ග තුනෙහිම පීඩිත කුලවල එකමුතුවෙන් කුල-පාදක කොන් කිරීම්වලට එරෙහිව පොදු අරගලයක් දියත් විය යුතු බවත් පෙන්වා දුන්නේය.

සාකච්ඡාව

සහභාගී වූ වෘත්තීය සමිති නියෝජිතයන් පිරිසක් පැවසුවේ, ලංකා සමාජයේ සමාජ අසාධාරණය, සමාජ වෙනස්කම් කිරීම් අවබෝධ කර ගැනීමේදී කුලය තවදුරටත් වැදගත් සාධකයක් නොවන බවයි. මීට පිළිතුරු දුන් මහාචාර්යවරයා, මහයියාවේ සනීපාරක්ෂක ප්‍රජාව හෝ අවතැන් වූවන් වැනි පීඩිත ප්‍රජාවන් ගැන සමාජ පන්තිය

තුළින් පමණක් අවබෝධ කර ගත නොහැකි බව පැවසීය. ලංකාවේ කුලය විවෘතව සාකච්ඡා නොවන නමුදු පුවත්පත්වල විවාහ දැන්වීම් කියවීමෙන් වුවද කුලය තවදුරටත් ක්‍රියාත්මක වන බව අවබෝධ කර ගත හැකිය. පීඩිත කුලවල උගත් තරුණයන් JVP, LTTE වැනි ප්‍රචණ්ඩකාරී දේශපාලන ව්‍යාපාරවලට එක් වීමේ ප්‍රවණතාවක් තිබුණි. කුල හැඟීම් කැපී පෙනුන දේශපාලන ව්‍යාපාරයන් මෑතකාලීනව ඉස්මතු වූ නැගෙනහිර හා දකුණු ප්‍රදේශ කරා අධ්‍යයනය ව්‍යාප්ත නොකළේ ඇයිද යන ප්‍රශ්නයට පිළිතුරු දුන් මහාචාර්යවරයා ආරක්‍ෂක තත්වය නිසා නැගෙනහිර ප්‍රදේශවලත්, මූල්‍ය ගැටලු නිසා දකුණේ අධ්‍යයන ප්‍රදේශ සීමා කිරිමට සිදු වූ බවත් පැවසීය.

නාගරික සනීපාරක්‍ෂක කම්කරුවන්ට සිදුවන ජන්මය හා වෘත්තීය පාදක කොට ගත් කොන් කිරීම්: පී.පී. සිවප්‍රකාශම්

1. බ්‍රිතාන්‍ය පාලන සමය තුළ මහ නගර සභා මඟින් ස්ථාපිත කළ සනීපාරක්‍ෂක කම්කරු වෘත්තීන් සඳහා දකුණු ඉන්දියාවෙන් ගෙනා කම්කරුවන් චක්කිලියාර් වැනි පීඩිත කුලවලට අයත් විය. වැසිකිළි පිරිසිදු කිරීම, කසළ ශෝධනය වැනි වෘත්තීන් මෙම කුලවලට ආවේණික රැකියා විය.
2. ලංකාවේ විවිධ නගරවල ජීවත් වන සනීපාරක්‍ෂක කම්කරුවන්ගේ සංඛ්‍යාව නිශ්චිතව පැවසිය නොහැක. මොවුන්ගෙන් වැඩි පිරිසක් මහනුවර මහයියාව ප්‍රදේශයේ ජීවත් වේ.
3. ප්‍රජාවේ කාන්තා පිරිමි දෙපාර්ශවයම සනීපාරක්‍ෂක වෘත්තියේ නියැළෙති. සනීපාරක්‍ෂක සේවා තාක්‍ෂණය දියුණු වීම නිසා මේ වන විට මොවුන්ගේ තත්වය තරමක් යහපත් අතට හැරී ඇත.
4. මොවුන් තවමත් ජීවත් වන්නේ බ්‍රිතාන්‍ය යුගයේ ඉදි කළ කම්කරු ලැයිම් තුළය. අධික තදබදය, අවම නඩත්තුව, අනවසර ඉදිකිරීම් ආදිය නිසා මෙම නිවාස ජීවත් වීමට සුදුසු මට්ටමක නොපවතී.
5. කුලය, ජනවාර්ගිකත්වය, පන්ති පසුබිම මෙන්ම ප්‍රවේණිගත රැකියා හේතුවෙන් මෙම ප්‍රජාව විවිධ අයුරින් සමාජ කොන් කිරීම්වලට, සමාජ අපහරණයට ලක් වේ.
6. සනීපාරක්‍ෂක කම්කරුවන් අතර කුල-පාදක කොන් කිරීම්වලට එරෙහි ප්‍රජා සංවිධාන නොමැත.
7. රජය විසින් පදිංචිකරුවන්ට ඉඩම් අයිතිය පවරා දීම, නිවාස ඉදි කිරීමට ණය ලබා දීම මෙන්ම රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධානවල අනුග්‍රහයෙන් ජල ව්‍යාපෘති හා සනීපාරක්‍ෂක ව්‍යාපෘති මොවුන් වෙනුවෙන් දියත් කොට ඇත.

8. පීඩිත කුලවලට ඇති සමාජ සම්බාධක පිළිබඳ කතා කිරීමේදී ඔවුන්ගේ අයිතීන් පිළිබඳ ඔවුන්ව දැනුවත් කිරීමත් ඔවුන් සංවිධානගත කිරීමත් ඔවුන්ට අනුග්‍රහය ලබා දීමත් අත්‍යවශ්‍ය වේ.

සාකච්ඡාව

පැමිණි සිටි අයෙකු කුල-පාදක කොන් කිරීම් යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි ඇසූ විට කථිකයා තමාගේ දේශනයේදී යොදා ගත්තේ කුල-පාදක කොන් කිරීම් යන්න නොව වෘත්තිය හා අවරෝහණය (descent) පාදක කොට ලත් වෙනස්කම් කිරීම බව පැවසීය. කෙසේවුවත් වෙනස්කම් කිරීම් තුළ කුල ක්‍රමයේ බලපෑම් ද පවතින බව ඔහුගේ මතය විය.

ඉන්දියානු වතු කම්කරුවන් අතර ඇති කුල ක්‍රමය: ඒ.එස්. චන්ද්‍රා බෝස්

1. වතු වගා සඳහා රැගෙන ආ ඉන්දියානු කම්කරුවන් දලිත් කාණ්ඩයට අයත් පල්ලන්, පරයර්, චක්කිලියාර් යන පහළ කුලවලට අයත් පිරිස් වූහ.
2. ඉහළ කුලවලින් බඳවා ගත් කම්කරු අධීක්ෂකවරු වූ කංගානිවරු වතු පරිපාලනය හා කම්කරුවන් සම්බන්ධීකරණය කළ පිරිස විය.
3. වතු කම්කරුවන්ගේ දරුවන් අවම පහසුකම් සහිත වතුකරයේ පාසැල්වලට යැවීම නිසා අධ්‍යාපනය අතින් ඉහළට යෑමේ අවස්ථා ඔවුන්ට සීමිත විය.
4. වතුවල ඉන්දියානු දෙමළ ජනයා අතර ඉහළ කුලවල පිරිස් සංඛ්‍යාත්මකව අඩු වී ඇත. මේ නිසා පිරිස් බලය වැඩි පහළ කුලවල ජනයාට ඉහළ කුලවල ජනයාට අභියෝග කිරීමේ හැකියාව ලැබී ඇත.
5. වතු කම්කරුවන් අතර කුල හැඟීම ක්‍රමයෙන් ශේෂ වී ගොස් ඇති බව අද වන විට කංගානිවරු PPC කුලවලින් පවා පත්වීමෙන් පෙනේ.

ශ්‍රී ලංකාවේ තෝරාගත් තේ වත්තක කුලය: බී. ශෂි කුමාර්

1. වත්තේ ඉහළ කුලයේ පිරිස් කුඩියානවර් කුලයට අයත් විය.
2. ඒ ඒ කුලය තුළ උප බෙදීම් හඳුනා ගත හැකි වුවත් විවාහය වැනි කාරණාවලදී ප්‍රධාන බෙදීම් සලකා බැලේ.
3. ඉහළ කුල විසින් පාලනය කළ කෝවිල්වලට පහළ කුලවල ජනයාට ඇතුළු වීමට තවමත් යම් යම් බාධා පවතී.
4. කුල-පාදක රැකියා රටාව ක්‍රමයෙන් ක්ෂය වී ගියද, වීදි අතු ගාන අය (වාසකුට්ටි), පූජක (පන්ඩාරම්), බෙර වාදක (පරයර්) වැනි රැකියා තවදුරටත් ක්‍රියාත්මක වේ.

5. රැකියා සොයමින් කොළඹට සංක්‍රමණය වන තරුණ පිරිස් කුලය නොසලකා කටයුතු කරති.
6. වතුවල පහළ කුලවල ජනයා මුහුණ දෙන පොදු ගැටලුව නම් දරිද්‍රතාවයයි. PPC කුලවල අයගේ අක්‍රමවත් වියදම් රටාව නිසා මේ තත්වය උදා වී ඇති බව පැවසේ.
7. වතුවල මෑතකාලීනව කුල ගැටුම් රාශියක් හට ගෙන තිබුණි.

සාකච්ඡාව

කුලය අතීතයේ සිට පැමිණ ශේෂ වූවක් නිසා වතුවල වැදගත් සමාජ ආයතනය සමාජ පන්තිය බව ඇතැමෙකුගේ අදහස විය. උදාහරණයක් ලෙස වතුවල ව්‍යාප්ත වූ අධ්‍යාපනය තුළින් කුඩියානවර්වරු මෙන්ම ඇතැම් PPC කුලවල පිරිස්ද ප්‍රයෝජන ලබා ගත් බවත් එසේම කුලය, පන්තියට අමතරව ජනවාර්ගික අනන්‍යතාවය ද වතුවල සමාජ දේශපාලන ක්‍රියාකාරිත්වය තුළ වැදගත් භූමිකාවක් ඉටු කරන බවත් පෙන්වා දුන්හ. පර්යේෂකයන් වෘත්තීය සමිති හා එහි කුල භූමිකාව පිළිබඳ අවධානය යොමු කළ යුතු බව ද පැවසිණි.

යාපනයේ කුල-පාදක කොන් කිරීම්: පී. තන්ගේස්

1. යාපනයේ පහළම කුල ස්තර පොදුවේ 'පංචමර්' ලෙස හැඳින්වේ. වන්නර් (රෙදි සෝදන අය), අම්පට්ටර් (කරණවෑම්), පල්ලර් (කම්කරුවන්), පරයර් (බෙර වාදකයන්) යන කුල ඊට අයත් වේ. ඉහළම කුලය වෙල්ලාල කුලය ලෙස සැලකිණි.
2. පංචමර්වරුන් හා වෙල්ලාලවරුන් අතර ගැටුම් 1930 ගණන්වලදී වර්ධනය විය.
3. මල්ලාහම් ප්‍රදේශයේ සිදු කළ අධ්‍යයනය තුළින් යුද්ධයෙන් අවතැන් වූ ජනයා ජීවත් වූ අවතැන් කඳවුරු හතරක සිටි බොහෝ ජනයා නලවර් හා පල්ලර් කුලවලට අයත් බව හෙළි විය.
4. ඉඩම් අහිමි වීම, වෙනත් ඉඩම් මිලට ගෙන තමාගේ නිවෙසක් තනා ගැනිමට සම්පත් නොමැති වීම, ආරක්ෂක ගැටලු, කඳවුරු තුළ සමාජ සම්බන්ධතා මෙන්ම වෙල්ලාලවරුන්ගේ ආධිපත්‍යයෙන් යුතු අවට ප්‍රදේශවලට යෑමේ දුෂ්කරතා මෙම ජනයා මුහුණ දුන් ප්‍රධාන ගැටලු වේ.
5. පානීය ජලය ලබා ගැනීම, හින්දු කෝවිල්වලට ඇතුළු වීම හා තේ කඩවලට ඇතුළු වීම අඩංගු විවිධ කුල-පාදක කොන් කිරීම්වලට මෙම ජනයා ලක් වී ඇත.

6. සාම්ප්‍රදායයික වෙල්ලාල කුලයේ නායකත්වය බිඳ දමමින් කරයර් කුලයෙන් LTTE නායකත්වය බිහි විය.
7. කුල-පාදක කොන් කිරීම්වලට එරෙහිව පංචමර්වරුන් ගෙන ගිය අරගල හේතුවෙන් කුල-පාදක කොන් කිරීම් අඩු වී ඇත.

සාකච්ඡාව

යාපනයෙන් පැමිණි වෙනත් පර්යේෂකයෙකු පැවසුවේ, IDP ජනයා බහුතරයක් පංචමර් පසුබිමින් පැමිණි බව පිළිගත හැකි නමුත් එය කුල-පාදක කොන් කිරීමකට වඩා යාපනයේ ජනාවාස රටාව නිසා සිදු වූවක් විය හැකි බවය. ඊට පිළිතුරු දුන් තංගේස් මහතා, යුද්ධයට ගොදුරු වූ ඉහළ කුලවල පිරිස් ආරක්ෂිත ස්ථාන කරා සංක්‍රමණය වන්නේ නම් පංචමර් ජනයාට එසේ කිරීමට නොහැකි වීම නොසලකා හැරිය නොහැකි බවය. සමහරුන් තර්ක කළේ මේ වන විට වෙල්ලාලවරුන් බොහෝ පිරිසක් යාපනයෙන් නික්ම ගොස් ඇති නිසා වෙල්ලාල ආධිපත්‍යයක් නොමැති බවය. LTTE නායකයන්ගේ සමාජ පසුබිම පිළිබඳ විශ්වාසනීය තොරතුරු නොමැති නිසා ඔවුන්ගේ කුල සංයුතිය පිළිබඳ පූර්ණ විග්‍රහයක් කිරීම අපහසු බවට කරුණු ඉදිරිපත් විය.

කුල-පාදක කොන් කිරීම්වලට ගොදුරු වූ දැරියකගේ අත්දැකීම්

වරප්‍රසාද නොලත් කුල පසුබිමකින් පැමිණි දැරියක් තමාගේ පෞද්ගලික අත්දැකීම් කෙටියෙන් විස්තර කළාය. සමාජ තත්වය නිසා පාසලේදී ඇය විඳි දුෂ්කරතා පීඩාවන් මෙන්ම ඉන් ගැළවී යාමේ අවස්ථා සීමා වීම පිළිබඳව ඇය හෙළිදරව් කළාය. පීඩිත සමාජ පසුබිම්වලින් පැමිණි ඇය වැනි තරුණ පිරිස් දෙස සියලුම පාර්ශවයන්ගේ නෙත් යොමු වේවායි ඇය ප්‍රාර්ථනා කළාය.

සිංහල සමාජය තුළ කුල-පාදක කොන් කිරීම්: මහාචාර්ය කාලිංග ටියුඩර් සිල්වා

1. සිංහල කුල ක්‍රමය හින්දු කුල ක්‍රමය මෙන් ආගමිකව තහවුරු වූවක් නොවන අතර එය ලෞකික කුල ක්‍රමයක් ලෙස සැලකේ.
2. ඉහළම කුලය රදළ වන අතර, පහළම කුල ලෙස රොඩී (යාචක), කින්නර (පැදුරු වියන්නන්), ගහල (වධකයන්) කුල සැලකේ. මුළු ජනගහනයෙන් සුළු පිරිසක් වන මොවුන් හුදෙකලාව ජීවත් වේ.
3. වහුම්පුර (ගෘහස්ත සේවක), බත්ගම (කම්කරු) කුල පීඩිත කුල ලෙස හඳුනා ගත හැක. ඉඩම් අහිමිකම, දරිද්‍රතාවය, නීති විරෝධි ක්‍රියා, හිංසනය, සමාජ ආන්තික භාවය මෙම කුලවලට ආවේණික ලක්ෂණ වේ.

4. 1971, 1987-89 කාලවල මතු වූ කැරලිකාරී දේශපාලන ව්‍යාපාරයක් වූ ජනතා විමුක්ති පෙරමුණ තුළ ඉදිරියෙන්ම සිටියේ කරාව, බත්ගම හා වහුම්පුර කුලවල ජනයා බව වාර්තා වී ඇත (අයිවන් 1993).
5. මහනුවර දිස්ත්‍රික්කයේ ගම්මාන දෙකක සිදු කළ අධ්‍යයන තුළින් සිංහල සමාජයේ කුල-පාදක කොන් කිරීම්වලට නිදසුන් සපයා ඇත.
6. මුළු ජනගහනයෙන් 80% ක් බෙරවා කුලයට අයත් වැලිවිට ග්‍රාමයේ එම ජනයාගේ වාසගම් සහ පුද්ගලික නාමයන් පවා කුලයත් පාරම්පරික තත්වයත් ප්‍රදර්ශනය කරන හංවඩු ලක්ෂණ සහිත නම් විය.
7. කොටිකාබද්ද මහත්මිය විසින් කින්නර කුලයේ ජනයා ජීවත් වූ හේනාවල ගමේ සිදු කළ අධ්‍යයනයෙන් එම ජනයා කුල පසුබිම නිසා සමාජ ආර්ථික ආන්තිකභාවයට පත් වූ අයුරු පෙන්වා දෙයි.
8. කුලය සිංහල සමාජයේ විවෘතව සාකච්ඡා නොවන්නකි. කුලය සඟවනවා හෝ ප්‍රතික්ෂේප කරනවා විනා සමාජ ප්‍රතිපත්ති හෝ පොදු ප්‍රශ්නයක් ලෙස සාකච්ඡාවට නොගැනේ.

සාකච්ඡාව

ඇතැමෙකු තර්ක කළේ ශ්‍රී ලංකා කුල ක්‍රමයේ මෘදු බව නිසා කුලය ක්ෂය වී ඇති හෙයින් කුල-පාදක කොන් කිරීම් පිළිබඳ මහජන මතයක් ගොඩ නැගීම නිෂ්ඵල කාර්යයක් වන බවයි. මීට පිළිතුරු දුන් පර්යේෂකයන් පසුගිය කාලය තුළ කුල-පාදක කොන් කිරීම් අඩු වී ඇති නමුත් හේනාවල, යාපනයේ අවතැන් වූ අය සිටින කඳවුරු සහ මහයියාව වැනි ප්‍රජාවන් තුළ තවදුරටත් කුල-පාදක කොන් කිරීම් සිදු වන බව පෙන්වා දුන්හ. 1930 ඇරඹූ රාජ්‍ය සුබසාධක ප්‍රතිපත්ති හා 1977 විවෘත ආර්ථිකය කුලය කෙරෙහි බලපෑවේ කෙසේදැයි ඇසූ ප්‍රශ්නයට පිළිතුරු දුන් මහාචාර්ය සිල්වා, වත්මන් අධ්‍යයනයෙන් හෙළිවන පරිදි කිසිදු ප්‍රතිපත්තියක් කුල-පාදක කොන් කිරීම් මුලිනුපුටා දැමීමට සමත් වී නැති බව පැවසීය.

ශ්‍රී ලංකාවේ කුල-පාදක කොන් කිරීම් සම්බන්ධ ප්‍රධාන ප්‍රවණතා: සාමූහික සාකච්ඡා

සාමූහික සාකච්ඡා සඳහා සිවිල් සමාජ සංවිධාන හතරක නියෝජිතයන් එක් විය. මහනුවර මානව සංවර්ධන ආයතනයේ සිවප්‍රකාශම් මහතා පැවසුවේ කුල-පාදක කොන් කිරීම් පිළිබඳ පුළුල් දැනුවත්භාවයක් අවශ්‍ය බවය. ඔහුගේ සංවිධානය කුල ක්‍රම තුනෙහිම පීඩිත කුල පිළිබඳ ක්‍රියාකාරී සංවිධානයකි. මහනුවර සමාජ සංවර්ධන ආයතනයේ නිර්මාතෘ මුතුලින්ගම් මහතා, අධ්‍යයනයෙන් හෙළි වූ තොරතුරු සමාජ ක්‍රියාකාරකයන්ට ප්‍රයෝජනවත් බව පැවසුවේය. ශ්‍රී ලංකාවේ සමාජ අරගල බොහෝ ඇති වූ මුත් ඒවා පන්තිය හා ජනවාර්ගික වෙනස්කම් කිරීම් මත පදනම් වූ බව

ඔහුගේ අදහස විය. බදුල්ල ප්‍රජා සංවර්ධන ආයතනය නියෝජනය කළ නවරත්න හෙන්නායක මහතාට අනුව ඔහුගේ සංවිධානය සිංහල, දෙමළ, ඉන්දියානු දෙමළ ඕනෑම ප්‍රජාවක පීඩිත කුල වෙනුවෙන් ක්‍රියා කරයි. මෙම දුෂ්කර ප්‍රදේශයේ රොඩී කුලයේ කාන්තාවන් ශ්‍රම සහ ලිංගික සූරාකෑමට ලක් වන බව හෙළි කළේය. කොළඹ මානව හිමිකම් කොමිසමේ නිමල්කා ප්‍රනාන්දුට අනුව ලංකාවේ කුල-පාදක කොන් කිරීම්වලට එරෙහි අරගල පුළුල් මානව හිමිකම් අරගල බවට පත් විය යුතුය. මෙම ජනයා කුල-පාදක වෙනස්කම් කිරීම්වලට එරෙහිව ඇති නීති පවා යොදා ගන්නේ කලාතුරකිනි. හේතුව ඒ පිළිබඳ ඔවුන්ගේ දැනුවත් බව අවම නිසාය. මේ නිසා ලංකාවේ සිදුවන සියලුම ආකාරයේ වෙනස්කම් කිරීම් මුලිනුපුටා දැමීමට සියලු පිරිස් එකට එක්විය යුතු බව ඇය පැවසුවාය.

සමාප්තිය: රිකී නෝර්ලින්ඩ් (අන්තර්ජාතික දලිත් සහයෝගීතා ජාලය)

ඉන්දියාවේ හා වෙනත් ප්‍රදේශවල සිටින දලිත් ජනයාගේ අයිතිවාසිකම් නගා සිටුවීමට ඔවුන් වෙනුවෙන් පෙනී සිටින අනුග්‍රාහක සංවිධානයක් ලෙස අන්තර්ජාතික දලිත් සහයෝගීතා ජාලයේ (ISDN) භූමිකාව විස්තර කරමින් ඇය කතාව ආරම්භ කළාය. දලිත්වරුන් මුහුණ දෙන ගැටලු අතර වෙළඳපොළට ප්‍රවේශ වීම, අධ්‍යාපනය ලබා ගැනීම, පානීය ජලය ලබා ගැනීම වැනි ගැටලු රැසකි. සනීපාරක්ෂක කම්කරුවන් ගත් කල විකල්ප රැකියා නොමැති වීම, ඉන්දියාවේ සිට පැමිණි ඔවුන් අදාළ රටවලදී වාර්ගික සුළුතරය බවට පත් වීම හා වරප්‍රසාද නොලත් කුලවලට අයත් වීම නිසා විවිධ පීඩනයන්ට ලක් වේ. කුල-පාදක කොන් කිරීම් උදෙසා පර්යේෂකයන්, ක්‍රියාකාරකයන් අතර අදහස් හුවමාරුවේ හා විශ්වසනීය තොරතුරු විශ්ලේෂණයේ අවශ්‍යතාව ඇය පෙන්වා දුන්නාය. රටවල් කිහිපයක සිදු කරන මෙම අධ්‍යයන ව්‍යාපෘතිය තුළින් කුල-පාදක කොන් කිරීම්වලට එරෙහි අරගලවලට නව මාවතක් සකසනු ඇත. අවසානයේදී ඇය සමුළුවේදී සිය අදහස් බෙදාහදා ගැනීමට තමාට ආරාධනා කිරීම පිළිබඳ සංවිධායකයන්ට සිය ස්තූතිය පළ කළාය.

ආශ්‍රිත ග්‍රන්ථ

Ann, Adele, 1993, *Women Fighters of Liberation Tigers*, Jaffna: Thasan Printers.

Arumainayagam, K., 1979, "Kudi-makkal–Domestic Servants", *Tribune*, September 8, 24 (9): pp. 30-31.

Arumainayagam, K., 1979, "Kudi-makkal–Domestic Servants", *Tribune*, September 15, 24 (10): pp. 27-28.

Arumainayagam, K., 1979, "Kudi-makkal–Domestic Servants", *Tribune*, September 22, 24 (11): pp. 9-10.

Arumainayagam, K., 2000, "Caste in Jaffna in the 19th Century" in Duraisingam, T. (ed.), *Politics and Life in Our Times,* Vol. 1. pp. 1699–1709. Colombo: Unie Art Pvt.

Arumainayagam, K., 2000, "Caste in Jaffna in the 19th Century" in Duraisingam, T. (ed.), *Politics and Life in Our Times,* Vol. 11. pp. 1710-1745, Colombo: Unie Art Pvt.

Balasundaram, S., 2005, *Malaiyaha People: A Study of Changing Ethnic Identity Formation Among the Plantation Tamils in Sri Lanka*, Unpublished B.A. Thesis, University of Peradeniya.

Banks, Michael, 1957, *The Social Organization of the Jaffna Tamils*, Unpublished PhD Thesis, Cambridge University.

Banks, Michael, 1960, "Caste in Jaffna" in E.R. Leach (ed.), *Aspects of Caste in South India, Ceylon and North West Pakistan*, Cambridge: Cambridge University Press, pp. 61-77.

Brass, Daniel, 2001, *Landscapes of Malaiyaha Identity*, Colombo: Marga Institute.

Brass, Daniel, 2005, *Malaiyaha (Up-country) Tamil Identity and Politics in the Twenty First Century*, Colombo: International Centre for Ethnic Studies,

Bhanjee, Tarique, 1999, Follow up report regarding research in Mahaiyawa MC (unpublished manuscript).

Casie Chetty, Simon, 1934, *Castes, Customs, Manners and Literature of the Tamils*, Colombo: Bailing Press.

Chandrabose, A.S., 2003, *Distribution of Population in Sri Lanka and the People of Up-Country, in Contemporary Problems of Up-country Tamil People: A Multidimensional Perspective* (Tamil), Colombo: Sivalingam Memorial Committee.

Chandraprema, C.A., 1991, *Sri Lanka: Years of Terror: The JVP Insurrection 1987-1989, Colombo*: Lake House.

Chandresekaran, M., 2006, *Trials and Tribulations of Repatriates from Sri Lanka*, Conference paper read in Indo-Lankan Seminar.

Coomaraswamy, Radhika, 1997, "The Tigers and Women's Emancipation", *Frontline,* 10 January, 1997.

Daniel Valentine, E., 2001, *Sri Lankans and Tamils in Anthropography of Violence*, Delhi: Oxford University Press. pp. 14-42.

Daniel, E.V. & Thangaraj, Y., 1994, "Forms, Formations and Transformation of the Tamil Refugee" in E.V. Daniel & Chr. Knudser, J. (eds.), *Mistrusting Refugees,* Los Angeles: University of California Press, pp. 39-68.

David, Kenneth, 1974a, "And Never the Twain Shall Meet? Meditating and Structural Approaches to Caste Ranking" in H. M. Buck and G. Yocum (eds.), *Structural Approaches to South Indian Studies*, Chambersburg, PA: Wilson College Press, pp. 43-80.

David, Kenneth, 1974b, "Hierarchy and Equivalence in Jaffna, North Ceylon Normative Code as Mediators" in K. David (ed.), *The New Wind: Changing Identities in South Asia,* The Hague: Mouton, pp. 179-226.

David, Kenneth, 1973a, "Spatial Organization and Normative Schemes in Jaffna, Norther Sri Lanka" in *Modern Ceylon Studies*, 4 (1 & 2): pp. 21-52.

David, Kenneth, 1973b, "Until Marriage Do Us Part: A cultural Account of Jaffna Tamil Categories for Kinsmen" in *Man* 8 (4): pp. 521-535.

De Silva, Colvin R., 1952, *Ceylon Under British Occupation:* 1795-1983. 1(2). Colombo: Apothecaries.

De Silva, S.B.D., 1982, *The Political Economy of Underdevelopment*, London: Routledge & Kegan Paul.

Dirks, Nicholas B., 1997, "The Invention of Caste: Civil Society in Colonial India" in H.L. Seneviratne (ed.), *Forging of Caste and Community in India and Sri Lanka*, Delhi: Oxford University Press, pp. 120-136.

Gamburd, M.R., 2002, *Transnationalism and Sri Lanka's Housemaids: The Kitchen Spoon's Handle,* New Delhi: Saga.

Gill, Timothy, 2007, *Making Things Worse: How 'Caste Blindness' in Indian Post-tsunami Disaster Recovery has Exacerbated Vulnerability and Exclusion,* Netherlands: Dalit Network.

Gombrich, R., 1991, *Precept and Practice: Traditional Buddhism in Rural Highlands of Ceylon*, Delhi: Motilal.

Goonesekere, R.K.W., 2001, *Caste Discrimination: A Global Concern*, (A report by Human Rights Watch for the United Nations World Conference against Racism, Racial Discrimination, Xenophobia and Related Intolerance. Durban, South Africa, September 2001.

Goonesekere, R.K.W., 2000, *Prevention of Discrimination and Protection of Indigenous Peoples* (E/CN.4/Sub.2/2001/16), Working paper on the topic of discrimination based on work and descent, submitted pursuant to Sub-Commission resolution 2000/4.

Hullop, O., 1993, "Caste Identity and Cultural Continuity Among Tamil Plantation Workers in Sri Lanka", *Journal of Asian and African Studies* 28 (1& 2): pp. 67-87.

Hullop, O., 1994, *Bonded Labour: Caste and Cultural Identity Among Tamil Plantation Workers in Sri Lanka,* New Delhi: Sterling Publications.

Ivan, Victor, 1993, *Prachandatwaya, Avihinsawa ha Viplavaya*, (in Sinhala) Colombo: Godage Brothers.

Jayaraman, R., 1975, *Caste Continuities in Ceylon: A Study of the Social Structure of Three Tea Plantations,* Bombay: Popular Prakashan.

Jayawickrama, N., 1976, *Human Rights in Sri Lanka,* Colombo: Ministry of Justice.

Jiggins, Janice, 1979, *Caste and Family in the Politics of the Sinhalese*, Cambridge: CUP.

Kannangara, A.P., 1993, "The rhetoric of caste status in modern Sri Lanka" in Peter Robb (ed.), *Society and Ideology: Essays in South Asian History*, pp. 111-141.

Kulasekera, K.M.P., 1984, *The Caste System and the British Administration in the Kandyan Provinces of Sri Lanka,* Kalyani, 3-4. 1984: pp. 205:230.

Leach, E.R., 1959, *Hydraulic Society in Ceylon, Past and Present* 15: pp. 1-23.

Leach, E.R., 1960, "Introduction: What Should We Mean by Caste?" in E.R. Leach (ed.), *Aspects of Caste in South India, Ceylon and North West Pakistan*, Cambridge: Cambridge University Press, pp. 1-10.

Leach, E.R.,1961, *Pul Eliya: A Village in Ceylon*, Cambridge: Cambridge University Press.

McGilvray, Dennis, 2008, *Crucible of Conflict: Tamil and Muslim Society on the East Coast of Sri Lanka,* Durham: Duke University Press.

McGilvray, Dennis, 1983, "Paraiyar Drummer of Sri Lanka: Consensus and Constraint in an Untouchable Caste", *American Ethnologist* 10 (1): pp. 97-115.

McGilvray, Dennis, 1982, "Mukkuvar Vannimai: Tamil Caste and Matriclan Ideology in Batticoloa, Sri Lanka" in Dennis McGilvray (ed.), *Caste Ideology and Interaction*, Cambridge: Cambridge University Press, pp. 34-97.

Mahroof, M.M.M., 2000, "A Conspectus of Tamil Caste System in Sri Lanka: Away from a Parataxis", *Social Scientist*, 28(11/12): pp. 40-50.

Moore, Mick, 1985, *The State and Peasant Politics in Sri Lanka,* Cambridge: Cambridge University Press.

Moore, Mick, 1993, "Thoroughly Modern Revolutionaries: The JVP in Sri Lanka", *Modern Asian Studies,* 27 (3): pp. 593-642.

Moore, M.P. & Perera, U.L.J.J., 1978, *Land Policy and Village Expansion in Sri Lanka*. Marga 5 (1).

Muthulingam, S. 1996, *Unwritten History*, Kandy: ISD.

Omvedt, Gail, 1978, "Towards a Marxist Analysis of Caste: A Response to T B Ranative", *Social Scientist* 6 (11): 70-76.

Parakrama, Arjuna, 1998, *Identity in Crisis or Crisis as Identity: Note from the Margins of This War,* Newton Gunasinghe Memorial Lecture.

Peebles Patrick, 2001, *The Plantation Tamils of Ceylon*, Leicester University Press: London.

Pfaffenberger, Bryan, 1982, *Caste in Tamil Culture: The Religious Foundation of Sudra Domination in Tamil Sri Lanka.*

Pfaffenberger, Bryan, 1990, "The Political Construction of Defensive Nationalism: The 1968 Temple-entry Crisis in Northern Sri Lanka", *Journal of Asian Studies* 49 (1): pp. 78-95.

Pieris, Ralph, 1956, *Sinhalese Social Organization: The Kandyan Period*, Colombo: University of Ceylon Press.

Raghavan, M.D., 1953, "Sociology of Jaffna: The Nalavar and the Koviar" in *Tamil Culture*. April. pp. 139-150.

Raghavan, M.D., 1957, *Handsome Beggars: The Rodiya of Ceylon,* Colombo: Government Press.

Raghavan, M.D., 1967, *The Tamil culture in Ceylon: A General Introduction,* Colombo: Kalai Nilaim Limited.

Ragunathan, M., 2002, *Social Issues in Eela Novels,* Jaffna: Mahajan.

Ravikumar, 2005, *Caste of the Tiger: Eelam and the Dalit Question* (unpublished report).

Roberts, Michael, 1984, *Caste Conflict and Elite Formation: The Rise of Karava Elite in Sri Lanka, 1500-1931,* Cambridge: Cambridge University Press.

Roberts, Michael, 2005, "Saivite Symbols, Sacrifice and Tamil Tiger Rites", *Social Analysis* 49 (1): pp. 67-93.

Rupasinghe, G., 2000, *Livelihood Development Among Potters in Rural Sri Lanka,* Kandy: IDE, 2000 (unpublished report).

Ryan, Bryce, 1993, *Caste in Modern Ceylon,* New Delhi: Navrang (first published in 1957).

Schalk, P., 1992, "Birds of Independence or the Participation of Tamil Women in Armed Struggle", *Lanka*, 7, pp. 44-148.

Schalk, P., 1997, "Historicization of the Martial Ideology of the Liberation Tigers of Tamil Eelam (LTTE)", South Asia: *Journal of South Asian Studies*, 20, pp. 1-38.

Seneviratne, H.L. 1978, *Rituals of the Kandyan State*, Cambridge: Cambridge University Press.

Siddhartan, M., 2003, "Negotiating Tamilness: A Case Study of Jaffna-Tamil Migrants to Colombo Since 1990" in Mayer, D. Rajasingham, Senanyake and Y. Thangarajah (eds.), *Building Local Capacity for Peace: Rethinking Conflict and Development in Sri Lanka,* Delhi: Macmillan, pp. 305-320.

Silva, K.T. & Atukorala, S., 1992, *The Watte-dwellers: A Sociological Study of Selected Urban Communities in Sri Lanka,* Lanham: University Press of America.

Silva, K.T. & Hettihewage, A., 2001, "Poverty, Social Exclusion and Impact of Selected Legal Measures Against Caste Discrimination in South Asia" in P. Robson & A. Kjonstad (ed.), *Poverty and Law*, London: Hart Publishing, pp. 59-72.

Silva, K,T., 1982, *Caste, Class and Capitalist Transformation in Highland Sri Lanka*, Melbourne: Monash University (PhD thesis).

Silva, K,T., 1992, "Capitalist Development, Rural Politics and Peasant Agriculture in Highland Sri Lanka: Structural Change in a Low Caste Village" in James Brow and J. Weeramunda (eds.), *Agrarian Change in Sri Lanka*, New Delhi: Sage, pp.63-95.

Silva, K,T., 1999, "Caste, Ethnicity and Problems of National Identity in Sri Lanka", *Sociological Bulletin* 1999 48 (1 & 2): pp. 201-217. Reprinted in S.L. Sharma and T.K. Oommen (eds.), *Nation and National Identity in South Asia*, New Delhi: Orient Longman, 2000, pp. 201-216.

Silva, K,T., 2005, *Kulaya, Pantiya and Lankawe Samaja Gatum,* (in Sinhala), Boralasgamuwa: Visidunu Prakashakayo.

Sivathambi, K., 2000, *Yaalpaanam: Chamookam Panpaadu Karuthunilai,* (in Tamil), Colombo: Kumaran Puththaka Illam.

Stirrat, R.L., 1982, "Caste Conundrums: Views of Caste in a Sinhalese Catholic Fishing Village" in Dennis B. McGilvary (ed.), *Caste Ideology and Interaction*, London: Cambridge University Press, pp. 8-33.

Suryanarayan, L., 2001, Memorial Speech on late R. Sivalingam, Colombo, 28th July 2001.

Thanges, P., 2006, *Caste and Ethnicity in Jaffna: War-induced Transformation of Identity*, Unpublished B.A Thesis, University of Peradeniya.

Thanges, P., 2007, "Yaalpaanathil Saathi: Marapum Maattamum" (in Tamil) in *Yaalpaanach Chamookam*, Colombo: Malar Veliyeedu, pp. 11-86.

Thorat, S.& Shah, P.G., 2007, *Dismantling Descent-based Discrimination: Report on Dalit's Access to Rights,* New Delhi: NCDHR & IIDS.

Trawick, Margaret, 1999, "Reasons for Violence: A Preliminary Ethnographic Account of the LTTE" in S. Gamage & I.B. Watson (eds.), *Conflict and Community in Contemporary Sri Lanka*, New Delhi: Sage, pp. 139-177.

UNFPA, 2007, *Case Studies from RHIYA: Good Practices in Education and Communication,* Brussels: UNFPA, Reproductive Health Initiative for Youth in Asia, 2007.

Uswatte Aratchy, G., 1972, "From Highway to Blind Alley: A Note on Youth and Higher Education", *Marga,* 1(3): 75-85.

Vegujanan & Ravana, 2007, *Saathiyamum Athatkethirana Poraddangalum* (in Tamil), 2nd edition, Chennai: South Vision.

Weeratunga, Nireka, 1988, *Aspects of Ethnicity and Gender Among the Rodi of Sri Lanka,* Colombo: ICES.

Wesumperuma, Darmapriya, 1986, *Indian Immigrant Plantation Workers in Sri Lanka: A Historical Perspective 1880-1910*, Kelaniya: Vidyalankara Press.

Wickramasekera, S.B.W., 1961, *The Social and Political Organization of the Kandyan Kingdom (Ceylon)*, London: University of London, London (MA Thesis).

Wickramasinghe, Nira, 1995, *Ethnic Politics in Colonial Sri Lanka*, New Delhi: Vikas Publishers.

Yalman, Nur, 1967, *Under the Bo Tree,* Berkeley: California University Press.

සූචිය

අ
අගමුදියන්
අඩිමෙයි
අතුකෝරාල, කේ
අනන්‍යතාවය
අන්තර්
-පුද්ගල සන්නිවේදනය
-කුල විවාහ
-වාර්ගික විවාහ
අනුග්‍රාහක-ක්‍රායක සම්බන්ධතා
අභ්‍යන්තරික යටත් විජිතකරණය
අම්පට්ටර්
අම්බලකාරන්
අවරෝහණය
අස්පර්ශනීයත්වය
අශුද්ධ
අහම්පඩියාර්
අලුහල්
එංග අලුහල්
උංග අලුහල්
අඳය

ආ
ආචාරි
ආධිපත්‍යය
ආන්තික බව, තත්වය
ආනුභාවික
-තොරතුරු
-පර්යේෂණ
ආරක්ෂාකාරී ජාතික ව්‍යාපාරය
ආරුමනිනායගම්
ආහාර සලාක

ඇ
ඇන්, ඇඩෙලී

ඉ
ඉඩම් භුක්තිය
ඉඩම් භුක්ති ක්‍රමය
ඉන්දියානු දෙමළ
ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ
ඉන්දු ලංකා ගිවිසුම

ඊ
ඊළාම් මෙහෙයුම

උ
උඩුකුරු චලයතා
උතුරු පළාත් සුළුතර දෙමළ මහා සභාව
උදුවිල්
උප කුල
උමා මහේෂ්වරන්
උස්වත්තේ ආරච්චි, ජී.
උල්ලූර් චෙට්ටිමාර්
ඌරන්

ඓ
ඓන්ද්‍රිය ඒකාබද්ධතාව

ඔ
ඔයාත ජාති

ඕ
ඕපාත වත්ත

ක
කට්කෝවලම් කාමන්කුත්තු
කටුකැලේ පුල්ලෙයාර් කෝවිල
කදිරේෂන් කෝවිල
කන්කසන්තුරේ
කන්තාර්
කන්නංගර
කරයර්
කරයිනගර්
කර්දීස්
කයිකුලාර්
කයිට්ස්
කරාව
කරාවෙඩ්ඩි
කලාසිරිගම
කාමන්කුත්තු
කාසිචෙට්ටි, සයිමන්
කිට්ටු
කින්නර

කිල් ජාති
කුකුවාර් (කුයාවර්)
කුඩිමෙයි
කුඩියානවර්
කුඹල්
කුඹුරු පනත
කුරයින්ඩ ජාති
කුරවරයි
කුලසේකර, කේ.එම්.පී.
කුලීන
කුමාරප්පා
කුමාරස්වාමි, රාධිකා
කුල
-අවිච්ඡින්නතා
-දෘෂ්ටිවාදය
-ධුරාවලිය
-පාදක ගැටුම්
-පීඩාකාරි
-පීඩිතයන්
-මහන්තත්වය
-මූලධර්ම
-රැකියා
-ව්‍යුහය
-විමුක්තිය
-හීන
කුල ක්‍රම
-උඩරට කුල
-වැඩවසම් ක්‍රමය
-පීඩිත කුල
-වැඩවසම් ක්‍රමය
-සේවා කුල
කුලය
-ලෞකිකරණය වීම
-ප්‍රතිනිර්මාණය වීම
කූරගල
කෝනාපුලම් සුබසාධන මධ්‍යස්ථානය
කෝපේ
කෝරාල ගම්
කෝරලේ
කෝවියාර්
කෝවිල්වලට ඇතුළු වීමේ අරගලය

ග
ගත්තර කිරීම
ගබඩාගම්
ගරුත්වය
ගම්උදාව
ගම්මුලාදෑනි
ගල්ලදු
ගහල
ගැම්බර්ඩ්, ජේ.
ගිල්, තිමොති
ගුඩ්හෑන්ඩ්, ජේ.
ගුණසේකර, ආර්.කේ.ඩබ්.
ගෙටෝකරණය
ගොම්බ්‍රිච්, ආර්.
ගොවිගම
ගෝලීයකරණය

ච
චක්කිලියාර්
චන්ද්‍රප්‍රේම, සී.ඒ.
චන්ද්‍රසේකරන්, එම්.
චන්ද්‍රාබෝස්, ඒ.එස්.
චාන්කර්නි
චාර්ලිස් ඇන්තනී
චාරිත්‍රමය තහංචි
චාවකච්චේරි
චෙට්ටි

ජ
ජන ඝනත්වය
ජනතා විමුක්ති පෙරමුණ
ජනවාර්ගික
-අනන්‍යතාවය
-ආන්තික බව
-ඒකාග්‍රතාව
-ගෙටෝකරණය
ජනවාර්ගිකත්වය
ජනසතු
ජයරාමන්, ආර්.
ජයවික්‍රම, එන්.
ජාතික විමුක්තිය
ජාතිකත්වය

ජාතික මානව හිමිකම් කොමිෂන් සභාව
ජිගින්ස්, ජැනිස්

ට
ටෙම්පල්ස්ටෝවේ වත්ත

ඩ
ඩර්ක්, නිකොලස් බී.
ඩැනියෙල්, ඊ.වී.
ඩෙල්ෆ්
ඩේවිඩ් කෙනත්

ත
තවාර්
තට්ටාර්
තන්කාරර්
තන්ගරාජ්, වයි.
තන්ගේස්, පී.
තමිල් සෙල්වම්
තමිලර්
තහංචි
තෙලිප්පලායි
තේ කඩවලට ඇතුළුවීමේ ව්‍යාපාරය
තේරු උත්සවය
තෝරැට්ටි

ද
ද සිල්වා, කොල්වින් ආර්.
ද සිල්වා, එස්.බී.ඩී.
දලිත්
-අරගලය
දුරාව
-පන්න දුරා
-වෙල්ල දුරා
දෙමළ
-කොට් සංවිධානය
-කොංග්‍රසය
-ජාතික ව්‍යාපාරය
-විමුක්ති ව්‍යාපාරය
දේවාල ගම්

ධ
ධුරාවලිගත පිලිවෙළ
ධුරාවලිගත චාරිත්‍රමය ව්‍යවහාර
ධුරාවලිය
-කුල
-සමාජ ආර්ථික

න
නයිදු
නල්ල ජාති
නල්ලූර්
නවන්දන්න
නාගරික කසළ ශෝධක ප්‍රජාව
නාගරික සබා
නාට්ටුවර්
නාදශ්වරම්
නැකති
නිදහස් අධ්‍යාපනය
නිදවාන් සුබසාධන මධ්‍යස්ථානය
නොක්ස්, රොබට්

ප
පට්ටි
පදු
පන්ඩාරම්
පංචමර්
පෆෙන්බර්ග්, බ්‍රයන්
පරයන්
පරයර්
පල්ලන්
පල්ලර්
පාසැල් තුළ ළමයින්ට ආසන පැනවීම හා ආහාර සැපයීම අතින් සමානාත්මතාවය ඇති කිරීම සඳහා වූ අරගලය
පිරාමනර්
පීඩිත දෙමළ කම්කරුවන්ගේ සංවිධානය
පීබල්ස්, පැට්‍රික්
පීරිස්, රැල්ෆ්
ප්‍රභාකරන්, වී
ප්‍රවේණිගත

පෙරේරා, යූ.එල්.ජේ.ජේ.
පොන්නම්මා
පොයින්ට් පෙද්රෝ

බ
බඩහැල
බත්ගම
බද්ද
-කින්නර බද්ද
-කුරුවේ
-කොට්ටල්
-බඩහැල
-බෙරවා
-මඩිහේ
-මහ
-හුනු
බාන්ජී, ටැරික්
බාලසුන්දරම් ශෂි කුමාර්
බෑන්ක්, මයිකල්
බ්‍රාස්, ඩැනියෙල්
බ්‍රාහ්මණ
බෙරවා
බේබි සුබ්‍රමනියම්

ම
මත්පැන් පානය
මයිලිට්ටි
මරම්මරිහල්
මරුතන්කර්නි
මලයියාහ මිනිසුන්
මල්ලාහම්
මහජන එක්සත් පෙරමුණ
මහ නගර සභා
මහරූෆ්, එම්.එම්.එම්.
මහයියාව
මාගා
මාධ්‍යයක ගෘහ විශාලත්වය
මානව හිමිකම් උල්ලංඝනය
මානව වංශ විද්‍යාත්මක
මාරි අම්මා
මාවිද්දපුරම් කෝවිල
මැක්ගිල්ව්‍රේ
මුක්කුවර්
මුතුලින්ගම්, එස්.
මුදලියාර්
මුහාම් මක්කාල්
මුරුතයි වීරන්
මුවර්, එම්.පී.
මුහාම් මක්කාල් / සන්ගාල්
මෝචාවත්ත
MT
MC

ය
යාල්මන්, නූර්
යෝගී

ර
රසුනාදන්
රටේ ඇත්තෝ
රත්නපාල, එන්.
රදල
රදා
රයන්, බ්‍රයිස්
රවිකුමාර්
රහීම්
රාගවන්
රාජකාරිය
රාවනා
රූපසිංහ, ජී.
රෙජිස්ටාර්
රෙඩ්ඩියාර්
රෙසෙලාවත්ත
රොඩී
රොබට්ස්

ල
ලංකා කම්කරු කොන්ග්‍රසය
ලීච්

ව
වතු ආර්ථිකය
වතු දෙමල
වන්නර්
වර්කුන්දිපල්ලර්
වර්ගවාදී වෙනස්කම් අහෝසි කිරීම සඳහා වන ජාත්‍යන්තර සම්මුතිය
වසාවිලාන්

වහුම්පුර
වැල් රාජා
වික්‍රමසිංහ, එන්.
විසුම්පෙරුම, ඩී.
වීරතුංග, නිරේකා
වෙගුජනන්
වෙල්ලාල
-මොට්ටයි
-වෙම්පු ඒඩා
වෙලානයි

ශ
ශීඝ්‍රගාමී ක්ෂේත්‍ර අධ්‍යයන
ශ්‍රම විභජනය
ශ්‍රම සංවිධානය
ශ්‍රම හමුදාව
ශ්‍රමික කුල
ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය

ෂ
ෂෙරුප්පුකට්ටිහල්
ෂෝ

ස
ස්ත්‍රී පුරුෂ සමාජ භාවය
ස්වයං අනන්‍යතාවය
සන්දිලිපේ
සංක්‍රමණ
සමතලකරණය
සමසමාජය
සමාජ
-අපහරණය
-අසාධාරණ පිටු දැකීමේ පනත
-අසාධාරණය
-ඒකාබද්ධතාව
-කොන් කිරීම්
-කෘත්‍යයන්
-ගතික
-චල්‍යතාව
-චර්යාව
-පන්තිය
-ප්‍රතිපත්ති
-ස්තරායනය
සම්බාධක
සයිමන් කාසි චෙට්ටි
සයිව කුරුක්කල්
සර්වෝදය ව්‍යාපාරය
සලාගම
සාන්ඩාර්
සාලාවයිත් තොලිලාලර් වෙන්නිරා
ආඩෙව් සන්ගම්
සිද්දාර්ථන්, එම්.
සිප්පාචාරි
සිල්වා, කේ.ටී.
සිවතම්බි, කේ.
සිවප්‍රකාශම්
සිහයි අලන්කාරිපාලර් සන්ගම්
සුබසාධක ප්‍රතිපත්ති
සුබසාධක රාජ්‍යය
සුබසාධන වැඩසටහන්
සුසෙයි
සෙනෙවිරත්න, එච්.එල්.
සේවා සංවිධානය
සෝමතිලක

හ
හකුරු
හුනු
හුලේ
හුලොප්
හේන

කුලෙන් තොර ද කුල අන්ධ ද?

කුලය, සමාජ කොන්කිරීම් සහ ශ්‍රී ලංකාවේ සැඟවුණු සමාජ යථාර්ථය

කාලිංග ටියුඩර් සිල්වා, පී.පී. සිවප්‍රකාශම්, පරම්සෝති තන්ගේස්

වත්මන් ලංකාවේ කුලය පිළිබඳ දැඩි නිහැඬියාවක් පවතී. 1833 රාජකාරිය අහෝසි කිරීමෙන් අනතුරුව කිසිදු රාජකාරි කටයුත්තක් සඳහා කුලය පිළිගනු නොලැබේ. අසල්වැසි රටවල් වන ඉන්දියාවේ හා නේපාලයේ මෙන් ශ්‍රී ලංකාවේ ජන මාධ්‍යවල කුලය පිළිබඳව විවෘත සාකච්ඡාවක් සිදු නොවේ. උතුරු දිග ශ්‍රී ලංකාව ගැන සලකන විට LTTE සංවිධානය විසින් එක් අතකින් කුලය තහනම් කොට ඇති අතර අනෙක් අතින් එය ඊළාම් විමුක්ති අරගලයට බාධකයක් ලෙස හඳුනාගෙන ඇත. මෙවැනි පසුතලයක් පැවතුන ද කුලය විවාහය, දේශපාලනය හා සමාජ ක්‍රියාකාරිත්වය, සමාජ චලතාවය වැනි කාරණාවලදී පෞද්ගලික සහ පොදු අවකාශයන් තුළ ක්‍රියාත්මක වන බව පෙනේ. ශ්‍රී ලංකාවේ පවත්නා වර්තමාන සමාජ දේශපාලන පසුතලය තුළ කුලය පවත්නේ බොහෝදුරට සැඟවුනු සංසිද්ධියක් වශයෙනි. එනමුත් උතුරේ හා දකුණේ පවත්නා සමාජ අසහනයන් හා විරෝධතා සඳහා දායක වන සාධක ගැන සලකා බැලීමේදී කුලයට ද කිසියම් වැදගත්කමක් දිය යුතුය. මෙම කෘතිය මගින් සිංහල, ලාංකික දෙමළ සහ ඉන්දියානු දෙමළ ජන වර්ග තුළ ග්‍රාමීය අංශය, වතුකරය, නාගරික අඩු ආදායම් ජනාවාස, යුද්ධයෙන් පීඩිත කලාප, අවතැන් වූ ජනයාගේ කඳවුරු සහ ආගමික සහ දේශපාලන වැනි විවිධ සන්දර්භයන්හි කුල-පාදක සමාජ කොන් කිරීම් සිදුවන අයුරු විග්‍රහ කොට ඇත. ශ්‍රී ලංකා සමාජයෙහි කුල මුක්ත ස්වභාවයක් හෝ කුලරහිතභාවයකට වඩා කුලය පිළිබඳ අවිචාරාත්මක අන්ධානුකරණ ස්වභාවයක් පවත්නේ යැයි තර්ක කරන මෙම කෘතිය මගින් කුල පීඩිත ජනයාගේ ආත්ම ගරුත්වය හා මානව අයිතිවාසිකම් තහවුරු කිරීමට දායක වන සමාජ ප්‍රතිපත්ති සහ එබඳු ජන කොටස්වල සහභාගිත්වය සහිතව සමාජ වෙනස හා සමාජ සාධාරණත්වය ඇති කිරීමේ වැදගත්කම පෙන්වා දේ.

කාලිංග ටියුඩර් සිල්වා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකු සහ ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපතිවරයා ද වේ.

පී.පී. සිවප්‍රකාශම් මහනුවර මානව සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂවරයා වේ.



පරම්සෝති තන්ගේස් කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ කථිකාචාර්යවරයෙකි.

කුමරන් බුක් හවුස්

විෂයයන්: සමාජ විද්‍යාව, මානව විද්‍යාව, දේශපාලනය, මානව හිමිකම්

ISBN 978-955-659-155-2

9 789556 591552

මිල රු. 700.00

කුලෙන් තොර ද කුල අන්ධ ද?

කාලිංග ටියුඩර් සිල්වා, පී.පී. සිවප්‍රකාශම්, පරම්සෝති තන්ගේස්

කුලෙන් තොර ද කුල අන්ධ ද?

කුලය, සමාජ කොන්කිරීම් සහ ශ්‍රී ලංකාවේ සැඟවුණු සමාජ යථාර්ථය

කාලිංග ටියුඩර් සිල්වා

පී.පී. සිවප්‍රකාශම්

පරම්සෝති තන්ගේස්

අන්තර්ජාතික දලිත් සහයෝගීතා ජාලය, කොපන්හේගන්

දලිත් අධ්‍යයන පිළිබඳව ඉන්දියානු ආයතනය, නවදිල්ලිය සහ

කුමරන් බුක් හවුස්, කොළඹ - චෙන්නායි